328 වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 328 - இல. 08
Volume 328 - No. 08

2026 ජූලි 24වන සිකුරාදා
2026 யூலை 24, வெள்ளிக்கிழமை
Friday, 24th July, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයාට එරෙහි විශ්වාසභංග යෝජනාවේදී ස්ථාවර නියෝග අංක 91(ඉ) සහ (ඊ) පිළිපැදීම [තීරුව 1303]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1308-1351]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල ඒකාබද්ධ කිරීමේ යෝජනාව [තීරුව 1351]

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ඩිජිටල් ලියාපදිංචි පද්ධතිය නවීකරණය කිරීම [තීරුව 1358]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

ආර්ථික සහ ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) – [ගරු ඩී.වී. චානක මහතා] පළමුවන වර කියවන ලදී [තීරුව 1361]

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයාට එරෙහි විශ්වාස භංග යෝජනාව:**

නිෂ්ප්‍රභ විය [තීරු 1362-1492]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 1492-1520]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணையின்போது நிலையியற் கட்டளை இல. 91(உ) மற்றும் (ஊ)ஐப் பின்பற்றுதல் [ப: 1303]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1308-1351]

**தனி அறிவித்தல் மூல வினா:**

ஊழியர் சேமலாப நிதியையும் ஊழியர் நம்பிக்கை நிதியையும் இணைப்பதற்கான முன்மொழிவு [ப: 1351]

கம்பனிகள் பதிவாளர் திணைக்களத்தில் டிஜிட்டல் பதிவுத் தளத்தை நவீனமயமாக்கல் [ப: 1358]

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

பொருளாதார மற்றும் கிராமிய மூலவளங்கள் அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு டி.வீ. சானக] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1361]

**நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை:**

நிராகரிக்கப்பட்டது [ப: 1362-1492]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 1492-1520]


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Adherence to Standing Order Nos. 91(E) and (F) during No-Confidence Motion against Minister of Justice and National Integration [Col. 1303]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1308-1351]

QUESTION BY PRIVATE NOTICE:

Proposed Amalgamation of Employees' Provident Fund and Employees' Trust Fund [Col. 1351]

Modernization of Digital Registration Platform of Department of Registrar of Companies [Col. 1358]

PRIVATE MEMBERS' BILLS:

Economic and Rural Resources Development Foundation (Incorporation) - [The Hon. D.V. Chanaka] - Read the First time [Col. 1361]

VOTE OF NO-CONFIDENCE AGAINST MINISTER OF JUSTICE AND NATIONAL INTEGRATION:

Motion Negatived [Cols. 1362-1492]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1492-1520]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

**2026 ජූලි 24වන සිකුරාදා**
2026 யூலை 24, வெள்ளிக்கிழமை
Friday, 24th July, 2026

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයාට එරෙහි විශ්වාසභංග යෝජනාවේදී ස්ථාවර නියෝග අංක 91(ඉ) සහ (ඊ) පිළිපැදීම
### நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணையின்போது நிலையியற் கட்டளை இல. 91(உ) மற்றும் (ஊ)ஐப் பின்பற்றுதல்
### ADHERENCE TO STANDING ORDER NOS. 91(E) AND (F) DURING NO-CONFIDENCE MOTION AGAINST MINISTER OF JUSTICE AND NATIONAL INTEGRATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, 2026 ජූලි 22 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණය පරිදි අද දින අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාට එරෙහි විශ්වාස භංගත්වය පිළිබඳ යෝජනාව විවාදයට ගැනීමට නියමිත අතර, මෙම කාරක සභා රැස්වීමේදී එළඹි එකඟතාව පිළිබඳව මෙම සභාව දැනුවත් කිරීමට කැමැත්තෙමි.

මෙම විවාදයේදී ස්වකීය අදහස් ප්‍රකාශ කරන මන්ත්‍රීවරයන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 91(ඉ)හි සඳහන් පරිදි සිය අදහස් ප්‍රකාශ කිරීම, විවාදයට භාජන වෙමින් පවතින විෂයයට පමණක් සීමා කරනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 91(ඊ)හි සඳහන් පරිදි අධිකරණයේ විනිශ්චයට භාජන වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන යම් කාරණයක් පිළිබඳව සභාවේදී සිය අදහස් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිය යුතු වේ.

තවද, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 91(ඊ) උල්ලංඝනය කරමින් කටයුතු කරනු ලබන මන්ත්‍රීවරයන්ගේ ප්‍රකාශ අද දින හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට ද කටයුතු කිරීමට සිදුවනු ඇති බවත් තවදුරටත් දැනුම් දීමට කැමැත්තෙමි.

### II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2026 ජූලි 24 සිකුරාදා, එනම් අද දින, අපර භාග 4.00ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present Supplementary Estimate No. 03 of 2026.

I move that the Supplementary Estimate be referred to the Committee on Public Finance.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the -

(i) Annual Report of the Tertiary and Vocational Education Commission for the year 2024; and

(ii) Annual Performance Report of the Department of Examinations, Sri Lanka for the year 2025.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Performance Report of the President's Fund for the year 2025.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Performance Report of the National Procurement Commission for the year 2025.

I move that this Report be referred to the Committee on Constitutional Affairs.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Report on the observations and steps taken in terms of Standing Order No. 120(4) of the Parliament with regard to the matters mentioned on the University of Sri Jayewardenepura in the Report of the Committee on Public Enterprises, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Enterprises.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே 2024ஆம் ஆண்டுக்கான இலங்கை மீன்பிடி துறைமுகங்கள் கூட்டுத்தாபனத்தின் ஆண்டறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

இவ்வறிக்கை சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமென நான் பிரேரிக்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බලශක්ති අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

ගරු කථානායකතුමනි, කළුතර, නාගොඩ, ඩිපෝව ඉදිරිපිට, අංක 205 යන ලිපිනයෙහි පදිංචි එන්.ඒ.පී.එම්.ඩබ්ලිව්. සේනානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අළුබෝමුල්ල, රුග්ගහ පාර, අංක 118 යන ලිපිනයෙහි පදිංචි ඒ.ඒ. කමනි පෙරේරා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කැප්පෙටිවලාන, ගල්දෙණිය යන ලිපිනයෙහි පදිංචි ඒ.ඒ. සිරිමල් දයාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පොල්පිතිගම, කිරිබමුණේගම යන ලිපිනයෙහි පදිංචි ජේ.එච්. කරුණාතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) අලව්ව, කොහොළාන, මැදිකැලේ වත්ත යන ලිපිනයෙහි පදිංචි කේ.එච්.සී.එස්.ජේ. අමරනාගල්ලගේ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, කැලණිය, දළුගම, පරණ නුවර පාර, අංක 397 යන ලිපිනයෙහි පදිංචි එස්.ජී.කේ.ඩී. චමින්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### කිරි ගොවීන් නඟාසිටුවීම: ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්
### பால் உற்பத்தியாளர்களைக் கட்டியெழுப்புதல்: நடைமுறைப்படுத்தப்பட்ட வேலைத்திட்டங்கள்
### UPLIFTMENT OF DAIRY FARMERS: PROGRAMMES IMPLEMENTED

29/2024

**1. ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney-at-Law)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කිරි පිටි ආනයනය කිරීම සඳහා විශාල මුදලක් වැය වන බවත්;

(ii) කිරි ගොවීන් නඟාසිටුවීම මඟින් විශාල ආර්ථික වාසියක් මෙන්ම ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමට හැකි බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) දෛනික කිරි අවශ්‍යතාවයෙන් අප රට තුළ නිපදවනු ලබන කිරි ප්‍රමාණය කොපමණද;

(ii) කිරි ගොවීන් නඟාසිටුවීමට සහ දිරිමත් කිරීමට රජය විසින් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள் காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பால்மா இறக்குமதிக்காகப் பெருமளவு பணத்தொகை செலவு செய்யப்படுகிறது என்பதையும்;

(ii) பால் உற்பத்தியாளர்களை கட்டியெழுப்புவதன் மூலம் பாரிய பொருளாதார நன்மைகளை அடைந்து கொள்ள முடியும் என்பதுடன், மக்களின் சுகாதார நிலைமைகளையும் மேம்படுத்த முடியும் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அன்றாட பால் தேவையில் எமது நாட்டில் உற்பத்தி செய்யப்படும் பாலின் அளவு யாது என்பதையும்;

(ii) பால் உற்பத்தியாளர்களை கட்டியெழுப்புவதற் காகவும் ஊக்குவிப்பதற்காகவும் அரசாங்கம் ஏதேனும் வேலைத்திட்டத்தை நடைமுறைப் படுத்தியுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறெனில், அவ்வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Is he aware that -

(i) a large amount of money is spent on the importation of milk powder; and

(ii) a significant economic benefit, as well as an improvement in the health status of the public, can be achieved by empowering dairy farmers?

(b) Will he inform this House -

(i) the quantity of milk produced in the country, out of the total daily requirement;

(ii) whether the Government has implemented any programme to uplift and incentivize dairy farmers; and

(iii) if so, the said programme?

(c) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) 43%

(ii) ඔව්.

(iii) කිරි ගොවීන් නඟාසිටුවීමට හා දිරිමත් කිරීමට රජය විසින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

1. ජාතික කිරි නිෂ්පාදන වැඩසටහන.

2. අභිජනන ගොවිපළ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නිකවැරටිය කිරි ගොවිපළ සංවර්ධනය.

3. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මඟින් විවිධ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීම.

- ජාතික කිරි නිෂ්පාදන වැඩසටහන
  - අපේක්ෂිත ඉලක්ක
    - Dairy Hub සමිති 325ක් හරහා කිරි ගොවීන් සංවිධානය කිරීම.
    - කිරි ව්‍යවසායකයන් බිහි කිරීම.
    - වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 410 සිට ලීටර් මිලියන 1,200 දක්වා ඉහළ නැංවීම.
    - මේ සඳහා ජාතික අය වැයෙන් රුපියල් මිලියන 1,000ක් 2026 වසර සඳහා වෙන් කර ඇත.

      නිකවැරටිය අභිජනන ගොවිපළ සඳහා වෙනම රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා.
- අභිජනන ගොවිපළ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ,
  - ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් නිකවැරටිය කිරි ගොවිපළ සංවර්ධනය කිරීම මඟින් අනාගතයේදී ක්ෂේත්‍රයට අවශ්‍ය එළ ගව සහ මී ගව ගැහැනු හා පිරිමි පැටවුන් නිකුත් කිරීමට හැකි න්‍යෂ්ටික ගොවිපළක් බවට පත් කිරීමට බලාපොරොත්තු වේ.
  - මේ සඳහා ජාතික අය වැයෙන් රුපියල් මිලියන 1,000ක් 2026 වසර සඳහා වෙන් වී ඇත.

    ඒ කටයුතු සඳහා ඉදිකිරීම් මේ වනකොට ආරම්භ කර තිබෙනවා

(ඇ) පැන නොනඟී.

**ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney -at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය විධියට ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම මේ කාරණය අහන්න කැමතියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා දීපු උත්තරය සාමාන්‍යයෙන් අපි අහලා පුරුදු උත්තරයක්. මේ ප්‍රශ්නය ඇහුවාම හැම ආණ්ඩුවකම ඇමතිවරු දුන්නේ මේ වාගේ උත්තරයක්. නමුත් මම විශ්වාස කරනවා, අපේ රට කිරිවලින් ස්වයංපෝෂිත වෙන්න අවශ්‍ය පරිසරය තිබෙන රටක් කියන එක. හැබැයි, මේ අමාත්‍යාංශය භාර ගන්නා කිසිම අමාත්‍යවරයෙක් ඒ වෙනුවෙන් වන නිශ්චිත වැඩ පිළිවෙළක් යටතේ ක්‍රියාත්මක වුණේ නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. කිරි පිටි ආනයනය කරන එක අපට නතර කරන්න බැහැ. හැබැයි, ඒක අඩු කරන්න පුළුවන්. නමුත් ඒ ප්‍රමාණය කවදාවත් අඩු වෙන්නේ නැහැ. එන්න එන්නම ඒ ප්‍රමාණය වැඩි වෙනවා. ඔබතුමා කිව්වා, නිකවැරටියේ සිදු කරන ව්‍යාපෘතියක් ගැන. නමුත් ඒ වාගේ එක project එකක් හරහා මේ ප්‍රශ්නයට උත්තර හොයන්න නම් අවුරුදු 25ක්, 30ක් ගත වුණත් බැරි වෙයි.

අපේ රටේ කිරි ගොවීන් අද වනවිට තමන්ගේ කිරි ගොවිතැනින් ඉවත් වෙනවා. ඒකට හේතුව, කිරිවලට නිශ්චිත මිලක් නැතිකමයි. ඒ වාගේම බොහෝ තැන්වල කිරි එකතු කරන මධ්‍යස්ථාන පවත්වා ගෙන යන්නේ පෞද්ගලික අංශයෙන්. කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන පෞද්ගලික අංශයේ ආයතන තමයි කිරි එකතු කිරීම කරගෙන යන්නේ. රජය හෝ මිල්කෝ ආයතනය හෝ මැදිහත් වෙලා අඩුම තරමින් කිරි ටික එකතු කරලා හෝ එම ගොවීන් දිරිමත් කරන වැඩසටහනක් අපේ රටේ තවම නිවැරදිව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මම දන්නා තරමින් දකුණු පළාත තුළ එවැනි වැඩසටහනක් කොහොමවත්ම ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ රටට කිරි ආනයනය කරන එක නතර කරන්න බැරි එක ඇත්ත. මම හිතන විධියට, කිරි පිටි

නිෂ්පාදනය කරන ආයතන ලංකාවේ එකක් හෝ දෙකක් තමයි තිබෙන්නේ. එම ප්‍රමාණය තවදුරටත් වැඩි කර ගැනීමට ව්‍යවසායකයන් දිරිමත් කරනවා කියලා ඔබතුමා කිව්වා. ඒ සඳහා ගෙන තිබෙන පියවර මොකක්ද කියන එක මා දැන ගන්න කැමැතියි. ඒ වාගේම, මම කලින් කියපු milk collection centres ටික හදන්නත් ඕනෑ. ඒක එච්චර අමාරු වැඩක් නොවෙයි. ඒ සඳහා අමාත්‍යාංශයට පුළුවන්කමක් තිබෙනවාද කියන කාරණයත් මා දැන ගන්න කැමැතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, මේ සඳහා කිසිම රජයකින් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර නැහැ කියලා ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඔව්, ඒක එහෙම වෙන්න පුළුවන්. නමුත් අපි ආණ්ඩුවක් විධියට, අමාත්‍යාංශය විධියට වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව, Dairy Hub ව්‍යාපෘතිය තිබෙනවා. විශේෂයෙන්ම ලංකාවේ තිබෙන පශු වෛද්‍ය කාර්යාල 325 පදනම් කරගෙන කිරි ගොවීන් සවිබලගන්වමින්, සමිති ගොඩනහමින් පවතිනවා. එම කිරි ගොවීන් ලබා ගන්නා කිරි ටික කාට දුන්නත් අපට ප්‍රශ්නයක් නැහැ.

මේ වෙනකොට සියයට 90ක් විතර ඒ සමිති ගොඩනහලා අවසානයි. ඊළඟට, ඒ සමිති මට්ටමින් ඒ ගොවීන්ට උදවු කරන, කිරි ප්‍රමාණය වැඩි කර ගැනීමට අදාළ ප්‍රවර්ධන කටයුතුවලට අපි අත ගහලා තිබෙනවා. විශේෂයෙන්ම හොඳ වැස්සි පැටවුන් ලබා දෙනවා වාගේම කිරි ගවයින්ගෙන් ගන්නා කිරි ප්‍රමාණය වැඩි කර ගන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික භාවිතාව පිළිබඳව අපි වැඩි අවධානයක් යොමු කරලා තිබෙනවා. නිකවැරටිය ගොවිපළ වැනි එක තැනක් අපි තෝරා ගත්තේ, එතැන වැඩිදියුණු කරලා, හොඳ වැස්සි පැටවුන් ලබා දීමේ ව්‍යාපෘතියක් තමයි එතැනින් ආරම්භ වෙන්නේ. ඒ අනුව කිරි ව්‍යවසායකයින් නිර්මාණය කිරීමට අදාළ වැඩසටහන් මේ වෙනකොට දියත් කරලා තිබෙනවා. පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයම මැදිහත් වෙලා තමයි මේ කටයුතු කරන්නේ. අනෙකුත් අංශත් එහෙමයි කටයුතු කරන්නේ. අපට පෞද්ගලික අංශය බැහැර කරලා යන්න පුළුවන්කමක් නැහැ. ඒවාට තිබෙන බාධා ඉවත් කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, රාජ්‍ය අංශය ගත්තොත්, මිල්කෝ හා NLDB කියන ආයතන දෙකම ඉන්දියාවේ අමුල් සමාගමට විකිණීම සඳහා සියලු සැලසුම් සකස් කරලා තිබුණු බව. එහි අන්තිම ගිවිසුම අත්සන් කරන්න විතරයි තිබුණේ. ඒක පදනම් කරගෙන අපට ශ්‍රේෂ්ඨාධිකරණයට පවා යන්න සිද්ධ වුණා, අභියාචනාධිකරණයට යන්න සිද්ධ වුණා. ඒ අනුව රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනු කරලා, අපි ඉන්දියාවත් එක්කත් සාකච්ඡා කරලා, මිල්කෝ ආයතනය බේරා ගත්තා. මිල්කෝ ආයතනය අපේ යටතට එනකොට රුපියල් ලක්ෂ 35,000ක් ණය තිබුණා. ගොවීන්ට විතරක් රුපියල් ලක්ෂ 17,000ක් ණය තිබුණා. ඒ ණය මුදල් ලබා ගැනීම සඳහා මගේ මූලිකත්වයෙන් ගොවීන් එක්ක ගිහිල්ලා, පී. හැරිසන් හිටපු ඇමතිතුමා හමු වුණා, විජිත් විජයමුණි ද සොයිසා හිටපු ඇමතිතුමා හමු වුණා. ඒ, ඔබතුමන්ලාගේ හිටපු ඇමතිවරු. හැබැයි, ඒ සල්ලි දුන්නේ නැහැ. ඒ අනුව අපි ඒ ආයතනය අරගෙන කෙටි කාලයක් යනකොට ඒ රුපියල් ලක්ෂ 35,000ක ණය ගෙව්වා. ඒ විතරක් නොවෙයි, ඒ ආයතනය ලාභ ලබන තැනට ගෙන ආවා. මිල්කෝ ආයතනයේ සේවකයින් 1,228ක් වැඩ කරනවා. පසුගිය දෙසැම්බර් 31වැනි දා, ඒ සුදුසුකම්ලත් සියලු සේවකයන්ට රුපියල් 75,000ක බෝනස් එකක් ලබා දුන්නා. අගමැතිතුමියගේ මූලිකත්වයෙන් රුපියල් කෝටි 18ක් ගොවීන්ට බෙදා දුන්නා. අද මිල්කෝ ආයතනය රාජ්‍ය ආයතනයක් විධියට ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා, පිළිතුර කෙටි කරන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ඉතින් ඒ තත්ත්වයත් එක්ක තවත් අවුරුද්දක් විතර යනකොට අපට මිල්කෝ ආයතනය යටතේ දැවැන්ත කිරි කර්මාන්තශාලාවක් විවෘත කිරීමට ඉඩකඩ ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. ඊට අදාළ කටයුතු කරගෙන යනවා. ඒ අනුව ඔබතුමා අහපු ප්‍රශ්නයට අදාළව අපි මේ වෙනකොට මැදිහත්වීමක් කරමින් ඉන්නවා.

**ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇහුවේ, ව්‍යවසායකයන් දිරි ගන්වන්න මොනවාද කළේ කියලායි. ඒකට උත්තරයක් නොවෙයි, වෙන උත්තරයක් තමයි එතුමා දුන්නේ. කමක් නැහැ. මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා පසුගිය කාලයේ හිටපු ඇමතිවරුන් දෙදෙනෙකුගේ නම්. ඒ වාගේම ඔබතුමන්ලාගේ දේශපාලන වේදිකාව තුළ විශාල සද්දයක් තිබුණා, කිරි ගවයන් ආනයනය කිරීම සම්බන්ධ ගැටලුවක් ගැන. මේ වෙනකොට එහි ප්‍රගතිය මොකක්ද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ඒ වාගේම තවත් විශේෂ කාරණයක් තිබෙනවා. පසුගිය ආණ්ඩුව කාලයේ කිරි නිෂ්පාදනය කිරීම සඳහා අංග සම්පූර්ණ milking plants පහක් ව්‍යාපාරිකයන්ට ලබා දුන්නා, ව්‍යවසායකයන් දිරි ගන්වන්න කියලා. ඔබතුමා නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට එය දන්නවා ඇති. මම හොයලා බැලුවා, ඒ පහ මේ වෙනකොට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. සම්පූර්ණයෙන් රජයේ අනුග්‍රහය යටතේ විශාල මුදලක් වැය කරලා තමයි බැසිල් රාජපක්ෂ හිටපු අමාත්‍යවරයා විසින් ඒවා ලබා දුන්නේ. ඒ වෙනුවෙන් විගණන ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවාද, ඒවා ගත්තේ කවුද, ඒ වෙනුවෙන් අරගෙන තිබෙන නීතිමය ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මා දැන ගන්න කැමැතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ඔව්. ඒ සමස්ත ක්‍රියාවලියට අදාළව විමර්ශන ආරම්භ වෙලා තිබෙනවා. ඕස්ට්‍රේලියාවේ වෙලාර්ඩ් රූරල් සමාගමත් එක්ක මැදිහත් වෙලා තමයි ඒ ගවයින් ගෙනැල්ලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, 2018 මැයි 8වැනි දා වෙලාඩ් රූරල් සමාගමට නෙදර්ලන්ත රබෝ බැංකුවෙන් ණයක් අරගෙන ඩොලර් මිලියන 11.9ක් advance විධියට ගෙවා තිබෙනවා, ගවයින් මිලදී ගැනීම සඳහා.

හැබැයි, ඒකට අදාළව ගවයින් ගෙන ආවෙත් නැහැ. මොකක්වත් ආවේ නැහැ. කතන්දර ගොඩක් තිබෙනවා. ඒකට අදාළව මේ වෙනකොට විමර්ශන යනවා. ඉදිරියේදී නීතිමය තත්ත්වයන් තුළ - ඔබතුමා කියපු දෙවැනි කාරණය - මේ සියල්ලට අදාළව උත්තර ලැබෙයි. ඊට අදාළ වගකිව යුත්තෝ ගෙන්නලා මේ වෙනකොට පරීක්ෂණ කරලා තිබෙනවා. ඒගොල්ලන්ගෙන් කට උත්තර අරගෙන තිබෙනවා. ඔය සමස්ත ක්‍රියාවලියට අදාළව මේ වෙනකොට විමර්ශන ආරම්භ වෙලා, ඒවා ඉදිරියට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

## චීනයෙන් ආනයනය කරන ලද කාබනික පොහොර පිළිබඳ විගණන වාර්තාව: නිර්දේශ
### சீனாவிலிருந்து சேதனப் பசளை இறக்குமதி செய்தமை தொடர்பான கணக்காய்வு அறிக்கை: விதப்புரைகள்
### AUDIT REPORT ON IMPORT OF ORGANIC FERTILIZER FROM CHINA: RECOMMENDATIONS

120/2024

**2.** ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) චීනයේ කාබනික පොහොර ආනයනය කිරීම සම්බන්ධයෙන් විගණන වාර්තාවක් නිකුත් කර තිබෙන බව දන්නේද;

(ii) එම විගණන වාර්තාව අනුව චීනයේ කාබනික පොහොර ආනයනය කිරීම හේතුවෙන් සිදුවී ඇති මූල්‍යමය අලාභය කොපමණද;

(iii) එම විගණන වාර්තාව මඟින් ලබාදී ඇති නිර්දේශ කවරේද;

(iv) එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சீனாவிலிருந்து சேதனப் பசளை இறக்குமதி செய்தமை தொடர்பாக கணக்காய்வு அறிக்கை யொன்று வெளியிடப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி கணக்காய்வு அறிக்கையின் பிரகாரம் சீன சேதனப் பசளையை இறக்குமதி செய்தமையால் ஏற்பட்டுள்ள நிதி இழப்பு எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி கணக்காய்வு அறிக்கைமூலம் வழங்கப்பட்டுள்ள விதப்புரைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி விதப்புரைகளை நடைமுறைப்படுத்து வதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that an audit report has been issued regarding the import of organic fertilizer from China;

(ii) the financial loss that has been caused by the import of organic fertilizer from China, as per the said audit report;

(iii) the recommendations that have been made in the audit report concerned; and

(iv) the steps that will be taken to implement the said recommendations?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නයට ටිකක් දිග පිළිතුරක් තිබෙන්නේ. මේකත් මේ රටේ පසුගිය කාලයේ ආන්දෝලනයට ලක් වෙච්ච ප්‍රශ්නයක්. විශේෂයෙන්ම චීන පොහොර නැව සම්බන්ධයෙන් තමයි මේ ප්‍රශ්නය යොමු කරන්නේ. මෙය රටවල් දෙකක් අතරේ සිද්ධ වෙච්ච ගනුදෙනුවක් නිසා අපි ඒ තත්ත්වයන් ගැන අවබෝධය ඇතුළේ මේකට පිළිතුර සපයන්න අවශ්‍ය වෙනවා.

(අ) (i) ඔව්.

(ii) කොළඹ වාණිජ මහාධිකරණ නඩු අංක CHC/213/21/MR හා CHC/214/21/MR දරන නඩුකර යටතේ 2022.01.03 දින එළඹි සමථ කොන්දේසි ප්‍රකාරව, අත්තිකාරමක් ලෙස ඇමෙරිකානු ඩොලර් 6,873,975ක් ගෙවා ඇත.

(iii) 01). අදාළ සුරක්ෂණයන් කල් ඉකුත් වීමට පෙර මුදල් කර ගැනීම හෝ සුරක්ෂණයන්ගේ කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු නොකිරීම හා අත්තිකාරම් ගෙවීමේදී කිසිදු සුරක්ෂණයකින් තොරව අරමුදල් නිදහස් කිරීම හේතුවෙන් රජයට සිදු වූ පාඩුව මෙම ගනුදෙනුවට සම්බන්ධ වග කිව යුත්තන්ට එරෙහිව නඩු පවරා අය කර ගැනීම.

02). ගිවිසුමේ කොන්දේසි හා 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත අනුව ශ්‍රී ලංකාවට ආනයනය කළ නොහැකි ජීවානුහරණය නොකළ, මර්දනය කිරීමට නිර්දේශිත කෘෂි රසායන වර්ගයක් නොමැති බැක්ටීරියා සහිත පොහොර තොගයක් ලංකාවට නැව්ගත කිරීමට ක්‍රියා කිරීම, 2020/2021 මහ කන්නයේදී වී වගාවට අවශ්‍ය පොහොර ගිවිසුම් ප්‍රකාරව ලබා නොදී පාඩුවක් සිදු කිරීම, නොසැපයූ පොහොර තොගයක් වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 6.9කට සමාන ශ්‍රී ලංකා රුපියල් 1,382,720,494ක මුදලක් ලබා ගැනීම හා සමථය ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සැපයුම්කරුට එරෙහිව නෛතිකව කටයුතු කිරීම.

03). ශ්‍රී ලංකාවේ නීති රීති ප්‍රකාරව හා ගිවිසුම්වලට අනුකූලව ක්‍රියා නොකළ උක්ත සැපයුම්කාර සමාගම ශ්‍රී ලංකාව තුළ අසාදු ලේඛනගත කිරීමට කටයුතු කිරීම.

(iv) කාබනික පොහොර මෙට්‍රික් ටොන් 96,000ක ප්‍රසම්පාදනය සම්බන්ධව 2022 අගෝස්තු 26 දින නිකුත් කරන ලද SPR/2022/04 දරන විශේෂ විගණන වාර්තාවේ නිර්දේශවලට අදාළව ගත යුතු

ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන් යුතුව සෙසු සාමාජිකයන් ලෙස කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (කෘෂි ව්‍යාපාර) සහ පශු සම්පත් අංශයේ නීති නිලධාරි ඇතුළත් කමිටුව කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරන ලදී. විගණන වාර්තාවේ අදාළ කොටස ඇමුණුම 01 ලෙස දක්වා ඇත. එකී කමිටුවේ නිර්දේශ 2024.02.14 දින, රජයේ විගණන කාර්යාලය වෙත අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දී ඇත. එම ලිපිය ඇමුණුම 02 ලෙස දක්වා ඇත.

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/2161/323/030-IX වූ "කාබනික පොහොර ආනයනය කිරීමට අදාළව සීමාසහිත ලංකා පොහොර සමාගම/ සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සහ ක්විංඩාඕ සිවින් බයෝටෙක් සමූහ සමාගම අතර පවත්නා ආරවුල නිරාකරණය කිරීම" යන මැයෙන් කෘෂිකර්ම ඇමතිතුමා ඉදිරිපත් කළ 2021.12.13 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය - (අමප අංක 21/1453/323/030-IV) පිළිබඳව වූ 2021.08.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව එම රැස්වීමේදී සහාගත කරන ලද කරුණු සමඟ සලකා බලන ලදුව, අදාළ සමාගම් අතර පවතින ආරාවුල සුහදශීලි එකඟතාවක් මත නිරාකරණය කර ගැනීමට 2021.12.13 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, නියම කර ඇත. අමාත්‍ය මණ්ඩල සන්දේශය ඇමුණුම 03 ලෙස දක්වා ඇත.

- 2021.12.10 දිනැති ලිපියෙහි අවසන් පූර්ව ඡේදයෙහි සඳහන් (1) සිට (4) දක්වා වන කරුණු මත පදනම්ව සමාගම් අතර පවතින ආරාවුල සුහදශීලි එකඟතාවක් මත නිරාකරණය කර ගැනීම.
- පොහොර සම්බන්ධයෙන් ඉදිරියේදී පැන නැඟිය හැකි මේ හා සමාන ආකාරයේ ආරාවුල් වළක්වා ගැනීම පිණිස ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
- අදාළ ආරාවුල නිරාකරණය කර ගැනීම හේතුවෙන් ශ්‍රී ලංකා රජයට ඇති වන මූල්‍ය බැඳීම් මහා භාණ්ඩාගාරය විසින් දැරීම.

එබැවින් මෙම කරුණට අදාළ සියලු පාර්ශ්වයන්ගේ අදහස් විමසමින් මිත්‍රශීලී එකඟතාවකින් විසඳා ගැනීම සඳහා වන වඩාත් යෝග්‍ය යෝජනා, අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස විදේශ කටයුතු ඇමතිතුමා වෙත නියම කිරීමට 2022 සැප්තැම්බර් 05වන දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. (එකී අමාත්‍ය මණ්ඩල තීරණය ඇමුණුම 04 වශයෙන් නම් කර ඇත.)

ඇමුණුම් 01, 02, 03, 04 ද, පසුබිම් වාර්තාව සහ එහි සඳහන් ඇමුණුම 05 ද **සභාගත*** කරනවා.

ඒ අනුව, ඉහත කී 2021.12.13 හා 2022 සැප්තැම්බර් 13වන දින ලබා දෙන ලද අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව මෙම ප්‍රසම්පාදනයට අදාළ ගැටලු නිරාකරණය කර ගැනීම, මිත්‍රශීලී එකඟතාවක් මත, විසඳා ගැනීමට අවශ්‍ය සාකච්ඡා අදාළ සියලු පාර්ශ්ව සමඟ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් කරනු ඇත. එසේම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පත් කරන ලද විශේෂ කමිටුවේ නිර්දේශ ප්‍රකාරව පහත සඳහන් පියවර ගැනීම සිදු කර ඇත.

**නිර්දේශ:**

01. නිලධාරීන් විසින් කාර්යසාධන බැඳුම්කර සම්බන්ධයෙන් නිසි කලට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බැවින්, ඔවුනට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදු නොකරන බව විගණකාධිපතිතුමා වෙත දැනුම් දීම සිදු කර ඇත.

02. රජයේ පොහොර සමාගම් සහ චීන සමාගම අතර කාබනික පොහොර ආනයනය කිරීමේ ක්‍රියාවලිය මේ වනතෙක් අවසන් වී නොමැති බැවින් තවදුරටත් මිත්‍රශීලීව දෙරට අතර එකඟතාවකින් මෙම ගැටලුව විසඳා ගත යුතු බව අමාත්‍ය මණ්ඩලයේ තීරණය වී ඇති බැවින් එසේ කටයුතු කිරීම.

03. මිත්‍රශීලී එකඟතාවකින් මෙම ගැටලුව දෙරට අතර විසඳා ගත යුතුය යන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව හා 2022.01.03 දින සමථයට එළැඹී සමථ කොන්දේසි ප්‍රකාරව මෙතෙක් අවසන් වී නැති මෙම පොහොර ආනයන ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ඇණහිටීමේ තත්ත්වයට පත් විය හැකි බැවින් සහ එමඟින් දෙරට අතර පවතින මිත්‍රශීලී සබඳතාවට ඉදිරියේදී ගැටලුවක් ඇති විය හැකි හෙයින් උක්ත සමාගම ශ්‍රී ලංකාව තුළ අසාදු ලේඛනගත නොකිරීම.

තවද, මේ වන විට කාබනික පොහොර ප්‍රසම්පාදනයට අදාළව 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන පනත යටතේ විමර්ශනයක් ආරම්භකොට පවත්වාගෙන යන බැවින්, එකී විමර්ශනය අවසානයේදී ඒ සම්බන්ධයෙන් ඉදිරි නෛතික කටයුතු සිදු කෙරෙනු ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

දීර්ඝ පිළිතුරක් ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

දැන්වත් ටිකක් තේරුම් ගන්න වෙනවා නේද ගරු නියෝජ්‍ය ඇමතිතුමා? ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට ජාත්‍යන්තර රටවලට අභියෝග කළාට ආණ්ඩු කිරීමේදී මිත්‍රශීලීව ඒ කටයුතු කළ යුතුයි කියන අදහස, යෝජනාව, ඒ යා යුතුයි කියන වැඩ පිළිවෙළ මේ පිළිතුර තුළ තිබෙනවා. ඒක ඉතා වැදගත් ඔබේ ආණ්ඩුවට. මොකද, දැන් බැහැ ගහලා හරි ගන්න. අපි හිතුවේ ආණ්ඩුව ආපු ගමන් ඒ කාලයේ හිටපු ඇමතිවරයා කනෙන් ඇදලා අරගෙන ඒ කරපු හොරකමේ සල්ලි චීනයෙන් ගනියි කියලා. දැන්

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චමින්ද විජේසිරි මහතා]

ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. ඔබතුමන්ලා මේ ගැන අල්ලස් කොමිසමේ දාපු නඩුවක් නඩුවක් තිබෙනවා. නමුත් ඒකත් ප්‍රායෝගික වෙන්නේ නැහැ, ඔබතුමන්ලා මිත්‍රශීලීත්වයෙන් මේක විසඳා ගත්තොත්. ගරු කථානායකතුමනි, මේ පිළිතුර තුළ ගරු නියෝජ්‍ය ඇමතිතුමා දිගින් දිගටම මේ පොහොර ආනයනය සිද්ධ වෙච්ච ප්‍රසම්පාදන ක්‍රියාවලිය වැරදි නැහැයි කියන කාරණය තමයි සඳහන් කළේ. ප්‍රසම්පාදනය හරි. නේද ගරු නියෝජ්‍ය ඇමතිතුමා? මෙතැන ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරි. නමුත්, අශූචි කියන එක සුවඳ බලලා ගන්නත් බැහැ, නේද? කාලා බලලා ගන්නවා වාගේ සුවඳ බලලා ගෙනාවත් වැඩක් නැහැ, පර්යේෂණවලින් තමයි ඒවා ෆේල් වෙලා තිබෙන්නේ. ඒ පර්යේෂණ ආයතනවලින් ඒවා සුදුසු නැහැ කියලා තිබෙනවා. ගල් අඟුරුත් එහෙමයි. මේකත් එහෙමයි. ගරු කථානායකතුමනි, මේ ගැන විගණන විමසුම් තිබෙනවා, විගණන වාර්තා තිබෙනවා. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ, ඔබගේ ආණ්ඩුව තීන්දුවක් අරගෙන තිබෙනවා, විගණන විමසුම්වල කෙසේ සඳහන් වෙලා තිබුණත්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරි නම් ඒක හොරකමක් නොවෙයි, වංචාවක් නොවෙයි කියලා. ඒකට උදාහරණය තමයි ගල් අඟුරු. ගල් අඟුරු බාලයි. හැබැයි, ඒ ප්‍රසම්පාදනය හරි; ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ වැරැද්දක් තිබුණේ නැහැ. ගල් අඟුරු බාල වුණාට ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදි නිසා *[බාධා කිරීමක්]* ඒක මගේ වැඩක් නේ. ගරු කථානායකතුමනි, යම්කිසි ප්‍රශ්නයක් අහනකොට ඒක ඇමතිතුමාට තේරුම් ගන්නත්, තේරුම් කිරීමේ පහසුව සඳහාත් මට යම් උදාහරණයක් ගන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විනාඩි 2කින් අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒක කියනකොට ගල් අඟුරු ගෙන්වපු ඇමතිතුමාට රිදෙනකොට, ඒකට එතුමා කැගහන එක මට අදාළ නැහැ. හොරකම වහන්න ගිය ඇමතිවරයාට, ඒ හොරකම ගැන පැහැදිලි කරනකොට දුක ඇති. මම අහන්නේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
විගණන විමසුමේත් මේ කාරණය තිබියදීත් ඔබ ආණ්ඩුව ගත් පොදු තීන්දුව අනුව, ඒ කියන්නේ ප්‍රසම්පාදනය හරි නම්,- *[බාධා කිරීමක්]* ඔබතුමා ලබා දුන් පිළිතුරේ කිසිම තැනක මේ අසූචි පොහොර මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාදාමය වැරදියි කියන්නේ නැහැ. ඒ නිසා තමයි ඒ සමාගම අසාධු ලේඛනයටත් මේ වනතෙක් දාලා නැත්තේ. මට වංචාව වහන්න ඕනෑ නැහැ. නමුත් ඔබතුමා දුන් පිළිතුරත්, ඔබේ ආණ්ඩුව වර්තමානයේදී ගත් තීන්දු අනුවත් අසූචි පොහොර මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය හරි නිසාත් මේක වංචාවක් නොවෙයි කියන එක ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු මන්ත්‍රීතුමනි, අපි එදාත් මේ පොහොර නැව ගේනකොට ඒකට අදාළව හැප්පුණා. හැබැයි, අපි ඒ හැප්පුණේ චීන රජයත් එක්ක නොවෙයි. අපි එතැනදී චීන රජය ගැටලුවක් කර ගත්තේ නැහැ. වර්තමානය වෙනකොට චීන රජය සහ ශ්‍රී ලංකා රජය ඉතාම මිත්‍රශීලී ගනුදෙනුවක් පවත්වාගෙන යනවා. ඒ වාගේම ඉතාම සහයෝගයෙන් වැඩකටයුතු කරනවා. ඒ නිසා මේක රටවල් දෙකක් අතර තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. අපේ රට ඇතුළේ මේකට වගකිවයුතු අය ඉන්නවා. ඒ අයට අදාළව විමර්ශන කෙරෙනවා. ඒ විමර්ශනවලින් හෙළිවෙන කරුණු අනුව නීත්‍යනුකූලව කටයුතු කරන්න අපි කිසිසේත්ම පැකිළෙන්නේ නැහැ. කොහොම නමුත්, විශේෂයෙන්ම රටකින් රටකට පස් පිඩක්වත් ගේන්න පුළුවන්කමක් නැහැ.

එතකොට, අපේ රටට තවත් රටකින් ක්ෂුද්‍රජීවීන් ඉන්න කිසිම දෙයක් ගෙනෙන්න පුළුවන්කමක් නැහැ. කාබනික පොහොර කියන්නේ ක්ෂුද්‍රජීවී ක්‍රියාවලියක්. ඒ ක්ෂුද්‍රජීවී ක්‍රියාවලිය අත්හිටුවා තමයි මේ පොහොර ලංකාවට ගෙනෙනවා නම් ගෙනෙන්න ඕනෑ. ක්ෂුද්‍රජීවී ක්‍රියාවලිය අත්හිටුවනවා කියන්නේ, එතකොට ඒක පොහොරක් වෙන්නේ නැහැ. ඔන්න ඔය තත්ත්වය තුළ තමයි ශාක නිරෝධායනයට අදාළ පනතට අනුව මේක නිර්දේශ නොවන්නේ. ඇත්තටම ඒ වෙනකොටත් ඒ අදාළ නිර්දේශ ලබා දුන්නේ වර්තමාන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය තුෂාර වික්‍රමාරච්චි මැතිතුමා. එතුමා ඇත්තටම ඒකට අත්සන් කළේ නැහැ. ඒක ඉතාම විශිෂ්ට කටයුත්තක්. ඒ තත්ත්වයත් එක්ක රටට අනවශ්‍යව, කිසිම පරීක්ෂණයකින් තොරව මේ පොහොර ගෙනාපු එකත් එක්ක තමයි අපිට මුදල් අහිමි වන්නේ. ලංකාව තුළ ඊට අදාළව මැදිහත් වෙච්ච විමර්ශන ඉස්සරහට යනවා. ඒවායේ නතරවීමක් සිද්ධ වන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දීපු පිළිතුරු සියල්ල තුළ මේ ආණ්ඩුව විසින් හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හෝ කරන සියලු දේවල්වලට ඒ වැරදිකරු නිර්දෝෂයි කියන කාරණය තමයි මට හැඟෙන්නේ. ඒ වැරදිකරු නිර්දෝෂ කිරීම සඳහා වූ සාක්ෂිය ගරු නියෝජ්‍ය ඇමතිතුමා හැටියට අද ඔබතුමා ලබා දී තිබෙනවා. ගරු කථානායකතුමනි, මේක පරිශීලනය කරනකොට මේක උසාවි කටයුත්තටත් ලේසි වේවි කියලා මා හිතනවා. ගරු ඇමතිතුමනි, අමාත්‍යාංශය හැටියට, පොහොර ප්‍රසම්පාදනය කරලා තමයි ගෙනෙන්නේ. දැන් ඔබතුමා කියන ආකාරයට පරීක්ෂණවලින් තමයි ඒවායේ ක්ෂුද්‍රජීවීන් ඉන්නවා කියලා තහවුරු වන්නේ. ඒ වාගේම දෙයක් තමයි ගල් අඟුරු හා සම්බන්ධ සිද්ධියේදීත් වුණේ. ගල් අඟුරු ටෙන්ඩරය දැම්මා. ගල් අඟුරු බාලයි කියලා අදාළ ආයතනවලින්ම කිව්වා. හැබැයි ඒවා බාල වුණාට ප්‍රශ්නයක් නැහැ. මම කලින් කිව්වා වාගේ ප්‍රසම්පාදනය හරියි කියන කාරණය නිසා, ඒවා බාල වුණාට ප්‍රශ්නයක් නැහැ. ඒකයි මම කිව්වේ, ප්‍රසම්පාදනය හරි කියන පිළිගැනීම තුළ මේ හොරකම්, වංචා, දූෂණ සියල්ල යටපත් කරන්න සිද්ධ වෙනවා කියලා.

ඔබතුමාගේ පිළිතුර අවසානයේදී විශේෂයෙන්ම කිව්වා, පර්යේෂණ සිදු වෙනවා කියලා. ඒ පර්යේෂණ සියල්ලටම හේතුවක් වෙනවා, සාධකයක් වෙනවා, උදවුවක් වෙනවා, මේ ප්‍රසම්පාදනය තුළ කිසිම වැරැද්දක් වෙලා නැහැ කියන එක. මොකද අපි ඇත්තටම දකිනවා ඒවා අසූචි නිසාත්, සුදුසු නිසාත් මිල ගෙවීම් කරලා තිබෙන බව. හිටපු රජයට හෝ වර්තමාන රජයට ඒ මිල ගෙවීමේ පාඩුව ගෙවන්න වෙනවා. මුදල් අස්ථානගත වෙලා තිබෙනවා. ඒ මුදල් අස්ථානගත වීමේ ප්‍රතිඵලය විඳින්න වෙන්නේ රටේ ජනතාවටයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුරු ලැබුණේ නැති නිසා දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මම මේ කාරණය අහනවා. ඔබතුමා දීපු පිළිතුර තුළිනුත්, ඔබතුමන්ලාගේ ආණ්ඩුව ගත්ත තීන්දුව තුළිනුත් අපට අවසානයේ තේරෙන්නේ, විපක්ෂයේ සිටියදී ආණ්ඩු බලය ගන්න කියපු කාරණයක් කියන එක මිස, ඇත්තටම ජනතාව බලාපොරොත්තු වෙච්ච සාධාරණය හෝ මේ වංචාව තුළින් සිදු වෙච්ච අලාභය කිසිසේත්ම රටට ලැබෙන්නේ නැහැ කියන එකයි. ඒ වාගේම හොරු නොවෙයි, නිර්දෝෂී පුද්ගලයන් හැටියට ඔප්පු කරලා තමුන්නාන්සේ අද මේ පිළිතුර ලබා දුන්නා කියන කාරණය තමයි මට හැඟෙන්නේ.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

මෙහි ප්‍රසම්පාදන ක්‍රියාවලියත්, අනෙකුත් ක්‍රියාවලීන් පිළිබඳවත් අපට එක පාරටම තක්සේරුවක් දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. විශේෂයෙන්ම මෙතැන වැරැද්දක් කරලා තිබෙනවා කියන එක විගණන වාර්තාවෙන් ඔප්පු වෙලා තිබෙනවා. විගණන වාර්තාවෙන් නිර්දේශ ලබා දෙනවා, මෙම චීන සමාගම අසාදු ලේඛනයට ඇතුළත් කරන්න කියලා. රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනුවලදී - රටවල් දෙකක් අතර තිබෙන ගනුදෙනුවලට - ඒක බාධාවක් වෙන නිසා ඒ තත්ත්වය පිළිබඳව එවකට කැබිනට් මණ්ඩලය යම් තීරණයක් අරගෙන තිබෙනවා. ඒ තීරණය පිළිබඳව අපට ගැටලුවක් නැහැ. ඒ සම්බන්ධයෙන් අපිත් එතැන හිටගන්නවා. මෙහිදී අපි කොතැනකවත් චීන රජය අනිකා කරගෙන නැහැ. හැබැයි, මේ තිබෙන්නේ චීන සමාගමක් සහ ලංකාව අතර ගනුදෙනුවකදී ඇති වෙච්ච ගැටලුවක්. ඒ තත්ත්වය තුළ, ඊට අදාළ විමර්ශන ක්‍රියාත්මක වනවා. හිටපු ඇමතිවරයෙකුගෙන් පවා මේ පිළිබඳව තොරතුරු විමසා, කටඋත්තර අරගෙන තිබෙනවා. ඒ තත්ත්වයත් එක්ක මම නැවත වතාවක් කියනවා, අපි මේකට චීන රජය පටලවා ගන්නේ නැහැ, චීන රජයත් එක්කම නොවෙයි අපට මෙහි ගැටලුව තිබෙන්නේ කියන එක. ශ්‍රී ලංකාවේ එදා තිබුණු දේශපාලන අධිකාරිය, ඒ වාගේම ඊට වග කිව යුතු අනෙකුත් අය මේ කටයුත්තට සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ සම්බන්ධ වීම තුළ අපේ රටට විශාල මුදල් ප්‍රමාණයක් අහිමි කෙරුවා විතරක් නොවෙයි, රටේ ජනතාවට පොහොරත් නැතිව ගියා.

විපක්ෂ නායකතුමා ම පසුගිය දවසක මෙතැනදී අපෙන් ප්‍රශ්නයක් අහනකොට පැහැදිලිව ප්‍රකාශ කෙරුවා, ඒ කාලය තුළ සියයට 35කින් වී අස්වැන්න අඩු වුණා කියලා. ඒක ඇත්ත. අන්න ඒ තත්ත්වයට හේතු වෙච්ච දෙයක් බවට මේ කාරණාව පත්වෙලා තිබෙනවා. ඒ නිසා මේකට අදාළ විමර්ශන අවසන් වුණායින් පසුව අදාළ පුද්ගලයින් සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරන්න අපි කිසිසේත්ම පැකිළෙන්නේ නැහැ කියන කාරණය මේ වෙලාවේ අවධාරණය කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -658/2025- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -1413/2025- (1), ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නැඟෙනහිර පළාතේ ග්‍රාමීය ප්‍රදේශවල ජාතික පාසල්: විදුහල්පති පුරප්පාඩු
## கிழக்கு மாகாணத்தில் கிராமப்புறங்களில் உள்ள தேசியப் பாடசாலைகள்: அதிபர் வெற்றிடங்கள்
## NATIONAL SCHOOLS IN RURAL AREAS OF EASTERN PROVINCE: PRINCIPAL VACANCIES

1889/2026

**5. ගරු අබුබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නැඟෙනහිර පළාතේ, නාගරික ප්‍රදේශවලින් බැහැරව පිහිටි ජාතික පාසල්වල විදුහල්පති පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින බැවින්, පරිපාලන හා අධ්‍යාපනික කටයුතුවලදී ගැටලු මතුවී ඇති බවත්;

(ii) අම්පාර දිස්ත්‍රික්කයේ ඇතැම් වෙරළබඩ අධ්‍යාපන කලාපවල සුදුසුකම්ලත් විදුහල්පතිවරුන් අතිරික්තව සිටියදී විදුහල්පතිවරුන් පත් නොකළ පාසල් බොහොමයක් පවතින බවත්;

එතුමිය දන්නේද?

(ආ) (i) ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට (SLEAS) නව නිලධාරීන්ගේ අවශ්‍යතාව පවතින අවස්ථාවක, පවතින විදුහල්පති පුරප්පාඩු පිරවීම සඳහා එම සේවයේ නිලධාරීන් කැඳවීමේ අවශ්‍යතාව කවරේද;

(ii) එම නිලධාරීන්ට ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමට හැකිවනු පිණිස විදුහල්පති රාජකාරිවලින් නිදහස් කිරීමට හැකියාවක් තිබේද;

[ගරු අබූබකර් අතම්බාවා මහතා]

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සහ විදුහල්පති සේවයේ නිලධාරින්ගේ රැකියා අවස්ථා සමාන පදනමක් මත විධිමත් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) සුදුසුකම්ලත් විදුහල්පතිවරුන් ප්‍රමාදයකින් තොරව පාසල් පරිපාලනයට පත් කිරීම සහතික කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கிழக்கு மாகாணத்தில், நகர்ப்புறங்களுக்கு அப்பால் அமைந்துள்ள தேசியப் பாடசாலைகளில் பெருமளவிலான அதிபர் வெற்றிடங்கள் காணப்படுவதால், நிருவாக மற்றும் கல்வி நடவடிக்கைகளில் சிக்கல்கள் ஏற்பட்டுள்ளது என்பதையும்;

(ii) அம்பாறை மாவட்டத்தின் சில கரையோரக் கல்வி வலயங்களில் தகைமையுடைய அதிபர்கள் மேலதிகமாக இருக்கின்றபோதிலும், அதிபர்கள் நியமிக்கப்படாத பல பாடசாலைகள் காணப்படுகின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) தேசிய கல்வி மறுசீரமைப்பு நடவடிக்கை களுக்காக இலங்கை கல்வி நிருவாக சேவைக்கு (SLEAS) புதிய உத்தியோகத்தர்களின் தேவைப் பாடு ஏற்பட்டுள்ள சந்தர்ப்பத்தில், நிலவும் அதிபர் வெற்றிடங்களை நிரப்புவதற்காக அச்சேவை யின் உத்தியோகத்தர்களை அழைப்பதன் அவசியம் யாது என்பதையும்;

(ii) மேற்படி உத்தியோகத்தர்கள் கொள்கை உருவாக்கம், அமுலாக்கம் மற்றும் கல்வி மறுசீரமைப்பு நடவடிக்கைகளில் கவனம் செலுத்தக்கூடிய வகையில், அதிபர் கடமைகளிலிருந்து அவர்களை விடுவிப்பதற் கான இயலுமை உள்ளதா என்பதையும்;

(iii) இலங்கை கல்வி நிருவாக சேவை மற்றும் அதிபர் சேவையின் உத்தியோகத்தர்களின் தொழில் வாய்ப்புகளை சமமான அடிப்படையில் முறைப்படுத்துவதற்கு எடுக்கப்படும் நடவடிக்கை கள் யாவை என்பதையும்;

(iv) தகைமையுள்ள அதிபர்களை தாமதமின்றி பாடசாலை நிருவாக நடவடிக்கைகளுக்காக நியமிப்பதை உறுதிப்படுத்துவதற்கு எடுக்கப் படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Is she aware that -

(i) problems have arisen in administrative and academic activities due to the large number of vacancies in the post of principal in National Schools located outside urban areas in the Eastern Province; and

(ii) many schools in the Ampara District continue to function without principals despite the existence of an excess number of qualified principals in certain coastal education zones within the district?

(b) Will she inform this House -

(i) the necessity of calling upon officers of the Sri Lanka Educational Administrative Service (SLEAS) to fill existing principal vacancies, at a time when the Service requires new officers for the implementation of national education reforms;

(ii) whether there is any possibility of relieving such officers from the duties performed in the capacity of principals in order to enable them to focus on policy formulation, implementation and education reform initiatives;

(iii) the steps that will be taken to streamline employment opportunities for officers in the Sri Lanka Educational Administrative Service (SLEAS) and the Principals' Service on an equal basis; and

(iv) the measures that will be adopted to ensure the appointment of qualified principals to school administration without delay?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) නැඟෙනහිර පළාතේ පවතින ජාතික පාසල්වල විදුහල්පති පුරප්පාඩු පහත පරිදි වේ.

| අනු අංකය | විදුහල්පති තනතුර අනුමත සේවය හා ශ්‍රේණිය | අනුමත පාසල් සංඛ්‍යාව | ස්ථිර විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව | විදුහල්පති තනතුර පුරප්පාඩු පාසල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I ශ්‍රේණිය | 5 | 3 | 2 |
| 02 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය II/III ශ්‍රේණිය | 6 | 3 | 3 |
| 03 | ශ්‍රී ලංකා විදුහල්පති සේවය I ශ්‍රේණිය | 31 | 24 | 7 |
| | එකතුව | 42 | 30 | 12 |

ඒ අනුව, අනුමත පාසල් 42ක් සඳහා ස්ථිර විදුහල්පතිවරු 30දෙනෙකු රාජකාරි කරන අතර, ස්ථිර විදුහල්පති තනතුරු 12ක්

සඳහා පුරප්පාඩු පවතී. නමුත්, එම පුරප්පාඩු පැවතියද, වැඩ බලන විදුහල්ති හෝ රාජකාරි ආවරණය කරන විදුහල්පතිවරයෙක් මඟින් එම පාසල්වල අධ්‍යාපන හා පරිපාලන කටයුතු කළමනාකරණය කර ගනු ලබන අතර, මෙම පුරප්පාඩු තනතුරු සඳහා අයදුම් පත් කැඳවා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතී.

(ii) අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළබඩ අධ්‍යාපන කලාප - සමන්තුරේ, කල්මුණේ, තිරුක්කෝවිල් හා අක්කරෙයිපත්තු යන කලාප - සැලකීමේදී කල්මුණේ අධ්‍යාපන කලාපය තුළ පිහිටි පළාත් පාසල්වල ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරී නිලධාරීන් 21කගේ අතිරික්තයක් පවතිනවා. මෙම වර්ෂයේ ස්ථාන මාරුවලට පෙර මෙම අතිරික්තය 35ක්ව පැවතුණා.

අදාළ ජාතික හා පළාත් පාසල්වල ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ කාර්ය මණ්ඩල තොරතුරු ඇමුණුම් 01, 02 සහ 03 මඟින් ඉදිරිපත් කර ඇත. එම ඇමුණුම් පහත දැක්වේ.

ඇමුණුම 01

**අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළබඩ කලාපවල පිහිටි ජාතික පාසල් හා පළාත් පාසල්හි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ කාර්ය මණ්ඩල තොරතුරු**

| කලාපය | ශ්‍රේණිය | 2026.06.30 දිනට ශ්‍රී.ලං.වි.සේ. අනුමත සංඛ්‍යාව | | | 2026.06.30 දිනට ශ්‍රී.ලං.වි.සේ. නියුක්ත සංඛ්‍යාව | | | 2026.06.30 දිනට ශ්‍රී.ලං.වි.සේ. අතිරික්තය/(ඌනතාව) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පළාත් | ජාතික | එකතුව | පළාත් | ජාතික | එකතුව | පළාත් | ජාතික | එකතුව |
| තිරුක්කෝවිල් | I | 6 | 2 | **08** | 0 | 1 | **1** | (-6) | (-1) | **(-7)** |
| | II/III | 54 | 6 | **60** | 30 | 4 | **34** | (-24) | (-2) | **(-26)** |
| | එකතුව | 60 | 8 | 68 | 30 | 5 | 35 | (-30) | (-3) | (33) |
| අක්කරෙයිපත්තු | I | 18 | 3 | **21** | 10 | 1 | **11** | (-8) | (-2) | **(-10)** |
| | II/III | 95 | 11 | **106** | 78 | 11 | **89** | (-17) | - | **(-17)** |
| | එකතුව | 113 | 14 | 127 | 88 | 12 | 100 | (-25) | (-2) | (-27) |
| කල්මුණේ | I | 18 | 1 | **19** | 19 | 7 | **26** | 1 | 6 | **7** |
| | II/III | 92 | 12 | **104** | 112 | 11 | **123** | 20 | (-1) | **19** |
| | එකතුව | 110 | 13 | 123 | 131 | 18 | 149 | 21 | 5 | 26 |
| සමන්තුරේ | I | 6 | 2 | **8** | 14 | 4 | **18** | 8 | 2 | **10** |
| | II/III | 86 | 8 | **94** | 71 | 6 | **77** | (-15) | (-2) | **(-17)** |
| | එකතුව | 92 | 10 | 102 | 85 | 10 | 95 | (-7) | 0 | (-7) |

ඇමුණුම - 02

**අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළබඩ කලාපවල පිහිටි ජාතික පාසල්හි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ කාර්ය මණ්ඩල තොරතුරු**

| කලාපය | ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | තත්‍ය තනතුරු සංඛ්‍යාව | අතිරික්තය/(ඌනතාව) |
|---|---|---|---|---|
| **තිරුක්කෝවිල්** | I | 2 | 1 | (-1) |
| | II/III | 6 | 4 | (-2) |
| | **එකතුව** | **8** | 5 | **(-3)** |
| **අක්කරෙයිපත්තු** | I | 3 | 1 | (-2) |
| | II/III | 11 | 11 | - |
| | **එකතුව** | **14** | **12** | **(-2)** |
| **කල්මුණේ** | I | 1 | 7 | 6 |
| | II/III | 12 | 11 | (-1) |
| | **එකතුව** | **13** | **18** | **5** |
| **සමන්තුරේ** | I | 2 | 4 | 2 |
| | II/III | 8 | 6 | (-2) |
| | **එකතුව** | **10** | **10** | **0** |

ඇමුණුම - 03

**අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළබඩ කලාපවල පිහිටි පළාත් පාසල්හි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ කාර්ය මණ්ඩල තොරතුරු**

| කලාපය | ශ්‍රේණිය | 2026.06.30 දිනට ශ්‍රී.ලං.වි.සේ. අනුමත සංඛ්‍යාව | | | 2026.06.30 දිනට ශ්‍රී.ලං.වි.සේ. නියුක්ත සංඛ්‍යාව | | | 2026.06.30 දිනට ශ්‍රී.ලං.වි.සේ. අතිරික්තය/(ඌනතාව) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිංහල | දෙමළ | එකතුව | සිංහල | දෙමළ | එකතුව | සිංහල | දෙමළ | එකතුව |
| තිරුක්කෝවිල් | I | 0 | 6 | 6 | 0 | 0 | 0 | 0 | (-6) | (-6) |
| | II | 0 | 11 | 11 | 0 | 6 | 6 | 0 | (-5) | (-5) |
| | III | 0 | 43 | 43 | 0 | 24 | 24 | 0 | (-19) | (-19) |
| | එකතුව | 0 | 60 | 60 | 0 | 30 | 30 | 0 | (-30) | (-30) |
| අක්කරෙයිපත්තු | I | 0 | 18 | 18 | 0 | 10 | 10 | 0 | (-8) | (-8) |
| | II | 0 | 27 | 27 | 0 | 14 | 14 | 0 | (-13) | (-13) |
| | III | 0 | 68 | 68 | 0 | 64 | 64 | 0 | (-4) | (-4) |
| | එකතුව | 0 | 113 | 113 | 0 | 88 | 88 | 0 | (-25) | (-25) |
| කල්මුණේ | I | 0 | 18 | 18 | 0 | 19 | 19 | 0 | 1 | 1 |
| | II | 0 | 32 | 32 | 0 | 38 | 38 | 0 | 6 | 6 |
| | III | 0 | 60 | 60 | 0 | 74 | 74 | 0 | 14 | 14 |
| | එකතුව | 0 | 110 | 110 | 0 | 131 | 131 | 0 | 21 | 21 |
| සමන්තුරේ | I | 0 | 6 | 6 | 0 | 14 | 14 | 0 | 8 | 8 |
| | II | 0 | 19 | 19 | 0 | 18 | 18 | 0 | (-1) | (-1) |
| | III | 0 | 67 | 67 | 0 | 53 | 53 | 0 | (-14) | (-14) |
| | එකතුව | 0 | 92 | 92 | 0 | 85 | 85 | 0 | (-7) | (-7) |

කල්මුනේ කලාපයේ අතිරික්ත විදුහල්පතිවරුන් එම කලාපය තුළ පත් කිරීම සඳහා පුරප්පාඩු සහිත පාසල් නොමැති බැවින්, පුරප්පාඩු පවතින ආසන්න කලාප වන අක්කරෙයිපත්තු සහ මඩකලපුව මධ්‍යම ඇතුළු කලාප කිහිපයක් සඳහා වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය යටතේ - 2026 - විදුහල්පතිවරු 14දෙනෙකු ස්ථාන මාරු කරන ලදී. එමෙන්ම, 2027 විදුහල්පති ස්ථාන මාරු යටතේ තවත් පිරිසක් ස්ථාන මාරු කිරීමට යෝජනා කර ඇත. නමුත්, මේ සඳහා පවතින බාධාව වන්නේ, මෙම අතිරික්ත විදුහල්පතිවරුන් බොහෝදෙනා වයස අවුරුදු 55 ඉක්මවූවන් මෙන්ම, රෝගාබාධවලින් පෙළෙන අය වීම හේතුවෙන් ඔවුන් අභියාචනා කර තිබීම හේතුවෙන් ඒ සමහර විදුහල්පතිවරුන්ගේ ස්ථාන මාරුවීම් ප්‍රතික්ෂේප කිරීමයි. මෙතැනදී නිශ්චිත කාර්ය පටිපාටිය සහ ආයතන සංග්‍රහය අනුව එම විදුහල්පතිවරුන්ට අදාළ විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ නිකුත් කර තිබෙනවා.

(ආ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථාව ප්‍රකාරව, එම සේවයේ නිලධාරීන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළු පරිපාලනමය කාර්යයන් සඳහාත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලත් පාසල්වල විදුහල්පති තනතුරේ රාජකාරි කිරීමටත් ප්‍රතිපාදන සැකසී තිබෙනවා.

(ii) අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ පාසල්වල සේවය කරන ලද නිලධාරීන් ප්‍රතිපත්ති සම්පාදනය හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවීමේදී එම නිලධාරීන් තම පාසල්වල විදුහල්පතිවරුන් ලෙස සේවය කර ලබා ගත් අත්දැකීම් භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, එවැනි අත්දැකීම් ඇති නිලධාරීන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සකස් කිරීම සඳහා නිදහස් කිරීමට කිසිදු බාධාවක් නොමැත.

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය හා ශ්‍රී ලංකා විදුහල්පති සේවය යනු, එකිනෙකට වෙනස් වූ සේවා ව්‍යවස්ථා දෙකක් මඟින් ක්‍රියාත්මක වන සේවා දෙකකි. එසේම, මෙම සේවාවල අනන්‍ය වූ සුවිශේෂිතා මත ඊට අනුරූපී වූ තනතුරු හා කාර්යයන් පවරා ඇති අතර, මේ වන විටත් ඒවා අනුමත වී ඇත. මෙම සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ඒ ඒ නිලධාරීන්ගේ රැකියා අවස්ථා/තනතුරු

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

නිර්මාණය කර ඇත. ඒ අනුව, එකිනෙකට වෙනස් වූ සේවා දෙකක් සම්බන්ධව සමාන පදනමක් මත සිට කටයුතු කිරීමට සේවා ව්‍යවස්ථා ප්‍රකාරව ප්‍රතිපාදන නොමැත.

(iv) ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා නවක නිලධාරීන් බඳවා ගැනීමේ සීමිත ලිඛිත තරග විභාගය 2026.06.07 දින පවත්වා ඇති අතර, එහි ප්‍රතිඵල නිකුත් වීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණ පවත්වා පවතින පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනමින් සිංහල හා දෙමළ මාධ්‍ය අනුව නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු සම්පාදනය කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே! என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

ஜனாப் எச்.எம். அனீஸ் என்பவர் கல்முனை கல்வி வலயத்திலுள்ள அல்-ஹிலால் வித்தியாலயத்துக்குப் புதிய அதிபராக நியமனம் செய்யப்பட்டுள்ளார். கிழக்கு மாகாணக் கல்வி அமைச்சால் முறையான நேர்முகத் தேர்வு நடாத்தப்பட்டு, அதிகூடிய புள்ளிகளைப் பெற்று, 2025.09.23ஆம் திகதி அதிபருக்கான நியமனக் கடிதத்தைப் பெற்றும், மத்திய கல்வி அமைச்சு அவரை மாகாணத்துக்கு விடுவித்திருந்தும், மாகாண பொதுச் சேவைகள் ஆணைக்குழு உள்வாங்கத் தயார்நிலையில் இருந்தும், கிழக்கு மாகாணக் கல்வி அமைச்சின் செயலாளர் தயார்நிலையில் இல்லாமல் இருப்பதற்கான காரணம் என்ன? கிழக்கு மாகாணக் கல்வி அமைச்சின் செயலாளர் குறித்த அதிபரின் விடயத்தைச் சாதகமாகப் பரிசீலனை செய்ய முடியாதென ஆறு மாதங்கள் கடந்த நிலையில் பதில் கடிதம் அனுப்பியுள்ளார். இதனால் நேர்முகப் பரீட்சையும் நியமனக் கடிதமும் அர்த்தமற்றதாகி யுள்ளது. எனவே, இவ்விடயத்திலுள்ள குறைபாடுகள் நிவர்த்தி செய்யப்படுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, පත් කිරීමකදී පත්වීම් බලධාරියා වන්නේ පළාත්බද නම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මධ්‍යම ආණ්ඩුව නම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. මේ පත් කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදය අනුගමනය කර, නිශ්චිතව විමර්ශනයක් කරලා, සමාලෝචනය කර තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් මැදිහත් වන්න අපි සූදානම් කියන පණිවුඩය ගරු මන්ත්‍රීතුමාට ලබා දෙනවා.

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கல்முனை கல்வி வலயத்தில் சில தேசிய பாடசாலைகளில் அதிபர்களாகப் பதவி வகித்தவர்களின் நிதி முறைகேடுகள் தொடர்பில் மாகாண கல்வித் திணைக்கள விசாரணைகள், தேசிய கணக்காய்வு அறிக்கைகள் என்பன தெளிவான ஆதாரங்களை வெளிக்கொணர்ந்தன. இருப்பினும், மேற்கொண்டு நடவடிக்கைகள் எடுக்கப்படாமல் இருக்கின்றன. இத்தகைய செயற்பாடுகள் கல்விச் செயற்பாடுகளில் பின்னடைவை ஏற்படுத்தக்கூடுமெனக் கருதப்படுகின்ற இந்தச் சந்தர்ப்பத்தில், பாடசாலைகளில் இடம்பெறும் ஊழல், மோசடிகள் தொடர்பில் காத்திரமான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா? எனக் கேட்கின்றேன். மேலும், கிழக்கு மாகாணப் பாடசாலைகளில் கல்விசாரா ஊழியர்களின் பற்றாக்குறை நிலவுகின்றது. குறிப்பாக, காவலாளிகள், அலுவலக உதவியாளர்களின் பற்றாக்குறை மிக நீண்டகாலமாக நிலவி வருகின்றது. இது தொடர்பில் எதிர்காலத்தில் நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ දෙවන අතුරු ප්‍රශ්නයේ දෙවන කොටසට පිළිතුර මෙයයි. අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් දැන් සිද්ධ වනවා. ලංකාව පුරාම තිබෙන පාසල්වලට අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. නගරබද පාසල්වල වුණත් අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ඉටු කරනු ලබන සේවා 37ක් පමණ තිබෙනවා. ඒවායේ අඩුපාඩු තිබෙනවා. බඳවා ගැනීම් ක්‍රියාවලිය සිද්ධ වනවා. අපි හිතන විධියට, මේ අවුරුද්ද ඇතුළත යම්කිසි සැලකිය යුතු පිරිසක් ඒ සඳහා බඳවා ගැනීමට සහ ස්ථානගත කිරීමට හැකියාව තිබෙනවා.

අනෙක් කාරණය, විමර්ශන ක්‍රියාවලියයි. එක් දිනකදී බොහෝ විමර්ශන එනවා, අමාත්‍යාංශයට සහ අනෙකුත් පළාත්බද ආයතනයන්ට. විමර්ශන සම්බන්ධයෙන් පොදුවේ ගත්තොත්, නිලධාරීන් සංඛ්‍යාවේ සහ ඒ ක්‍රියාවලියේ යම්කිසි ප්‍රමාදවීමක් අපි දකිනවා. නමුත් ඔබතුමාට පුළුවන්, මේ ක්‍රියාවලි සම්බන්ධව හඳුනා ගත් අඩුපාඩු නිශ්චිතව අපට යොමු කරන්න. පොදු විමර්ශන ක්‍රියාවලිය ඉක්මන් කරවීමේ කටයුත්තකුත් සිද්ධ වනවා. මේ නිශ්චිත කාරණා තනි තනි කාරණා ලෙස ඉදිරිපත් කළොත් අපි ඉතාම ඉක්මනින් ඒ සඳහා මැදිහත් වෙලා විමර්ශන කටයුතු කරලා ඉක්මන් තීන්දු ලබා දෙන්න බලාපොරොත්තු වනවා.

## ආබාධ සහිත පුද්ගලයින් සඳහා ආනයනය කරන ආධාරක උපකරණ: බදු නිදහස් කිරීම්
## மாற்றுத்திறனாளிகளுக்காக இறக்குமதி செய்யப்படும் உதவி உபகரணங்கள்: வரிச் சலுகை
## ASSISTIVE DEVICES IMPORTED FOR PERSONS WITH DISABILITIES: TAX EXEMPTIONS

1980/2026

**6. ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආබාධිත තැනැත්තන් භාවිතයට ගන්නා 'ආධාරක උපකරණ' ආනයන බද්දෙන් නිදහස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, නිදහස් කර ඇති ප්‍රතිශතය කවරේද;

(iii) නිදහස් කොට ඇති බදු වර්ග සහ උපකරණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පෞද්ගලික පරිහරණය සඳහා ආබාධිතභාවයට ගැළපෙන පරිදි නිෂ්පාදනය කර ඇති රථ වාහන ආනයනය කිරීමේදී බදු සහන ලබා දීමට හැකියාව තිබේද;

(ii) එසේ නම්, බදු සහන ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් පවතින නීතිමය පසුබිම සහ චක්‍රලේඛ කවරේද;

(iv) පවතින චක්‍රලේඛ සහ නීති රාමුව තුළ ආධාරක උපකරණ හෝ රථ වාහන ආනයනයේදී බාධා පවතින්නේ නම්, එම නීති සංශෝධනය කිරීමට පියවර ගන්නේද;

(v) ආබාධිත තැනැත්තන්ට පෞද්ගලිකව හෝ ඔවුන්ගේ සංවිධානවලට විදේශීය පරිත්‍යාග ලෙස ලැබෙන ආධාරක උපකරණ සහ යෝග්‍ය රථ වාහන ආනයන බද්දෙන් නිදහස් කර තිබේද;

(vi) පරිත්‍යාග ලෙස ලැබෙන භාවිත කරන ලද උපකරණ හා රථ වාහන සඳහා බදු සහනයක් ලබා දීමේ හැකියාවක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாற்றுத்திறனாளிகள் பயன்படுத்தும் உதவி உபகரணங்களுக்கு இறக்குமதி வரியிலிருந்து விலக்களிப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், விலக்களிக்கப்பட்டுள்ள சதவீதம் யாது என்பதையும்;

(iii) விலக்களிக்கப்பட்டுள்ள வரி வகைகள் மற்றும் உபகரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தனிப்பட்ட பாவனைக்காக மாற்றுத்திறனுக்கு உகந்த வகையில் உற்பத்தி செய்யப்பட்டுள்ள வாகனங்களை இறக்குமதி செய்யும்போது வரிச் சலுகை வழங்குவதற்கான இயலுமை காணப்படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், வரிச் சலுகையைப் பெற்றுக்கொள்ள பின்பற்றவேண்டிய நடைமுறைகள் யாவை என்பதையும்;

(iii) அது தொடர்பான சட்டப் பின்னணி மற்றும் சுற்றுநிருபங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி உதவி உபகரணங்களை அல்லது வாகனங்களை இறக்குமதி செய்யும் விடயம் தொடர்பில் நடைமுறையிலுள்ள சுற்றுநிருபங்கள் மற்றும் சட்டங்களில் யாதேனும் தடைகள் காணப்படுமாயின், அச்சட்டங்களை திருத்து வதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(v) மாற்றுத்திறனாளிகளுக்கு தனிப்பட்ட ரீதியில் கிடைக்கப்பெறும் அல்லது அவர்களின் அமைப்புகளுக்கு வெளிநாடுகளிலிருந்து நன்கொடையாக கிடைக்கப்பெறும் உதவி உபகரணங்களுக்கும் ஏனைய பொருத்தமான வாகனங்களுக்கும் இறக்குமதி வரியிலிருந்து விலக்களிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(vi) நன்கொடையாக கிடைக்கப்பெறும் பயன் படுத்தப்பட்ட உபகரணங்கள் மற்றும் வாகனங் களுக்கு வரிச் சலுகை வழங்குவதற்கான இயலுமை காணப்படுகின்றதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) whether action has been taken to exempt assistive devices used by persons with disabilities from import tariffs;

(ii) if so, the percentage of such exemptions; and

(iii) the types of tariff exemptions that have been given and the types of equipment that have been exempted from such tariffs?

(b) Will he also inform this House -

(i) whether it is possible to provide tax relief when importing adapted vehicles for personal use by persons with disabilities;

(ii) if so, the procedures that have to be followed in obtaining such tax relief;

(iii) the existing legal framework relating to that and details of the circulars in effect in that respect;

(iv) if there are obstacles in importing assistive devices or adapted vehicles within the provisions of the existing circulars and legal framework, whether steps will be taken to amend such laws;

(v) whether assistive devices and adapted vehicles that are personally received by persons with disabilities or organizations of such persons as donations from foreign countries have been exempted from import tariffs; and

(vi) whether there is any possibility of providing some tax relief for used equipment and vehicles that are received as donations?

(c) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)

(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා ]

(අ) (i) ඔව්, තීරු බදුවලින් නිදහස් කර ඇත.

(ii) තීරු බද්දෙන් සම්පූර්ණයෙන්ම නිදහස්ය.

(iii) තීරු බද්දෙන් නිදහස් කර ඇති භාණ්ඩ පිළිබඳ ලේඛනයක් ඇමුණුම මඟින් දක්වා ඇත. එහි ප්‍රධාන වශයෙන් සංයෝජිත කේත 87.13 කියන කාණ්ඩය යටතේ යාන්ත්‍රිකව ක්‍රියා කරන උපකරණත්, යාන්ත්‍රිකව ක්‍රියා නොකරන අනෙකුත් උපකරණත් කාණ්ඩ ගණනාවක් යටතේ නිදහස් කිරීමට කටයුතු කර තිබෙනවා. ඒ තොරතුරු ඇතුළත් ලේඛනය ඇමුණුම වශයෙන් මම **සභාගත*** කරනවා.

(ආ) (i) ඉහත සඳහන් ආකාරයේ රථ වාහන ආනයනය කිරීමේදී බදු සහන ලබා දීම සඳහා මේ වනවිට යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මකව නොමැත.

(ii) බදු සහන ලබා දීමට යෝජනා ක්‍රමයක් නොමැති බැවින් නිශ්චිත ක්‍රමවේදයක් සඳහන් කළ නොහැක.

(iii) දැනට චක්‍රලේඛ නොමැත.

(iv) ආධාරක උපකරණ සඳහා තීරු බදු නිදහස් වන අතර එවැනි භාණ්ඩ ආනයනයට වෙනත් බාධා පවතින බව නිරීක්ෂණය වී නොමැත. එහෙත් වාහන සඳහා බදු සහන ලබා දීමේ යෝජනා ක්‍රමයක් සකස් කර නොමැති බැවින් ආනයනය කරනු ලබන වාහන සඳහා අදාළ වන සියලු බදු ගෙවීමට ආනයනකරුවන් බැඳී සිටී. එමෙන්ම පැරණි වාහන, වමෙන් ධාවනය වන වාහන ආදිය ආනයනය කිරීමේදී ආනයන හා අපනයන පාලන නීති ක්‍රියාත්මක වන අතර, එම නීති ලිහිල් කිරීමට, වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීමට දැනට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොමැත.

(v) ආධාරක උපකරණ තීරු බද්දෙන් නිදහස් කර ඇතත්, වාහන සඳහා එවැනි සහනයක් ක්‍රියාත්මක නොවේ.

(vi) ආධාරක උපකරණ සඳහා තීරු බදු නිදහස් වන අතර, වාහන සඳහා බදු සහන ලබා දීමට යෝජනා ක්‍රමයක් සකස්ව නොමැත.

(ඇ) පැන නොනඟී.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

පිළිතුරු ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නා කාරණාවක් තමයි මේ ආධාරක උපකරණ සහ ආබාධ සහිත ප්‍රජාව තමන්ගේ ආබාධිත බව අවම කර ගන්න පාවිච්චි කරන සහායක උපකරණ දේශීය වශයෙන් නිෂ්පාදනය වෙන්නේ නැහැ කියන එක. රජය විධියට යම් උත්සාහයක් දරනවා, මේ උපකරණ - විශේෂයෙන් රෝද පුටු වාගේ දේවල් - නිෂ්පාදනය කරන්න. නමුත් දැනට තිබෙන සන්දර්භය තුළ මේවා අනිවාර්යයෙන් ආනයනය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. සම්පූර්ණ උපකරණය විධියට - රෝද පුටුවක් වේවා, වෙනත් උපකරණයක් වේවා - ආනයනය කරනවාට අමතරව මේ උපකරණවලට අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය, අමතර කොටස් තිබෙනවා. විශේෂයෙන් විදුලියෙන් ක්‍රියාත්මක වන උපකරණවලට බැටරි අවශ්‍ය වෙනවා. මේ භාණ්ඩවලට විතරක් නොවෙයි, වෙනත් භාණ්ඩවලටත් මේ බැටරි පාවිච්චි කරනවා. නමුත් මේ අමතර කොටස් ආනයනය කිරීමේදී සාමාන්‍ය ක්‍රමවේදයම භාවිත වන නිසා ආබාධ සහිත ප්‍රජාව දුෂ්කරතාවට පත් වනවා. මේ සම්බන්ධ අමතර කොටස් වාගේ දේවල් ආනයනය කිරීමේදී යම්කිසි සහනශීලී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලා මම දැනගන්න කැමතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, දැනට තිබෙන තත්ත්වය අනුව විශේෂයෙන්ම ආබාධ සහිත පුද්ගලයන් සඳහා වාහන කියන කාණ්ඩයේදී මෝටර් සහිතව හෝ රහිතව ගෙන්වනු ලබන රෝද තුනේ කාණ්ඩයට තිබෙන උපකරණවලට තීරු බදු නිදහස තිබෙනවා. ඒ කියන්නේ, 8713.10 සහ 8713.90 කියන කාණ්ඩ දෙක යටතේදී ඒ සඳහා ඉඩකඩ තිබෙනවා. ඒවාට තීරු බද්දක් නැහැ; VAT සහ SSCL නැහැ; PAL එක සියයට 10ක් වදිනවා. ඊට අමතරව උපකරණ සම්බන්ධයෙන් ගත්තොත්, ඒවා කිසිදු බද්දකට යටත් වෙන්නේ නැහැ. සුදු සැරයටි, බ්‍රේල් උපකරණ, කෘත්‍රිම පාදවලට යොදා ගන්නා ජොයින්ට්ස් සහ ශ්‍රවණ ආධාරක වාගේ උපකරණ කාණ්ඩයට කිසිදු බද්දක් පැනවෙන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමා, අමතර කොටස් සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලුව මෙකයි. ආබාධ සහිත තැනැත්තන් භාවිත කරන ත්‍රිරෝද රථ සහ පොදුවේ භාවිත කරන ත්‍රිරෝද රථවල අමතර කොටස්වල වෙනස්කම් හඳුනා ගන්න බැහැ. ඒවා එකම ආකාරයෙන් තිබෙන්නේ. ඒ නිසා දැනට අපිට අධ්‍යයනය කරලා බලන්න සිද්ධ වනවා, විශේෂයෙන්ම ආබාධ සහිත පුද්ගලයන් භාවිත කරන ත්‍රිරෝද රථවල අමතර කොටස්වලට සහනයක් ලබා දීම හෝ එවැනි කණ්ඩායමකට ඉලක්කගත සහනාධාරයක් හෝ ලබා දීමේ ක්‍රමවේදයක් පිළිබඳව. දැනට ඒ අමතර කොටස්වලට ඒ සහනය හෝ බදු නිදහස් කිරීම සිදු කරන්න බැහැ, මේ තිබෙන සංකීර්ණතාව නිසා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

පිළිතුරු ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා, ඒ වාගේ සහනයක් ලැබෙයි කියලා. මොකද, ඒ උපකරණ අපේ ජීවිතය සාමාන්‍ය තත්ත්වයෙන් පවත්වා ගෙන යාමට අත්‍යවශ්‍යයි.

දෙවන අතුරු ප්‍රශ්නය විධියට මම ඔබතුමාගෙන් මේ කාරණය පිළිබඳව දැනගන්න සතුටුයි. මේ HS code ක්‍රමය යටතේ භාණ්ඩ නම් කිරීමේදී සහ හඳුනා ගැනීමේදී විශේෂ ගැටලුවක් තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, සාමාන්‍යයෙන් පාපැදි කියන කාණ්ඩයටම තමයි රෝද පුටුත් අන්තර්ගත වෙන්නේ. ඔබතුමා කියන විධියට බ්‍රේල් යතුරු ලියන තීරු බද්දෙන් නිදහස් වුණාට ඵලකයක් - slate එකක් - බඳුව තිබෙන බ්‍රේල් අතින් ලිවීමේ උපකරණ වැටෙන්නේ board කියන HS code ගණයටයි. දැන් මෙකත් එක්ක විශාල පටලැවිල්ලක් වෙලා තිබෙනවා, විශේෂයෙන්ම ආබාධ සහිත ප්‍රජාව පාවිච්චි කරන සහ සාමාන්‍ය ජනතාව පාවිච්චි කරන උපකරණ එක HS code ක්‍රමයක් යටතේ තිබෙන නිසා. ඒ නිසා අපිට බැරිද, දේශීය විධියට මේ හඳුනා ගැනීම් කරලා සාකච්ඡාමය වැඩ පිළිවෙළක් ඔස්සේ මේ HS code ක්‍රමය වෙනස් කර ගැනීමට? එහෙම කළොත් මම හිතන විධියට

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සහන ලබා දීමේදී පහසුවක් ඇති වෙනවා, ශ්‍රී ලංකා රේගුවටත් බදු අය කර ගැනීමේදී. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාගෙන් අහන්නේ මේ විශේෂිත උපකරණවලට දේශීය වශයෙන් HS code ක්‍රමයක් හඳුනා ගැනීමේ ක්‍රියාදාමයක් ආරම්භ කරන්න පුළුවන්ද කියන කාරණාවයි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මෙතැනදී ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පාපැදි - bicycles - සම්බන්ධයෙන් කලින් වෙනම HS code එකක් තිබුණාද දන්නේ නැහැ. නමුත් මේ වනවිට ඒ අදාළ ක්‍රියාවලිය ඇතුළේ පාපැදි සඳහා වෙනමම HS code එකක් තමයි ක්‍රියාත්මක වෙන්නේ, 87.1200 වශයෙන්. එය සාමාන්‍ය තීරු බදුවලට යටත් වෙනවා. ඒක වෙන් කර තිබෙනවා. ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් තිබෙන වාහන ටික වෙනම කාණ්ඩයක් යටතේ එන්නේ.

ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට බ්‍රේල් සහ අනෙකුත් උපකරණ සම්බන්ධයෙන් සංකේත අංකයක් තිබෙනවාද කියන එක විමසා බලන්න වෙනවා. මොකද, අපි ක්‍රමයෙන් උත්සාහ කරනවා, HS codes උපකාණ්ඩවලට වෙන් කරමින් ක්‍රමයෙන් ජාත්‍යන්තර මට්ටමේ තීරු බදු ප්‍රමිතිවලට අනුකූලව අය කිරීමේ ක්‍රියාවලිය ගෙන එන්න. අපිට ආබාධිත ප්‍රජාව ඉතාම වැදගත් වෙනවා. ඔවුන්ට ලබා දෙන්න පුළුවන් සහන අපි උපරිමයෙන් ලබා දෙනවා. නමුත් ආනයනය කියන කාරණයේදී පොදු වර්ගීකරණයට වැටෙන තැනදී බදු සහන පොදුවේ දෙන්න බැරි වෙනවා. මොකද, එය සමහර විට අවභාවිත වෙන්න පුළුවන්, වෙනත් වාහන සහ වෙනත් උපකරණවලට අය නොවෙන එක වළක්වා ගැනීමේ ක්‍රමවේදයක් නැති නිසා. ඒ නිසා එක පැත්තකින් අපිට හැකි උපරිමයෙන් තීරු බදු සහ අනෙකුත් බදු සහන ලබා දෙන්න උත්සාහ කරන ගමන්ම, මෙවැනි ආබාධ සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් ඉලක්කගත සහන ලබා දීමේ ක්‍රමවේද සම්බන්ධව මේ වනවිටත් අපි සාකච්ඡා කරමින් පවතිනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -2061/2026- (1), ගරු ජේ.සී. අලවතුවල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ අවුරුදු 18 ට අඩු දරුවන්: පුනරුත්ථාපනය

### போதைப்பொருளுக்கு அடிமையான 18 வயதுக்குட்பட்ட சிறுவர்கள்: புனர்வாழ்வளிப்பு

### DRUG-ADDICTED CHILDREN UNDER 18 YEARS: REHABILITATION

2093/2026

**8. ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2025 වර්ෂයේ සිට මේ දක්වා මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ පොලිස් භාරයේ සිටින වයස අවුරුදු 18ට අඩු ළමයින් සංඛ්‍යාව කොපමණද;

(ii) මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ ළමයින් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iv) මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ ළමයින් පුනරුත්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(v) එම ආයතනවල නම් කවරේද;

(vi) මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ ළමයින් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, පුනරුත්ථාපන ආයතන වෙත යොමු කරන තෙක් දිගු කාලයක් ළමා රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා තබන බව දන්නේද;

(vii) එසේ නම්, ඔවුන් කඩිනමින් පුනරුත්ථාපනය කිරීම සඳහා යොමු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025ஆம் ஆண்டிலிருந்து இதுவரை கொழும்பு மாவட்டத்தில் போதைப்பொருள் பாவனை தொடர்பாகப் பொலிஸ் காவலிலுள்ள 18 வயதுக்குக் குறைவான சிறுவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) போதைப்பொருள் பாவனைக்கு அடிமையா கியுள்ள சிறுவர்களுக்குப் புனர்வாழ்வளிக்கும் செயன்முறையொன்று காணப்படுகின்றதா என்பதையும்;

(iii) ஆமெனில், அந்தச் செயன்முறை யாது என்பதையும்;

(iv) போதைப்பொருள் பாவனைக்குப் பழகியுள்ள சிறுவர்களுக்குப் புனர்வாழ்வளிப்பதற்காக நாட்டில் காணப்படும் நிறுவனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) அந்த நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(vi) போதைப்பொருள் பாவனைக்குப் பழகியுள்ள சிறுவர்களை நீதிமன்றங்களில் முன்னிலைப் படுத்திய பின்னர், புனர்வாழ்வு நிறுவனங் களுக்கு அனுப்பப்படும் வரை நீண்ட காலமாக சிறுவர் தடுப்பு நிலையங்களில் தடுத்து வைக்கப்படுகின்றமையை அறிவாரா என்பதை யும்;

(vii) ஆமெனில், அவர்களைத் துரிதமாக புனர் வாழ்வுச் செயற்பாடுகளுக்கு அனுப்புவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he state -

(i) the number of children under the age of 18 years who are in police custody in the Colombo District since 2025 for drug use;

[ගරු දේවානන්ද සුරවීර මහතා]

(ii) whether there is a methodology for rehabilitating children who are addicted to drugs;

(iii) if so, that methodology;

(iv) the number of institutions available in Sri Lanka for the rehabilitation of children who are addicted to drugs;

(v) the names of those institutions;

(vi) whether he is aware that children who are addicted to drugs are detained in child detention centres for a long period of time after being produced before court until they are referred to rehabilitation centres; and

(vii) if so, the measures that will be taken to ensure prompt rehabilitation of such children?

(b) If not, why?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) නොමැත.

(ii) ඔව්.

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතෙහි 02 වන වගන්තිය අනුව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිර්දේශ මත යම් ස්ථානයක්, ගොඩනැඟිල්ලක් හෝ ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් රැකබලා ගැනීමට හා පුනරුත්ථාපනය සඳහා වූ මධ්‍යස්ථාන වශයෙන් නම් කිරීමට අමාත්‍යවරයාට බලය පැවරී තිබේ. දැනට බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ ඇති පල්ලේකැලේ, වටරැක, තල්දෙන, වීරවිල, අනුරාධපුර, පල්ලන්සේන, කන්දවත්ත හා මීතිරිගල යන ස්ථාන අටක නාමෝද්දිෂ්ට ප්‍රතිකාර මධ්‍යස්ථාන ගැසට් කර ඇත.

(iii) • 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතෙහි 9(1) වගන්තියේ නෛතික ප්‍රතිපාදනවලට අනුව අන්තරායදායක ඖෂධවලට ඇබ්බැහි වීම සම්බන්ධයෙන් ප්‍රතිකාර ලැබීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන තැනැත්තෙකුට ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කළ හැකිය.

බාල වයස්කරුවන් පුනරුත්ථාපනය හා ප්‍රතිකාර මධ්‍යස්ථානවලට යොමු කිරීමේදී දෙමාපියන් හෝ භාරකරු විසින් ඒ සඳහා ඉල්ලීමක් කළ යුතුය.

මේ සම්බන්ධව සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම අනුයුක්ත අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සංවර්ධන නිලධාරියෙකු ස්ථානගතව ඇති අතර, ඔහු හා සම්බන්ධ වී පුනරුත්ථාපනයට යොමු විය හැකිය.

• පනතේ 10(1), (2), (3), (4) වගන්තීන්හි නෛතික ප්‍රතිපාදන අනුව ප්‍රතිකාර මධ්‍යස්ථානයකට අනිවාර්යයෙන් ඇතුළත් කිරීමේදී ගත යුතු ක්‍රියාමාර්ග පහත පරිදිය.

යම් තැනැත්තෙක් අන්තරායදායක ඖෂධ පුරුද්දක් වශයෙන් පාවිච්චි කරන්නෙකු බව හා එයට ඇබ්බැහි වූවකු බව පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධාරියෙකුට තොරතුරු ලැබුණු අවස්ථාවක රජයේ වෛද්‍ය නිලධාරියෙකු ලවා ඒ තැනැත්තා පරීක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

රජයේ වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව අනුව ඔහු විසින් පරීක්ෂා කරනු ලැබූ තැනැත්තා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තැනැත්තෙක් නම්, පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරියා විසින් එම තැනැත්තා මහෙස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කර ඔහුගේ නියෝගය අනුව අදාළ මධ්‍යස්ථානයට ඇතුළත් කළ හැකිය.

• 2022 අංක 41 දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතේ 86 සහ 87 වගන්ති මඟින්ද පුනරුත්ථාපනයට යොමු කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන දක්වා ඇති අතර, ඇබ්බැහි වීමේ ප්‍රමාණය සැලකිල්ලට ගෙන තීරණය කරන යම් කාලසීමාවකට අධිකරණය විසින් ඒ තැනැත්තා ප්‍රතිකාර මධ්‍යස්ථානයකට භාර දිය හැකිය.

(iv) මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ ළමයින් පුනරුත්ථාපනය සඳහාම වූ මධ්‍යස්ථාන තුනක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

එම මධ්‍යස්ථාන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන අතර, ඒවා පහත පරිදි වේ.

| අනු අංකය | පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ නම හා පිහිටි ස්ථානය | පුනරුත්ථාපනයට යොමු කළ හැකි සංඛ්‍යාව | වර්තමානයේ සිටින සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | මධ්‍යම පළාත් නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, හන්දෙස්ස, මහනුවර (මාස 03කි) | 25 | 25 |
| 02 | බස්නාහිර පළාත් කාන්තා නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, තලංගම (මාස 03කි) | 25 | 03 |
| 03 | නාමෝද්දිෂ්ට මධ්‍යස්ථානයක් වන වටරැක බන්ධනාගාරය, වටරැක | පුනරුත්ථාපනය කළ සංඛ්‍යාව (2026.01.01 සිට 2026.07.10 දක්වා) 1,459 | |

ගරු කථානායකතුමනි, මම කලින් කිව්වේ නාමෝද්දිෂ්ට ප්‍රතිකාර මධ්‍යස්ථානවල ස්වභාවය. පල්ලෙකැලේ, වටරැක, තල්දෙන, වීරවිල, අනුරාධපුර, පල්ලන්සේන, කන්දවත්ත, මීතිරිගල යන ස්ථාන 8ක ඒ පුනරුත්ථාපන මධ්‍යස්ථාන තිබෙනවා.

(v) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ වන,

* මධ්‍යම පළාත් නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, හන්දෙස්ස, මහනුවර.

මෙහි වයස අවුරුදු 21ට අඩු පිරිමි දරුවන් පුනරුත්ථාපනය කරනු ලබයි.

විශේෂයෙන්ම බාලවයස්කාර දරුවන් වෙනුවෙන් තමයි අපි ඒ මධ්‍යස්ථානය පවත්වාගෙන යන්නේ, ගරු කථානායකතුමනි. වයස අවුරුදු 21ට අඩු පිරිමි දරුවන් තමයි පුනරුත්ථාපනය කරන්නේ.

* බස්නාහිර පළාත් කාන්තා නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, තලංගම.

ඒක මේ පාර්ලිමේන්තුව ආසන්නයේ තිබෙන්නේ. එහි වයස අවුරුදු 21ට අඩු ගැහැනු දරුවන් සහ කාන්තාවන් පමණක් පුනරුත්ථාපනය කරනු ලබනවා.

* නාමෝද්දිෂ්ට මධ්‍යස්ථානයක් වන වටරැක බන්ධනාගාරය, වටරැක.

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත යටතේ ස්ථාපිත කර ඇති නාමෝද්දිෂ්ට ප්‍රතිකාර මධ්‍යස්ථාන අතරින් ළමුන් සඳහා වටරැක බන්ධනාගාරය පමණක් ක්‍රියාත්මක වන අතර, එහි මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ ළමුන් පමණක් නොව සෙසු වැරදි සඳහා යොමු කළ ළමුන්ද ප්‍රතිකාර ලබයි.

(vi) ඔව්.

පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට අවස්ථාව ලැබෙන තුරු පරිවාස නිලධාරින් මඟින් පරිවාස භාරයේ රඳවා තබා ගැනීම සිදු කරනවා, ගරු කථානායකතුමනි.

(vii) පුනරුත්ථාපන කටයුතු සඳහා යම්කිසි නිශ්චිත කාල සීමාවකට යටත්ව යොමු කරනු ලබන අතර එම කාර්යය අවසන් වනතුරු වෙනත් පිරිසක් යොමු කිරීමට හැකියාවක් නොමැති බැවින්, කෙටි කාලීන විසඳුමක් ලෙස පවතින මධ්‍යස්ථානවල ඇති ඉඩකඩ පුළුල් කිරීමද, දීර්ඝ කාලීන විසඳුමක් ලෙස නව මධ්‍යස්ථාන ගොඩනැඟීමද හඳුනාගෙන ඇත.

- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ වන මධ්‍යම පළාත් නිවාරණ මධ්‍යස්ථානයේ ධාරිතාව තුන් ගුණයකින් පුළුල් කිරීම සඳහා තෙමහල් ගොඩනැඟිල්ලක් ඉදි කරමින් පවතින අතර එහි ඉදි කිරීම් කටයුතු අවසන් අදියරේ පවතී. මීට අමතරව, ළමුන් සඳහා මධ්‍යස්ථාන කිහිපයක් කඩිනමින් ආරම්භ කිරීමට පියවර ගනු ලැබේ.
- වයස අවුරුදු 21 අඩු ගැහැනු දරුවන් සඳහා තලංගම ප්‍රතිකාර මධ්‍යස්ථානය පූර්ණ වශයෙන් කාන්තා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් බවට පත් කර තිබෙනවා, ගරු කථානායකතුමනි.

(ආ) පැන නොනඟී.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එක කාරණයක් සඳහන් කරන්න ඕනෑ. කොළඹ, දෙහිවල සුමන විද්‍යාලයේ පුනරුත්ථාපන මධ්‍යස්ථානය පිළිබඳව ඔබතුමාගේ පිළිතුර තුළ සඳහන් වුණේ නැහැ. කොහොම නමුත්, මගේ පළමු අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැනට අධිකරණය හරහා සිදු කරනු ලබන මේ පුනරුත්ථාපන ක්‍රියාවලිය ඉතාම සංකීර්ණ එකක් වෙලා තිබෙනවා. ඒක අපි කවුරුත් දන්නා කාරණාවක්. මේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ඔබතුමන්ලා අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මෙම පුනරුත්ථාපන ක්‍රියාවලිය සංකීර්ණයි කියලා ගරු මන්ත්‍රීතුමා අහන්නේ, ගරු අධිකරණයන් හරහා පුනරුත්ථාපනයට යොමු කිරීම් ගැන. ගරු කථානායකතුමනි, මෙහි අංශ දෙකක් තිබෙනවා, ස්වේච්ඡා පුනරුත්ථාපනය සහ අනිවාර්ය පුනරුත්ථාපනය යනුවෙන්. අනිවාර්ය පුනරුත්ථාපනය ගරු අධිකරණයන් හරහා යන්නේ. එතකොට වෛද්‍ය වාර්තා අරගෙන ඊට අදාළ මැදිහත්වීමක් කරන්න ඕනෑ. හැබැයි, ගරු කථානායකතුමනි, පොලිස් ස්ථානවලින් අපට කියනවා, මේක සංකීර්ණ ක්‍රියාවලියක්, අත්‍යවශ්‍ය කෙනෙක්වත් පුනරුත්ථාපනයට යවා ගන්න බැහැ කියලා. ඒක නිසා තමයි ගරු අධිකරණ අමාත්‍යතුමාගේ අවධානය යොමු කරලා ඒ පුනරුත්ථාපන ක්‍රියාවලියට අදාළව මේ නීති සංශෝධනය කරන්න බලාපොරොත්තු වෙන්නේ. නොබෝ දිනකින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරාවි. ඒ අනුව ඒ සංශෝධන කටයුත්ත සිද්ධ වෙනවා, ගරු මන්ත්‍රීතුමා. හැබැයි, දැන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හරහා ස්වේච්ඡා පුනරුත්ථාපනය වේගයෙන් ක්‍රියාත්මක වෙනවා.

ගරු කථානායකතුමනි, පසුගිය අය වැයෙන් සඳහන් කළ පරිදි, සෑම දිස්ත්‍රික්කයකම ස්වේච්ඡා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් විවෘත කරන්න කියලා අපි දිස්ත්‍රික්කවලට ඒ අදාළ දැනුම් දීම කරලා තිබෙනවා. ඒ අනුව අම්පාර, මඩකලපුව, කොළඹ දිස්ත්‍රික්කය ඇතුළු දිස්ත්‍රික්ක කිහිපයක මේ වනකොට පුනරුත්ථාපන මධ්‍යස්ථාන ආරම්භ කර තිබෙනවා. ඒ අනුව දැන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මැදිහත් වෙලා අධ්‍යාපන වැඩසටහන්වලින් වාගේම මේ පුනරුත්ථාපන ක්‍රියාවලියට අදාළව සෑහෙන ශක්තිමත් වෙලා තිබෙනවා. දැන් දිස්ත්‍රික්ක ඇතුළේ ඒ ක්‍රියාවලිය සිද්ධ වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සමාජය තුළ දැවැන්ත කථිකාවක් තිබෙනවා කියලා අපට දැනෙනවා, සමහර පොලිස් නිලධාරින් චේතනාන්විතවම, ඒ කියන්නේ පළිගැනීමේ චේතනාවෙන්ම ඇත්තටම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි නොවූවන් අත්අඩංගුවට අරගෙන, ඒ අයට මත්ද්‍රව්‍ය සම්බන්ධ කරලා විවිධ ආකාරයේ නඩු දමන ක්‍රියාවලියක් තිබෙනවා කියලා. ඒ වාගේම, පුනරුත්ථාපන ක්‍රියාවලියට සම්බන්ධ වුණු සමහර පුද්ගලයන් පුනරුත්ථාපනය වෙලා ආවාට පසුවත් ඒ අදාළ ආයතනවලින් විමසීමක් කරන්නේ නැතිව ඒ අය සම්බන්ධයෙනුත් ඒ ක්‍රියාවලියම සිද්ධ කරනවා.

[ගරු දේවානන්ද සුරවීර මහතා]

පොදුවේ ගත්තාම, ග්‍රාමීය මට්ටමේ මත්ද්‍රව්‍ය බෙදා හරින්නන් සම්බන්ධයෙන් පොලීසිය මට්ටමින් ඇල් මැරුණු ස්වභාවයකින් කටයුතු කරන බව තමයි අපට දැනෙමින් තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා මම විමසන්න කැමැතියි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයේ කොටස් 2ක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා පොලිස් නිලධාරින් අදාළ කරලා මුලින්ම අහපු ගැටලුව සමාජයේ තරමක් කරීකා වන දෙයක්. අමාත්‍යාංශය සියලු පොලිස් ස්ථානවලට උපදෙස් දීලා තිබෙනවා මෙවැනි කටයුතු ගැන ආරංචි තිබෙනවා කියලා. නමුත් ගරු කථානායකතුමනි, අපි සොයා බැලුවාම ඒවායේ ලොකු සත්‍යතාවක් නැහැ. එතැනදී වෙලා තිබෙන්නේ, අප විශ්වාස නොකරන උදවිය, බාල වයස්කාර දරුවෝ, සමහර පවුල් විෂ මත්ද්‍රව්‍යවලට ගොදුරු වෙලා තිබීමයි. එතකොට ගරු මන්ත්‍රීතුමනි, අප කරා ආරංචිය එනවා, "අහවලා මෙහෙම කරන කෙනෙක් නොවෙයි, අහවලා මෙහෙම පුරුද්දක් තිබෙන කෙනෙක් නොවෙයි. ඒත් අන්න ඔහුව අත්අඩංගුවට අරගෙන. පොලීසිය තමයි වැරැද්ද කරලා තිබෙන්නේ" කියලා. නමුත් කරුණු සොයා බැලීමේ කටයුත්තේදී හෙළි වෙනවා, ඔහු මත්ද්‍රව්‍යවලට ඇත්තටම ඇබ්බැහි වුවෙක්, එහෙම නැත්නම් සමහර ජාවාරම්වලටත් හවුල් වෙලා තිබෙන කෙනෙක් කියලා. අද අන්න ඒ කාරණය දකින්න තිබෙනවා. පිළිතුරේ පළමුවෙනි කොටස ඒකයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ඇතැම් උදවිය වරදේ පටලවා ගැනීම සඳහා, ඇතැම් උදවිය අපහසුතාවට පත් කිරීම සඳහා, - විශේෂයෙන්ම සමාජ මාධ්‍ය තුළ වෙන්න පුළුවන්, වෙනත් මාධ්‍යයක් තුළ වෙන්න පුළුවන් - විවිධ බොරු, අසත්‍ය ප්‍රචාර පතුරවමින් ඉන්නවා. විෂය භාර අමාත්‍යවරයා සහ නියෝජ්‍ය අමාත්‍යවරයා වන මා සම්බන්ධයෙනුත් විවිධ කරීකා නිර්මාණය කරලා තිබෙනවා. පසුගිය දවස්වල, හනුමා පිළිමයක් සම්බන්ධව මමත් යම්කිසි ජාවාරම්කරුවෙකුට අත් උදවුවක් දුන්නා කියලා කථාවක් තිබුණා. ගරු කථානායකතුමනි, අපේ පංගුපේරුවක් නැහැ. අපි කෙළින්ම පොලිස්පතිවරයා වෙතත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙතත් ඒ පිළිබඳව දැනුම් දීමක් කළා. දැනුම් දීම කළාට පසුව ඒ අදාළ නාළිකාවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් සම්බන්ධ වෙලා එම ජාවාරම්කරුවා මීට දවස් දෙකකට කලින් අත්අඩංගුවට ගත්තා. ඒක හොඳ දෙයක්. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ගත්තොත්, ඇත්ත වශයෙන්ම සමාජයේ ඇති වන කරීකාව අනුව එය සාධාරණ ප්‍රශ්නයක්. නමුත්, පොලීසිය ලෙස ඒ සම්බන්ධයෙන් දැඩි පියවර ගෙන තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ප්‍රශ්න අංක 9.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා හොඳ උත්තරයක් ලබා දුන්නා. ඒ අහපු ප්‍රශ්නයට මම බොහොම කැමැතියි. හැබැයි, ඒ සඳහා මිනිත්තු 14ක් ගත්තා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පළමු ප්‍රශ්නයට විනාඩි 19ක් අරගෙන තිබෙනවා. එය ඉතා බරපතළ ගැටලුවක්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙම නොවෙයි. ඔබතුමා ඔය ගන්නා ස්ථාවරයට මම කැමැතියි. හැබැයි, ඒ අවස්ථාව කරුණාකර විපක්ෂයටත් ලබා දෙන්න. ඊයේ Parliamentary Business Committee එකේදිත් කිව්වා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

## විසුරුවා හරින ලද පළාත් සභාවල සභාපති ධුර: විස්තර

### கலைக்கப்பட்ட மாகாண சபைகளின் தவிசாளர் பதவிகள்: விபரம்

### OFFICE OF CHAIRPERSON OF DISSOLVED PROVINCIAL COUNCILS: DETAILS

2095/2026

**9. ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් සභා නවයේ සභාපති ධුර දරන මහජන නියෝජිතයන්ගේ වරප්‍රසාද එක් එක් පළාත් සභාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පළාත් සභා සභාපති ධුරය පළාත් සභා විසුරුවා හැරීමෙන් පසුව අහෝසි නොවීමට හේතු කවරේද;

(iii) එම තනතුර සඳහා වන වරප්‍රසාද සහ වැය වන රාජ්‍ය වියදම් සැලකිල්ලට ගෙන, පළාත් සභා විසුරුවා හරිනු ලැබූ විටම තනතුරද අහෝසි කිරීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள ஒன்பது மாகாண சபைகளின் தவிசாளர் பதவிகளை வகிக்கும் மக்கள்

பிரதிநிதிகளின் சிறப்புரிமைகள் ஒவ்வொரு மாகாண சபைக்கும் ஏற்ப வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) மாகாண சபைகள் கலைக்கப்பட்டதன் பின்னர், மாகாண சபைத் தவிசாளர் பதவி வறிதாகாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி பதவிக்கான சிறப்புரிமைகள் மற்றும் செலவிடப்படும் அரச செலவினங்கள் ஆகியவற்றை கருத்திற்கொண்டு, மாகாண சபைகள் கலைக்கப்படும்போதே பதவியையும் இல்லாதொழிப்பதற்கான சாத்தியக்கூறுகள் காணப்படுகின்றனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the privileges attached to the public representatives holding the office of Chairperson of each of the nine Provincial Councils in Sri Lanka, separately in respect of each Provincial Council;

(ii) the reasons as to why the office of Chairperson of a Provincial Council does not cease to function after the dissolution of the Provincial Councils; and

(iii) considering the privileges attached to the said office and the public expenditure incurred on it, whether there is a possibility of causing the office to cease functioning upon the dissolution of the Provincial Councils?

(b) If not, why?

**ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)

(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් සභා නවයේ සභාපති ධුර දරන මහජන නියෝජිතයන්ගේ වරප්‍රසාද එක් එක් පළාත් සභාව අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01 ලෙස පහත වගුවෙහි දක්වා ඇත.

ඇමුණුම 01:

| අනු අංකය | පළාත | සභාපතිවරයාට ලබා දෙන වරප්‍රසාද | | | | | | | සභාපතිවරයාට ලබා දී ඇති කාර්යය මණ්ඩලය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මාසික වැටුප හා ජීවන වියදම් දීමනාව (රුපියල්) | නිල නිවාස ගණන | නිල රථ ගණන | ලබා දෙන ඉන්ධන ප්‍රමාණය | | දුරකතන බිල්පත් ප්‍රතිපූර්ණය (රුපියල්)* | වෙනත් දීමනා | පෞද්ගලික ලේකම් | කළමනාකරණ සහකාර | කාර්යාල කාර්ය සහයක | රියදුරු |
| | | | | | ඩීසල් | පෙට්‍රල් | | | | | | |
| 01 | උතුරු පළාත | 63500 | - | 01 | 200L | | 10000 | - | - | - | - | 01 |
| 02 | වයඹ පළාත | 63500 | නිල නිවාසයක් ලබා දී ඇති අතර සභාපතිවරයාගේ වැටුපෙන් මාසිකව 12.5% අය කරනු ලැබේ. | 01 | 400L | | 10000 | - | 01 | 02 | 01 | 02 |
| 03 | ඌව පළාත | 63500 | - | 01 | 400L | | 10000 | - | 01 | 02 | 01 | 02 |
| 04 | මධ්‍යම පළාත | 63500 | - | 01 | 400L | | 10000 | - | 01 | 02 | 01 | 02 |
| 05 | දකුණු පළාත | 63500 | - | 01 | 400L | | 7500 | - | 01 | 02 | 01 | 02 |
| 06 | සබරගමුව පළාත | 63500 | - | 01 | 400L | | 10000 | | 01 | 02 | 01 | 02 |
| 07 | බස්නාහිර පළාත | 63500 | - | 01 | | 400L | 10000 | - | 01 | 02 | 01 | 02 |
| 08 | නැගෙනහිර පළාත ** | 63500 | 01 | 01 | | 400L | 2500 | 2000 (සංග්‍රහ දීමනාව) | 01 | 02 | 01 | 02 |
| 09 | උතුරු මැද පළාත | ගරු සභාපතිතුමා 2019.05.05 දින අභාවප්‍රාප්ත වී ඇත. | | | | | | | | | | |

* කාර්යාලීය දුරකතනය සඳහා රු.5000/- ක උපරිමයකට යටත්ව ද ජංගම දුරකතනය සඳහා උපරිමය රු.2500/- කට යටත්වද, නිවාස දුරකතන සඳහා උපරිමය රු.2500/-ක සීමාවට යටත්ව බිල්පත්වල මුදල ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

* දකුණු පළාත විසින් කාර්යාලීය දුරකතන සඳහා රු.5000/- හා ජංගම දුරකතන සඳහා රු.2500/- ක උපරිමයකට යටත්ව බිල්පත් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

** නැගෙනහිර පළාතේ ගරු සභාපතිතුමා 2026.02.13 වන දින අභාවප්‍රාප්ත වී ඇති අතර එදින සිට දීමනා හා වරප්‍රසාද නතර කර කාර්ය මණ්ඩලය ඉවත් කර ඇත.

[ගරු පී. රුවන් සෙනරත් මහතා]

(ii) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ II වන කොටසේ 7(2) (ඇ) වගන්තියට අනුව පළාත් සභාව විසුරුවා හරිනු ලබන කවර අවස්ථාවක වුවද එසේ විසුරුවා හරිනු ලැබීමෙන් පසු පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීම වනතෙක් සභාපතිවරයා ඔහුගේ ධුරය හිස් නොකළ යුතු බව සඳහන්ව ඇති බැවින් සභාපති ධුරය අහෝසි නොවේ.

(iii) නැත.

1987 අංක 42 දරන පළාත් සභා පනතේ II වන කොටසේ 7(2) (ඇ) වගන්තියට අනුව, පළාත් සභාව විසුරුවා හරිනු ලබන කවර අවස්ථාවක වුවද එසේ විසුරුවා හැරීමෙන් පසුව පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීම වනතෙක් පළාත් සභාවේ ගරු සභාපතිවරයා සිය ධුරය හිස් නොකර පවත්වා ගෙන යා යුතුය යන්න සඳහන්ව ඇත්තේ අඛණ්ඩතාව තහවුරු කිරීමට වන බව නිරීක්ෂණය වන අතර පනත් සංශෝධනයකින් මිස සභාපති තනතුර අහෝසි කළ නොහැක.

(ආ) අදාළ නොවේ.

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පිළිතුර ලබා දුන්නාට ස්තුතියි. ඔබතුමාගේ පිළිතුර අනුව පැහැදිලි වෙනවා, පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුවත් එහි සභාපති ධුරය අඛණ්ඩව, අවිච්ඡින්නව පවත්වාගෙන යන බව. පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව එම පළාත් සභාවේ සභාපතිතුමාට පැවරී තිබෙන කාර්යභාරය කුමක්ද? මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය එයයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු පී. රුවන් සෙනරත් මහතා**
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)

ගරු කථානායකතුමනි, කිසිදු කාර්යභාරයක් පැවරිලා නැහැ. මම පළාත් සභා 9ටම කථා කරලා බැලුවා. විශේෂයෙන්ම උතුරු මැද පළාත් සභාව හැර අනෙකුත් කිසිදු පළාත් සභාවක සභාපතිවරයා පළාත් සභාවේ කිසිදු කාර්යයකට සම්බන්ධ වෙලා නැහැ.

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පළාත් සභා අහෝසි වෙලා තිබෙන මොහොතක පළාත් සභාවේ සභාපතිවරයාට නිශ්චිත කාර්යභාරයකුත් නොමැති යැයි ඔබතුමා සඳහන් කරන මොහොතක මහජන බදු මුදලින් විශාල ප්‍රමාණයක් ඔවුන් නඩත්තු කිරීම සඳහා වැය කරනවා. ඒ කාරණයට අදාළව මගේ ප්‍රශ්නයේ (අ) (i) යටතේ ඔබතුමා පිළිතුර ලබා දුන්නා. ඒ අය වෙනුවෙන් ජනතාවගේ බදු මුදල් විශාල ප්‍රමාණයක් වැය කරනවා. බදු මුදල් වියදම් කරමින් නිශ්චිත කාර්යභාරයක්, රාජකාරියක් නොමැති පළාත් සභාවේ සභාපති ධුරය පවත්වා ගෙන යෑම සම්බන්ධයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශය ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු පී. රුවන් සෙනරත් මහතා**
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට ලබා දුන් පිළිතුරට අමතරව, ඊට අදාළ පසුබිම් වාර්තාව සහ එහි සඳහන් ඇමුණුම් 02, 03 සහ 04 ද මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

එතුමා අහපු ඒ කාල සීමාව තුළ මේ දක්වා රුපියල් කෝටි 332,935,224.30ක් ගෙවා තිබෙනවා, සභාපතිවරයාට සහ කාර්ය මණ්ඩලයට. පළාත් නවය විධියට ගත්තොත්, දකුණ පළාත් සභාවේ රුපියල් හාරකෝටි අනූඑක් ලක්ෂයක්, බස්නාහිර පළාත් සභාවේ රුපියල් හාරකෝටි හැටනවදහසක්, මධ්‍යම පළාත් සභාවේ රුපියල් හාරකෝටි හාරලක්ෂයක්, ඌව පළාත් සභාවේ රුපියල් හාරකෝටි දහනවලක්ෂයක්, උතුර පළාත් සභාවේ රුපියල් හාරකෝටි දෙලක්ෂයක්, නැඟෙනහිර පළාත් සභාවේ රුපියල් පන්කෝටි හැටහතරලක්ෂයක්, වයඹ පළාත් සභාවේ රුපියල් හාරකෝටි අසූපන්ලක්ෂයක්, සබරගමුව පළාත් සභාවේ රුපියල් හාරකෝටි තැත්තෑතුන් ලක්ෂයක් ආදි වශයෙන් වැටුප් ගෙවා තිබෙනවා, ඒ ඒ සභාවල සභාපතිවරුන්ට සහ කාර්ය මණ්ඩලයට. මේ ආකාරයට ගත් විට, සභාපතිවරයාට නිල වාහන, දුරකථන, කාර්යාල, නිවාස ඇතුළු පහසුකම් සපයනවා; කාර්ය මණ්ඩලයේ 6දෙනෙකුත් ඉන්නවා. රියැදුරන් ද ඇතුළුව පළාත් 8ම මුළු කාර්ය මණ්ඩලය 48දෙනෙක් කටයුතු කරමින් ඉන්නවා. රියැදුරෙකුට පැය 100ක උපරිම අතිකාල දීමනාවක් ලැබෙනවා. සංයුක්ත දීමනාවක් උපරිම දින 4කට යටත්ව ලබා දෙමින් තිබෙනවා. විශාල මුදලක් - රුපියල් මිලියන 332ක් - වැය කරමින් තිබෙනවා, පළාත් සභාවේ සභාපතිවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයට.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයට අදාළව ගත්තොත්, විශේෂයෙන්ම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ II වන කොටසේ 7 (2) (ඇ) වගන්තියට අනුව සභාවේ බහුතර ඡන්දයෙන් සම්මත කරන යෝජනා සම්මතයකින් තමයි ඒ තනතුර අහෝසි කරන්න හෝ වෙනස් කරන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ පිළිබඳව සාකච්ඡා වෙමින් පවතිනවා.

## ලියාපදිංචි රියැදුරු පුහුණු පාසල්: විස්තර
பதிவுசெய்யப்பட்டுள்ள சாரதி பயிற்சிப் பாடசாலைகள்: விபரம்
REGISTERED DRIVING SCHOOLS: DETAILS

2101/2026

**10. ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති රියැදුරු පුහුණු පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වන රියැදුරු අභ්‍යාස ආයතන තිබේද;

(iii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක වන රියැදුරු පාසල් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ තිබෙන පෞද්ගලික හා රාජ්‍ය මැදිහත් වීමෙන් ක්‍රියාත්මක වන රියැදුරු පුහුණු ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) පොතුහැර ප්‍රදේශයේ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන රියැදුරු පුහුණු ආයතනයක් පිහිටා තිබේද;

(iii) එම ආයතනය විසින් පසුගිය වසර 5 තුළ උපයා ඇති ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் பதிவுசெய்யப்பட்டுள்ள சாரதி பயிற்சிப் பாடசாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அரச தலையீட்டுடன் இயங்குகின்ற சாரதி பயிற்சி நிறுவகங்கள் உள்ளனவா என்பதையும்;

(iii) இலங்கை போக்குவரத்துச் சபையால் செயற்படுத்தப்படுகின்ற சாரதி பயிற்சிப் பாடசாலைகள் உள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) குருநாகல் மாவட்டத்திலுள்ள தனியார் மற்றும் அரச தலையீட்டுடன் இயங்குகின்ற சாரதி பயிற்சி நிறுவகங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) பொத்துஹெர பகுதியில் இலங்கை போக்கு வரத்துச் சபையால் செயற்படுத்தப்படுகின்ற சாரதி பயிற்சி நிறுவகமொன்று நிறுவப் பட்டுள்ளதா என்பதையும்;

(iii) மேற்படி நிறுவகம், கடந்த 05 வருட காலப்பகுதியில் ஈட்டியுள்ள வருமானம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the number of registered driving schools in Sri Lanka;

(ii) whether there are driving schools operating under State intervention; and

(iii) whether there are driving schools operated by the Sri Lanka Transport Board?

(b) Will he also inform this House -

(i) the number of private and State-operated driving schools operating within the Kurunegala District;

(ii) whether there is a driving school operated by the Sri Lanka Transport Board in the Pothuhera area; and

(iii) the income earned by the said driving school during the last five years?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 764යි.

| No | District | Grade | | | No. of Instructors | No. of Vehicles |
|---|---|---|---|---|---|---|
| | | A | B | C | | |
| 1 | Colombo | 3 | 6 | 77 | 145 | 451 |
| 2 | Anuradhapura | 2 | 5 | 26 | 55 | 208 |
| 3 | Ampara | 1 | 6 | 14 | 37 | 98 |
| 4 | Badulla | 1 | 7 | 22 | 49 | 142 |
| 5 | Batticaloa | 0 | 3 | 15 | 29 | 81 |
| 6 | Galle | 1 | 3 | 19 | 35 | 99 |
| 7 | Gampaha | 4 | 15 | 74 | 160 | 491 |
| 8 | Hambantota | 1 | 8 | 17 | 48 | 133 |
| 9 | Jaffna | 0 | 2 | 14 | 32 | 87 |
| 10 | Kilinochchi | 0 | 3 | 7 | 16 | 46 |
| 11 | Kandy | 1 | 1 | 42 | 67 | 199 |
| 12 | Kalutara | 1 | 5 | 33 | 60 | 183 |
| 13 | Kurunegala | 2 | 13 | 69 | 119 | 370 |
| 14 | Kegalle | 1 | 5 | 34 | 56 | 159 |
| 15 | Mannar | 0 | 2 | 3 | 11 | 24 |
| 16 | Matale | 1 | 2 | 19 | 31 | 105 |
| 17 | Matara | 2 | 1 | 22 | 38 | 118 |
| 18 | Mullaitivu | 0 | 2 | 5 | 11 | 32 |
| 19 | Monaragala | 1 | 3 | 17 | 35 | 94 |
| 20 | Nuwara Eliya | 0 | 5 | 13 | 33 | 90 |
| 21 | Puttalam | 2 | 4 | 22 | 53 | 146 |
| 22 | Polonnaruwa | 0 | 3 | 6 | 21 | 45 |
| 23 | Ratnapura | 0 | 9 | 30 | 66 | 185 |
| 24 | Trincomalee | 0 | 3 | 16 | 27 | 86 |
| 25 | Vavuniya | 0 | 1 | 7 | 14 | 33 |
| Total | | 24 | 117 | 623 | 1248 | 3705 |
| Total | | 764 | | | | |

(ii) 23යි.

(iii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක වන රියැදුරු පාසල් දිවයින පුරා 19කි.

[ගරු බිමල් රත්නායක මහතා]

(ආ) (i) 02යි.

(ii) ඔව්. 01යි. (වෘත්තීය පුහුණු ආයතනය - VTI)

(iii) පොතුහැර රියැදුරු අභ්‍යාස විද්‍යාලයේ මූල්‍ය වාර්තාව

| වර්ෂය | වාර්ෂික ආදායම (රු.) | වාර්ෂික මුළු පිරිවැය (රු.) | ලාභය / අලාභය (රු.) |
|---|---|---|---|
| 2020 | 5,440,163.00 | 12,619,321.00 | -7,179,158.00 |
| 2021 | 3,814,519.00 | 13,092,342.00 | -9,277,823.00 |
| 2022 | 9,002,491.00 | 16,291,227.00 | -7,288,736.00 |
| 2023 | 9,986,603.00 | 19,263,631.00 | -9,277,028.00 |
| 2024 | 12,389,469.00 | 16,452,478.00 | -4,063,009.00 |
| 2025 | 17,249,606.00 | 18,900,065.00 | -1,650,459.00 |
| එකතුව | 57,882,851.00 | 96,619,064.00 | -38,736,213.00 |

සමස්ත රියැදුරු අභ්‍යාස විද්‍යාලවල මූල්‍ය සංසන්දනය

| වර්ෂය | වාර්ෂික ආදායම (රු.) | වාර්ෂික මුළු පිරිවැය (රු.) | ලාභය / අලාභය (රු.) |
|---|---|---|---|
| 2020 | 34,343,594.00 | 69,853,679.00 | -35,510,085.00 |
| 2021 | 35,284,892.00 | 80,539,895.00 | -45,255,003.00 |
| 2022 | 65,537,545.00 | 82,313,137.00 | -16,775,592.00 |
| 2023 | 81,489,110.00 | 95,563,673.00 | -14,074,563.00 |
| 2024 | 88,722,293.00 | 94,349,586.00 | -5,627,293.00 |
| 2025 | 118,250,233.00 | 100,724,228.00 | +17,526,005.00 |
| 2026 (මැයි දක්වා) | 59,738,426.00 | 47,000,000.00 | +12,000,000.00 |
| එකතුව | 483,366,093.00 | 524,035,569.00 | -40,669,476.00 |

මේ අවුරුදු දෙක ඇතුළත ලාභ ලබන්න පටන් අරගෙන තිබෙනවා. නමුත් මීට පෙර කාලයේ පාඩු ලබා තිබෙනවා.

(ඇ) අදාළ නොවේ.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය හැටියට මම ගරු ඇමතිතුමාගෙන් අහන්නේ මෙයයි.

පොතුහැර ප්‍රදේශයේ තිබෙන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මඟින් මෙහෙයවන රියැදුරු පාසල සහිත භූමිය අක්කර 15කට අධික භූමියක්. මේ පුහුණු පාසල තුළ දැනට ඉන්නේ උපදේශකයන් 4දෙනායි. ඒ අයගෙන් 3දෙනෙක් අනියම් පදනම මත සේවය කරන්නේ. ගරු අමාත්‍යතුමා ප්‍රකාශ කළ ආකාරයට මේක පසුගිය වසර 5ක කාලය තුළ දැවැන්ත ලෙස පාඩු ලබපු ආයතනයක්. රුපියල් මිලියන 100කට වැඩි දැවැන්ත පාඩුවක් ලබා තිබුණා. නමුත් මේ රජය පත්වෙලා ගතවුණු අවුරුදු දෙකකට ආසන්න කාලය තුළ ලාභ ලබන ආයතනයක් බවට ක්‍රමයෙන් පත්වෙමින් තිබෙනවා.

මේ ආයතනය තුළ තිබෙන අඩුපාඩු සියල්ල මඟහරවා ගත්තොත් තවත් ලාභ ලැබිය හැකි හොඳ ආයතනයක් බවට මෙම ආයතනය පත් කර ගන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය හැටියට මේ වෙනකොට මොනයම් හෝ ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවාද කියලා මම ගරු අමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, පොතුහැර තිබෙන ආයතනය සම්බන්ධයෙන් නම් එහෙම විශේෂ සැලැස්මක් සකස් කර තිබෙන බව දන්වලා නැහැ. එය ක්‍රමානුකූලව ලාභ උපයමින් ඉදිරියට යනවා. නමුත් රියැදුරු පුහුණු පාසල්වල වර්ධනය වෙනුවෙන් අපි යම් ක්‍රියාමාර්ග ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ශ්‍රී ලංගම ඒවා පමණක් නොවෙයි, පෞද්ගලික අංශයේ ඒවාත් යම්කිසි ප්‍රමිතියකට අනුව දියුණු කරන්න අපි සැලැස්මක් ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ වාගේම අපි ඒ syllabus එක සකස් කරනවා. තව මාස 2කදී පමණ අපි අනිවාර්ය කරනවා, - දැනටත් ඒක ක්‍රියාත්මක කරලා තිබෙනවා - මඟී ප්‍රවාහනයේ යෙදෙන සෑම රියැදුරෙක්ම public transport licence එකක්, විශේෂ රියැදුරු බලපත්‍රයක් ලබා ගන්න ඕනෑ කියලා. ඒ රියැදුරු බලපත්‍රය ලබා දිය හැක්කේ විශේෂ රියැදුරු පුහුණු පාසල්වලට පමණයි. අපි එවැනි දෙයක කරන්න උත්සාහයක දරමින් ඉන්නවා.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කුරුණෑගල දිස්ත්‍රික්කය කියන්නේ, ලංකාවේ තුන්වැනි තැනට වැඩිම ජනගහනයක් ජීවත්වෙන දිස්ත්‍රික්කයක්. අපේ දිස්ත්‍රික්කයේ කුරුණෑගල නගරය සහ ඒ අවට නාගරික ලක්ෂණ පෙන්නුවත් ඉන් එළියට යද්දී බොහෝ ග්‍රාමීය ලක්ෂණ තිබෙන්නේ. විශේෂයෙන්ම ග්‍රාමීය මාර්ගවල බස් රථ ධාවනය ගත්තොත්, රියැදුරන්ගේ අඩුපාඩුවක් තිබෙනවා. අපේ දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන ආයතන 2ක් තිබෙනවා. ඒවායෙන් රියැදුරන් හැටියට විශාල ප්‍රමාණයක් එළියට එනවා. නමුත් ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකාරතුමන්ගෙන් ඒ ගැන ඇහුවාම කිව්වේ, ලංගම බස් රථ ධාවනය කර ගැනීමට හැකියාව තිබුණත් රියැදුරන්ගේ අඩුපාඩුවක් තිබෙන බවයි. නමුත් කොන්ත්‍රාත් පදනම මත බස් රථ ධාවනය කිරීම සඳහා රියැදුරන් සපයා ගැනීමේ හැකියාව තිබෙනවා කියනවා. ඒ සඳහා ඔවුන් ඉල්ලීමක් කරනවා. මම අමාත්‍යතුමාගෙන් අහන්නේ, ඒ සඳහා අමාත්‍යාංශයට මොනයම් හෝ ප්‍රතිපාදනයක් තිබෙනවාද කියලායි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම කිහිප සැරයක්ම කියා තිබෙනවා, ශ්‍රීලංගම ආයතනය එදා මෙදා තුර පැවති දේශපාලන නායකත්වය විසින් කුඩුපට්ටම් කරන ලද ආයතනයක් කියලා. එහි සේවකයන් 24,000ක් ඉන්නවා. ඒ 24,000න් වැඩි ප්‍රමාණයක් පුරවලා තිබෙන්නේ දේශපාලනය හරහා. ඒ අයගෙනුත් සැලකිය යුතු ප්‍රමාණයක් ශ්‍රීලංගම ගොඩනැඟීමට වඩා වෙනත් දේවල්වල තමයි දැනුත් ඉන්නේ. ඒ සමහරු දේශපාලන හෙංචයියන්, දේශපාලන මැරයන්. 2022 මැයි 09වැනි දා ගෝල්ෆේස් අරගළයේ නිරායුධ සාමකාමී සත්‍යාග්‍රහයට පහර දෙන්න ආපු පුද්ගලයන් පවා තාම ඒ තැන්වල වැඩ කරනවා. ඒ ආයතනයේ රියැදුරු, කොන්දොස්තර ප්‍රශ්නය ගත්තත් එහෙමයි. ඔවුන්ගෙනුත් යම් ප්‍රමාණයක් වැඩ

කරන්නේ නැති, අරාජික, සමහර විට ටිකට්පත්වලින් පවා මුදල් වංචා කරන අය. ඒ නිසා සේවක හිඟය නොවෙයි තිබෙන්නේ. ඉන්න සේවකයන් කාර්යක්ෂමව වැඩ නොකිරීමත්, අනවශ්‍ය සේවකයන් ප්‍රමාණයක් බඳවාගෙන තිබීමත්, ඒ වාගේම ඒගොල්ලන් හදාගෙන තිබෙන සමහර ක්‍රියාමාර්ගත් තමයි මේ අකාර්යක්ෂමතාවට හේතු වෙලා තිබෙන්නේ. මම උදාහරණයක් කියන්නම්. මීට කලින් තිබිච්ච විධියට ටිකට් වංචාවක් වුණාම, තාවකාලිකව ඒ පුද්ගලයාගේ වැඩ තහනම් කරලා පඩි ගෙවනවා. එතකොට බස් එක දුවන්නේ නැහැ. බස් එක නතර කරනවා; පුද්ගලයා පඩි සහිතව ගෙදර ඉන්නවා. ඔන්න ඕවා නිසා තමයි ගරු මන්ත්‍රීතුමනි, රියැදුරන් නැහැ, කොන්දොස්තරවරු නැහැ කියන ප්‍රශ්නය ගොඩනැඟිලා තිබෙන්නේ. ඒ නිසා අපි ඒක වෙනස් කළා. දැන් ඒගොල්ලන්ට වේතන දඩයක් ගහනවා. ඒ කියන්නේ වංචාවක් කරලා අහු වුණොත් පඩියෙන් යම්කිසි දඩයක් ගහනවා. හැබැයි ඒගොල්ලන් රස්සාව කරන්න ඕනෑ. රියැදුරුවරු හෝ කොන්දොස්තරවරු හරි එවැනි වැරදි කළාම ඒගොල්ලන්ගේ වැටුපෙන් දඩයක් අය කරනවා. ඒ අතර ඒගොල්ලන්ට රස්සාව කරන්න පුළුවන්.

ඊට අමතරව සමහර පුද්ගලයන් ඒ කාර්යාලවල වෙන රැකියා කරන ක්‍රම හදාගෙන තිබෙනවා. ඔවුන් රියැදුරු, කොන්දොස්තර විධියට ඇවිල්ලා කාර්යාලවල වෙන රැකියා කරනවා. ඒ නිසාත් සේවක හිඟය ඇති වෙලා තිබෙනවා. ඒවා නිවැරදි කරන්න සභාපතිතුමා ඇතුළු අලුත් අධ්‍යක්ෂ මණ්ඩලය සැහෙන්න මහන්සි වෙනවා. නමුත් ඒ කළමනාකරණය අන්ත දූෂිත ලෙස තමයි ගොඩනහලා තිබෙන්නේ. හොඳ අය නැතුවා නොවෙයි. අපි දැනට මේ අලුත් ක්‍රමයට අන්තර්ග්‍රහණය කරගෙන යෑමේ වැඩසටහනක් කරනවා. ඒකට අනිවාර්යයෙන්ම කාලයක් යනවා. ඒ නිසා ජනතාව පීඩා විඳිනවා, ශ්‍රීලංගමයෙන් ලැබිය යුතු හොඳම සේවාව නොලැබීම නිසා. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට පේනවා ඇති, මම දීපු උත්තරය ඇතුළෙත් සාධනීය පැත්තට යම් කිසි උත්සාහයක් ගනිමින් තිබෙනවා කියලා. නමුත් ඒ විනාශය අවුරුදු 30, 40ක් තිස්සේ කරපු විනාශයක්. අපට ඒක මාස 22න් ගොඩනගන්න බැහැ. නමුත් අපි ඒක ගොඩනගනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය

## අනුරාධපුර, ඇලයාපත්තුව උළු කර්මාන්තශාලාව: වර්තමාන තත්ත්වය

### அநுராதபுரம், எலயாபத்துவ ஓட்டுத் தொழிற்சாலை: தற்போதைய நிலை

### TILE FACTORY IN ELAYAPATTUWA, ANURADHAPURA: CURRENT STATUS

658/2025

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohana Bandara)

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇලයාපත්තුව ප්‍රදේශයේ උළු කර්මාන්තශාලාවක් තිබෙන බවත්;

(ii) මේ වනවිට එම උළු කර්මාන්තශාලාව අක්‍රිය තත්ත්වයේ පවතින බවත්;

(iii) ඒ හේතුවෙන්, එම කර්මාන්තශාලාවේ වටිනා යන්ත්‍රෝපකරණ දිරාපත් වෙමින් තිබෙන බවත්;

එතුමා දන්නේද?

(ආ) එම කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம் மாவட்டத்தின் எலயாபத்துவ பிரதேசத்தில் ஓட்டுத் தொழிற்சாலையொன்று உள்ளது என்பதையும்;

(ii) தற்போது அந்த ஓட்டுத் தொழிற்சாலை இயங்காத நிலையில் உள்ளது என்பதையும்;

(iii) அதன் காரணமாக, அந்தத் தொழிற்சாலை யிலுள்ள பெறுமதி மிக்க இயந்திர உபகரணங்கள் பழுதடைந்து வருகின்றன என்பதையும்; அவர் அறிவாரா?

(ஆ) மேற்படி தொழிற்சாலையை மீள இயங்கச் செய்வதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Is he aware that -

(i) there is a tile factory in the Elayapattuwa area of the Anuradhapura District;

(ii) the said tile factory is currently in a non-functional state; and

(iii) as a result, the valuable machinery of the said factory is deteriorating?

(b) Will he inform this House of the measures that will be taken to restart the said factory?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) මෙම කර්මාන්තශාලාව සහිත ඉඩම කර්මාන්තපුරයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා යෝජිත බැවින් එහි තිබෙන ප්‍රයෝජනයට ගත හැකි යන්ත්‍ර සූත්‍ර ගලවා ඔඩ්ඩුසුඩාන් සහ එරගම කර්මාන්තශාලා වෙත රැගෙන ගොස් ඇති අතර ඉතිරි අබලි ද්‍රව්‍ය මේ වන විටත් ඉවත් කරමින් පවතී.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ආ) ඇලයාපත්තුව උළු කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීමක් සිදු නොවන අතර ලංකා පිඟන් සංස්ථාව සතු කර්මාන්තශාලා ඵලදායී ලෙස උපයෝජනය කිරීම යන මැයෙන් 2025.12.31 දිනැතිව ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබා දී ඇති අංක අමප/26/0067/810/005 හා 2026.01.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකා පිඟන් සංස්ථාව සතු ඇලයාපත්තුව ඇතුළු අනෙක් කර්මාන්තශාලා පිහිටි ඉඩම් 03ක (බංගදෙනිය, යටියන, වැඩ) කර්මාන්තපුර ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයන වාර්තාවද ඇතුළත් සවිස්තරාත්මක ව්‍යාපෘති යෝජනාවක් සකස් කර සමාලෝචනය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

## 2020 සිට විදේශ පුහුණු අවස්ථා සඳහා සහභාගි වූ රාජ්‍ය නිලධාරීන්: විස්තර

## 2020 முதல் வெளிநாட்டுப் பயிற்சி நிகழ்ச்சிகளில் கலந்துகொண்ட அரச உத்தியோகத்தர்கள்: விபரம்

## PUBLIC SERVANTS PARTICIPATED IN FOREIGN TRAINING PROGRAMMES SINCE 2020: DETAILS

2061/2026

**7. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු ජේ.සී. අලවතුවල මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஜே.சீ. அலவத்துவல சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. J.C. Alawathuwala)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රාජ්‍ය නිලධාරීන්ගේ හැකියාවන්, කුසලතා සහ ආකල්ප වර්ධනය සඳහා විදේශීය පුහුණු අවස්ථා වැදගත් බව පිළිගන්නේද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා විදේශීය පුහුණු අවස්ථා සඳහා සහභාගිවූ රාජ්‍ය නිලධාරීන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ එම පුහුණුවීම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම විදේශීය පුහුණු අවස්ථා සියලු රාජ්‍ය සේවකයන් අතර සාධාරණ ලෙස බෙදී යන පරිදි ලබාදීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரச உத்தியோகத்தர்களின் திறமைகள், ஆற்றல்கள் மற்றும் மனப்பாங்கை மேம்படுத்து வதற்கு வெளிநாட்டுப் பயிற்சி வாய்ப்புகள் முக்கியத்துவம் வாய்ந்தவை என்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(ii) 2020ஆம் ஆண்டு முதல் இதுவரையில் வெளிநாட்டுப் பயிற்சிகளில் பங்கேற்ற அரச உத்தியோகத்தர்களின் எண்ணிக்கை, அவர்களது பெயர்கள் மற்றும் மேற்படி பயிற்சிக்காகச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி வெளிநாட்டுப் பயிற்சி வாய்ப்புகளை அனைத்து அரச உத்தியோகத்தர்களுக்கும் நியாயமான முறையில் பகிர்ந்தளிக்கக் கூடியவாறு வழங்குவதற்கான முறைமையியல் ஒன்றைத் தயாரிப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether he admits that foreign training opportunities are important for the development of the competencies, skills and attitudes of public servants;

(ii) the number of public servants who have participated in foreign training programmes from the year 2020 to date, their names and the cost incurred on such training; and

(iii) the measures that will be taken to formulate a proper mechanism to ensure that such foreign training opportunities are distributed fairly among all public servants?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. රාජ්‍ය නිලධාරීන්ගේ පවතින වෘත්තීය හැකියාවන්, කුසලතා සහ ආකල්ප වර්ධනය කරමින් වඩාත් කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ජනතාව වෙත සැපයීම සඳහා විදේශීය පුහුණු අවස්ථා ලබා දීම ඉතා වැදගත් සහ කාලීන අවශ්‍යතාවක් බව පිළිගනු ලැබේ.

(ii) සමස්ත රාජ්‍ය සේවය සඳහා වන විදේශීය පුහුණු පාඨමාලා මූලික වශයෙන් සම්බන්ධීකරණය කරනු ලබන්නේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසිනි.

ඒ අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් ලබා ගන්නා ලද 2020 වර්ෂයේ සිට 2026 වර්ෂයේ මේ දක්වා කාලය තුළ සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට අයත් රාජ්‍ය නිලධාරීන්ගේ විදේශ පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා වියදම් විස්තරය පහත පරිදි වේ. එම නිලධාරීන්ගේ නම්, තනතුරු සහ සහභාගි වූ රට ඇමුණුම මඟින් දක්වා ඇත. ඇමුණුම ඇතුළත් **සීඩී තැටිය**** ඉදිරිපත් කර ඇත.

---

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

| වර්ෂය | විදේශ පුහුණු සඳහා සහභාගි වූ නිලධාරීන්ගේ සංඛ්‍යාව | දරන ලද වියදම රුපියල් (මිලි.) |
|---|---|---|
| 2020 | 957 | 502.32 |
| 2021 | 1150 | 1,207.05 |
| 2022 | 2301 | 973.68 |
| 2023 | 1260 | 1,331.11 |
| 2024 | 1745 | 1,272.33 |
| 2025 | 2006 | 1,167.99 |
| 2026 මේ දක්වා | 1292 | 479.89 |
| එකතුව | 10711 | 6,934.37 |

(iii) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ලැබෙන විදේශ පුහුණු පාඨමාලා අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු අතර බෙදා දීම එම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

ඇතැම් විදේශ පුහුණු පාඨමාලා සඳහා නිලධාරින් තෝරා ගැනීම අදාළ මහ කොමසාරිස් කාර්යාල, තානාපති කාර්යාල විසින් සිදු කරනු ලබන අතර ඇතැම් පුහුණු පාඨමාලා සඳහා නිලධාරින් තේරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ හඳුනාගනු ලැබූ නිශ්චිත ක්‍රමවේදයක් හරහා සිදු කරනු ලබයි.

(ආ) ඉහත (අ) (i), (ii), (iii) පැහැදිලි කිරීම මත මෙම ප්‍රශ්නය තවදුරටත් ඇති නොවන බව නිරීක්ෂණය වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල ඒකාබද්ධ කිරීමේ යෝජනාව
### ஊழியர் சேமலாப நிதியையும் ஊழியர் நம்பிக்கை நிதியையும் இணைப்பதற்கான முன்மொழிவு
### PROPOSED AMALGAMATION OF EMPLOYEES' PROVIDENT FUND AND EMPLOYEES' TRUST FUND

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල - EPF සහ ETF - මෙරට දස ලක්ෂ සංඛ්‍යාත වූ සේවකයින්ගේ විශ්‍රාමික ජීවිතයේ මූල්‍ය සුරක්ෂිතභාවය සහ සමාජ ආරක්ෂණය තහවුරු කරන ප්‍රධාන අරමුදල් දෙකක්. මෙම අරමුදල් සේවකයින්ගේ, සේවායෝජකයින්ගේ දායකත්වයෙන් ගොඩනැඟී ඇති බැවින් ඒවායේ පාලන ව්‍යුහය, කළමනාකරණ ක්‍රමවේදය සහ නීතිමය රාමුව වෙනස් කිරීමේදී සේවකයින්ගේ අයිතිවාසිකම්, දැනට පවතින ප්‍රතිලාභ, අරමුදල්වල ආරක්ෂාව සහ ස්වාධීන කළමනාකරණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු වෙනවා. එම නිසා මේ වැදගත් කාරණාව පිළිබඳව පිළිතුරු බලාපොරොත්තුවෙන් මම ප්‍රශ්න ගණනාවක් රජයට ඉදිරිපත් කරනවා.

1. සේවක අර්ථසාධක අරමුදල - EPF, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල - ETF - යටතේ දැනට ලියාපදිංචි වී ඇති සහ ප්‍රතිලාභ ලබන සමස්ත සාමාජිකයින් සංඛ්‍යාව සහ අරමුදලේ දැනට පවතින සමස්ත වත්කම් වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද?

2. EPF සහ ETF සඳහා ලියාපදිංචි පෞද්ගලික සේවායෝජක ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද? එම අරමුදල් සඳහා ලියාපදිංචි විය යුතු නමුත්, මේ වන විට ලියාපදිංචි වී නොමැති වාර්තාගත සේවායෝජක ආයතන සංඛ්‍යාව කොපමණද?

3. EPF සහ ETF අරමුදල් ඒකාබද්ධ කිරීම හෝ තනි පාලන රාමුවක් යටතට ගෙන ඒමේ ශක්‍යතාව අධ්‍යයනය කිරීම සඳහා පත් කර ඇති කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද?

   මොකද, ඇත්තවශයෙන්ම පාලන ව්‍යුහයේ වෙනසක් කිරීම සාමාන්‍ය පරිපාලනමය තීරණයක් හැටියට අපට ගණන් ගන්න බැහැ. දසලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ, සේවකයින්ගේ ජීවිතයේ ඉතිරි කිරීම් තමයි මේකේ තිබෙන්නේ. ඒ නිසා සේවක නියෝජනය, වෘත්තිය සමිති නියෝජනය, ස්වාධීන විශේෂඥයින් නියෝජනය ප්‍රමාණවත් ලෙස ඇතුළත් කර තිබෙනවාද කියන එක ගැන අපට දැනගන්නට අවශ්‍යයි.

   එම කමිටුව පත් කිරීමට පදනම් වූ ප්‍රතිපත්තිමය හා පරිපාලනමය හේතු මොනවාද?

4. මෙම යෝජනාව සම්බන්ධයෙන් වෘත්තීය සමිති, සේවායෝජක සංවිධාන, EPF/ETF සාමාජිකයින්, ශ්‍රී ලංකා මහ බැංකුව, අනෙකුත් අදාළ මූල්‍ය හා නියාමන ආයතන ඇතුළු පාර්ශ්වකරුවන්ගෙන් අදහස් විමසා තිබේද?

   මොකද, මේ අරමුදල්වල සැබෑ හිමිකරුවන් සේවකයින් වන නිසා ඒ අයගේ පූර්ණ විශ්වාසය හා කැමැත්ත නොමැතිව මේ වාගේ ප්‍රතිපත්තිමය වෙනසක් ඉදිරියට ගෙනයෑම ප්‍රජාතන්ත්‍රවාදී පාලන මූලධර්මවලට පටහැනියි.

   වෘත්තීය සමිති, සේවායෝජක සංවිධාන සාමාජිකයින් සමඟ සැබෑ අදහස් විමසීමක් සිදු කර තිබේද?

   නැත්නම් එය උපදේශන ක්‍රියාවලියකින් තොරව ඉදිරියට ගෙන යන තීරණයක් ලෙස රටට තේරුම් ගන්න සිද්ධ වෙනවා, ජනතාවට තේරුම් ගන්න සිද්ධ වෙනවා.

   ඒ නිසා මෙවැනි සංවේදී ප්‍රතිසංස්කරණයක් සම්බන්ධයෙන් ලැබුණු සියලු යෝජනා, විරෝධතා සහ නිර්දේශ මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට රජය කටයුතු කරනවාද? විවිධ පාර්ශ්ව ලබා දෙන අදහස් හා නිර්දේශ ඇතුළත් වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

5. EPF සහ ETF අරමුදල් ඒකාබද්ධ කිරීමේ යෝජනාව මඟින් පවතින පරිපාලන ගැටලු විසඳීම අපේක්ෂා කරන්නේද, නැතහොත් එය අරමුදල් දෙකෙහි කළමනාකරණ කාර්යක්ෂමතාව වැඩි කිරීමේ අරමුණින් පමණක් ඉදිරිපත් කර තිබේද? ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාව තහවුරු කරන විධිමත් ආර්ථික, මූල්‍ය හා පරිපාලන අධ්‍යයනයක් රජය සතුව තිබේද? අනෙකුත් අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් මෙන්ම වෙනත් රටවල සමාන අරමුදල් කළමනාකරණ ආකෘතීන් සැලකිල්ලට ගෙන තිබේද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

විශේෂයෙන්ම පරිපාලන කාර්යක්ෂමතාව වැඩි කිරීම යහපත් අරමුණක් වුණත්, එහි නාමයෙන් සේවක අයිතිවාසිකම් සහ අරමුදල්වල ස්වාධීනත්වයට අවදානමක් එල්ල විය හැකි බැවින් මේ කරුණු කාරණා පිළිබඳව පැහැදිලි විග්‍රහයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

6. මෙම කමිටුවේ අවසන් වාර්තාව සහ නිර්දේශ රජයට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත දිනය කුමක්ද? එම නිර්දේශ මත පදනම්ව EPF සහ ETF සම්බන්ධයෙන් අවසන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට රජය අපේක්ෂා කරන කාලරාමුව කුමක්ද?

7. EPF සහ ETF අරමුදල් ඒකාබද්ධ කළහොත්, එම අරමුදල්වල වත්කම් රජයේ සාමාන්‍ය මූල්‍ය අවශ්‍යතා, රාජ්‍ය වියදම් හෝ රාජ්‍ය ණය පියවීම සඳහා සෘජුව හෝ වක්‍රව භාවිත කිරීම වැළැක්වීම සඳහා පවතින නීතිමය ආරක්ෂණ තවදුරටත් තහවුරු කරන්නට රජය කටයුතු කරන්නේද? එසේ නම්, ඒ සඳහා යෝජිත නීතිමය හා ආයතනික ආරක්ෂණ වැඩ පිළිවෙළ කුමක්ද?

8. සේවායෝජකයින් විසින් EPF සහ ETF සඳහා ගෙවිය යුතු දායක මුදල් සහ අදාළ අධිභාර අයකර ගැනීමේ ප්‍රමාදයන්, හිඟ දායක මුදල් අයකර ගැනීමේ ගැටලු සහ සේවක අයිතිවාසිකම් බලාත්මක කිරීමේ පවතින දුර්වලතා සම්බන්ධයෙන් රජය විසින් විධිමත් ඇගැයීමක් සිදුකර තිබේද? එසේ නම්, එම ගැටලු විසඳීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

9. EPF සහ ETF අරමුදල් ඒකාබද්ධ කිරීමෙන් සේවකයින්ට ලැබෙනු ඇතැයි රජය අපේක්ෂා කරන නිශ්චිත නව ප්‍රතිලාභ මොනවාද? යෝජිත ඒකාබද්ධ කිරීම හේතුවෙන් දැනට සේවකයින්ට හිමි ප්‍රතිලාභ, දායකත්ව මත හිමිකම්, විශ්‍රාම ප්‍රතිලාභ, නිවාස, සෞඛ්‍ය, තවත් සුභසාධන ප්‍රතිලාභ සහ නීතිමය ආරක්ෂාව කිසිදු ආකාරයකින් අඩු නොවන බවට රජය සහතික වන්නේද?

මම විශේෂයෙන් අහන්න කැමැතියි, මේ කාරණයත්. IMF ගිවිසුමත් සමඟ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය තුළ මේ රටේ සුපිරි පොහොසතුන්ව බේරුවා, primary bond dealersලාව බේරුවා, බැංකු පද්ධතිය බේරුවා. හැබැයි EPF එකේ, ETF එකේ ලොකු කප්පාදුවක් සිද්ධ වුණා. පසුගිය රජය එකඟ වුණු IMF එකඟතාවට අනුව EPF එකෙන් සහ ETF එකෙන් පික්පොකට් ගැහුවා. එය නිවැරදි කරන්නට වර්තමාන රජය ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු විපක්ෂ නායකතුමා විසින් අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි වී ඇති සහ ප්‍රතිලාභ ලබන සමස්ත සාමාජිකයින් සංඛ්‍යාව මිලියන 22.9කි. ඉහත සාමාජිකයන් අතරින් මාසිකව සාමාජික මුදල් බැරවන ගිණුම් සංඛ්‍යාව මිලියන 3.1කි.

සේවක භාරකාර අරමුදලෙහි ලියාපදිංචි සාමාජිකයින් සංඛ්‍යාව මිලියන 3ක් පමණ වේ.

2025 වසර අවසාන වනවිට සේවක අර්ථසාධක අරමුදලේ වත්කම් වටිනාකම රුපියල් ට්‍රිලියන 4.9ක් වන අතර, සේවක භාරකාර අරමුදලෙහි වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 637.5 ඉක්මවා ඇත.

2. 2025 වසරට සක්‍රිය සේවා යෝජක සංඛ්‍යාව 101,000ක් පමණ වේ. අර්ධ රාජ්‍ය අංශයේ සේවා යෝජක සංඛ්‍යාව 376කි.

ලියාපදිංචි වී නොමැති ආයතන පිළිබඳ වාර්තා වූ විට ලියාපදිංචි කිරීමට කටයුතු කරන බැවින්, එවැනි ලැයිස්තුවක් නොමැත.

3. කමිටුවේ සංයුතිය;

i. කම්කරු අමාත්‍යාංශයේ ලේකම් - කමිටුවේ සභාපති

ii. මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් නම් කරනු ලබන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු

iii. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

iv. කම්කරු කොමසාරිස් ජනරාල්තුමිය

v. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් නම් කරනු ලබන එම මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු

vi. කම්කරු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙකු ඉහත සඳහන් නිලධාරීන් කමිටුවේ ලේකම් / කැඳවුම්කරු

සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සම්බන්ධයෙන් වගකීම් දරන ආයතන සහ ඊට අදාළ අමාත්‍යාංශ නියෝජනයෙන් මෙම කමිටුව සැදී ඇත.

4. සේවක අර්ථසාධක අරමුදලේ පරිපාලනය සඳහා ත්‍රෛපාර්ශ්වික පාලන ව්‍යුහයක් හඳුන්වා දීමේ අවශ්‍යතාව පිළිබඳව ජාතික කම්කරු උපදේශක සභාව - NLAC - හිදී සාකච්ඡා කර ඇත.

ගරු කථානායකතුමනි, අපි බලයට එනකොට ජාතික කම්කරු උපදේශක සභාව වසර එකහමාරකින් කැඳවා තිබුණේ නැහැ. අපි මේ වනකොට අවස්ථා 10ක් ජාතික කම්කරු උපදේශක සභාව කැඳවා තිබෙනවා. එම අවස්ථා 10න් 7කදී මේ සේවක අර්ථසාධක අරමුදලේ පරිපාලනය සඳහා යම් ත්‍රෛපාර්ශ්වික ව්‍යුහයක් සකස් කරන්න ඕනෑය කියන එක අපි සාකච්ඡා කරලා තිබෙනවා.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද 2026.07.03 දිනැතිව ජාත්‍යන්තර ප්‍රමිති අනුව මෙවැනි සමාන අරමුදල් කළමනාකරණයන් පිළිබඳ අධ්‍යයනයකින් යුතුව යෝජනා ඉදිරිපත් කර තිබෙනවා, රටවල් ගණනාවක අත්දැකීම් සමඟ.

ලංකා සේවායෝජක සම්මේලනය විසින් ද ත්‍රෛපාර්ශ්වික පාලන ව්‍යුහ පිළිබඳ ජාත්‍යන්තර භාවිතයන් සම්බන්ධයෙන් කරන ලද විද්වත් අධ්‍යයන වාර්තාවක් 2024 වසරේදී NLAC වෙත ඉදිරිපත් කර ඇත.

5. මෙම යෝජනාව තුළින් ඉදිරිපත් කර ඇත්තේ අරමුදල් කළමනාකරණය තුළට එහි සැබෑ හිමිකරුවන්ගේ හඬ ගෙන යා හැකි පාලන ව්‍යුහයක් හඳුන්වා දීමයි. මෙය ශ්‍රී ලංකාව විසින් අපරානුමතිය කර ඇති C144 - Convention No. 144 - ප්‍රඥප්තියට අනුකූලව මෙවැනි සමාජ ආරක්ෂණ අරමුදල් කළමනාකරණය සඳහා රජයේ මෙන්ම සේවා හා සේවක සහභාගිත්වය ද ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

ILO එකේ C144 කියන සම්මුතියට අනුව මෙවැනි ව්‍යුහයක් සකස් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දී තිබෙනවා.

මෙහිදී EPF හා ETF ඒකාබද්ධ කිරීමට ඇති හැකියාව පිළිබඳව - ඒ කියන්නේ පරිපාලන කටයුතු ඒකාබද්ධ කිරීමට ඇති හැකියාව පිළිබඳව - ශක්‍යතා අධ්‍යයනය කිරීම යනු එහි එක් විකල්පයක් පමණි. කෙසේ වුවද, ත්‍රෛපාර්ශ්වික පාලන ව්‍යුහයක් මඟින් එක් ආයතනයක් ලෙස කළමනාකරණය කෙරුණ ද, EPF එකත්, ETF එකත් අරමුදල් දෙකක් වශයෙන් පවතිනවා.

මෙහිදී සමාජ ආරක්ෂණ අරමුදල් කළමනාකරණය සම්බන්ධයෙන් ඉන්දියාව, මලයාසියාව, දකුණු කොරියාව, සිංගප්පූරුව, මාලදිවයින, ජර්මනිය, කෙන්යාව සහ ආර්ථික සංවර්ධනය හා සහයෝගීතාව පිළිබඳ සන්ධානයට අයත් රටවල - OECD countriesවල - තිබෙන ක්‍රමවේද පිළිබඳව අධ්‍යයනය කර ඇත.

6. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මාස තුනක් ඇතුළත කමිටු වාර්තාව ලබා දිය යුතුය.

7. ඔව්.

මෙම ඒකාබද්ධ කිරීම මඟින් පවතින නීතිමය ආරක්ෂණය තවදුරටත් වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරේ. අමාත්‍ය මණ්ඩල පත් කළ කමිටු වාර්තාව මඟින් ඊට අදාළ නිර්දේශ ද - මාස තුනකට පසුව - ඉදිරිපත් කෙරෙනු ඇත.

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් EPF එකේත්, ETF එකේත් මූල්‍ය අවශ්‍යතාව හෝ රාජ්‍ය ණය පියවීම සඳහා සෘජුව හෝ වක්‍රව භාවිත කිරීම වැළැක්වීම සඳහා පවතින නීතිමය ආරක්ෂණය පිළිබඳව කථා කළත්, එවැනි ආරක්ෂණයක් තිබුණා නම් එතුමාත් ප්‍රබල වගකීමක් දරපු ආණ්ඩුවක් පවතිද්දි 2015 වර්ෂයේ සිදුවෙච්ච බැඳුම්කර වංචාවෙන් මෙම අරමුදල්වලට සුවිශාල පාඩුවක් සිදු වුණේ කොහොමද කියන ප්‍රශ්නය මතු වනවා. ඒ විතරක් නොවෙයි. සේවක අර්ථසාධක අරමුදලට 2002 ඉඳලා 2015 පෙබරවාරි 28 දක්වා බැඳුම්කරවලින් සිදුවෙච්ච පාඩුව - අලාභය - රුපියල් බිලියන 9.8ක්. ඒ සම්බන්ධයෙන් කරන ලද චෝහාරික විගණනය - forensic audit - මඟින් ද එය පෙන්වා දී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. කොටස් වෙළෙඳ පොළ ආයෝජනය මඟින් pumping and dumping, එහෙම නැත්නම් වෙළෙඳ පොළ මිල අධිකව ඉහළ ගොස් ඇති වෙලාවක මිලදී අරගෙන 1998 ඉඳලා 2017 දක්වා EPF එකට සිදු කරන ලද පාඩුව රුපියල් බිලියන 9.4ක්. ඒ විතරක් නොවෙයි. ලැයිස්තුගත කරන ලද සමාගම්වල ආයෝජනය කිරීම තුළින් රුපියල් බිලියන 12.4ක හඳුනා නොගත් ආවස්ථික පිරිවැයක් - opportunity cost එකක් - දැරීමට සිදු වූ බව Verité Research ආයතනය මඟින් ඇස්තමේන්තු කරලා තිබෙනවා. ඒ නිසා අප විසින් ඇති කරනු ලබන කුමන හෝ යන්ත්‍රණයක් මඟින් EPF සහ ETF සඳහා එක් ආයතනයක් හෝ වෙනම ආයතනයක වුවත් මා කලින් දැක්වූ ඒ වංචා, දූෂණ, හොරකම් සිදු නොවන ලෙස විනිවිදභාවය තහවුරු කරමින් නියාමන ආයතනවල නිසි අධීක්ෂණයට ලක්වන පරිදි නිශ්චිත ආයතනික රාමුවක් සැලසුම් කරනවා. අප මේ කුමන දේ කළත් මෙම යෝජනා ක්‍රියාත්මක කිරීමට පෙර වෘත්තීය සමිති, සිවිල් සංවිධාන, සේවා යෝජක සංගම් ආදී හැම කොට්ඨාසයකම අදහස් හා යෝජනා සැලකිල්ලට ගන්නත් බලාපොරොත්තු වනවා.

8. EPF එක හා ETF එක පිහිටුවීමෙන් පසු කිසිදු රජයක් විසින් මේ දක්වා එවැනි විධිමත් අධ්‍යයනයක් සිදු කරලා නැහැ.

EPF එක 1958දී පනතකින් පිහිටෙව්වේ. ETF එක පිහිටෙව්වේ 1980දී. එවැනි කිසිදු අධ්‍යයනයක් මේ ගෙවුණු කාල සීමාවට අදාළව කරලා නැහැ, ගරු කථානායකතුමනි.

කෙසේ වුවත්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් පහත පරිදි ක්‍රියා කරනු ලැබේ.

- ගෙවීම් පැහැර හරින අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවලින් හිඟ අය කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කරලා තිබෙනවා. උදාහරණයක් විධියට අර්ධ රාජ්‍ය අංශයේ හිඟ සේවක අර්ථසාධක අරමුදල් සඳහා 2026 අය වැය මඟින් රුපියල් බිලියන 3.4ක් වෙන් කර දී තිබෙනවා.
- මේ වන විට විවෘත වරෙන්තු හා අක්‍රිය වී ඇති නඩු සක්‍රිය කිරීම සඳහා කඩිනම් පියවර ආරම්භ කරලා තිබෙනවා.
- කම්කරු දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත පද්ධතිය ඒකාබද්ධ කර නව දත්ත පද්ධතියක් යටතේ කටයුතු කිරීමට Labour Community Platform නමින් නව මෘදුකාංගයක් - software එකක් - සකස් කරමින් පවතිනවා.
- සේවක අර්ථසාධක අරමුදලේ සේවා, සේවා/සේවක ලියාපදිංචිය මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීමට digital EPF පහසුකම් මේ වනකොටත් අපි සපයා තිබෙනවා. පසුගිය දෙසැම්බර් මාසයේ අපි එය launch කළා, ගරු කථානායකතුමනි.

9. 
- තනි සේවා කවුළුවක් මඟින් EPF එකට සහ ETF එකට අදාළ සියලුම සේවා ලබා ගත හැකි වීම.
- ඒක තනි ආයතනයක් මඟින් කළමනාකරණය කිරීම තුළින් පිරිවැය ඵලදායීත්වයෙන් ඉහළ නංවා ගැනීමට හැකිවීම.
- ත්‍රෛපාර්ශ්වීය සහභාගිත්ව කළමනාකරණයක් තුළින් සාමාජිකයන්ගේ අවශ්‍යතාවන්ට වඩාත් සංවේදීව කටයුතු කළ හැකිවීම.
- සාමාජිකයන්ට වැඩි ප්‍රතිලාභ ලබා දිය හැකිවීම. උදාහරණ විධියට ගත්තොත්, සහන පොලියට නිවාස ණය, වෛද්‍යාධාර වැනි සහන ලබා දීම.
- ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංගමය සහ ආර්ථික සංවර්ධනය හා සහයෝගීතාව පිළිබඳ සන්ධානය මඟින් තොරතුරු හෙළිදරව් කිරීමේ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම හේතුවෙන් විනිවිදභාවය හා වගවීම වැඩිදියුණු කිරීම.

බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සාමාන්‍යයෙන් මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාත්, මමත් බොහෝදුරට මේ සභාවේ බොහොම වේගවත්ව අදහස් හුවමාරු කරගත් අවස්ථා රැසක් තිබෙනවා. නමුත් මේ අවස්ථාවේ මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, අහපු ප්‍රශ්නයට විධිමත් පිළිතුරක් ලබා දීම ගැන. ඒ විධිමත් පිළිතුර තුළ ඔබතුමා පැහැදිලි කළා, මේ ඒකාබද්ධවීම තුළ අරමුදල් එකතු වීමක් වෙන්නේ නැහැ, නමුත් මෙය පරිපාලනමය වශයෙන් වඩාත් කාර්යක්ෂම කරන්නට වැඩ පිළිවෙළක් යොදනවා කියලා. මම ඔබතුමාට යෝජනාවක් කරනවා, මේ යෝජිත වෙනස් කිරීම් පිළිබඳව ඔබතුමාත්, ඔබතුමාගේ නිලධාරිනුත් සමඟ අපට මේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කරන්න අවස්ථාවක් ලබා දෙන්න කියලා. මොකද, වැඩ කරන ජනතාවගේ අරමුදල් සුරක්ෂිත කිරීම අපි හැමෝගේම බලාපොරොත්තුවයි. ඒ නිසා මේ සම්බන්ධව අපටත් යෝජනා රැසක් තිබෙනවා. ඒ යෝජනා ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දෙන්න.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කෙසේ නමුත්, ඔබතුමාගේ පිළිතුරෙන් මතුවුණු කරුණු කිහිපයක් ගැන මම ප්‍රශ්න කරන්න කැමැතියි. ඔබතුමා කිව්වා, බැඳුම්කර ක්ෂේත්‍රයේ සිදුවුණු ගනුදෙනු තුළ ලොකු පාඩුවක් සිදුවුණා කියලා. ඒ ගණනත් ඔබතුමා කිව්වා. ඒ වාගේම pumping and dumping තුළ සිදුවුණු පාඩුව ගැනත් ඔබතුමා කරුණු ඉදිරිපත් කළා. මම ඔබතුමාට යෝජනා කරනවා, ඒ සිදුවුණු පාඩුව රජයට ආපසු ලබා ගැනීමට නෛතික ක්‍රමවේදයක් අවශ්‍යයි කියලා. ඒ වාගේම ඒ වැරදි කරපු අයට එරෙහිව නිසි ක්‍රියාමාර්ග අරගන්න ඕනෑ. මොකද, මේවා රටේ වැඩ කරන ජනතාවගේ සල්ලි.ඒ නිසා ඒවා ලබා ගන්න වැඩ පිළිවෙළක් යොදන්න.

ඒ වාගේම මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමතියි. මම ප්‍රශ්නයක් ඇහුවා, IMF ගිවිසුම හරහා ETF එකට, EPF එකට පික්පොකට් ගහපු එක ගැන. මොකද, වැඩ කරන ජනතාවගෙන් තමයි ඒ මුදල කපා ගත්තේ. උග්‍ර පොහොසතුන්ට - බිලියනපතියන්ට, ට්‍රිලියනපතියන්ට - අත තැබුවේ නැහැ; බැංකු ක්ෂේත්‍රයට අත තැබුවේ නැහැ; ඒ වාගේම primary bond dealersලාට අත තැබුවේ නැහැ. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ - local debt restructuring - වැඩ පිළිවෙළ තුළ ඇත්තවශයෙන්ම වැඩ කරන ජනතාවගේ අරමුදල්වලින් තමයි ඒ කප්පාදුව සිදු වුණේ. ඒ සිදු වුණු අඩුපාඩුව, ඒ වරද නිවැරදි කරන්නට කරුණාකරලා ඉක්මනින්ම පියවර ගන්නය කියන කාරණය කෙරෙහි මම ඔබතුමාගෙත්, රජයේත් අවධානය යොමු කරවනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, මේ වනකොට මේ රටේ සිදු වෙච්ච සියලු වංචා සහ දූෂණ හෙළිදරව් කරමින් වංචනිකයන්ට, දූෂිතයන්ට අදාළව නීතිය ක්‍රියාත්මක කරමින් තිබෙන බව. බැඳුම්කර වංචාව වෙන්න පුළුවන්, සඳහන් කරපු අනෙකුත් වංචා වෙන්න පුළුවන්, ඊට අදාළව නීතිය ක්‍රියාත්මක වෙනවා.

ගරු කථානායකතුමනි, 2023 අවුරුද්දේ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයේදී සේවක අර්ථසාධක අරමුදලට පාඩුවක් සිදු වුණාය කිව්වා. මෙවැනි දේවල් සිදු වුණේ අපි යෝජනා කරන මෙන්න මේ ත්‍රෛපාර්ශ්වීය, ඒ කියන්නේ මේ අරමුදල්වල භාරකරුවන් මේ පාලනයෙන් ඉවත් කර තිබීම නිසායි. ඔවුන් භාරකරුවන් වුණා නම්, මේ පාලනයට සම්බන්ධ වෙලා හිටියා නම් එහෙම දෙයක් වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. දැනට මේ අරමුදල් දෙක අංශ තුනකින් පාලනය වෙනවා. මේකේ පරිපාලන කටයුතු - හිඟ අය කර ගැනීම්, බඳවා ගැනීම ආදී කටයුතු - අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන කම්කරු දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලබනවා. ඊළඟට, සේවක අර්ථසාධක අරමුදල - EPF එක - තිබෙන්නේ මහ භාණ්ඩාගාරය සතුවයි. සේවක භාරකාර අරමුදල - ETF එක - තිබෙන්නේ මුදල් අමාත්‍යාංශය සතුවයි. ඒ නිසා තමයි මේ ඒකාබද්ධ ජාත්‍යන්තර අත්දැකීම් එක්ක පාලන ව්‍යුහයක් යෝජනා කර තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න. විශේෂයෙන්ම විපක්ෂයේ සමහරු - හැමෝම නොවෙයි - අපි කියනවා වාගේ කොරහේ කිඹුල්ලු දකිනවා. එහෙම නැත්නම් පොතට කලින් හැම දාම පිට කවරය තමයි බලන්නේ. ඒ වාගේම එළියෙත් සමහර වෘත්තීය සමිති ඉන්නවා, මේ විධියටම කොරහේ කිඹුල්ලු දකින, පොතට කලින් පිට කවරය පමණක් කියවන. දැන් මේ තිබෙන්නේ පිට කවරය පමණක් කියවලා. අපි මාස තුනක් ඇතුළත වාර්තාවක් ගන්න කමිටුවක් පත් කරලා තිබෙන්නේ. දැන් මේ කමිටුවේ කරන්නේ මොනවාද, මේකට වෙන්න යන්නේ මොනවාද කියන ඔක්කෝම අහනවා. ගරු විපක්ෂ නායකතුමාත් යෝජනා කළ පරිදි කමිටුවේ නිර්දේශ ආවාට පස්සේ වෘත්තීය සමිති, සේවා යෝජකයන් සහ රජය නියෝජනය වන අපගේ ත්‍රෛපාර්ශ්වීය ආයතනය වන NLAC එක වෙත මෙය යොමු කරනවා. ඒ වාගේම ඔබතුමා යෝජනා කළ පරිදි අනෙකුත් සංවිධාන සමඟත් සාකච්ඡා කර එම වාර්තා මත පදනම් වෙමින් අපිට පාර්ලිමේන්තුවේදීත් මේ පිළිබඳව සාකච්ඡා කරන්නට පුළුවන්. ඒ අනුව අපි වඩාත් හොඳ යෝජනා සහ අදහස් අරගෙන මේ ක්‍රියාවලිය හොඳම තැනකට ගෙන ඒමට අවශ්‍ය කටයුතු කරමු. මේක කිසිසේත්ම ඉතිහාසයේ සිද්ධ වුණු ආකාරයට මේ අරමුදල් විනාශ වෙන්න, මංකොල්ල කන්න, මේ අරමුදල්වලට අත තියන ව්‍යුහයක් නොවෙයි. ඒවා ආරක්ෂා කරන ව්‍යුහයක් තමයි අපි මේ සකසන්න හදන්නේ. ඒකට අදාළ කරන යෝජනා දෙන්න කියලා තමයි අපි මෙවැනි කමිටුවක් පත් කරලා තිබෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

## II

## සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ඩිජිටල් ලියාපදිංචි පද්ධතිය නවීකරණය කිරීම

### கம்பனிகள் பதிவாளர் திணைக்களத்தில் டிஜிட்டல் பதிவுத் தளத்தை நவீனமயமாக்கல்

### MODERNIZATION OF DIGITAL REGISTRATION PLATFORM OF DEPARTMENT OF REGISTRAR OF COMPANIES

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි කිරීම හා සමාගම් නියාමනය සඳහා ප්‍රධාන ව්‍යවස්ථාපිත ආයතන වන සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව කාර්යක්ෂම, සුරක්ෂිත හා විනිවිදභාවයෙන් යුතු ඩිජිටල් ලියාපදිංචි පද්ධතියක් පවත්වා ගෙන යාම ශ්‍රී ලංකාවේ ආයෝජන පරිසරය, ව්‍යාපාර කිරීමේ පහසුව, ආයතනික පාලනය, මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මූල්‍ය සැපයීම වැළැක්වීම - AML/CFT - සහ ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන අතර, මෙහි ප්‍රමාදයන්, පද්ධති අක්‍රිය වීම් සහ දුර්වල සේවා සැපයීම පිළිබඳ පැමිණිලි රැසක් තවදුරටත් පවතින බැවින්, ගරු වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් මම පහත සඳහන් ප්‍රශ්න විමසනවා.

1. අද දිනට ලියාපදිංචි කර ඇති සමස්ත සමාගම් සංඛ්‍යාව, ඒවායේ වර්ග අනුවත්, සක්‍රිය හා අක්‍රිය සමාගම් ලෙසත් වෙන වෙනම කොපමණද?
2. දැනට විභාග වෙමින් පවතින සමාගම් සංස්ථාපනය අයදුම්පත්, සමාගම් නාම වෙන් කිරීමේ අයදුම්පත් සහ නීතිමය ගොනු කිරීම් - statutory filings - සංඛ්‍යාව, පැරණිතම අයදුම්පත කුමක්ද සහ එක් එක් සේවාව සඳහා සාමාන්‍ය සැකසුම් කාලය කොපමණද?

ගරු කථානායකතුමනි, ASYCUDAවලින් මේවා එළියට ගිහිල්ලා තිබෙන්නේ. එදා Public Finance Committee එකට පොලිසිය පැමිණි වෙලාවේදී කියා තිබෙනවා, ලියාපදිංචි කිරීමට මේක check කරන්න බැහැ කියලා. මේ වෙලාවේ ගරු අගමැතිතුමිය සභාවේ සිටින නිසා මම කාරුණිකව ඉල්ලීමක් කරනවා, කැබිනට් මණ්ඩලය හරහා ඒ සම්බන්ධව සොයා බලන්න කියලා. මොකද, ASYCUDA linkage එකේ තිබෙන එක අත්‍යවශ්‍ය කරුණක්. මේක මාස තුනක් වැඩ නැහැ. කොම්පැනි 3,300ක් මේ තුළ හිර වෙලා තිබෙනවා කියා දැනුවත් කර තිබෙනවා.

3. වර්තමානයේ නව සමාගමක් සංස්ථාපනය කිරීම සඳහා සාමාන්‍යයෙන් ගත වන කාලය කොපමණද?

4. පසුගිය මාස දෙක තුළ සමාගම් සංස්ථාපන අයදුම්පත් 3,500ක් පමණ ප්‍රමාද වී ඇති බව සත්‍යයක්ද? එසේ නොවේ නම්, දැනට ප්‍රමාද වී ඇති සත්‍ය සංඛ්‍යාව කොපමණද? එම ප්‍රමාදයට හේතු කවරේද?

5. ඉලෙක්ට්‍රොනික සමාගම් ලියාපදිංචි කිරීමේ පද්ධතිය - that is, electronic registration of companies - සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන්නේද? එසේ නොවේ නම්, පසුගිය වසර තුන තුළ සිදු වූ පද්ධති බිඳ වැටීම්, සේවා බාධා කිරීම් සහ පද්ධතියේ ක්‍රියාකාරීත්ව ප්‍රතිශතය - system uptime - කොපමණද?

6. KPMG ආයතනය - ඒ කියන්නේ financial audit firm එකක් - ඇතුළු බාහිර උපදේශකයන්ගේ සහාය ඇතිව සංවර්ධනය කරන ලද පෙර ඉලෙක්ට්‍රොනික ලියාපදිංචි පද්ධතියක් අත්හිටුවා ඇත්ද? එසේ නම් ඊට හේතු, ඒ සඳහා වැය වුණු මුළු වියදම, වර්තමානයේ එම පද්ධතිය ක්‍රියාත්මක හා නඩත්තු කරනු ලබන ආයතනය කුමක්ද සහ එය ජාත්‍යන්තර ඩිජිටල් පාලන හා සයිබර් ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූලද?

Sir, at a time when there are cybercrimes taking place, this is essential to check the on-the-spot situation of a company whether by the Police, the Registrar of Companies or the Customs. So, I beg of you to please ensure that this is looked into and that necessary action is taken with immediate effect.

7. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව ASYCUDA World පද්ධතිය සමඟ ඉලෙක්ට්‍රොනිකව ඒකාබද්ධ කර තිබේද? එසේ නම්, කුමන දිනයේ සිටද? එසේ නොවේ නම්, එය ක්‍රියාත්මක නොවීමට හේතු මොනවාද සහ එම තත්ත්වය කොපමණ කාලයක් පවතින්නේද?

8. සියලුම සමාගම් නීතියෙන් නියමිත සැබෑ හිමිකාරීත්ව - beneficial ownership - තොරතුරු ඉදිරිපත් කිරීමේ අවශ්‍යතා සපුරා තිබේද? එසේ නොමැති නම්, පැහැර හැර ඇති සමාගම් සංඛ්‍යාව, ඒවාට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග මොනවාද? එම තොරතුරු සත්‍යාපනය කර මූල්‍ය බුද්ධි ඒකකය - FIU - සහ අදාළ AML/CFT බලධාරීන් සමඟ හුවමාරු කරන්නේද?

මම ඉතාම ඕනෑකමින් කියන්න ඕනෑ, අද වනවිට ව්‍යාපාරික ලෝකය ඉතා භයෙන් තමයි ගමන් කරන්නේ කියන කාරණය. මොකද, ව්‍යාපාර කරන්න තිබෙන වාතාවරණය - atmosphere එක - නැති වෙලා තිබෙනවා. මේ වාගේ කළොත් කොම්පැනි තිබේවි, බිස්නස් නැති වේවි, ආදායම් උපයන්න මාර්ග නැති වේවි. මේවායෙන් සියයට 98ක් පමණ බොහොම නිවැරදිව, හරියට කරනවා. සියයට එකක්, දෙකක් පමණ පව්කාර ලෙස කරන්න ගිහින් සමස්ත පද්ධතිය නැති කරන්න එපා කියලා මම ගරු ඇමතිතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

9. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර ස්ථිර පදනමක් මත දැනට පුරවා තිබේද? එසේ නොවේ නම්, ඊට හේතු සහ ස්ථිර පත්වීම සිදු කරන දිනය කවදාද?

10. සමාගම් සංස්ථාපනය, ලියාපදිංචි කිරීම් සහ අනුමත කිරීම් සඳහා නියමිත සේවා ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීම, ඩිජිටල් ලියාපදිංචි පද්ධතිය නවීකරණය කිරීම සහ එහි ඩිජිටල් පරිවර්තනය සම්පූර්ණ කිරීම සඳහා රජය කටයුතු කරන්නේද? එසේ නම්, එය ක්‍රියාත්මක කිරීමේ කාලසටහන කුමක්ද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මා කල් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
### தனி உறுப்பினர் சட்டமூலங்கள்
### PRIVATE MEMBERS' BILLS

## ආර්ථික සහ ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### பொருளாதார மற்றும் கிராமிய மூலவளங்கள் அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### ECONOMIC AND RURAL RESOURCES DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

> "ආර්ථික සහ ග්‍රාමීය සම්පත් සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Rural Development, Social Security and Community Empowerment for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. You have 17 minutes.

## අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයාට එරෙහි විශ්වාස භංග යෝජනාව
### நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை
### VOTE OF NO-CONFIDENCE AGAINST MINISTER OF JUSTICE AND NATIONAL INTEGRATION

[පූ.භා. 11.27]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු දිලිත් ජයවීර මහතා
ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු ජේ.සී. අලවතුවල මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු කබීර් හෂීම් මහතා
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා
ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු අමිල ප්‍රසාද් මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු බී. ආරියවංශ මහතා
ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු සුරංග රත්නායක මහතා
ගරු රෝහණ බණ්ඩාර මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු ජගත් විතාන මහතා
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු ඩී.වී. චානක මහතා
ගරු චානක මාදුගොඩ මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා,- අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාට එරෙහි විශ්වාස භංගත්වය,- 2026 ජූලි මස 05 සහ 06 යන දිනවල මීගමුව

බන්ධනාගාරය තුළ රැඳවියන් කණ්ඩායම් අතර ඇති වූ ගැටුම් හේතුවෙන් බන්ධනාගාර නිලධාරින් සහ රැඳවියන් ඇතුළු පුද්ගලයන් 31 ක් මිය ගොස් ඇති අතර, 100කට වැඩි පිරිසක් තුවාල ලබා ඇති හෙයින්ද;

මෙය රටේ මෑත ඉතිහාසයේ බන්ධනාගාරයක් තුළ සිදු වූ බරපතළම ගැටුමක් වන අතර, එමඟින් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ පවතින බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය සහ ආරක්ෂක කළමනාකරණය පිළිබඳව බරපතල ගැටලු මතු වී ඇති හෙයින්ද;

මීගමුව බන්ධනාගාරයේ අවි ආයුධ හා ආරක්ෂිත උපකරණ සුරක්ෂිතව පවත්වා ගැනීමට අපොහොසත් වීම සහ රැඳවියන් අතර ගැටුම් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග නොගැනීම යනාදිය බන්ධනාගාර පරිපාලනයේ දරුණු අකාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරන හෙයින්ද;

2026 ජූලි මස 05 ගැටුම ආරම්භ වූ දින එය නිරාකරණය කිරීම සඳහා කඩිනමින් ප්‍රමාණවත් සහ කාලෝචිත පියවර ගැනීමට අධිකරණ විෂය භාර අමාත්‍යවරයා අපොහොසත් වීම තුළ ජූලි මස 06 වන දින ගැටුම් තීව්‍ර වූ බැවින්ද;

පූර්ව සැලසුමකින් තොරව රාජ්‍ය නිලධාරින් වන බන්ධනාගාර නිලධාරින් ගැටුම සිදු වූ ස්ථානයට යොමු කිරීම තුළින් එම නිලධාරින්ගේ ජීවිත අනතුරකට දැමූ හෙයින්ද;

රාජ්‍ය බන්ධනාගාර පද්ධතිය තුළ රැඳවියන්ගේ හා නිලධාරින්ගේ ජීවිත ආරක්ෂා කිරීමේ අවසාන වගකීම දරන අධිකරණ විෂය භාර අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීමට අසමත් වී ඇති බව මෙම ගරු සභාව විශ්වාස කරන හෙයින්ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අධිකරණ විෂය භාර අමාත්‍යවරයාට පවරා ඇති බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය සහ බන්ධනාගාරවල යටිතල පහසුකම් සංවර්ධනය හා තදබදය අඩු කිරීම යන කාර්යයන් වගකීම් සහිතව ඉටු කර නොමැති හෙයින්ද;

"පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ බන්ධනාගාරය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයා අපොහොසත් වීම තුළ ජනතාව විසින් ලබාදුන් ජනවරමට විරුද්ධ වී ඇති හෙයින්ද; සහ

ඉහත සඳහන් කළ කරුණු අනුව, අධිකරණ විෂය භාර අමාත්‍යවරයාට පැවරී ඇති කාර්යයන් වගකීමෙන් ඉටුකර නොමැති බැවින් සහ පැවරී ඇති කාර්යයන් පිළිබඳව අමාත්‍යවරයා වගවීමක් රහිතව කටයුතු කරන බව බැලූ බැල්මටම පෙනී යන හෙයින්;

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාට තවදුරටත් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ධුරයේ කටයුතු නිසි පරිදි ඉටු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

ගරු කථානායකතුමනි, මේ රටේ ඉතිහාසයේ බන්ධනාගාර පරිපාලනය හා සම්බන්ධව ඇති වුණු ඉතාම බරපතළ, කනගාටුදායක සිදුවීම මේක. ඒ වාගේම, මේ සිද්ධියෙන් රැඳවියන් විශාල සංඛ්‍යාවක් වාගේම නිලධාරින් විශාල පිරිසක් මිය ගියා. ඉතිහාසයේ නිලධාරින් දසදෙනෙකු මිය ගිය මෙවැනි සිදුවීමක් කවදාවත් වාර්තා වෙලා නැහැ. මෙහිදී සම්පූර්ණයෙන් 31දෙනෙක් මිය ගිහිල්ලා කෝටි- ප්‍රකෝටි ගණනක දේපළ විනාශ වුණා, සිය ගණනකට තුවාල සිදු වුණා. මෙය අපේ රටේ ඉතිහාසයේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය හා සම්බන්ධව සිදු වුණු ඉතාම අවාසනාවන්ත සිදුවීමක්. මෙවැනි වෙනත් අවස්ථා මේ රටේ තිබිලා තිබෙනවා.

2020 නොවැම්බර් 30වැනි දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1143හි මෙසේ සඳහන් වී තිබෙනවා:

"බන්ධනාගාරගත වෙලා, සිරගත වෙලා සිටින අය රාජ්‍ය භාරයේ සිටින අය බව අපි කවුරුත් දන්නවා. ඔවුන් රිමාන්ඩ් භාරයේ සිටින අය වෙන්න පුළුවන්, සිරකරුවන් වෙන්න පුළුවන්. ඔවුන් ඉන්නේ රාජ්‍යය භාරයේ. එම නිසා රාජ්‍ය භාරයේ සිටින සිරකරුවන් සහ එම රැඳවියන්ගේ ජීවිත ආරක්ෂාව පිළිබඳ මූලික වගකීම තිබෙන්නේ ආණ්ඩුවට."

නිලධාරින් පිළිබඳවත් ආණ්ඩුවට තිබෙන්නේ ඒ වගකීම. මේ කියා තිබෙන්නේ වෙන කවුරුවත් නොවෙයි, වර්තමාන ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා. එතුමාම කියපු ආකාරයට බන්ධනාගාර රැඳවියන් මෙන්ම බන්ධනාගාර නිලධාරින්ගේත් ජීවිත ආරක්ෂා කිරීම රාජ්‍යයේ වගකීමක්. ඒ වගකීම පිළිබඳව වර්තමාන ඇමතිතුමා දන්නවා. ඒ නිසා තමයි ඒ සිදුවීමෙන් පස්සේ එතුමා කිව්වේ, "මේකේ වගකීම මම භාර ගන්නවා" කියලා. හැබැයි, වගකීම භාර ගැනීම හුදු ප්‍රකාශයකට පමණක් සීමා වුණා. වගකීම භාර ගැනීම වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදාය අනුව ඉවර වෙන්නේ ඉල්ලා අස්වීමෙන්.

මීට කලින් 1988 නොවැම්බර් මාසයේ 11 වැනිදා වැලිකඩ බන්ධනාගාරයේත් එවැනි සිදුවීමක් වෙලා රැඳවියන් දෙදෙනෙකු මිය ගියා. ඒ අවස්ථාවේදී අධිකරණ හා බන්ධනාගාර විෂය භාර ඇමතිවරයා, ආචාර්ය නිශ්ශංක විජයරත්න මැතිතුමා වාගේම එතුමාගේ නියෝජ්‍ය ඇමතිතුමාත් ඉල්ලා අස්වුණා. ඒක තමයි වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදාය. ඒ සම්ප්‍රදායය ගොඩනඟනවාය කියලා තමයි මේ රජය බලයට පත් වුණේ. නමුත් අපේ ඇමතිතුමා එහෙම ඉල්ලා අස්වුණේ නැහැ.

ගරු කථානායකතුමනි, බන්ධනාගාර අර්බුදයට බලපාන ප්‍රධාන කාරණා හතරක් තිබෙනවා. පළමුවැනි එක, නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය. නීතිපති දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය අතිශයින් ප්‍රමාදයි; ගුණාත්මකභාවයෙන් පහළයි. ඒ පිළිබඳව කටයුතු කිරීමට ස්වාධීන අභිචෝදක කාර්යාලය පිහිටුවීමට පොරොන්දු වුණා. එය ඉටු කළේ නැහැ. ඒ වාගේම නඩු පැවරීමේ ක්‍රියාදාමය අතිශයින් පරක්කුයි; අකාර්යක්ෂමයි. Prosecution guidelines අරගෙන ඇවිල්ලා නඩු පැවරීමේ ප්‍රතිපත්තිය ලේඛනගත කරන්න එකඟ වුණා, මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන්. ඒක කළේ නැහැ. ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුව නිසි ලෙස කටයුතු කරනවාද, නොකරනවාද කියලා යම් පුරවැසියෙකුට යම් දුක්ගැනවිල්ලක් ඇති වුණාම ඒ පිළිබඳව විමර්ශනය කරන්න පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරයෙකු - a special Ombudsman - පත් කිරීම සඳහා පොරොන්දුවක් දීලා තිබෙනවා. ඒක කළේත් නැහැ. ඒ වාගේම පළාත්බද නීතිපති කාර්යාල පිහිටුවලා, නීතිපති දෙපාර්තමේන්තුවේ බර සැහැල්ලු කරන්න, පරිපාලනය විධිමත් කරන්න පොරොන්දු වුණා. ඒක කළේත් නැහැ. ඒ වගකීම තිබෙන්නේ ඇමතිතුමාට. එතකොට බන්ධනාගාර හා සම්බන්ධ, රැඳවියන්ට යුක්තිය ඉටුවීම හා සම්බන්ධ ප්‍රධාන පාර්ශ්වයක් වන නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රතිසංස්කරණ කරන්න, ගරු ජනාධිපතිතුමා බලයට පත් වෙලා දැන් වසර දෙකක් ගත වෙලාත්, රජය බලයට පත්වෙලා වසර දෙකකට ආසන්න කාලයක් ගත වෙලාත්, ඇමතිතුමා දැන් අවුරුදු දෙකකට ආසන්න කාලයක් තිස්සේ මේ ඇමති ධුරය දැරුවත් සම්පූර්ණයෙන් අසමත් වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාරයේ ඇති වෙලා තිබෙන මේ අර්බුදයේ තවත් ප්‍රධාන පංගුකරුවෙක් තමයි රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව. සාමාන්‍යයෙන් අපි විශ්වාස කරනවා, මාස තුනක් ඇතුළතවත් වාර්තාවක් ලබා ගන්න පුළුවන් නම් ඒක නිවැරදි, ප්‍රමාණවත් තත්ත්වයක් කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ ඉන්න සම්පූර්ණ රැඳවියන් සංඛ්‍යාව 41,114ක්. එයින් මත්ද්‍රව්‍ය හා සම්බන්ධ සැකකරුවන් සංඛ්‍යාව 32,623ක්. රස පරීක්ෂක වාර්තා නොමැතිවීම නිසා 2026.05.31 දිනට ඇප ලබා ගැනීමට නොහැකිව සිටින රැඳවියන් සංඛ්‍යාව 15,607ක්. ඒ කියන්නේ බන්ධනාගාර තුළ සිටින සම්පූර්ණ රැඳවියන්ගෙන් තුනෙන් එකකටත් වැඩි ප්‍රමාණයක් බන්ධනාගාර තුළ ඉන්නේ, රස පරීක්ෂක වාර්තා නොමැතිවීම නිසා. මේ ප්‍රශ්නය අවබෝධ කරගෙන තිබුණා. මේ පිළිබඳව නිසි ප්‍රතිපාදන සලසලා, පළාත්බද රස පරීක්ෂක කාර්යාල පිහිටුවීම පිළිබඳවත් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවක් තිබෙනවා. ඒ සියලු පොරොන්දු අමතක කළා විතරක් නොවෙයි, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සකර්මණ්‍ය තත්ත්වයට පත් කරන්න; එහි වේගය වැඩි කරන්න අද වෙනකල් ප්‍රමාණවත් පියවර ගැනීමට පවා අසමත් වෙලා තිබෙනවා. යෝජනා පමණයි! ප්‍රතිඵලයක් නැහැ, අවුරුදු දෙකක් ගිහිල්ලාත්. මේ බන්ධනාගාර තුළ ඉන්න මත්ද්‍රව්‍ය හා සම්බන්ධ සැකකරුවන්ගේ ප්‍රශ්නය නිසා බන්ධනාගාර තුළ ගැඹුරු අර්බුදයක් මතු වී තිබෙන බව මීට කලින් අවස්ථා ගණනාවකදී මමත්, මේ පර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ - දෙපක්ෂයේම - මන්ත්‍රීවරුනුත් මේ පාර්ලිමේන්තුවේදී සඳහන් කරලා තිබෙනවා. එසේ තිබියදීත් ප්‍රමාණවත් පියවර ගන්න ඇමතිතුමා අසමත් වෙලා තිබෙනවා. ඒක ඇමතිතුමාගේ වගකීම.

ඒ වාගේම, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රතිසංස්කරණ විධියට කළ යුතු දේවල් මොනවාද කියලා හඳුනාගත් ලැයිස්තුවක්ම ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 209 පිටුවේ තිබෙනවා. අවාසනාවට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කිසිවක් කරලා නැහැ. ඒ වාගේම අධිකරණ කටයුතුවලදී විශාල ගැටලුවක් ඇති වෙලා තිබෙනවා, මීට කලින් කරපු සංශෝධනයක් නිසා; මේ රජය එන්න කලින් කරපු සංශෝධනයක් නිසා. අයිස් සහ හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10ට වැඩි අවස්ථාවකදී ඇප ලබා දීම අභියාචනාධිකරණය වෙත පැවරීමේ ප්‍රතිඵලයක් හින්දාත්, රස පරීක්ෂක වාර්තා පැමිණීම වසරකට වඩා වැඩි කාලයක් ගත වීමට තරම් ගැඹුරු අර්බුදයක් ඇති වෙලා තිබෙන හින්දාත් අතිවිශාල පිරිසකට ඇප ලබා ගැනීමට නොහැකි වුණා. ඒ නිසා මේ ඇප නීතිය සංශෝධනය කළ යුතු බවට ශ්‍රී ලංකා නීතිඥ සංගමයත්, ඒ වාගේම නීතිඥ ප්‍රජාවත්, අධිකරණ අමාත්‍යාංශයත්, නීතිපති දෙපාර්තමේන්තුවත් ඉතා විස්තරාත්මකව සාකච්ඡා කරලා මේ පිළිබඳ අවසන් කෙටුම්පත 2025 ජනවාරි මාසය වනකොට හදලා තිබුණා. ජනාධිපති නීතිඥ යූ.ආර්. ද සිල්වා මැතිතුමා මේ පිළිබඳව නිශ්චිතවම අපට තොරතුරු ලබා දීලා තිබෙනවා. 2025 ජනවාරි මාසය වනකොට ඒ අවසන් කෙටුම්පත හදලා ඉවරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාරයේ මේ කියන සිදුවීම වෙන්නේ හත්වෙනි මාසයේ 05වෙනි දා සහ 06වෙනි දා. ජනවාරියේ ඉඳන් මේ වන කොට මාස 7ක් ගත වෙලාත් ඒ කෙටුම්පතට නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන, ඉන්පසුව ඒක කැබිනට් මණ්ඩලයට යොමු කරන්න බැරි වුණා. මේ සිදුවීමට පසුව තමයි ඒ කෙටුම්පත කැබිනට් මණ්ඩලයට යොමු කළේ. එය මොන තරම් ලජ්ජාවක්ද, මොන තරම් ප්‍රමාදයක්ද, මොන තරම් පසුගාමී තත්ත්වයක්ද? ඒ කියන්නේ, මේ ගැන සංවේදීකමක් නැහැ. 15,000කට වැඩි රැඳවියෝ ප්‍රමාණයක් ඉන්නේ ඇප ගන්න බැරිව. මුළු බන්ධනාගාරවල ආයතන තිබෙනවා, විශාල ප්‍රමාණයක්. ඒ සම්පූර්ණ ආයතන සංඛ්‍යාව 37ක්. ඒ 37 තුළ තියාගන්න පුළුවන් පූර්ණ ධාරිතාව 10,801යි. ඒවා තුළ 41,114ක් ඉන්නවා. ඒ අයගෙන් 15,000කටම ඇප ගන්න පුළුවන්කමක් නැහැ, රස පරීක්ෂක වාර්තා නැතුව. ගැඹුරු අර්බුදයක්. උත්තරය දන්නවා. කළ යුතු දේ දන්නවා. එය ඇප නීතියේ ප්‍රශ්නයක් බව හඳුනා ගත්තා. ඒ ඇප නීතිය සංශෝධනය කිරීමට කෙටුම්පත් සකස් කළා, සියලු පාර්ශ්වයන් එකතු වෙලා. හැබැයි, සකස් කරලා අවසානාත්මක කෙටුම්පත ඉදිරිපත් කළේ නැහැ, නිසි පියවර අනුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ ඇමති නොකර වෙන කවුද ඒවා කරන්නේ? කෘෂිකර්ම ඇමති කරන්නද? ඉඩම් ඇමති කරන්නද? ජනාධිපතිතුමාට මේවාට වෙලාව තිබෙනවාද? අගමැතිතුමියට කොච්චර වුවමනාවක් තිබුණත් ඒක කරන්න හැකියාවක් තිබෙනවාද? නැහැ. මේක අධිකරණ ඇමතිගේ රාජකාරිය. නමුත් ඒක කළේ නැහැ. මේ සිදුවීමෙන් පස්සේ තමයි මේ හැම දේම දැන් මතක් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, තමන්ගේ යුතුකම මොකක්ද කියලා එතුමා හඳුනා ගත්තේ නැහැ. ජූලි මාසයේ 05වෙනි දා පෙර වරු 11.00ට තමයි මේ ගැටුම් ඇති වුණේ. ජූලි මාසයේ 05වෙනි ඉරිදා පස් වරු 1.00 වනකොට දෙදෙනෙකු මිය ගිහිල්ලා, 20ක් තුවාල වෙලා කියලා රෝහල මඟින් ආරංචිය ලැබෙනවා; ජනමාධ්‍ය හරහා ආරංචිය ලැබෙනවා. පහුවදා උදෑසන 9.00ට, 9.30ට විතර නැවත දෙවෙනි කැරැල්ල ඇති වෙනවා. ඒ වන විටත් මේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමා මේ පිළිබඳව සකර්මණ්‍ය ලෙස මැදිහත් වුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි පළමු සිදුවීම වෙන්නේ 05වෙනි දා; දෙවැනි සිදුවීම වෙන්නේ 06වෙනි දා. මේ පාර්ලිමේන්තුවේ ජූලි මාසයේ 07වෙනි දා ඇමතිතුමා ප්‍රකාශයක් කරනවා, අමාත්‍යවරයාගේ ප්‍රකාශයක් මඟින්. මෙවැනි අවස්ථාවක අපි සාමාන්‍යයෙන් අපේක්ෂා කරන්නේ අමාත්‍යවරයා නිවැරදි ප්‍රකාශයක් කරයි කියලා; විශ්වාසවන්ත ප්‍රකාශයක් කරයි කියලා. පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරන කොට ඒකේ බරක් තියෙනවා. එතුමා ඊට කලින් දවසේ කිව්වා, මට යන්න ඕනෑ බලන්න කියලා. 06 වෙනිදා සවස කිව්වේ. ඒ කියන්නේ සඳුදා සවස. "මට social media පැය දෙකක් තිස්සේ බලන්න බැරි වුණා; social mediaවලින් තොරතුරු ලබා ගන්න බැරි නිසා මැරිච්ච ගාණ මට කියන්න බැහැ, මම මේ පිළිබඳව හොයලා බලන්නම්" කියලා මාධ්‍යයට කිව්වා. අඩු ගාණේ එතුමාට සවස් වරුවේවත් මේ නියම තොරතුරු ලබා ගන්න පුළුවන්කම ලැබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුවදා උදේ මේ පාර්ලිමේන්තුවට එතුමා දීපු පිළිතුරේ මොකක්ද කියන්නේ? එතුමා කියනවා, "මම මගේ කොටස වශයෙන් හෙට උදෑසන - ඒ කියන්නේ 08 වෙනිදා - 7.30 වනකොට බන්ධනාගාරවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සියලුදෙනා කැඳවලා තිබෙනවා, මේ වුණු ගැටලුව කුමක්ද කියලා දැන ගන්න" කියලා. ඒ කියන්නේ, මේ පාර්ලිමේන්තුවට මේ තොරතුරු කියද්දීත්, එතුමා දන්නේ නැහැ මොකද වුණේ කියලා. එතුමා හිතන්නේ මේ පශ්චාත් පරීක්ෂණ පැවැත්වීම තමයි එතුමාගේ රාජකාරිය කියලා. ඇමති කෙනෙකුට තිබෙන්නේ විධායක බලයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොනවාද මෙතුමාට ලැබිලා තිබෙන බලය, කැබිනට් ඇමතිවරයෙකු හැටියට? 2024.11.25වන දා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

අති විශේෂ ගැසට් නිවේදනය මඟින් අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය හර්ෂණ නානායක්කාර මැතිතුමාට බලය පවරනවා. ගරු ජනාධිපතිතුමා සතු විධායක බලයයි පවරන්නේ. ජනාධිපතිතුමාට හැම දේම වෙන් වෙන්ව කරන්න බැරි නිසා ජනාධිපතිතුමාගේ බලය ක්‍රියාත්මක කරමින් බන්ධනාගාර ක්ෂේත්‍රය සහ අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳව කටයුතු කරන්න ඕනෑ, සකර්මණ්‍ය ලෙස මැදිහත් වෙන්න ඕනෑ, පැය 24ම වැඩ කරන්න ඕනෑ ඇමතිවරයායි මේ. මොනවාද මෙතුමාට කරන්න තිබෙන්නේ? මෙතුමාට පවරා දී තිබෙනවා බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, බන්ධනාගාර පරිපාලනය හා ප්‍රතිසංස්කරණය ආදිය. තවත් බරපතළ දේවල් තිබෙනවා. මම ඒවා මෙතැනදී දැන් කියන්න යන්නේ නැහැ. අනෙක් කථිකයෝ ඒවා ගැන කථා කරාවි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ තනතුර දරන්න පටන් ගෙන වසර දෙකකට ආසන්න වෙනවා. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සම්බන්ධව ගැසට් පත්‍රයෙන් ඔබතුමාට පවරපු බලය තුළ ඔබතුමා කරලා තිබෙන පිළිගත හැකි ප්‍රමාණවත් වැඩ මොනවාද? මොකුත් නැහැ.

සිරකරුවෝ 10,000ක් ඉන්න ඕනෑ තැන 40,000ක් ගාල් කරනවා. සංශෝධනය කරන්න ඕනෑ නීතියට අදාළ සංශෝධන කෙටුම්පත තියාගෙන බලාගෙන ඉන්නවා. ඒ විතරක් නොවෙයි. මීගමුව බන්ධනාගාරය තුළ ඊයේ උදෑසන 11.00ට ආරම්භ වුණු සිදුවීම ගැන පහුවදා වනකල් බලාගෙන ඉන්නවා; නිදාගෙන ඉන්නවා.

මම එතුමාගේ කථාවේ තවත් කොටසක් සඳහන් කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා කියනවා, "ඔවුන් කියන දේ අහලා සමථ වෙලා - ඒ කියන්නේ, 05වන දා සිදුවීමෙන් පස්සේ ඔවුන් කියන දේ අහලා සමථ වෙලා - හවස ඔවුන් ඇතුළට යනවා. පහුවැනි දා - හයවැනි දා - උදේ වරුවේ ඔවුන්ට ආහාර දීලා, ඔවුන් උසාවි යන වැඩවලට ලෑහැස්ති කරද්දී ඉතාම ක්ෂණයෙන් දෙපාර්ශ්වය අතර ගැටුමක් ඇති වෙනවා" කියලා. ඒ කියන්නේ, රෑ settle වෙලා කියලායි. මොකක්ද රෑයේ පොලීසිය කිව්වේ මහෙස්ත්‍රාත් අධිකරණයට? 05වන දා රාත්‍රියේ සිරකරුවෝ 2,400ක් නිදැල්ලේ හිටියේ, වාට්ටු සියල්ලම ඇරලා තිබුණේ. 2,400ක් රැඳවියෝ මීගමුව බන්ධනාගාරය ඇතුළේ නිදහසේ හිටියේ. උණුසුම් තත්ත්වය පහ වෙලා තිබුණේ නැහැ. බන්ධනාගාර නිලධාරින්ට පාලනයක් තිබුණේ නැහැ, පාලනය අත් හැරලා තිබුණේ. හැබැයි පොලීසිය කැඳවන්න අසමත් වුණා.

මොකක්ද කියන්නේ, අපරාධ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති චන්දන කොඩිතුවක්කු මහත්මයා? ඔහු කියනවා, "05වෙනි දා මේ කියන සිදුවීම වුණාට පස්සේ අපි සූදානම් වෙලා සිටියා සහාය දෙන්න. මම මගේ කණ්ඩායම කැඳෙව්වා. හැබැයි බන්ධනාගාරය ඇතුළට යන්න බැහැ, ලිඛිත අවසරයක් නැතිව. - ඒකයි නීතිය- මට ඒ ලිඛිත අවසරය ලැබුණේ දෙවෙනි සිදුවීම වෙලා නිලධාරීන් 10ක් මැරිලා, රැඳවියන් විශාල පිරිසක් මැරිලා, 200ක් විතර තුවාල වුණාට පස්සේ" කියලා. ගරු ඇමතිතුමනි, විධායකයේ නියෝජිතයා හැටියට, විෂය භාර ඇමතිවරයා හැටියට ඔබතුමා ඒ සම්බන්ධීකරණ කටයුත්තේදී සම්පූර්ණයෙන් අසමත් වුණා. පොලීසිය භාර ආනන්ද විජේපාල ඇමතිතුමා සමඟ සම්බන්ධීකරණය වෙලා පොලීසිය කැඳවා ගන්න අසමත් වුණා. ඒ වාගේම ඔබතුමා අසමත් වුණා ආරක්ෂාව තහවුරු කරන්න ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා සමඟ හෝ ඇමතිතුමා සමඟ සම්බන්ධ වෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, your time is up.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්. මට අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇමතිවරයා තමන්ට ගැසට් පත්‍රයෙන් ලැබිලා තිබෙන බලය ගැන අවබෝධයක් නැති කෙනෙක්. මේ ඇමතිවරයා තමන් සකර්මණ්‍ය ලෙස කටයුතු කළ යුතු බව දන්නේ නැති කෙනෙක්. මේ ඇමතිවරයා 05වන දා සිදුවීමේ ඉඳලා පහුවදා උදේ වනකල් ශාරීරිකව සහ මානසිකව නිද්‍රාශීලීව හිටපු කෙනෙක්; නිදාගෙන හිටපු කෙනෙක්. මිනිස්සු මැරෙන කල්, සිය ගණනක් තුවාල වන කල් තමන් ඇමති කියලා හිතන්නේ නැතිව වැඩ කරපු කෙනෙක්. මේ ඇමතිවරයා දිගු කාලීන ප්‍රතිපත්තිමය වෙනස්කම් කළේත් නැහැ; එදා දවසේ මැදිහත් වෙලා කැරැලි මර්දන කණ්ඩායම් කැඳවලා, පොලීසිය කැඳවලා, STF එක කැඳවලා, හමුදාව කැඳවලා සම්බන්ධීකරණය කළේත් නැහැ. නියෝජ්‍ය පොලිස්පති කොඩිතුවක්කුගේ ප්‍රකාශයෙන් ඒක පැහැදිලි වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ අනුව ඔබතුමා වගකීම් පැහැර හැරලා තිබෙනවා. ඉල්ලා අස්වෙන එක ඔබතුමාගේ වැඩක්. අස් කරන එක ජනාධිපතිතුමාගේ වැඩක්. අස් නොවෙන එක ලජ්ජා නැති වැඩක්.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Mujibur Rahuman to second the Vote of No-Confidence.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 92 (2) (ආ) සහ 76 (3) ස්ථාවර නියෝග අනුව මට Privilege ප්‍රශ්නයක් නඟන්න තිබෙනවා. අද Parliament Sitting Day එකක්. අද මම speakers' list එකේත් ඉන්නවා. ඉතින් අද මම උසාවියට ගියේ නැහැ කියලා warrant එකක් issue කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will bring it to the notice of the Hon. Speaker.

Hon. Mujibur Rahuman, would you second that Vote, please?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Harsha de Silva?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Deputy Speaker, we also got that text message. If the Hon. Member is in Parliament, how can a judge issue a warrant to arrest him? I mean, it is a Privilege of a Member of Parliament. So, I think you need to take this up, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. (Dr.) Harsha de Silva, I will inform the Secretary-General of Parliament to convey this to the honourable judge. - *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. - *[Interruption]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of Opposition? - *[Interruption.]*

Hon. Members, please sit down. - *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම පාර්ලිමේන්තු රැස්වීමට සහභාගී වීමට තිබෙන අවස්ථාව ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා සතු වරප්‍රසාදයක්. එතුමා මහජනතාවගේ ඡන්දයෙන් පත් වුණු මන්ත්‍රීවරයෙක්. එතුමා ජනතා ස්වෛරීත්වයෙන් ව්‍යවස්ථාදායකය - පාර්ලිමේන්තුව - නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්; මහජන නියෝජිතයෙක්. එතුමාගේ කාර්යය ක්‍රියාත්මක කිරීමේදී කිසිම ආයතනයකට බාධා පමුණුවන්න බැහැ. කොහොමද එතුමා,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of Opposition, I will get the Secretary-General of Parliament - *[Interruption.]* Yes, Hon. (Dr.) Ramanathan Archchuna, I am talking to you. I will get the Secretary-General of Parliament to confirm this to the court. - *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, let me finish. - *[Interruption..]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, would you all please sit down?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, let me finish.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Leader of Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතා ඡන්දයෙන් පත් වුණු මහජන නියෝජිතයෙක් හැටියට එතුමා පාර්ලිමේන්තුවේ කරන රාජකාරියට කුමන කෙනෙකුටවත් බාධා කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, that has been noted.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක එතුමාගේත්, අපි සියලුදෙනාගේත් වරප්‍රසාද කඩවීමක්. ඒක නිසා වහාම ඔබතුමා තීන්දුවක් දෙන්න. ඒක කථානායකගෙන් අහන්න දෙයක් නොවෙයි. ඔබතුමා මේ සභාව තුළදී තීන්දුවක් දෙන්න. ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙනවා. ඒ පිළිබඳ තීන්දුවක් ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, I am talking to you. Have you informed the court of your presence here today?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I have sent my lawyer; I have sent the list of proceedings of this House, which had been shown to the judge to prove that proceedings are going on and the speakers' list to show that my name is on it, but still I have been issued with a warrant. So, what more could I do? I have been here since 9 o' clock in the morning.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, in that case, it is the discretion of the honourable judge. So, we have nothing much to do from here. This will be communicated to the court.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order. *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Now, who is raising the point of Order? Hon. Member, would you please sit down? *[Interruption.]*

The Hon. Leader of Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු රැස්වීම් පවත්වනකොට මේ උත්තරීතර සභාවේ සිටීම එතුමා සතු අයිතියක්. ඒක වරප්‍රසාදයක්. ඒක ජනතා නියෝජනය සහ ජන සම්මතවාදය. ඒ සියල්ලක්ම අනුගමනය කරමින් එතුමාට අයිතිය තිබෙන්නේ උසාවියේ ඉන්න නොවෙයි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න. ඔබතුමා ඒක ගැන තීන්දුවක් දෙන්න. දැන් තීන්දුවක් දෙන්න. ඒක ඔබතුමාගේ වගකීම. තීන්දුව ලබා දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, there is no order I can issue at this moment. Anyway, I will look into it and ask the Secretariat to find out about it from the court. - *[Interruption.]*

Hon. Mujibur Rahuman, would you second that Vote now?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sujeewa Senasinghe, what is your point of Order? - *[Interruption.]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Thank you, Hon. Deputy Speaker. May I have some silence, please? - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you can talk at the top of your voice. - *[Interruption.]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට පොඩ්ඩක් සවන් දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීම්]* Please, I am speaking. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, please, may I speak? - *[Interruption.]* Could you silence them, Sir?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
If you talk, they would be silent.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පක්ෂග්‍රාහී නොවී- *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක- *[බාධා කිරීම්]* අපි ආණ්ඩු පක්ෂයේ හිටපු කාලයේ විපක්ෂය විසින් මෙවැනිම කාරණයක් යොමු කළා. පාර්ලිමේන්තුවට පැමිණෙන අවස්ථාවේදීත්, පාර්ලිමේන්තුවෙන් පිටව යන අවස්ථාවේදීත් අත්අඩංගුවට ගන්න බැහැ කියන කාරණය එදා විපක්ෂයෙන් යොමු කළා. ගොඩක් වෙලාවට ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට ඒක දැනෙන්නේ නැහැ. සියලුදෙනා කිව්වා, එහෙම වෙන්න ඕනෑ නැහැ කියලා. හැබැයි, අපි නැඟිටලා කිව්වා, නැහැ, එහෙම නොවෙයි අනිවාර්යයෙන්ම අයිතිවාසිකම් තිබෙනවා කියලා. දේශපාලනය කරනකොට ඔබතුමන්ලාටත් මේවාට මුහුණ පාන්න වෙනවා. *[බාධා කිරීම්]* කෑ ගහන්න එපා. මේක රටින් පැනලා යන එකක් නොවෙයි නේ. ඒ අයිතිවාසිකම්, මන්ත්‍රී වරප්‍රසාද ඔබතුමන්ලා ආරක්ෂා කරන්න. ඔබතුමන්ලාට වුන් එකක් ඇති. ආණ්ඩු පක්ෂයේම,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I got the message.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Watagala, what is your point of Order?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලි නීතිය මේකයි. එතුමාට නඩුවක් තිබෙනවා නම් එතුමාගේ ඇපකරු සමඟ ගරු අධිකරණයට දැනුම් දෙන්න ඕනෑ අද ඒමට හැකියාවක් නැහැ, ඇපකරු ඉදිරිපත් කරනවා කියලා. ඒක නීතිඥ මහත්මයා කියන්න ඕනෑ. නීතිඥ මහත්මයා විතරක් ගිහිල්ලා ඒක කිව්වාට හරියන්නේ නැහැ. *[බාධා කිරීම්]* ඕනෑම සිවිල් හෝ අපරාධ නඩුවක විත්තිකාරයා යන්න ඕනෑ. *[බාධා කිරීම්]* විශේෂ අවසරයක් නැත්නම් විත්තිකාරයා අධිකරණයට යන්න ඕනෑ. *[බාධා කිරීම්]* අපි කොච්චර,- *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක තමයි නීතිය. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, would you all please settle down? Please, listen to him. - *[Interruption.]*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මන්ත්‍රීවරයකු වීම නිසා එහෙම නිදහසක් ලැබෙන්නේ නැහැ. එයා විත්තිකාරයෙක් නම් එයා අද අධිකරණයට යන්න ඕනෑ. එයා යන්නේ නැත්නම් එයාගේ ඇපකාරයා යන්න ඕනෑ. ඇපකාරයා ගිහිල්ලා කියන්න ඕනෑ මෙහෙම සිද්ධියක් තිබෙනවා කියලා. ඒක තමයි ඇත්ත කථාව. *[ඝෝෂා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, I am talking to you. Would you please listen to me? Have you requested for a letter from Parliament stating that today is a Sitting day and that you are supposed to be here? -*[Interruption.]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, why does he need a letter? The whole country knows that we are sitting today! -*[Interruption]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please, I am asking that from the Hon. (Dr.) Ramanathan Archchuna. Hon. (Dr.) Ramanathan Archchuna, have you produced that letter to the court?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
The Secretary-General asked me to sit in Parliament till 5.30 p.m. because then only they will give me the letter; they will never give a letter before that. So far, I had asked for thousands of letters from the Secretary-General and they had always asked me to sit in Parliament till 5.30 p.m.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Have you requested for a letter for today?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I can request for a letter, but they will give it only after 5.30 p.m. Now, they cannot give it. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
So, you have not requested for it this morning, is it? - *[Interruption.]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, you have to be reasonable. The whole country knows that Parliament is sitting today, and he is a Member. Please be reasonable, Sir! - *[Interruption.]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
And, when you take decisions like this, the court will - *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of Opposition, what do you have to say now? - *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Deputy Speaker, sessions of Parliament take precedence and priority over all other things because Parliament is supreme.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Absolutely.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
This is a sovereign body; this is a supreme body. So, his priority is to attend Parliament and nothing else. Therefore, please give a ruling, Sir; ඔබතුමා මේ අවස්ථාවේ තීන්දුවක් දෙන්න. එතුමාට අයිතිය තිබෙනවා, මේ විවාදයට සහභාගි වෙන්න. එතුමාගේ අයිතිය ආරක්ෂා කරන්න.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Anura Karunathilaka?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අපි දකින්නේ මේ කාරණයේ එක පැත්තක කරුණු විතරයි. උසාවියට ඉදිරිපත් වෙලා තිබෙන කරුණු අපි දන්නේ නැහැ. ඒ නිසා මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමාට මේ වෙලාවේ විනිශ්චයක් දෙන්න බැහැ. ඒ නිසා නිශ්චිත කරුණු සොයා බැලීමෙන් පස්සේ ඒ මන්ත්‍රීතුමාට අසාධාරණයක් වෙලා තිබෙනවා නම් ඒ පිළිබඳ තීන්දුවක් ගන්න අපට පුළුවන්. ඒ වාගේම අපි කල්පනා කර බලන්න ඕනෑ, මේ වාගේ සිදුවීමකදී නියමිත ක්‍රියාපටිපාටිය ඒ මන්ත්‍රීවරයා විසින් අනුගමනය කර තිබෙනවාද නැද්ද කියන එක. දෙපැත්තේම මේ කරුණු නැතිව අපට මේ වෙලාවේ තීන්දුවක් ගන්න බැහැ. ඔබතුමාට එහෙම තීන්දුවක් ගන්න හැකියාවක් නැහැ. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Najith Indika, what is your point of Order and under which Standing Order are you raising it?

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා, මේ කථාව අපි ඉක්මනින් අවසන් කරලා, විශ්වාස භංග යෝජනාව ගැන කථා කරමු කියලා. *[බාධා කිරීම්]* මොකද, විශ්වාස භංග යෝජනාව අමතක කරන්න හදනවාද මන්දා, වෙන කථාවක් ඇදලා අරගෙන. මේකට ඉක්මන් තීන්දුවක් දීලා අපි විශ්වාස භංග යෝජනාව ගැන කථා කරමු කියලා මම ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීම්]* මේක වෙන පැත්තකට ඇදගෙන යනවා. මේගොල්ලන් අකැමැතිද දන්නේ නැහැ, විශ්වාස භංග යෝජනාව ගැන කථා කරන්න. ඒ නිසා අපි විශ්වාස භංග යෝජනාව ගැන ඉක්මනට කථා කරමු කියන එකයි මගේ යෝජනාව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Ramanathan Archchuna, you have not requested Parliament for a letter to confirm with the learned court that you have Sittings today.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I could only request for a letter once I sit in Parliament. They never gave it to me before that. I had asked for a letter to be given beforehand, but they said, "Sit in Parliament until 4.30 p.m. and then, we will give it to you." They have never let me obtain a letter from the Secretary-General's Office before 4.30 p.m. So, how can I request for a letter?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Ramanathan Archchuna, the Secretariat informs me that that is the standard procedure they follow. You should have at least made a request for a letter this morning. - *[Interruption.]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Sir, when you mention that you are in Parliament, that is taken as a -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, give me just one minute.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I will just listen to the Hon. (Dr.) Harsha de Silva.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, let us be reasonable. The issue is whether the court has been informed by letter that Parliament is sitting today. But still, what is the reasonableness of that because the whole country knows that Parliament is sitting today? And, the Hon. (Dr.) Ramanathan Archchuna is an MP; everyone knows that. So, you do not need to send a letter; I do not think it is necessary.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Harsha de Silva, that is the procedure followed.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Sir, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Sujeewa Senasinghe, I gave you a lot of time. Okay, I will give you just half a minute.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Sir, the normal procedure is, - *[Interruption.]* Wait, I am speaking.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, I will give you time. Please sit down for now.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Sir, even to the Supreme Court, if you do not mention that you are in Parliament, it is considered as contempt of court. Any court would not take it lightly. We practise there. So, what we say is, "The Member is in Parliament today". The lawyer and everyone else have to take responsibility for that. You just cannot go and say, "He is in Parliament." The judges take cognizance of that. Please understand that.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay. Anyway, that is the procedure, he has to inform the court. - *[Interruption.]* The normal procedure is to inform the court and I cannot interfere with that.

Now, Hon. Mujibur Rahuman, would you second the No-Confidence Motion moved by Hon. Ajith P. Perera? You have ten minutes to second the Motion.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

Thank you very much, Hon. Deputy Speaker. Now only my time starts, I understand.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, your time starts now.

[පූ.භා. 11.59]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු විශ්වාස භංග යෝජනාව ස්ථිර කරමින් මගේ අදහස් දැක්වීම ආරම්භ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාර හා අධිකරණය භාරව සිටින හර්ෂණ නානායක්කාර ඇමතිතුමා සම්බන්ධයෙන් අද දින විශ්වාස භංග යෝජනාවක් ගෙන එන්න අපට සිදු වුණේ ඇයි කියන එක ගැන අපේ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කරුණු ගණනාවක් පැහැදිලි කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාරයේ ඇති වෙච්ච මේ සිදුවීම පළමුවැනි සිදුවීම නොවෙයි. අතීතයේ මීට කලින් හිටපු ආණ්ඩු කිහිපයකදීම බන්ධනාගාර තුළ මෙවැනි කලහකාරී හැසිරීම්, මෙවැනි ජීවිත අහිමිවීමේ සිද්ධි වෙලා තිබෙනවා. එවැනි සිදුවීම් කලින් ඇති වෙලා තිබෙන නිසා තමයි ජාතික ජන බලවේගයේ මැතිවරණ ප්‍රකාශනයට ඒක එතුමන්ලා ඇතුළත් කරන්නේ. ඒ, මේ වාගේ සිදුවීම් ඇති වෙලා තිබෙන නිසා. "මනුෂ්‍යත්වය පාදක බන්ධනාගාරයක් - යුක්තිගරුක රැඳවුම් දිවියක්" කියලා තමයි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 207වන පිටුවේ තමුන්නාන්සේලා සඳහන් කරලා තිබෙන්නේ. ඒ, මෙවැනි සිදුවීම් දන්නා නිසා. ඒක නිසා ඒ තුළ ගන්නා වූ ක්‍රියාමාර්ග, බලයට පත් වුණාට පස්සේ බන්ධනාගාරය තුළ ඇති කරන වෙනස්කම්, යටිතල පහසුකම් දියුණු කරන ඒවා, රැඳවියන්ට ලබා දෙන පහසුකම්, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව බන්ධනාගාරයක් හදනවා කියපු එක, යහපත් කල්ක්‍රියාවෙන් ඉන්න අයව නිදහස් කරන එක, සුළු වැරැදිවලට අහුවෙලා ඉන්න අයට වෘත්තීය පුහුණු ලබා දෙනවා වාගේ නොයෙකුත් දේවල් එතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබෙනවා.

හර්ෂණ නානායක්කාර ඇමතිතුමා මේ සිද්ධිය දන්නවා. මෙවැනි සිදුවීම් බන්ධනාගාර තුළ ඇති වෙන්න පුළුවන් කියන එක එතුමන්ලා දැනගෙන හිටියා; ඒක කල්තියාම දන්නවා. ඒ දන්නා නිසා තමයි අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා බන්ධනාගාර සම්බන්ධව ගන්න ඕනෑ ප්‍රතිසංස්කරණ ගැන එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් කළේ. ඒක නිසා, මේක එක පාරට සිද්ධ වුණාය කියලා කියන්න බැහැ. ඒක කියෙව්වාම අපි සියලුදෙනාම තීරණය කළා, ඇමතිවරයා ඒක දැනගෙන මේක හිතාමතාම මඟහැරියාය කියන ඒ චෝදනාව කරන්න. ඒක නිසා තමයි විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න වුණේ. නැත්නම් අපට විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න ඕනෑ නැහැ. විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න වුණේ මේක කල්තියාම දැනගෙන සිටි නිසායි. බන්ධනාගාරය තුළ තදබදයක් තිබෙනවා. එහි නොයෙකුත් ආකාරයේ ප්‍රශ්න තිබෙනවා. යටිතල පහසුකම් හදන්න තිබෙනවා. දහදාහක් ඉන්න ඕනෑ තැන 40,000ක ප්‍රමාණයක් ඉන්නවා. ඒ ඔක්කෝම දැනගෙන හිටියා. ඒක දැනගෙන හිටියේ නැහැයි කියලා කියන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට විශේෂ දේ තමයි පුරප්පාඩු. එතුමා බන්ධනාගාර ඇමතිකම භාර අරගෙන අවුරුදු එකහමාරකට වැඩියි. දැන් අවුරුද්දක් තිස්සේ පුරප්පාඩු තිබෙනවා. ඒ පුරප්පාඩු පුරවලා නැහැ. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාව ඉවත් කරලා මේ වෙනකොට අවුරුද්දක් වෙනවා. දැනට අවුරුද්දක් ගත වෙලා තිබෙනවා, එම පුරප්පාඩුව තවම පුරවලා නැහැ. ඊළඟට, අතිරේක බන්ධනාගාර කොමසාරිස් තනතුර. ඒ තනතුරත් පුරප්පාඩුව තිබෙනවා. තවම පත් කරලා නැහැ. එක තනතුරක් තිබෙනවා, පුරප්පාඩුයි. බන්ධනාගාර අධිකාරි - විශේෂ ශ්‍රේණියේ - පුරප්පාඩු පහක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම පුරප්පාඩු පුරවලා නැහැ. බන්ධනාගාර අධිකාරිවරු 17දෙනෙකු ඉන්න ඕනෑ. 14දෙනෙකුගේ පුරප්පාඩු තිබෙනවා. තුන්දෙනායි ඉන්නේ. පත් කරලා නැහැ. සහකාර බන්ධනාගාර අධිකාරිවරු 40දෙනෙක් ඉන්න ඕනෑ. 40දෙනෙක් අනුමත කරලා තිබෙනවා. 22යි ඉන්නේ. 18දෙනෙකුගේ පුරප්පාඩු තිබෙනවා, තවම පත් කරලා නැහැ. බන්ධනාගාර ජේලර්වරියන් තුන්දෙනෙක් අනිවාර්යයෙන්ම ඉන්න ඕනෑ. නමුත් එක්කෙනායි ඉන්නේ. දෙදෙනෙකුගේ පුරප්පාඩු තිබෙනවා, පත් කරලා නැහැ. බන්ධනාගාර ජේලර්වරුන්ගේ කාඩර් එකට 30දෙනෙකු අනුමත කරලා තිබෙනවා. 11දෙනෙකුගේ පුරප්පාඩු තිබෙනවා, පුරවලා නැහැ. පළමුවැනි පෙළ ජේලර්වරියන් හතරදෙනෙකු ඉන්න ඕනෑ. හතරදෙනාම නැහැ. තනතුරු හතරම පුරප්පාඩුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පළමුවෙනි පෙළ ජේලර්වරු 59දෙනෙකු ඉන්න ඕනෑ. ඒකෙන් 9දෙනෙකුගේ පුරප්පාඩු තිබෙනවා, පුරවලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට බලද්දි බන්ධනාගාර පරිපාලනයේ ඉන්න ඕනෑ 1,357කගේ පුරප්පාඩු තිබෙනවා, මාස 6කට වඩා වැඩියි. මේ ඇමතිතුමාගේ වගකීම තමයි, ඒ පුරප්පාඩු පිරවීම. ඇමතිතුමා එම කාර්යය කරලා නැහැ. ඉතින් මේ තරම් පුරප්පාඩු තිබියදී බන්ධනාගාරයක් තියා කුකුළු කොටුවක්වත් පාලනය කරන්න බැහැ නේ. එහෙම නේද? මෙහෙම පුරප්පාඩු තිබුණොත් කුකුළු කොටුවක් පාලනය කරන්නත් බැහැ, බන්ධනාගාර කොහොමද පාලනය කරන්නේ? ඇමතිතුමා පැහැදිලිවම එතුමාගේ වගකීම පැහැර හැරලා තිබෙනවා. පුරප්පාඩු විතරක් 1,357ක් තිබෙනවා. අවුරුදු එකහමාරක් තිස්සේ එතුමා මේ තනතුර දරනවා. පුරප්පාඩු වෙච්ච මේ තනතුරු පිරවීම වෙනුවෙන්

ඒ අවුරුදු එකහමාර තුළ එතුමා මොකක්ද කළේ කියන එක තමයි අපි දැන් ප්‍රශ්න කරන්නේ. මේ ගැටුම පාලනය කරන්න බැරි වුණේ ඒ නිසා තමයි. විධායක ශ්‍රේණියේ නිලධාරින් නැතිව, විධායක ශ්‍රේණියේ තීන්දු තීරණ ගන්නේ නැතිව කොහොමද ඒගොල්ලන් බන්ධනාගාර පාලනය කරන්නේ? ඒ විධායක ශ්‍රේණියේ නිලධාරින්ගේ පුරප්පාඩු තිබෙනකොට, ඒ තීන්දු තීරණ ගන්න ඕනෑ අය එතැන නැති වුණාම කවුද ඒ තීන්දු තීරණ ගන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 5වැනි දා ඇති වුණු මේ සිදුවීම 6වැනි දා දක්වා ගියේ වෙන මොකක් නිසාවත් නොවෙයි, කළමනාකාරිත්වයේ තිබෙන අසමත්භාවය නිසායි. ඒ නිසා තමයි මේ ගැටුම දිගටම ගියේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 05වැනි දා මේ සිද්ධිය වුණා. 05වැනි දා සිද්ධියෙන් දෙදෙනකු මැරුණා. 5වැනි දා සිද්ධියෙන් දෙදෙනෙකුගේ ජීවිත අහිමි වුණාම එදා සවස විදේශීය සිරකරුවන් 12දෙනෙකු එතැනින් අයින් කර ගත්තා. විදේශීය සිරකරුවන් 12දෙනාව එතැනින් අයින් කර ගත්තේ ඇයි? ඒ කියන්නේ යම්කිසි හෝඩුවාවක් තිබුණා, ඊළඟ දවසේත් මේ ප්‍රශ්නය ඇති වෙන්න පුළුවන් කියලා. එහෙම වෙලා මේ විදේශීය සිරකරුවන්ගේ ජීවිතවලට හානියක් වුණොත් රජය වගකියන්න ඕනෑ නිසා තමයි 5වැනි දා සවස විදේශීය සිරකරුවන් 12දෙනාව අයින් කර ගත්තේ. ඒ වෙන කොහේවත් සිරකරුවෝ නොවෙයි, ඉන්දියානු සිරකරුවෝ. ඒ ඉන්දියානු සිරකරුවෝ එතැනින් අයින් කර ගත්තා. ඒගොල්ලන්ගේ ජීවිත විතරද ජීවිත? ලංකාවේ ඉන්න සිරකරුවන්ගේ ජීවිත, ජීවිත නොවෙයිද? ඉන්දියාවට තිබෙන බයට, ඉන්දියානු සිරකරුවන් 12දෙනාව අයින් කර ගත්තා. මොකද, ඉන්දියාවට උත්තර දෙන්න එපායැ. එතකොට ලංකාවේ ඉන්න සිරකරුවන්ගේ ජීවිත, ජීවිත නොවෙයිද? එදා හරියටම ඒ තත්ත්වය කළමනාකරණය කළා නම්, එදා ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරුණු ඒ සිරකරුවන්ව හඳුනාගෙන තිබුණා නම්, ඒගොල්ලන්ව එදාම අයින් කරලා වෙන වෙන සිර කඳවුරුවලට යවන්න තිබුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, you have two minutes left of your allocated time.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
No,three minutes,Sir; ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩි තුනක් තිබෙනවා. මම time එක බලලා කථා කරන්නේ. I have been watching the time.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You have only two minutes and 30 seconds.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එදා ඇති වූ තත්ත්වය පැහැදිලිවම කළමනාකරණය කරගන්න බැරි වුණේ අසමත්භාවය නිසායි. එදා ඒ තීන්දුව ගත්තා නම් පහුවදා මේ සිද්ධිය ඇති නොවෙන්න තිබුණා. එදා ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරුණු අනෙකුත් සිරකරුවන්ව හඳුනාගෙන එතැනින් අයින් කරලා තිබුණා නම්, 6වැනි දා මේ සිදුවීම ඇති නොවෙන්න තිබුණා. නමුත් ඒක කළේ නැහැ. ඇමතිතුමා එදා දවසේ මේ සිද්ධියත් එක්ක සම්බන්ධ වුණේ නැහැ. එදා එතුමා සම්බන්ධ කර ගන්න බැරි වුණා කියලා තමයි තොරතුරු වාර්තා වෙන්නේ. ඒ නිසා අපි කියනවා, එතුමා මෙහි වගකීම භාර ගන්න ඕනෑ කියලා.

පැහැදිලිවම මේ සම්බන්ධ අනෙක් විශේෂ දෙය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එදා ඒ අවි ගබඩාවේ කඳුළු ගෑස් තිබුණේ නැහැ. ඇයි කඳුළු ගෑස් නොතිබුණේ? කඳුළු ගෑස් නොතිබෙන්න හේතුව මොකක්ද? එදා අවි ගබඩාවේ කඳුළු ගෑස් තිබුණා නම් වෙඩි නොතබා කඳුළු ගෑස් පාවිච්චි කරන්න තිබුණා. ඒ අවි ගබඩාවේ එදා කඳුළු ගෑස් තිබුණේ නැහැ. ඒකේ වගකීම භාර ගන්නේ කවුද?

ඊළඟ කාරණය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මතක තියාගන්න, මේ නැති වුණු සිරකරුවන් සියලුදෙනාම අධිකරණය ඉදිරියේ වැරදිකරුවෝ නොවෙයි. ඒ සියලුදෙනාම සැකකරුවෝ. ඔවුන් ආණ්ඩුව භාරයේ සිටි සැකකරුවෝ. එම නිසා ඒ ජීවිතවල වගකීම බන්ධනාගාර ඇමතිවරයා හැටියට එතුමාට තිබෙනවා. එතුමාට ඒකෙන් ගැලවෙන්න බැහැ. එදා ඝාතනයට ලක් වුණු කවුරුවත් අධිකරණයෙන් වැරදිකරුවෝ වූ අය නොවෙයි. ඊළඟට නිලධාරින්. මේ නිලධාරින් 10දෙනාම වැලිකඩ බන්ධනාගාරයේ සිට තමයි මීගමුව බන්ධනාගාරයට ආවේ. වැලිකඩ බන්ධනාගාරයේ සිට මීගමුව බන්ධනාගාරයට මේ 10දෙනාව ගෙන්වන්න නියෝග දුන්නේ කවුද? ඒක කියන්න ඕනෑ. ඒකට කවුද වග කියන්නේ? කලබලයක් ඇතුළේ තිබියදී එම නිලධාරින් 10දෙනාව නිරායුධව එම බන්ධනාගාරය ඇතුළට යැව්වේ කවුද? එතකොටත් මේ බන්ධනාගාරය තුළ කලබලයක් තිබෙනවා කියලා දැනගෙන සිටියා. එතකොට මේ නිලධාරින් 10දෙනාගේ ජීවිත පිළිබඳ ගැටලුවක් මතු වෙලා තිබුණා. ඒ ගැටලුව ගැන හිතන්නේ නැතිව මේ 10දෙනාට ඇතුළට යන්න ඉඩ දුන්නා. ඉතිහාසයේ කවදාවත් බන්ධනාගාර නිලධාරින් මෙහෙම ඝාතනය වෙලා නැහැ. පළමුවැනි වතාවට තමයි මේ නිලධාරින් මෙහෙම ඝාතනය වුණේ. ඒක මතක තබාගන්න. ඒ නිසා තමයි අපි කියන්නේ, ඇමතිතුමා මේකට වගකියන්න ඕනෑ කියලා. ඒ වාගේම ඇමතිතුමා ගියා, ඒ නිලධාරින්ගේ මළ ගෙවල්වලට. ඒක හොඳ දෙයක්. හැබැයි, ඒ සැකකරුවන්ගේ මළ ගෙවල්වලට ඇමතිතුමා නොගියේ ඇයි? ඒ මිය ගිය සැකකරුවන්ගේ දෙමව්පියන් සමහර විට මාලිමාවට ඡන්දය දීපු උදවිය වෙන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, your time is up.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට තව විනාඩියක් දෙන්න.

තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව, ලස්සන හිරගෙයක් හදනවා, ලස්සන බන්ධනාගාරයක් හදනවා, මනුෂ්‍යත්වය පාදක කරගත් බන්ධනාගාරයක් හදනවා කියපු නිසා ඒ බන්ධනාගාරයේ හිටපු සිරකරුවන්ගේ දෙමව්පියන් මාලිමාවට ඡන්දය දීලා තිබෙන්න පුළුවන්. එහෙම නම්, අර නිලධාරින්ගේ මළ ගෙවල්වලට ගියා වාගේ රැඳවියන්ගේ මළ ගෙවල්වලටත් යන්නත් ඇමතිතුමාට යුතුකමක් තිබුණා. එතකොට ඇමතිතුමා ස්වාධීනව වැඩ කරනවා කියන මතය සමාජගත කරන්න තිබුණා. නමුත් ඇමතිතුමා ඒ මළ ගෙවල්වලට ගියේ නැහැ. ඇමතිතුමා නිලධාරින්ගේ මළ ගෙවල්වලට ගිහිල්ලා එතැනින් ගැලවුණා. ඇමතිතුමා මේ තනතුරෙන් අයින්වෙන්නේ නැහැ කියලා අපි දන්නවා. ඔබතුමාට අයින්වෙන්නත් බැහැ. මොකද, 159දෙනෙකු ඔබතුමාට ඡන්දය දෙනවා. ඒක අපි දන්නවා. නමුත් මේ අවස්ථාවේ අපි එක කාරණයක් මතු කරන්න ඕනෑ. එදා ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට වගකීම ගැන, වගවීම ගැන, විනිවිදභාවය ගැන, සදාචාරය ගැන, අලුත් දේශපාලන සංස්කෘතියක් හදන්න ඕනෑ කියලා කථා කළා. ඒවා ගැන කථා කරපු නිසායි තමුන්නාන්සේලාට ජන මතය ලැබුණේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Mujibur Rahuman, you have exceeded your time.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

අවසන් කරන්නම්. මට විනාඩියක් දෙන්න, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඒ දේශපාලන සංස්කෘතිය හදන්නේ නැතිව ඇමතිතුමා ඒ ජන මතයට පිටුපා තිබෙනවා. ඒක තමයි ඇත්ත කථාව. අයින්වෙන්නේ නැහැයි කියන්නේ, ජන මතයට පිටුපා තිබෙනවා කියන එකයි. නමුත් ඔබතුමන්ලා ජන මතය ගත්තේ, අපි වගකීම් දරනවා, අපි වගවෙනවා, අපි විනිවිදභාවය පෙන්වනවා, අපි අලුත් සදාචාරයක් හදනවා, අපි තනතුරුවල එල්ලිලා ඉන්නේ නැහැ, අපේ අතින් වරදක් සිදුවෙලා ජනතාවට වගකියන්න බැරි වුණොත් අපි මේකෙන් අයින්වෙනවා කියලා මතයක් හදලායි. තමුන්නාන්සේලා එදා mandate එක ගත්තේ එහෙමයි. නමුත් ඒ mandate එකට තමුන්නාන්සේලා අද වගකියන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරින් 7වැනි දා ඒ බන්ධනාගාරයට ගියා. නමුත් ඔවුන්ට බන්ධනාගාරය ඇතුළට යන්න දුන්නේ නැහැ. ඒක මේ රටේ තිබෙන ස්වාධීන කොමිෂන් සභාවක්. මානව හිමිකම් කොමිෂන් සභාවට නීතියෙන් අයිතියක් තිබෙනවා, ඕනෑම වෙලාවක බන්ධානාගාරවලට, සිරිමැදිරිවලට ගිහිල්ලා ඒවා ගැන සොයා බලන්න. නමුත් එදා බන්ධනාගාරයේ නිලධාරින් මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරින්ට බන්ධනාගාරයට ඇතුළු වෙන්න ඉඩ දුන්නේ නැහැ. එහෙම වෙන්න බැහැ. අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගේ පාලනය යටතේ ඒ නීතිය කැඩුණේ කොහොමද? ගෝඨාභයලාගේ, රාජපක්ෂලාගේ පාලන ක්‍රමය යටතේ ඒ නීතිය කැඩුණා නම් අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් තමුන්නාන්සේලා, තමුන්නාන්සේලාගේ පාලනය යටතේ මේ රටේ නීතියේ ආධිපත්‍යය හදනවා කියපු මිනිස්සු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you have exhausted your time. Please wind up.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

නමුත් බන්ධනාගාරයට යන්න දෙන්නේ නැතිව ඒ නිලධාරින්ව ආපහු හරවා යැව්වා. ඇමතිතුමා නිහඬව බලාගෙන සිටියා. ඒ ගැන වචනයක් කථා කළේ නැහැ. මේ ඇමතිතුමා අද වගකීම් පැහැර හැරලා තිබෙනවා. එතුමා තමයි මේකේ වගකීම දරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට ඉල්ලා අස්වනවා හැරෙන්න වෙන කරන්න මොකුත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිංහල කියමනක් කියමින් මගේ කථාව අවසන් කරනවා. "වෙහෙර ගිලපු කෙනාට අග්ගලාවත් කජ්ජක්ද?" කිව්වාලු.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Prime Minister, the Floor is yours. You have 15 minutes. - *[Interruption.]* Hon. Members, would you all be quiet and listen to the Hon. Prime Minister?

[12.12 p.m.]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Deputy Speaker, there is no doubt that the incidents on the 05th and 06th of July were tragic, the death toll was unacceptable and the incidents we witnessed were not something that could be accepted or condoned in any way. I think we all can agree on that.

Today, Sir, the Members of the Opposition have brought in this No-Confidence Motion and in doing so, they need to establish facts and evidence, beyond the brutality and the enormity of the incident, to show that because of what happened, the trust and confidence we have in the Minister of Justice and National Integration have eroded; they need to establish, through evidence and facts, how exactly the Minister of Justice and National Integration is solely responsible for what happened and that his behaviour before, during and after that incident amounts to a breach of trust and confidence. That is what the Members of the Opposition need to establish here. But, so far, what have we heard, Sir? The noise level of the Opposition's arguments is noteworthy; I think we all can agree that they are very loud. But, noise in and of itself does not establish facts; hate, personal attacks, venom and rhetoric cannot establish facts. What we have heard and what we are hearing today is a high level of noise. Also, what we are hearing in terms of facts is a distortion of truth, misrepresentation of facts, half-truth at best and a deliberate effort to personally and viciously attack a Member of the Cabinet. That does not establish, in any way, the intent of this Motion of No Confidence. So, predictably, the Opposition will, once again, fail in their efforts to embarrass, belittle or, in any way, undermine the confidence in this Government or in any Member of this Cabinet.

Sir, let us take what happened into account. Yes, we lost 32 lives: the lives of 10 prison officers and 22 prisoners. That is a fact and that is something that we need to investigate into, hold those responsible

accountable and ensure that there is no such repetition. Sir, if we look at the lead-up to this incident, much has been said about the number of vacancies in the prison system. Yes, the vacancies in the prison system are something that has been discussed for many years. Since 2022, none of these vacancies have been filled. That is a fact. What is also another fact is that it was during the last one-and-a-half years that these vacancies have begun to be filled. During the last one year, 695 Prison Guards had been recruited, currently, 190 recruitments are on the way and also 18 Assistant Superintendents of Prisons had been appointed. This is the first time since 2022 that these recruitments have been happening. That is a fact; that is something we can establish by fact. It is not a half-truth, a misrepresentation or a distortion.

Then, what else has been done? Much has been said about the inadequacies in the Department of Government Analyst. Yes, we agree and we know that. That is why the vacancies in the Department of Government Analyst have been filled; that is why money has been allocated for the purchasing of the much-needed equipment, which had not been purchased until two years ago. The procurement process has started for all of those things, none of which have happened earlier. Also, the procedures and processes in the Department of Government Analyst are being reviewed and revised and interventions have been made to speed up its work. So, that is what the Hon. Minister has been doing for the last two years. And, yes, the Department of Government Analyst is heavily under-resourced and understaffed. But, that did not happen during the last two years. That was the Department of Government Analyst this Government inherited and the Hon. Minister had to take on. Let us not forget that.

Sir, what else has been happening? There is a need to speed up the processes to ensure that the number of people who are in remand is reduced. We have to either act within the law or the laws have to be amended. Already, those legal reforms are underway and very soon, a Bill containing amendments to the Poisons, Opium and Dangerous Drugs Act is going to be presented to Parliament. That Act has been revised and the amendments are going to be presented to Parliament very soon. So, it is not as if the Hon. Minister has not been addressing these issues. But, you as well as everyone else, including the Members of this Opposition know that law reforms do not happen overnight. Law reform takes time; it requires consultation; the Legal Draftsman has to draft the amendments, the amendment Bills have to be placed on the Order Book and then, to be presented to Parliament. And, all of those processes are underway. So, once those reforms take place, yes, we would have the necessary procedures and laws in place, which could reduce the number in prisons.

Let me remind this House that at the time when this Government came into power and the Hon. Minister took office, there had already been 31,000-odd prisoners incarcerated. So, that is not something that has happened over the last two years; that has been a growing problem, which had gone unaddressed and which this Government and this Minister has been addressing. So, Sir, those are the facts that we need to consider when we are debating this Motion.

Let us also look at some of the other reforms that have been undertaken by this Government under the leadership of the Hon. Minister. The health services in the prisons have been improved. The Ministry of Health and Mass Media has been working to ensure that there is a proper health system for prisoners as well as the staff, expanding medical care, appointing new cadre and introducing inpatient services and specialized services. There are many such initiatives that the Ministry of Health and Mass Media, in collaboration with the Ministry of Justice and National Integration, has undertaken to establish more humane conditions within the prison system as well. Prisons cannot be rehabilitated overnight. With that, I think, we all have to agree. Community rehabilitation programmes and training programmes for prisoners have been introduced to give them skills so that when they leave the prison, they have the skills to enter employment and to become productive members of society. So, all of these things and more have been introduced by this Government and by the Minister of Justice and National Integration.

Also, Sir, since this is a Motion that has been brought against an individual, a Member of the Cabinet, we need to look at what this Minister has done as opposed to the conduct of previous Minsters in charge of this subject as well. There also needs to be that comparison because this is a Motion brought against an individual. Sir, we know that this is not the first instance this kind of an incident took place in our prison system. It is tragic, but that is the truth that we need to acknowledge.

If you remember, this is the month that marks a darkest part of our history; this is the month in which our country spiralled into a bout of ethnic violence that lasted for so many years. Let us not forget what happened in the Welikada Prison in 1983, where hundreds of prisoners were killed as part of the violence that took place in the Island at that time. Also, in 2012, a similar protest took place, where 20 prisoners and 13 STF officers were killed. Then, in 2020, in the Mahara Prison, 11 inmates were killed. At no point did any of those Ministers of Justice at that time resign. So, what is the difference that the Opposition is demanding today with the resignation of this Minister of Justice?

Sir, we are also quite aware of our mandate. Our mandate was to establish the rule of law and respect and trust in our judicial system. You can imagine - I think the country can understand it - the challenge of establishing that trust in a system where currently, there are investigations against the son of a previous Minister of Justice. Currently, the son of a previous Minister of Justice is in remand and is under investigation for interfering with the judicial process, engaging in corruption and entering into deals with those who are being convicted. That is the extent to which corruption has seeped into the judicial system and the prison system with the son of a Minister of Justice becoming involved in these corrupt activities. So, the task of cleaning up such a system is not easy. That incident also needs to be understood in that particular context, with which we now know how prisons were run in the past, where certain prisoners had special privileges and where, as much of the

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

organizing of criminal activities took place outside, a similar amount, if not a greater amount, of it was going on within the prison system, led and managed by those in the prison itself. Mobile phones were widely available and all kinds of things were going on within the prison system with the involvement of a few prison officers and, as was established now, with those even more powerful.

So, Sir, this is the corrupt system that this Minister of Justice has been tasked with cleaning up, and that involves investigations within the institution itself and transferring, investigation and prosecution of his own officials! Therefore, it is not an easy task, but he has begun that task. This Government has undertaken that extremely difficult challenge of cleaning up within, cleaning up the institutions. We inherited institutions which were destroyed, corrupt and where corruption was the reason for the existence of many of those institutions. We also know of a Deputy Minister of Justice who went into a prison drunk and threatened prisoners just because he could! That was the culture that existed and that is the culture this Minister of Justice is trying to reform, trying to change.

So, Sir, it is very clear that the Opposition has so far and I am quite sure in the course of the day also will not be able to establish any facts which support the Motion they have brought forward. So, this is purely a rhetorical exercise; this is not even about the system of justice, this is not even about the plight of those inmates who had been killed - yes, we acknowledge the prisoners live in horrendous circumstances - and this is not about the lives of the ten officers who lost their lives in the line of duty; this is not about any of those. So, what is this? This is yet another cheap effort by this Opposition to get some attention, to get some media time and also, most seriously, a part of a pushback against the very reforms that this Government, along with these Ministries, is undertaking because, if you notice, Sir, in the past several weeks, the attacks on our Minister of Justice and National Integration, our Minister of Public Security and Parliamentary Affairs, the Head of the CIABOC, the Chief Justice and all have been intensified. It is not a coincidence. Why is it that our judicial, law enforcement, anti-corruption and other institutional systems are being attacked? That is because the Members of the Opposition are trying to protect themselves and their friends, who are being investigated and are going to be, very soon, charged and held accountable for the things they did in the past. That is why there is this organized, concerted attack on the entire Judiciary and the people who are leading the effort to free our country of corruption and establish trust and confidence in the institutions tasked with delivering justice to the citizens of this country.

So, Sir, that is the situation and I do not believe this Opposition is capable of bringing in an argument strong enough to support the Motion they have presented. And, as a Government, we have full trust in our Colleague, the Minister of Justice and National Integration. This is not rhetoric, Sir, but he has demonstrated his integrity, his commitment and his dedication to deliver on the responsibility he has been tasked with. I am sure, at the end of the day, that image, the image of this Government and the respect we have for our mandate will only be reinforced and reconfirmed. I thank the Opposition for giving us the opportunity to do so.

Thank you very much.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, මගේ point of Order එක ස්ථාවර නියෝග 83 (1) සහ (2) යටතේයි. මම අද මගේ previous point of Order එක raise කළේ, just to show that I am in Parliament and will be sitting from 9 o'clock to 5 o'clock in the evening and not to discriminate or give a bad impression on the judge or the court proceedings. I respect the court. Again, I raised this point of Order just to show that I am still sitting here.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Sajith Premadasa, Leader of the Opposition, please.

[අ.භා. 1.00]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ, විශේෂයෙන්ම මගේ කථාව පටන් ගන්න කැමැතියි අපේ අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා විපක්ෂයේ සිටියදී 2020 නොවැම්බර් 30වැනි දා මේ පාර්ලිමේන්තුවේදී කියපු කථාවකින්. එය එදින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1143 යටතේ මෙසේ සඳහන් වනවා:

> "...බන්ධනාගාරගත වෙලා, සිරගත වෙලා සිටින අය රාජ්‍ය භාරයේ සිටින අය බව අපි කවුරුත් දන්නවා. ඔවුන් රිමාන්ඩ් භාරයේ සිටින අය වෙන්න පුළුවන්; සිරකරුවන් වෙන්න පුළුවන්. ඔවුන් ඉන්නේ රාජ්‍යය භාරයේ. එම නිසා රාජ්‍ය භාරයේ සිටින සිරකරුවන් සහ එම රැඳවියන්ගේ ජීවිත ආරක්ෂාව පිළිබඳ මූලික වගකීම තිබෙන්නේ ආණ්ඩුවට."

කවුද මෙහෙම කියන්නේ? අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා. ඒ වාගේම, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති මාලාවේත් ජනතා විමුක්ති පෙරමුණ සඳහන් කරනවා, බන්ධනාගාර තුළ සිදු වන සියලු ආකාරයේ හිංසන වළක්වා ලන්නට ඕනෑ, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව බන්ධනාගාරවල ඉඩ පහසුකම් සලස්වන්නට ඕනෑ කියලා. මේ ආදි වශයෙන් සිරකරුවන්ගේ, රැඳවියන්ගේ අයිතිවාසිකම් පිළිබඳව බොහොම ලොකුවට, උජාරුවට එම ප්‍රතිපත්ති මාලාවේ සඳහන් කරනවා. ජනාධිපතිවරයා විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට සිටියදී පාර්ලිමේන්තුවේදී ඉහත සඳහන් ප්‍රකාශය කරනවා. ඒ කියපු දේ තහවුරු කරමින් තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවලත් ඒ යෝජනා ඉදිරිපත් කරනවා. නමුත්, අවසානයේ වැලිකඩ වාගේම, මහර වාගේම, මීගමුව බන්ධනාගාරයේත් ඉතාම ශෝචනීය සිද්ධි, දැවැන්ත ඛේදවාචක සිදු වෙනවා. එය සිදු වන්නේ ආණ්ඩුවේ නොහැකියාව තුළ, අකාර්යක්ෂමතාව තුළ, අදක්ෂකම තුළ. ඔබතුමන්ලා පැහැදිලිවම ඔප්පු කරලා තිබෙනවා, මේ තිබෙන්නේ වැඩ බැරි ආණ්ඩුවක් කියලා. අපි දැන් අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගේ ප්‍රකාශයත් හොඳින් දන්නවා, එතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයත් හොඳින් කියවා තිබෙනවා. නමුත්, මීගමුව බන්ධනාගාරයේ සිද්ධියක් ඇති වුණා; මහා ඛේදවාචකයක් නිර්මාණය වුණා. ඒ සිදුවීම සම්බන්ධයෙන් අධිකරණ ඇමතිවරයා ඇතුළු මේ රජයෙන් මම ප්‍රශ්න කීපයක් අහන්න කැමැතියි. කවුද ඒකට වග කියන්නේ, who is responsible? කාගේද වගවීම, who is accountable? දැන් මේ වගවීම, වගකීම - accountability, responsibility - කියන litmus test එක අනුව අපි පැහැදිලිවම විශ්වාස කරනවා, අධිකරණ ඇමතිවරයාට හෘදය සාක්ෂියට එකඟව මේ තනතුර හොබවන්නට බැහැ කියලා.

ඇත්ත වශයෙන්ම එතුමා කෙරෙහි තිබෙන විශ්වාසය භංග වන්නේ, පලුදු වන්නේ මේ කාරණාව මතම නොවෙයි. එතුමා අධිකරණ ඇමතිවරයා ලෙස සිටින වර්තමානයේ පැහැදිලිවම අපේ රටේ අධිකරණයට, අධිකරණයේ නිදහසට, විශ්වසනීයත්වයට, විනිශ්චයකාරවරුන්ගේ ගෞරවයට රජය මරු පහරක් එල්ල කරමින් යනවා. එක් පැත්තකින්, අභියාචනාධිකරණයට, ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කළ යුතු ගරු විනිසුරුවරුන් පත් කරන්නේ නැහැ. ඒ මොකද? ඇත්තම කියනවා නම්, රජය හිතන්නේ මේ ඉන්න විනිසුරුවරුන් පත් කරන්න සුදුසු නැහැ කියලා. එක්කෝ එහෙම හිතනවා. එහෙම නැත්නම් හිතනවා, මේක මානසික අල්ලසක් හැටියට පාවිච්චි කරන්න. විනිසුරුවරුන් පත් කරන්නේත් නැහැ අභියාචනාධිකරණයට, ශ්‍රේෂ්ඨාධිකරණයට. ඒ අතරතුර අභියාචනාධිකරණයේ ගරු විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 63 සිට 65 දක්වා වැඩි කරන්නත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 65 සිට 67 දක්වා වැඩි කරන්නත් ආණ්ඩුව උත්සාහ දරනවා. ඒ උත්සාහය ප්‍රජාතන්ත්‍රවාදය නිසැකවම විනාශ කිරීමේ උත්සාහයක්, අධිකරණයේ ස්වාධීනත්වය සම්පූර්ණයෙන්ම කුඩුපට්ටම් කිරීමේ උත්සාහයක්, රටේ ජනතාව තුළ තිබෙන අධිකරණය පිළිබඳ විශ්වසනීයත්වය මොට කිරීමේ, බිඳ දැමීමේ උත්සාහයක්.

බලන්න, විවිධ නීතිඥ සහ විනිසුරු පාර්ශ්ව මේ සම්බන්ධයෙන් කියන්නේ මොනවාද කියලා. Colombo High Court Lawyers' Association එක මොකක්ද කියන්නේ? "මේක අධිකරණයේ ස්වාධීනත්වයට බරපතළ තර්ජනයක්. ඇත්ත වශයෙන්ම මෙයින් මූලික අයිතිවාසිකම් ද උල්ලංඝනය වෙනවා" කියලා එතුමන්ලා ප්‍රකාශ කරනවා. Badulla Bar Association එක මොකක්ද කියන්නේ? "මේ ගන්න හදන ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කරන්න එපා" කියලා එතුමන්ලා ප්‍රකාශ කරනවා. පොදු රාජ්‍ය මණ්ඩලීය නීතිඥවරුන්ගේ සංගමය මොකක්ද කියන්නේ? 2023 Goa Declaration එකේ කරුණු ද පෙන්වා දෙමින් එතුමන්ලා කියනවා, අධිකරණයේ ස්වාධීනත්වය - independence, අධිකරණයේ අපක්ෂපාතිත්වය - impartiality - සුරක්ෂිත වන ආකාරයට, ජනතාවගේ පිළිගැනීම, විශ්වසනීයත්වය - public confidence - තහවුරු වන ආකාරයට කටයුතු කරන්න ඕනෑ බව සහ මේ ගන්නා පියවර ඒ සියල්ලම කඩ කරන බව. ශ්‍රී ලංකා නීතිඥ සංගමය මොකක්ද කියන්නේ? එතුමන්ලා කියනවා, "අත්තනෝමතික ලෙස මේ වෙනස්කම් නොකළ යුතුයි. එමඟින් මහජන විශ්වාසය අහිමි වෙනවා" කියලා. ඒ අය කියනවා, මේ වාගේ *ad hoc* සංශෝධනවලට යන්න එපා කියලා. පසුගිය දිනක Judicial Service Commission එක හරහා ගරු විනිසුරුවන් ඒක රාශි වෙලා 65:0 ලෙස මේ සංශෝධනයට ඡන්දය ලබා දුන්නා. ඒ කියන්නේ, මේ සංශෝධනයට පක්ෂව ඡන්ද 0යි, විරුද්ධව ඡන්ද 65යි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ලංකාවේ ඔක්කෝම විනිසුරුතුමන්ලා කී දෙනෙක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
වටගල මන්ත්‍රීතුමා, කලබල වෙන්න එපා. මට සමා වෙන්න! ඔබතුමා මන්ත්‍රීතුමා නොවෙයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. සමා වෙන්න. *[බාධා කිරීමක්]* වටගල නියෝජ්‍ය ඇමතිතුමා, කලබල වෙන්න එපා. *[බාධා කිරීම්]* ඔබතුමාගේ වෙලාවේ ඔබතුමා උත්තර දෙන්න. *[බාධා කිරීම්]* ඒ සංශෝධනයට විරුද්ධව ඡන්ද 65යි. අඩුම ගණනේ ඒ එක්කෙනෙක්වත් කිව්වාද, ඒක හොඳයි කියලා? නැහැ. පක්ෂව ඡන්ද 0යි. *[බාධා කිරීමක්]* දැන් මොකක්ද වෙන්නේ? දැන් ඒ හැටපස්දෙනා පස්සේ එළවනවා. දැන් ඒ විනිසුරුවන් දඩයම් කරනවා. අපේ අධිකරණ ඇමතිතුමා කලාකරුවෙක් නේද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ඔව්, ඔව්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඔබතුමා films හදනවා නේද? "විනිසුරු දඩයම" කියලා film එකක් හදන්න පුළුවන් ඔබතුමාට. "විනිසුරු දඩයම" නමින් ඔබතුමාට හොඳ ලස්සන චිත්‍රපටයක් හදන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නියමයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මෙවැනි කාරණා පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් දිය හැකි උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. හංගේරියාවත්, පෝලන්තයත් මේ විධියටම විනිසුරුවන්ට බලපෑම් කිරීමේ යෝජනා ඉදිරිපත් කරන්න හැදුවා. හැබැයි මොකක්ද වුණේ? European Court of Human Rights ඒ ක්‍රියාදාම සියල්ලම අනීතිකයි කියන නිගමනයට ඇවිල්ලා ඒවා නතර කළා.

ඔබතුමන්ලා මොකක්ද මේ කරන්න හදන්නේ? මේ කරන්න හදන්නේ, State capture of the Judiciary. රජය, රාජ්‍යත්වය, ජනතා විමුක්ති පෙරමුණ, බලය පවතින කණ්ඩායම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂා කරන කුලුනු තුනෙන් වැදගත් කුලුනක් වන අධිකරණය තමන්ගේ භාරයට ගන්න හදනවා. තමන්ගේ අතකොළුවක් කර ගන්න හදනවා, තමන්ගේ එහෙයියෙක්, සුචව, කීකරු ගෝලබාලයෝ කර ගන්න හදනවා. කෙටින්ම කියනවා නම්, අධිකරණය රූකඩයක් බවට පරිවර්තනය කරන්න මේ රජය දරන උත්සාහය ඉතාම නින්දිතයි. ඒක පහත් ක්‍රියාවලියක්.

බලන්න, LAWASIA කණ්ඩායම දීලා තිබෙන statement එක. මේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලියක් හැටියට ඔවුන් ප්‍රකාශයට පත් කර තිබෙනවා.

අධිකරණ ඇමතිතුමනි, එදා ඔබතුමා Parliamentary Business Committee එකේ හිටියාද නැද්ද දන්නේ නැහැ. ඔබතුමා දන්නවාද, අධිකරණය කියන ආයතනය පිළිබඳව අපි විවාදයක් ඉල්ලුවා. එදා සුනිල් වටගල මැතිතුමාත් හිටියා. එතුමාත් උගත් නීතිඥවරයෙක්. නමුත් මොකක්ද වුණේ? අධිකරණය ගැන සාකච්ඡාවක් කරන්න තහනම්. ඒ ගැන යෝජනාවක් ගේන්න තහනම්! ඒක හරිද? ඒක ප්‍රජාතන්ත්‍රවාදී ද? අපේ රටේ පාර්ලිමේන්තුව තුළ අධිකරණය ගැන කථා කිරීම තහනම්! අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා ඒක පිළිගන්නවාද?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අනේ මට බාධා කරන්න එපා, නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමාට ඕනෑ ඕනෑ වෙලාවට නැඟිට නැඟිට කථා කරන්න එපා. *[බාධා කිරීම්]* ඔබතුමාගේ වෙලාවේ කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Sunil Watagala, your name was mentioned.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා මේ අවස්ථාවේ වැරදි අර්ථ කථනයක් කරනවා. Parliamentary Business Committee එකේ මම හිටියා. එදා තහනම් කිව්වේ අධිකරණය ගැන කථා කිරීම නොවෙයි. විනිශ්චයට භාජන වී ඇති කරුණු - *sub judice* matters - ගැන සාකච්ඡා කරන්න බැහැ කියන කාරණාව තමයි Parliamentary Business Committee එකේදී කථා කළේ. විපක්ෂ නායකතුමනි, මෙතැනදී නිකම් පටු, පෞද්ගලික ලාභවලට කථා කරන්න ලෑස්ති වෙන්න එපා. අපි ඒවාට ලෑස්තිත් නැහැ. මොකද, Parliamentary Business Committee එකේ කථා කරපු ඇත්ත කාරණාව ඔබතුමන්ලාත් දන්නවා. එතැන ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් හිටියා. එතැනදී කථා වුණේ *sub judice* mattersවලට මේ සභාවේ ඉඩක් නැහැ කියලා. ඇයි, මේ වාගේ වැරදි අර්ථ කථන ගේන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Leader of the Opposition.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අර උගත් නීතිඥතුමා කියන කැල්ලේ "උගත්" කියන කෑල්ල පොඩ්ඩක් අයින් කරන්න සිද්ධ වෙනවා. ඔබතුමා ඒක අමුතුවෙන් කියන්න ඕනෑ කථාවක් නොවෙයි. *Sub judice* matters කියන එක ස්ථාවර නියෝගවල තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
අපි ඒවා දැනගෙන, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අපි ඒවා දැනගෙන තමයි ඉල්ලීමක් කළේ අධිකරණය පිළිබඳ සාකච්ඡාවක් දෙන්න කියලා. *Sub judice* principle එක ගැන අපි දන්නවා. ගරු විනිශ්චයකාරවරුන්ගේ ක්‍රියා කලාපය, conduct එක වාගේ දේවල් ගැන කථා කරන්න නොවෙයි අපි විවාදයක් ඉල්ලුවේ. අපි ඉල්ලුවේ අධිකරණය කියන ආයතනය ගැන විවාදයක්.

අපේ රටේ tripartite system of government තිබෙන්නේ. ඒ තමයි විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය. ඒකට අමතරව අපි විශ්වාස කරනවා, තවත් කුලුනු දෙකක් තිබෙනවා කියලා. එකක්, ස්වාධීන මාධ්‍ය. මම හිතන විධියට, රජය ඒකට එකඟ නැහැ. අනෙක් එක, අපේ රටේ සිවිල් සමාජය; සිවිල් ප්‍රජාව. මම හිතන විධියට, රජය ඒකටත් එකඟ නැහැ. ඡන්දයට ඉස්සෙල්ලා නම් ඒවාට එකඟ වුණා. නමුත් දැන් නැහැ. අපි ඉල්ලීමක් කළේ මේ කුලුනු තුනෙන් වැදගත් කුලුනක් වන අධිකරණය කියන විෂයය ගැන අපට විවාදයක් දෙන්න කියලායි. දුන්නේ නැහැ.

මම හර්ෂණ නානායක්කාර මැතිතුමාගෙන් අහනවා. හර්ෂණ නානායක්කාර මැතිතුමා, හර්ෂණ නානායක්කාර මැතිතුමා, -

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාට ඇහුණේ නැත්තේ ඔබතුමා වෙන දෙයක් කථා කර කර හිටපු හින්දා නේ. කමක් නැහැ. ඔබතුමා සූදානම්ද අධිකරණය කියන ආයතනය පිළිබඳව මේ සභාවේ දින තුනක විවාදයක් ලබා දෙන්න? අධිකරණය කියන කුලුන ගැන, අධිකරණය කියන ආයතනය ගැන දින තුනක විවාදයක් දෙන්න කැමැතිද?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
දවස් දෙකක් දෙන්න කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දින තුනක් දෙන්න. *[බාධා කිරීම්]* ඇයි, ඔච්චර බය වෙන්නේ? *[බාධා කිරීම්]* ඇයි, ඔච්චර කලබල වෙන්නේ? *[බාධා කිරීම්]* විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, මේ අධිකරණ ඇමතිතුමා බන්ධනාගාර කියන පැත්තෙනුත් ෆේල්, අධිකරණය කියන පැත්තෙනුත් ෆේල් කියලා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඉල්ලීමක් කළා නේ. එතුමා ඒ ඉල්ලීම කරන්න ඕනෑ මෙතැන නොවෙයි නේ. අඩු ගාණේ ඒ ඉල්ලීම කරන්න ඕනෑ තැනවත් ඔබතුමා දන්නේ නැහැ නේ. ඒක නේ ප්‍රශ්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadasa, you have exceeded the time allotted to you.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම හිතාගෙන හිටියේ අධිකරණ ඇමතිතුමාත් උගත් කියලා. ඒ "උගත්" කියන කෑල්ල මම ඉවත් කර ගන්නවා. අධිකරණ ඇමතිතුමාගේත් "උගත්" කියන කෑල්ල ඉවත් කර ගන්නවා. ඔබතුමා කොහේද යන්නේ? අධිකරණ ඇමතිතුමනි, යන්න එපා.

එතුමා කිව්වා, ඒ ඉල්ලීම ඉදිරිපත් කරන්න ඕනෑ තැන අපි දන්නේ නැහැ කියලා. ඒක ඉදිරිපත් කළේ Parliamentary Business Committee එකේදි. ඒකෙන් ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප වුණා. ඒකෙන් කිව්වා ඒක කරන්න බැහැ කියලා. ඒක තහනම් කිව්වා. එම නිසා තමයි මේ සභා ගර්භයේදී අපි ඒ ඉල්ලීම කරන්නේ. සුනිල් වටගල මැතිතුමනි, - වැඩ බලන අධිකරණ ඇමති වාගේ ඉන්න - කරුණාකරලා ඔබතුමා හරි අපට අධිකරණය පිළිබඳව දින තුනක විවාදයක් ලබා දෙන්න. විශේෂයෙන්ම අධිකරණය සම්බන්ධයෙන් ඔබතුමන්ලා මේ දරන උත්සාහය, State capture of the Judiciary, ඒ කියන්නේ රාජ්‍යත්වයෙන් මේ රටේ අධිකරණය ගිල ගැනීම වහාම නතර කරන්න. නතර කරලා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති මාලාව තුළින් නිර්මාණය කරනවාය කියපු ස්වාධීන අධිකරණය ස්ථාපනය කරන්න කටයුතු කරන්නය කියන ඉල්ලීමත් කරනවා.

බෙහෙවින් ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Anura Karunathilaka. You have 14 minutes.

[අ.භා. 1.15]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "විනිසුරු දඬයම" කියලා film එකක් කරන්න කියලා විපක්ෂයෙන් යෝජනා කළා නේ. මම ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට යෝජනා කරන්න කැමැතියි, ඊට කලින් "නිදන් මංකොල්ලය" කියන film එක කළොත් ඊට වඩා හොඳ hit එකක් තියෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණු පෙළගස්වලා එනකොට මේ විශ්වාස භංග යෝජනාවේ එක තැනක සඳහන් වෙනවා, "අසමත් වී ඇති බවට ගරු සභාව විශ්වාස කරන හෙයින්ද" කියලා. අද හවස් වෙනකොට දැන ගන්න පුළුවන්, මේ සභාවේ විශ්වාසය තිබෙන්නේ කොතැනද කියලා. ඒක විපක්ෂයට දැන ගන්න පුළුවන්. ඒ වාගේම, සාමාන්‍යයෙන් විශ්වාස භංග යෝජනාවක් පෙළගස්වනකොට ඒකෙන් ඉදිරිපත් කරන කරුණු සනාථ කිරීම සඳහා කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මීට කලින් කථා කළ මන්ත්‍රීතුමා වගකීම් ඉෂ්ට නොකිරීම ගැන සඳහන් කරමින් පැහැදිලි කළා, බන්ධනාගාරවලට අදාළව බඳවා ගැනීම් කළේ නැහැ කියන කථාවක්. මේකෙන් තේරෙනවා, මේ විපක්ෂය මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්නේ කොයි තරම් කරුණු නොදැනද කියලා. මම කෙටියෙන් සඳහන් කරන්නම් මේ කාලය තුළ කොච්චර ප්‍රමාණයක් බඳවා ගැනීම් සිදු කර තිබෙනවාද කියලා. පසුගිය අවුරුදු තුනක්, හතරක් තිස්සේ බඳවා ගැනීම් කිසිවක් නොකරපු වටපිටාවක තමයි අපි මේ අලුත් බඳවා ගැනීම් කළේ.

අපි විශේෂ ශ්‍රේණියේ බන්ධනාගාර අධිකාරි තනතුරට බඳවා ගැනීම සඳහා කටයුතු කරලා තිබෙනවා; පූර්ණ කාලීන රාජකාරි ඉටු කරන තැනට පත් කරලා තිබෙනවා. බන්ධනාගාර අධිකාරි පුරප්පාඩු 14න් 13ක් පූර්ණ කාලීන රාජකාරි සඳහා බඳවාගෙන තිබෙනවා. ඒ වාගේම, කොමිෂන් සභාව සඳහා පත් කිරීම් කරලා තිබෙනවා. පුරප්පාඩුව පවතින සහකාර බන්ධනාගාර අධිකාරි තනතුරු 10 සඳහා බඳවා ගැනීමට ඉල්ලුම් පත්‍ර කැඳවලා පරීක්ෂණ පවත්වමින් යනවා. ප්‍රධාන ජේලර් පුරප්පාඩු 11ක් තිබෙනවා. ඒ පුරප්පාඩු 11ම පුරවන්න ඉල්ලුම් පත්‍ර කැඳවීමට අනුමැතිය ලැබී තිබෙනවා වාගේම, ඒ සඳහා කටයුතු කරගෙන යනවා. බන්ධනාගාර නියාමකවරු 695දෙනෙක් බඳවා ගැනීම සඳහා කටයුතු කරලා තිබෙනවා. පිරිමි නිලධාරින් 305දෙනෙක් සහ කාන්තා නිලධාරින් 51දෙනෙක් බඳවාගෙන පුහුණු කිරීම සඳහා මේ වෙනකොට අනුයුක්ත කරලා තිබෙනවා. ඉතිරි පුරප්පාඩු 90 සඳහා විභාග දෙපාර්තමේන්තුවෙන් ඒ විභාග ප්‍රතිඵල ලබාගෙන, ඒ අනුව ඉදිරියට කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම, දෙවන පෙළ ජේලර් පුරප්පාඩු 128ක් තිබෙන අතර, විවෘත තරග විභාගයෙන් පස්සේ දැන් 32දෙනෙක් බඳවාගෙන පුහුණු කරමින් ඉන්නවා. අභ්‍යන්තර 60දෙනෙකුට ඒ සම්මුඛ පරීක්ෂණ පවත්වලා බඳවා ගැනීමට කටයුතු කරමින් ඉන්නවා.

මේකෙන් පෙනෙනවා, අධිකරණ අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමා බන්ධනාගාරය සම්බන්ධයෙන් වගකීම්

[ගරු අනුර කරුණාතිලක මහතා]

අරගෙන, වගකීම්සහගතව වසර ගණනාවක් පැවැති පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරලා තිබෙන්නේ කොහොමද කියලා. ඒ උදාහරණයෙන්ම අපට පෙනෙනවා, විපක්ෂය විසින් ගෙනැවිත් තිබෙන විශ්වාස භංග යෝජනාවේ බොහෝ කරුණු දැනටමත් බිඳ වැටී හමාරයි කියලා.

අධිකරණ ඇමතිවරයා වන ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමාට විරුද්ධව ඉදිරිපත් කර ඇති විශ්වාස භංග යෝජනාවේ කරුණු කියෙව්වාම සමහර වෙලාවට අපට පෙනෙනවා, එතුමා කිසි දෙයක් කරලා නැහැ වාගේ කියලා. එක පැත්තකින් බැලුවාම, අධිකරණ ඇමතිවරයකුගේ ප්‍රධාන කාර්යයක් තමයි රටට නීති සම්පාදනය කරලා, ඒවා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගන්න එක. 2025 අවුරුද්දේ විතරක් රජයේ පනත් කෙටුම්පත් 26ක් සම්මත කරලා නීති බවට පත් කරන්න එතුමා නායකත්වය දීලා තිබෙනවා. 2026 වසරේ මේ වෙනකොට තවත් එවැනි පනත් කෙටුම්පත් 14ක් නීති බවට පත් කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම තවත් පනත් කෙටුම්පත් ගණනාවකට කැබිනට් අනුමැතිය අරගෙන මේ වෙනකොට නීති කෙටුම්පත් සඳහා යොමු කරලා තිබෙනවා. එයින් සමහර ඒවා අලුත්ම පනත් කෙටුම්පත්. සමහර ඒවා තිබුණු පනත් සඳහා ගෙනැවිත් තිබෙන සංශෝධන. එහෙම නම්, අධිකරණ ඇමතිවරයා හැටියට එතුමා වෙත පැවරී ඇති වගකීම් වන නීති සැදීම, ඒ අණ පනත් නීති බවට පත් කිරීම වැනි වැදගත් කාර්යයන් සඳහා නායකත්වය දීලා තිබෙනවා.

එහෙම නම් ඊළඟට බලන්න ඕනෑ, මෙහෙම දේවල් කරලා තිබියදී හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නේ ඇයි කියලා. එතකොට මම බැලුවා, මෑත කාලයේ සම්මත කරපු ප්‍රධාන පනත් පහක් මොනවාද කියලා. එකක් තමයි, 2025 දී ගෙනාපු Proceeds of Crime Act එක. ඒකෙන් වෙන්නේ, අපරාධයකින් උත්පාදනය වෙච්ච නීතිවිරෝධී දේපළ රාජසන්තක කිරීම සඳහා බලය ලැබීම. ඒ හරහා මුදල් විශුද්ධිකරණය, මත්ද්‍රව්‍ය ජාවාරම හා දූෂණයට එරෙහිව කටයුතු කිරීම සඳහා law enforcement ආයතනවලට විශාල බලයක් ලැබෙනවා. තේරුම් ගන්න පුළුවන් නේ, ඒ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් පිටුපස ඉන්න විපක්ෂයේ ඇතැම් උදවිය මුදල් විශුද්ධිකරණයට, මත්ද්‍රව්‍ය ජාවාරමට සෘජුව හෝ වක්‍රව සම්බන්ධයි කියන එක. මේ දූෂිත ජාවාරම් වළල්ලේ වක්‍රව ප්‍රතිලාභ ලබන තවත් කොටසක් ඉන්නවා. ඒ නිසා ඒ වාගේ පනත් ගෙනෙනවාට විරුද්ධ, ඒවායෙන් රිදුණු, ඒවායෙන් අපහසුතාවට පත් වෙච්ච අය මේ වාගේ විශ්වාස භංග ගෙනෙන එක ගැන අපි පුදුම වෙන්න ඕනෑ නැහැ. ඒ වාගේම අධිකරණ සංවිධාන පනත, අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යන පනත් දෙකම සංශෝධනය කරන්නත් එතුමා කටයුතු කළා. එතකොට මොකක්ද වෙන්නේ? ඒ පනත් දෙකෙන් මහාධිකරණ පද්ධතිය ශක්තිමත් වුණා; වේගයෙන් නඩු අහන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම නඩුවල තදබදය අඩුවෙන්න පටන් ගත්තා. දැන් ඔන්න එළියේ ඉන්න දූෂිත වළල්ලටත්, අපරාධකරුවන්ටත්, ඒවායේ ඒජන්තවරු වශයෙන් ඉන්න විපක්ෂයේ සමහර කණ්ඩායම්වලටත් දැනෙනවා, තමන්ගේ ටිකට් එක ඉක්මනට ඇදෙනවා කියලා. ඒ නිසා ඔවුන් බියෙන් සලිත වෙන්න පටන් ගත්තා; හීනෙනුත් බය වෙන්න පටන් ගත්තා; සුළු දිය පහ වෙන්න පටන් ගත්තා. ඒ වාගේ වෙලාවක මෙවැනි විශ්වාස භංග යෝජනා ගෙනෙනවා කියන එක අපට පුදුම වෙන්න දෙයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

තවත් වැදගත් පනතක් තමයි, Poisons, Opium and Dangerous Drugs (Amendment) Act කියන්නේ. මේ හරහා මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට එරෙහිව නීතිය ශක්තිමත් කරන්න කටයුතු කළා. තමන්ගේ යහළුවන්, ආධාරකරුවන්, තමන්ට මූල්‍ය සම්පාදනය කරන අය එකිනෙකා ගණනේ හිරගෙට යනවා දකිනකොට, කූරු ගණිනවා බලනකොට විපක්ෂය කලබල වෙන එක අහන්න දෙයක් නොවෙයි. එතකොට මෙවාට නායකත්වය දෙන රජයට, එහි වැදගත් කාර්යභාරයක් ඉෂ්ට කරන හර්ෂණ නානායක්කාර ඇමතිතුමා වාගේ අයට විරුද්ධව විශ්වාස භංග යෝජනා ගෙනෙන්න ඒගොල්ලන් අනිවාර්යයෙන්ම කටයුතු කරන්න ඕනෑ තමයි. ඒක තමයි ඒගොල්ලන්ගේ වගකීම. ඒක තමයි ඒගොල්ලන්ගේ රාජකාරිය.

ඒ වාගේම, මහාධිකරණ නඩුවල තදබදය ඉවත් කරන්නත්, මහාධිකරණ පද්ධතිය පුළුල් කරන්නත් හර්ෂණ නානායක්කාර ඇමතිතුමා කටයුතු කළා. අධිකරණ සේවා කොමිෂන් සභාව හරහා තමයි මේ කටයුතු කරන්නේ. අධිකරණ ඇමතිවරයා හැටියට එතුමාගේ වගකීම තමයි ඒ සඳහා අවශ්‍ය වන පහසුකම් ලබා දීම. එතුමා මැදිහත් වෙලා 2025දී නව මහාධිකරණ පරිශ්‍ර 4ක් ඇති කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගත්තා. 2026දී නව මහාධිකරණ 7ක් ඇති කරන්නත් එතුමා නායකත්වය දීලා තිබෙනවා. වැදගත් කාරණය තමයි, මේවායින් 5ක්ම සෘජුවම අපරාධ සහ දූෂණ නඩු සඳහා වෙන්වුණු අධිකරණ වීම. ඒවා අතරින් සිවිල් අභියාචනා මහාධිකරණයට එක ගොඩනැඟිල්ලක් තිබෙනවා, වාණිජ මහාධිකරණයට එක ගොඩනැඟිල්ලක් තිබෙනවා. ඉතින්, මේ නඩු ඉක්මනින් අහන්න අවශ්‍ය වන යටිතල පහසුකම් පුළුල් වෙනකොට අම්මලා, අප්පලා, දූලා, පුතාලට දවස ගානේ උසාවි යන්න සිද්ධ වෙනකොට රිදෙනවා තමයි. ඒක අරුමයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට එල්ල වෙලා නැති චෝදනා මොනවාද කියලා මම බැලුවා. දූෂිත හොර ජාවාරම්කරුවන්, ත්‍රාඩ ජාවාරම්කරුවන් හා පවුලේ අයත් එක්ක mega cruise shipsවල trip එකක් ගිහිල්ලා තිබෙනවා කියලා චෝදනාවක් තිබෙනවාද කියලා මම බැලුවා. එහෙම එකක් නැහැ. මොකද, 2015 - 2017 කාලයේ අධිකරණ පද්ධතිය භාරව හිටපු, ලංකාවේ විනිමය හොරා ගත්ත, කොල්ල කාපු ඇවන්ගාඩ් එකට අදාළව දැඩි ලෙස කථා බහට ලක් වූ අධිකරණ ඇමතිතුමා එතුමාගේ මුළු පවුලත් එක්කම ඒ cruise ship එකේ සවාරි ගහන photo ඇමෙරිකාවේ සංසරණය වෙනවා අපි දැක්කා. මම ඊළඟට බැලුවා, චෝදනා ලබපු අය අත්අඩංගුවට පත්වීම වැළැක්වීමට මැදිහත් වුණාය කියන චෝදනාව ගරු අධිකරණ ඇමතිතුමාට තිබෙනවාද කියලා. ඇත්තටම, එහෙම චෝදනාවක් නැහැ. ඒ වාගේම තමන්ගේ දුව හෝ පුතා පාවිච්චි කරලා අත්අඩංගුවට පත්වෙච්ච අය නොමරා ඉන්න, එහෙම නැත්නම් හිර ගෙදර තුළදී වෙනත් පහසුකම් ලබා දෙන්න ඔවුන් හරහා කටයුතු කළාය කියන චෝදනාවක් මේ චෝදනා පත්‍රයේ තිබෙනවාද කියලා බැලුවා. ඇත්තටම, එහෙම එකක් නැහැ. මොකද, හරක් කටාලා වාගේ අය නොමරා ඉන්න කටයුතු කරපු, හිර ගෙදර තුළ පහසුකම් ලබා දෙන්න කටයුතු කරපු, ඒ වෙනුවෙන් මිලියන පන්සීය, දාහ ගත්ත ඇමති පුත්තු දැන් අත්අඩංගුවේ ඉන්න බව අපි දන්නවා. හැබැයි, හර්ෂණ නානායක්කාරට එහෙම චෝදනා ඇත්තේ නැහැ. ඒ වාගේම කලින් දූෂණ සහ වංචා චෝදනා එල්ල වෙච්ච දේශපාලකයන්ගේ පෞද්ගලික නීතිඥයකු හැටියට කටයුතු කළාය කියන චෝදනාව හර්ෂණ නානායක්කාරට තිබෙනවාද කියලා මම හොයලා බැලුවා. හැබැයි, එහෙම චෝදනාවක් නැහැ. රාජපක්ෂලාගේ පෞද්ගලික නීතිඥයා අධිකරණ ඇමති හැටියට පත් වෙච්ච ඉතිහාසයක් තිබෙන රටක් මේක. හැබැයි, අපේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට විරුද්ධව එහෙම චෝදනාවක් ඉදිරිපත් කරන්න සමත් වෙලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කලින් සඳහන් කළා වාගේ මීගමුව බන්ධනාගාරයේ ඇතිවෙච්ච ගැටුම පිළිබඳ කම්පනයක්, සහකම්පනයක්, කනගාටුවක් අපි හැමෝම තුළ

තිබෙනවා. හැබැයි, ලංකා ඉතිහාසය තුළ හෝ ලෝක ඉතිහාසය තුළ පළමුවැනි වතාවට නොවෙයි මෙවැනි ගැටුම් ඇතිවුණේ. වගකීම්සහගත රජයක් හැටියට බන්ධනාගාර නිලධාරින්ගේ වාගේම රැඳවියන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන එක තමයි අපේ වගකීම. නමුත් සිදුවීම් වෙන එක සියයට සියයක් වළක්වන්න බැහැ. 2021දී ඉක්වදෝරයේ මේ වාගේම කැරැල්ලක් ඇති වුණා. එහිදී 119දෙනෙක් මැරුණා. 2022දී ඉක්වදෝරයේ බන්ධනාගාරයක් තුළ නැවතත් කැරැල්ලක් ඇතිවුණා. ඒ අවස්ථාවේ 44දෙනෙක් මැරුණා. 2017දී බ්‍රසීලයේ 56දෙනෙක් මැරුණා. අපට මතකයි, 2012දී ලංකාවේ වැලිකඩ බන්ධනාගාරයේ රැඳවියන් 27දෙනෙක් මැරුණු අවස්ථාව. ඒ අය පෝලිමට තියලා නම් කිය කියා කථා කරලා ඔළුවට වෙඩි තියලා මැරුවා කියන එක මාධ්‍යවලින් අනාවරණ වුණා. එහෙම දෙයක් මීගමුවේදී සිදු වුණේ නැහැ. 2020දී මහර බන්ධනාගාරයේ 11දෙනෙක් මැරුණා. 2026දී මීගමුවේත් අවාසනාවන්ත විධියට බන්ධනාගාර නිලධාරින් ඇතුළුව 30 දෙනෙක් සාතනය වෙලා තිබෙනවා. මේ රටේ ජනතාව ඉල්ලා සිටින පරිදි බන්ධනාගාරවලට අවශ්‍ය පහසුකම් වැඩි කරලා, අවශ්‍ය වන මානව සම්පත් සහ භෞතික සම්පත් ලබා දීලා කටයුතු කිරීමේ වගකීම, ඒ අයගේ ජීවිත ආරක්ෂා කිරීමේ වගකීම බන්ධනාගාර ඇමතිවරයා හැටියටත්, රජයක් හැටියටත් අපි කිසිලෙසකින් පැහැර හරින්නේ නැහැ. ඒ සඳහා අපට තිබෙන වගකීම අපි අමතක කරන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ජනතාව කාර්යක්ෂම, නොකිලිටි යුක්තිය පසිඳලීමේ පද්ධතියක් ඉල්ලා සිටිනවා. ඒ වාගේම රාජ්‍ය ආයතනවල බොහෝ අහුමුළුවල පැතිරිලා තිබෙන අපරාධවලින් මේ රට ගලවාගැනීමේ වගකීම ව්‍යවස්ථාදායකයටත්, විධායකයටත්, අධිකරණයටත් පොදුයි. සමස්ත යන්ත්‍රණය තුළ පැතිරිලා තිබෙන මේ අපරාධ රාජ්‍යයෙන් ගලවාගෙන නොකිලිටි රාජ්‍යයක් බවට පත් කිරීමේ වගකීම, මහජන අභිලාෂය, විධායකයට, ව්‍යවස්ථාදායකයට වාගේම අධිකරණයටත් පොදුයි. ඒ සඳහා මහජනතාවගේ කැමැත්ත, බලාපොරොත්තුව ජාතික ජන බලවේගය වෙත ලබා දීලා තිබෙනවා. ඒ සඳහා අපේ රටේ අධිකරණය ගුණාත්මකව වාගේම ප්‍රමාණාත්මකව වෙනස්කම්වලට ලක්විය යුතුයි. ඒක තමයි මේ පරිවර්තනීය අවධියේදී ජනතාව ඉල්ලා සිටින්නේ .

1978දී සාමාන්‍ය රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම යැමේ වයස 55ක් වෙලා තිබියදී ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විශ්‍රාම යැමේ වයස අවුරුදු 65ක් කළා. මේක දේශපාලන වුවමනාවට කළාය කියලා කිසිම චෝදනාවක් ඒ කාලයේ තිබුණේ නැහැ. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව වෙනත් විවේචන අපට තිබුණා. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විශ්‍රාම යැමේ වයස අවුරුදු 65ක් බවට පත්කිරීමට අදාළව දේශපාලන චෝදනාවක් ඒ කාලයේ ආවේ නැහැ. ඒ වාගේම 2020දී විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොට අගවිනිසුරු ඇතුළුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ උපරිම සංඛ්‍යාව 11 සිට 17 දක්වා වැඩි කළා. එහෙම වැඩි කරනකොට තමන්ගේ හිතවතුන් ඇතුළත් කරගන්න තමයි තව හයක් එකතු කරන්නේ කියලා එදා කවුරුවත් චෝදනා කළේ නැහැ.

ඒ වාගේම අපේ රටේ නඩු ගොඩගැසීම පිළිබඳ ඉතිහාසයත් අපි දන්නවා. මේ වෙනකොට මහාධිකරණවල අපරාධ නඩු 27,000ක් වාගේ ප්‍රමාණයක් තිබෙනවා. නමුත් විනිශ්චය ආසන තිබෙන්නේ 595යි. දිසා අධිකරණ නඩු 26,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. විනිශ්චය ආසන තිබෙන්නේ 2,650යි. මහේස්ත්‍රාත් අධිකරණ නඩු 818,000ක ප්‍රමාණයක් තිබෙනවා. විනිශ්චය ආසන තිබෙන්නේ 7,000ක් වාගේ ප්‍රමාණයක්. ඒ නිසා සිවිල් අභියාචන මහාධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය යන අධිකරණවලත් විනිශ්චය ආසන සංඛ්‍යාව අනුරූපීව වෙනස් වෙන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා.

මම කලින් කිව්වා වාගේ, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරනකොට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු 65යි, අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු 63යි, මහාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු 61යි, අනෙක් විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු 60යි. හැබැයි, 1978දී උපතේදී අපේක්ෂිත ආයු කාලය අවුරුදු 66.39ක්. හැබැයි, දැන් වනකොට - 2026දී - උපතේදී අපේක්ෂිත ආයු කාලය අවුරුදු 77.67ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අවුරුදු 48කට පස්සේ මේ සියලු වෘත්තිකයන්ගේ විශ්‍රාම යන වයස ගැන පියවරෙන් පියවර, ප්‍රමුඛතාව මත, අවශ්‍යතාව මත තීන්දු ගන්න ඕනෑ කාලය ඇවිල්ලාය කියන එකත් මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි.

අපි දන්නවා, විශේෂඥ වෛද්‍යවරුන් බඳවා ගන්න අපට වුවමනාව තිබුණත්, බඳවා ගැනීමට ප්‍රමාණවත් වන පරිදි ඔවුන් ඉල්ලුම් කරන්නේ නැති බව. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් බඳවා ගැනීමට අපට වුවමනාව තිබෙනවා. නමුත්, ඒ සඳහා ප්‍රමාණවත් පිරිසක් ඉල්ලුම් කරන්නේ නැහැ. ඒ නිසා අපට කල්පනා කරන්න සිද්ධ වනවා, මේ සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් කටයුතු කරන්න ඕනෑ කියලා. මේ දේවල්වලට විරුද්ධ වන අය අතළොස්සක් ඉඳීවි. සුදු ඇඳගෙන ඉන්න අය, කළු ඇඳගෙන ඉන්න අය, කහ ඇඳගෙන ඉන්න අය මේවාට විරුද්ධ වෙයි. හැබැයි අපි දන්නවා, ඒ විරුද්ධ වීම පිටුපස - ඒ අතළොස්සක් පිටුපස - කුමන වුවමනාවක් ද තිබෙන්නේ කියලා. ඒ අයගේ වුවමනාව තිබෙන්නේ හොඳ රටක් බිහි කිරීමට, ස්වාධීන අධිකරණ පද්ධතියක් බිහි කිරීමට නොවෙයි. ඇත්ත වශයෙන්ම ඔවුන්ගේ අවශ්‍යතාව තිබෙන්නේ අර දූෂිත වළල්ල ආරක්ෂා කර ගැනීමටයි කියන එක මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශ්වාසභංග යෝජනාව ගෙනෙන මහත්වරුන්ට අවසාන වශයෙන් මම දෙයක් කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මගේ කාලය බොහොම ඉක්මනට සීමා කරනවා කියලා මම දන්නවා. අපේ ඇඟේ ලේවල පාටම තමයි අපේ පක්ෂයේ පාට. අපේ සහෝදරයෙකුට, අපේ සහෝදරියකට අභූත චෝදනා ඉදිරිපත් කරලා කොටු කරන්න උත්සාහ කරනවා නම්, ඔවුන් වට්ටන්න උත්සාහ කරනවා නම් ඊට එරෙහිව නැඟී සිටින්නේ මේ සභා ගර්භය ඇතුළේ ඉන්න 158දෙනා විතරක් නොවෙයි, එළියේත් තවත් ලක්ෂ සංඛ්‍යාත පවුල් ඒ අය ආරක්ෂා කරන්න, ඒ අය වෙනුවෙන් පෙනී සිටින්න ඉන්නවාය කියන එක හොඳට මතක තියාගන්න කියලා ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

බෙහෙවින්ම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Pathmanathan Sathiyalingam. The Floor is yours for seven minutes.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Hon. Deputy Speaker, it must be eight minutes.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we have been reducing time because we started late.

[பி.ப. 1.32]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இன்றைய தினம் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் கௌரவ ஹர்ஷன நாணாயக்கார அவர்களுக்கு எதிராகக் கொண்டு வரப்பட்டுள்ள நம்பிக்கையில்லாப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு, எமது நிலைப்பாட்டை இந்தச் சபைக்குத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றோம்.

கௌரவ அமைச்சருக்கு எதிராகக் கொண்டுவரப்பட்டுள்ள நம்பிக்கையில்லாப் பிரேரணையில், அவருக்கு எதிராகப் பல குற்றச்சாட்டுகள் முன்வைக்கப்பட்டு இருக்கின்றன. அவற்றில் பலவற்றுக்குப் பதில் சொல்லவேண்டிய கடப்பாடு கௌரவ அமைச்சர் அவர்களுக்கும் இந்த அரசாங்கத்துக்கும் உள்ளது என்பதில் எமக்கு எந்த மாற்றுக் கருத்தும் இல்லை. நீர்கொழும்பு சிறைச்சாலையில் நடந்த அநியாயமான கொலைகளுக்குப் பொறுப்புக்கூற வேண்டியது மட்டுமல்ல, இவ்வாறான சம்பவங்கள் மீண்டும் நிகழாமல் இருப்பதை உறுதிப்படுத்த வேண்டிய பாரிய பொறுப்பும் கௌரவ அமைச்சருக்கு உள்ளது என்பதில் எவருக்கும் மாற்றுக் கருத்து இருக்க முடியாது. இவ்வாறான சிறைக்கலவரம் ஏற்படுவதற்கு ஏற்ற பல காரணங்கள் அங்கு மாத்திரமல்ல, இன்னும் பல சிறைச்சாலைகளிலும் காணப்படுகின்றன. இந்த நிலைக்குப் பொறுப்புக்கூற வேண்டியவர் தற்போதைய அமைச்சர் மட்டுமா? அல்லது இதுவரை காலமும் இந்த விடயத்துக்குப் பொறுப்பாக இருந்த அனைத்து அமைச்சர்களுமா? என்ற கேள்வி எங்களிடம் உள்ளது. தற்போது சிறைச்சாலைகளில் காணப்படும் பிரச்சினைகள் கடந்த காலங்களில் காணப்பட வில்லையா? என்ற கேள்வியும் எங்களிடம் இருக்கின்றது. கடந்த காலங்களில் சிறைக்கூடங்களில் அரசியல் கைதிகள் படுகொலை செய்யப்பட்டபோது, எந்த அமைச்சர், எந்த அரசாங்கம் பொறுப்புக் கூறியது? ஒரு நாளும் அவ்வாறு நடந்ததில்லை.

இவ்வாறான படுகொலைகள் எமது நாட்டில் ஒரு தடவையல்ல, பல தடவைகள் நடைபெற்றிருக்கின்றன. மீண்டும் மீண்டும் அவ்வாறான நிகழ்வுகள் நடைபெறாமல் தடுப்பதற்கு ஏன் இதுவரை காலமும் இந்த நாட்டை ஆண்ட அரசாங்கங்களோ, அமைச்சர்களோ நடவடிக்கை எடுக்கவில்லை? அவற்றுக்குப் பொறுப்புக்கூற வேண்டிய வர்கள் யாராக இருப்பார்கள்? என்ற கேள்விகளும் எங்களிடம் இருக்கின்றன. சிறைச்சாலைகளில் காணப்படும் பிரச்சினை களுக்குப் பொறுப்பேற்று கடந்த காலத்திலும் அமைச்சர்கள் பலர் பதவி விலகியிருக்க வேண்டுமல்லவா? எனினும், அவ்வாறான பதவி விலகல்கள் கடந்த காலங்களில் நடைபெறவில்லை என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். ஏன் அவ்வாறு செய்யவில்லை? அவ்வாறான பிழைகளை ஏற்றுக்கொண்டு பதவியிலிருந்து சுயமாக விலகும் கலாசாரம் எமது நாட்டில் அன்றும் இல்லை; இன்றும் இல்லை. ஆனால், குறைந்தபட்சம் கௌரவ அமைச்சர் ஹர்ஷன நாணாயக்கார அவர்கள் சம்பவம் நடந்து ஒருசில மணிநேரத்தில், சம்பவத்துக்கான காரணம் விசாரிக்கப்பட முன்னரே அதற்கான பொறுப்பை ஏற்றுக்கொண்டார். அதற்காக நாங்கள் அவரைப் பாராட்டுகின்றோம்.

தேசிய மக்கள் சக்திக்கு நாடு முழுவதிலும் விசேடமாக, வடக்கிலும் கிழக்கிலும் பெருமளவான மக்கள் வாக்களித்து ஒரு மாற்றத்தை வேண்டி நின்றார்கள் என்றும் அது தமிழ் மக்களின் பிரார்த்தனை என்றும் நேற்று இங்கு உரையாற்றிய கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் தெரிவித்தார். அவர் குறிப்பிட்டது போல, மக்கள் மாற்றத்தை எதிர்பார்த்தது உண்மை! ஆனால், அதைப் புரிந்தவர்களாக அந்த மக்களின் எதிர்பார்ப்பை நிறைவேற்றுவதற்கு ஏதாவது முயற்சி எடுக்கிறீர்களா என்று அதே மக்கள் சந்தேகம்கொள்ளும் அளவுக்கு நீங்கள் நடந்து கொள்கிறீர்கள் என்று நான் நினைக்கின்றேன்.

தேசிய மக்கள் சக்தியின் தேர்தல் விஞ்ஞாபனத்தில் சொல்லப்பட்ட மிக முக்கியமான சில விடயங்களை நடைமுறைக்குக் கொண்டுவரவேண்டிய பொறுப்பிலுள்ள கௌரவ அமைச்சர் அவர்கள், அவ்விடயங்கள் தொடர்பில் நடவடிக்கை எடுக்காததையிட்டு நாங்கள் மனம் வருந்து கின்றோம். முதலாவது, புதிய அரசியல் யாப்பு ஒன்றைக் கொண்டுவருவோமென மக்களுக்குக் கொடுத்த வாக்குறுதி. அதற்காக கௌரவ அமைச்சர் அவர்கள் என்ன முயற்சி எடுத்தாரென நாங்கள் அறிந்துகொள்ள விரும்புகிறோம். அடுத்து, அரசியல் கைதிகளை விடுதலை செய்வதாகக் குறிப்பிடப்பட்டு இருந்தது. கௌரவ அஜித் பீ. பெரேரா அவர்கள் அரசியல் கைதிகள் தொடர்பான ஒரு கேள்வியை இங்கு எழுப்பியபோது, அதற்குப் பதிலளித்த கௌரவ அமைச்சர் அவர்கள், சிறைச்சாலைகள் கட்டளைச் சட்டத்திலும் ஏனைய ஒழுங்குவிதிகளிலும் அரசியல் கைதிகள் என்று யாரும் இல்லையென பதிலளித்து இருந்தார். அப்படியாயின், உங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்தில் அரசியல் கைதிகளென நீங்கள் யாரைக் குறிப்பிட்டு இருந்தீர்களென இந்தச் சந்தர்ப்பத்தில் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்க விரும்புகின்றேன்.

இப்போது செம்மணி மனிதப் புதைகுழியில் அகழ்வுகள் நடைபெற்று, கிட்டத்தட்ட 500 மனித எச்சங்கள் கண்டுபிடிக்கப்பட்டு இருக்கின்றன. கடந்த மாதம் கௌரவ சாணக்கியன் அவர்கள் நிலையியற் கட்டளை 27(2)இன்கீழ் கௌரவ அமைச்சரிடம் இது சம்பந்தமாகக் கேள்வி கேட்டார். அந்த அகழ்வுப் பணிகள் ஒருபக்கம் நடந்துகொண்டு இருக்க, இன்னொரு பக்கம் கண்டுபிடிக்கப்பட்ட மனித எச்சங்கள் தொடர்பான பரிசோதனைகளை உரிய இடத்தில் செய்து, அந்தக் கொலைகள் எந்தக் காலகட்டத்தில் நடைபெற்றன அல்லது அவை யாருடையவை என அடையாளப்படுத்தக் கூடிய வசதிகள் இருந்தும் கௌரவ அமைச்சர் அவர்கள் அவற்றைக் கையாளவில்லை என்பதில் எங்களுக்குப் பாரிய குறை இருக்கின்றது. 1996ஆம் ஆண்டு சந்திரிக்கா அம்மையாருடைய காலப்பகுதியில் 12 மனித எச்சங்கள் ஆய்வுக்காக ஐக்கிய இராச்சியத்துக்கு அனுப்பிவைக்கப் பட்டன. இப்போதும் அவை அங்கு இருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுப்பதனூடாக அவற்றை யேனும் ஆய்வு செய்வதற்குச் சந்தர்ப்பம் இருக்கின்றது. எனவே, எதிர்வரும் காலத்திலாவது இதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென கேட்டுக் கொள்கின்றோம்.

இறுதியாக, ஒரு விடயத்தை இந்த உயரிய சபைக்குக் கூற விரும்புகின்றேன். எமது நாட்டில் அரச சேவையில் காணப்படும் முறைமைக் குறைபாடுகளை நிவர்த்தி செய்ய நடவடிக்கை எடுக்காமல், தனிநபர்களைக் குற்றம் சொல்வத னாலோ அல்லது மாற்றுவதனாலோ இப்பிரச்சினைக்குத் தீர்வு காண முடியாது. எனவே, இந்தப் பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற அல்லது இந்தப் பாராளுமன்றத் துக்கு வெளியே இருக்கின்ற அரசியல்வாதிகள் அனைவரும் ஒன்றுசேர்ந்து சிறைச்சாலை முறைமை மாற்றத்துக்கு உழைக்க வேண்டுமெனவும், இவ்வாறான நிகழ்வுகள் மீண்டும்

நடைபெறாமல் இருப்பதற்கு கௌரவ அமைச்சர் அவர்கள் முன்னின்று உழைக்க வேண்டுமெனவும் கேட்டு, சந்தர்ப் பத்துக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Asitha Niroshana Egoda Vithana. You have nine minutes.

[අ.භා. 1.39]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ විශාල කාලයක් ගත්තා. එතුමා එළියේ විවිධ ක්‍රියාකාරකම් කරන මන්ත්‍රීවරයෙක් බව අපි දන්නවා. එක විටෙකදී පොලිස් නිලධාරින් එක්ක ඔට්ටු වෙනවා. හෝටලයකට ගියොත් වේටර්ට ගහනවා. ගමට ගියාම සිවිල් වැසියන්ට පිස්තෝලය දිගු කරනවා. ඒ විදියේ විවිධ ක්‍රියාකාරකම් කරලා ඒ සම්බන්ධව අධිකරණමය කටයුතුවලට ගියාට පසුව එතුමා මොකද කරන්නේ? එතුමා පාර්ලිමේන්තුවට එන්න ඕනෑය කියලා කලින් දන්නවා නම්, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියට කථා කරලා අවශ්‍ය ලිපිලේඛන අරගෙන උසාවියට ඉදිරිපත් කරන්න ඕනෑ, තමන්ගේ නීතිඥයා ලවා. එම ලිපිලේඛන උසාවියට ඉදිරිපත් කරලා එතුමා පාර්ලිමේන්තුවට එන්න ඕනෑ. එහෙම කරන්නේ නැතුව උසාවි නොයා, අර ලිපිලේඛන භාර නොදී එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා දැන් ගරු කථානායකතුමාට කියනවා, වරෙන්තුව ආපසු කැඳවන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අහන්නේ මේකයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නොවෙයි, කවුරු වුණත් වරෙන්තු කළාට පසුව මොන ස්ථාවර නියෝග යටතේද ගරු කථානායකවරයාට ඒ වරෙන්තුව ආපසු කැඳවන්න පුළුවන්? කොහේද එහෙම සඳහන්ව තිබෙන්නේ? මෙතැන අධිනීතිඥවරුත් ඉන්නවා, නීතිඥවරුත් ඉන්නවා. සුජීව සේනසිංහ නම් කමක් නැහැ. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් ඉන්නවා. එතුමා අධිනීතිඥ කියලා කියන්නේ. අපි නම් දන්නේ නැහැ අධිනීතිඥ ද කියලා. හැබැයි, එතුමා කියනවා, අධිනීතිඥ කියලා. මොකක්ද මේ දෙන උපදෙස? මොකක්ද මේ දෙන ආදර්ශය? ගරු කථානායකවරයාට ස්ථාවර නියෝග යටතේ වරෙන්තු ආපසු කැඳවන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම අද මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ 2026 ජූලි මාසයේ 05 සහ 06 කියන දිනවල මීගමුව බන්ධනාගාරයේ ඇති වුණු ගැටුමට අදාළව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමාට විරුද්ධවයි. මෙම විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරද්දීම විපක්ෂයේ තිබෙන එකමුතුකම සහ විපක්ෂයට තිබෙන විශ්වාසය භංග වීම ප්‍රකාශයට පත් වී තිබෙනවා. අපි දන්නවා, විපක්ෂයේ 66දෙනෙක් වාඩි වෙලා ඉන්න බව. හැබැයි, මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කර තිබෙන්නේ 37දෙනායි. අඩුම තරමින් සමගි ජන බලවේගයේ 46දෙනාවත් මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කර නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා සජිත් ප්‍රේමදාස මහත්තයාට කියන්න තිබෙන්නේ විශ්වාස භංග යෝජනාවක් ගෙනෙද්දී පළමුව විපක්ෂය එකතු කරගෙන මොකක් හරි කරන්න කියන එකයි.

පාර්ලිමේන්තු ඉතිහාසයේ මීට පෙර එක අවස්ථාවක පමණයි අධිකරණ ඇමතිවරයෙකුට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනැවිත් තිබෙන්නේ. ඒ, 1976 වර්ෂයේදී ෆිලික්ස් ආර්.ඩී. බණ්ඩාරනායක ඇමතිතුමාට විරුද්ධවයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන් පසුව අපේ රටේ බන්ධනාගාර ආශ්‍රිතව විවිධ අවස්ථාවල විවිධ සිදුවීම් වුණා. 1983 වර්ෂයේ දමිළ ජාතිකයන් විශාල ප්‍රමාණයක් වැලිකඩ බන්ධනාගාරයේ රඳවා සිටියදී එම බන්ධනාගාරය තුළ විශාල ඝාතනයක් සිද්ධ වුණා. ඒ සිදුවීමේදී 11දෙනෙක් ඝාතනය කර තිබෙනවා, 1983 වර්ෂයේදී. නමුත් විශ්වාස භංග යෝජනා ගෙනැවිත් නැහැ. ඒ වාගේම 2000 වර්ෂයේදී බිඳුණුවැව රඳවුම් මධ්‍යස්ථානයේ සිටි රඳවූවන් 27දෙනෙක් ඝාතනය කර තිබෙනවා. නමුත් විශ්වාස භංග යෝජනා ගෙනැවිත් නැහැ. 2012 වර්ෂයේදී වැලිකඩ බන්ධනාගාරයේ 27දෙනෙක් දණ ගස්වා වෙඩි තැබුවා, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ පාලන කාල සීමාව තුළ. නමුත් විශ්වාස භංග යෝජනා ගෙනාවේ නැහැ. ඊළඟට, 2020 වර්ෂයේදී මහර බන්ධනාගාරයේදී 11දෙනෙක් වෙඩි තබා ඝාතනය කළා. නමුත් විශ්වාංස භංග යෝජනා ගෙනාවේ නැහැ. 2021 වර්ෂයේ වැලිකඩ බන්ධනාගාරයේ සිද්ධිය වෙද්දී විශ්වාස භංග යෝජනා ගෙනාවේ නැහැ. එහෙම නම් ඇයි, 2026 වර්ෂයේදී සිදුවුණු මේ සිදුවීමට අදාළව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයට වැලේ වැල් නැති වෙලා තිබෙන වෙලාවක් මේක. ඒ නිසා ආණ්ඩුවට ප්‍රහාර එල්ල කරන්න පුළුවන් ඕනෑම අවස්ථාවක් ඒගොල්ලන් ප්‍රයෝජනයට ගන්නවා. මීට කලින් 2021 වර්ෂයේ සැප්තැම්බර් 12වැනි දා එවකට බන්ධනාගාර රාජ්‍ය ඇමතිවරයා විදියට කටයුතු කළ ලොහාන් රත්වත්තේ මහ රෑ අනුරාධපුර බන්ධනාගාරයට ගිහිල්ලා සිරකරුවන් දෙදෙනෙකු දණ ගස්වා පිස්තෝලය ඔළුවට තැබුවා. නමුත් විශ්වාස භංග යෝජනා ගෙනාවේ නැහැ. ලොහාන් රත්වත්තේ හිටපු රාජ්‍ය ඇමතිවරයාම 2021 වර්ෂයේ සැප්තැම්බර් 21වැනි දා මහ රෑ නිරූපිකාවක් එක්ක වැලිකඩ බන්ධනාගාරයට ගියා, එල්ලුම් ගහ බලන්න. නමුත් විශ්වාස භංග යෝජනා ගෙනාවේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිය හා සාමය පිළිබඳව වත්මන් ආණ්ඩුව ගෙන යන මේ ක්‍රියා පිළිවෙත නිසා බියපත් වෙච්ච කට්ටිය තමයි අද මේ කලබල වෙලා තිබෙන්නේ. අපි රට තුළ යුක්තිය හා සාධාරණය ඉෂ්ට කරන්න මැදිහත් වෙමින් තිබෙනවා. නීතියේ ආධිපත්‍යය තහවුරු කරන්න මැදිහත් වෙලා තිබෙනවා. ඒ වාගේම මනුෂ්‍ය ඝාතන කරපු, මූල්‍ය වංචා කරපු අපරාධකරුවන්ට දඬුවම් දෙමින් තිබෙනවා. එම ක්‍රියාවලිය වේගයෙන් ඉස්සරහට යමින් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මත්ද්‍රව්‍ය ජාවාරම්වලට එරෙහිව වැට බඳිමින් තිබෙනවා. ඒ නිසා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීම, ඒ හා සම්බන්ධ දේශපාලකයන් අත්අඩංගුවට ගැනීම සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ කවුද? මේ විශ්වාස භංග යෝජනාව ගෙනා සමගි ජන බලවේගයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෙක් ලෝක ඉතිහාසයේ පළමු වතාවට කප්පම් අරගෙන discount දීලා තිබෙනවා. ලෝක ඉතිහාසයේ කවදාද කප්පම්වලට discount දුන්නේ? ඒ ආදර්ශය දුන්නේ සමගි ජන බලවේගයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සිටින සාමාජිකයෙක්. එහෙම විපක්ෂයක් තමයි අද වත්මන් අධිකරණ ඇමතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නේ. මත්ද්‍රව්‍ය ජාවාරම නැති කරන්න, අධිකරණ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා මැදිහත් වෙන්න අපි කටයුතු කරද්දී තමයි මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්නේ. අපරාධකරුවන් අත්අඩංගුවට ගනිද්දී, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගනිද්දී බන්ධනාගාර තුළ තදබදයක් ඇති වෙනවා තමයි. ඒක අපට පිළිගන්න පුළුවන් දෙයක්. මීට කලින් ඇති වෙලා තිබෙන දෙයක් තමයි 2026දී මීගමුව බන්ධනාගාරය තුළදීත් සිදු වුණේ. ඒ නිසා මේක අධිකරණ ඇමතිවරයාට ඉල්ලා අස්

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

වෙන්නවත්, එහෙම නැත්නම් එතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නවත් කාරණයක් නොවෙයි. එහෙනම් අතීතයේදීත් මෙහෙම විශ්වාස භංග යෝජනා ගෙනැල්ලා තිබෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව ගෙනියන වත්මන් වැඩ පිළිවෙළට තිබෙන බියයි මේ පෙනෙන්න තිබෙන්නේ. විපක්ෂයේ අපරාධකරුවන්ට තිබෙන බිය තමයි මේකෙන් ප්‍රකාශයට පත් වෙන්නේ. වත්මන් පාලනය තුළ අපි වංචාවට සහ දූෂණයට එරෙහිව වැට බඳිමින් අපරාධකරුවන්ට එරෙහිව කරන සටන ශක්තිමත් කරලා තිබෙනවා. ඒ සඳහා මහෙස්ත්‍රාත්වරුන් 33දෙනෙක් බඳවා ගෙන තිබෙනවා. ඒ වාගේම අපි බන්ධනාගාර තුළ ඉඩකඩ පුළුල් කිරීම, ඒ සඳහා මුදල් වෙන් කිරීම, බන්ධනාගාරවලට නිලධාරින් බඳවා ගැනීම සිදු කර තිබෙනවා. ඒ වාගේම, රස පරීක්ෂක වාර්තා නොලැබීම නඩු ප්‍රමාදයට බලපාන නිසා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට නව බඳවා ගැනීම් 72ක් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාර ක්‍රියාවලිය තුළ අලුතින් ඇති විය යුතු තවත් වෙනස්කම් පිළිබඳව සොයා බැලීම සඳහා අපි කමිටුවක් පත් කරලා ඒ වාර්තා ලබා ගැනීමට කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන් වැලිසර නාවික හමුදා කඳවුර තුළ විශේෂ පුද්ගලයන්, බරපතළ අපරාධ කරපු පුද්ගලයන් බන්ධනාගාරගත කිරීම සඳහා අපි විශේෂ ස්ථානයක් සකස් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අධිකරණ ක්‍රියාවලිය සක්‍රිය කරන්න අපි විනිසුරුවන් විශ්‍රාම ගත යුතු වයස දීර්ඝ කිරීම පිළිබඳව සාකච්ඡාවක් ආරම්භ කරලා තිබෙනවා. ඒක අධිකරණ ක්‍රියාවලියෙනුත් අපිට ආපු යෝජනාවක් විධියට සාකච්ඡා කරමින් පවතිනවා. මේ වනකොට ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකරුවෙකු විශ්‍රාම ගත යුතු උපරිම වයස් සීමාව අවුරුදු 65යි. අභියාචනාධිකරණ විනිශ්චයකරුවෙකු විශ්‍රාම ගත යුතු උපරිම වයස් සීමාව අවුරුදු 63යි. මහාධිකරණ විනිශ්චයකරුවෙකු විශ්‍රාම ගත යුතු උපරිම වයස් සීමාව අවුරුදු 61යි. දිසා සහ මහෙස්ත්‍රාත් අධිකරණ විනිශ්චයකරුවෙකු විශ්‍රාම ගත යුතු උපරිම වයස් සීමාව අවුරුදු 60යි. ඒ නිසා පොදුවේ ගත්තොත්, අත්දැකීම් සහිත, පෘථුල දැනුමක් තිබෙන විනිසුරුවන් යම් කාලයක් අධිකරණ තුළ රඳවා ගන්න පුළුවන් නම් මේ අධිකරණ ක්‍රියාවලිය සක්‍රිය කරන්නත් එය ඉවහල් වෙනවා. එම නිසා අපි ඒ ක්‍රියාවලිය පිළිබඳවත් අවධානය යොමු කරමින් තිබෙනවා. දැන් සමහර කට්ටිය ඒකට තමයි භය වෙලා තිබෙන්නේ. අත්දැකීම් තිබෙන, පරිණත, ඒ වාගේම බරපතළ අපරාධ පිළිබඳව විමර්ශනය කිරීමේ හැකියාව තිබෙන, දැනුම තිබෙන විනිසුරුවන් මේ අධිකරණ ක්‍රියාවලියෙන් පලවා හැරීම තමයි වත්මන් විපක්ෂයේ තිබෙන මූලික අරමුණ.

ඊයේ අපි දැක්කා සාකච්ඡාවක් පවත්වනවා. ඒ photograph එක නම් මසුරන් වටිනා photograph එකක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ photograph එක හුදී ජන පහන් සංවේගය ඇති වන photograph එකක්. අපි ගහපු කතිරය මොන තරම් ඵලදායීද කියන එක ඒ photograph එකෙන් තේරෙනවා කියලා තමයි රටේ මහජනතාව කියන්නේ. අලි, කොටි, වලස්සු, සර්පයෝ ඔක්කොම එකට එකතු වෙලා තිබෙනවා. විනිසුරුවන් විශ්‍රාම ගත යුතු වයස දීර්ඝ කිරීම පිළිබඳව බරපතළ සාකච්ඡාවක් තමයි විපක්ෂය ගෙනියන්නේ. ඒ සාකච්ඡාවට යනකොට අඩු තරමින් සමගි ජන බලවේගයේ අධිනීතිඥ කියා ගන්නා මහත්මයාවත් අරගෙන ගිහිල්ලා නැහැ නේ, හත්වළාමේ! කවදාවත් සජිත් ප්‍රේමදාස මහත්මයාට virtual ආණ්ඩුවක් හැරෙන්න වෙන ආණ්ඩුවක් හදන්න බැහැ. එහෙම හදන්න සූදානම් වන virtual ආණ්ඩුවේ අඩුම තරමින් shadow Cabinet එකේවත් ඇමතිකමක් නම් ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අධිනීතිඥයෝ ඔක්කොම පැත්තකින් තියලා තමයි සජිත් ප්‍රේමදාස මහත්මයා ඒ සාකච්ඡාවට ගිහිල්ලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට කියන්න තිබෙන්නේ මේ නඩු ගොඩනැඟිලා තිබෙන්නේ පැරණි ආණ්ඩුවල හිටපු දූෂිතයන්ට එරෙහිවයි කියන එක තමයි. රාජපක්ෂ පාලනය කරපු අපරාධවලට එරෙහිව තමයි මේ කටයුතු කරමින් තිබෙන්නේ. ඒ වාගේම, සජිත් ප්‍රේමදාස මහත්මයාගේ සමගි ජන බලවේගයේත්, එක්සත් ජාතික පක්ෂය ඇතුළු පසුගිය කාලයේ පාලනවලට හවුල් වෙච්ච ඒ සියලු මහත්වරුන් කරපු අපරාධ, මූල්‍ය වංචා තමයි මේ එකපිට, එකපිට අධිකරණ ක්‍රියාවලිය තුළ විභාග වෙමින් තිබෙන්නේ. ඒ නිසා අත්දැකීම් සහිත විනිසුරුවන් අපට අවශ්‍යයි. ඔවුන් විශ්‍රාම ගත යුතු වයස දීර්ඝ කිරීම පිළිබඳව බියපත් වෙලා තිබෙන්නේ වෙන මොකුත් නිසා නොවෙයි, ඒ අධිකරණ ක්‍රියාවලිය ඇතුළේ රටේ ජනතාවට යම් සාධාරණයක් වෙයි කියන ප්‍රශ්නය නිසායි.

ඒ වාගේම, මේ ක්‍රියාවලියට එරෙහිව අදහස් ප්‍රකාශ කළා, නීතිඥ සංගමයේ සභාපතිවරයා ඇතුළු කුඩා කණ්ඩායමක්. ඒ නිසා අපට කියන්න තිබෙන්නේ මේකයි. පසුගිය සතියේ බ්‍රහස්පතින්දා සජිත් ප්‍රේමදාස මහත්මයා එක්ක සාකච්ඡාවක් කළා, රජීව් අමරසූරිය කියන නීතිඥ සංගමයේ සභාපතිවරයා. අපි දන්නා පරිදි ඔහු සමඟ එකඟ වෙලා තිබෙනවා, එළඹෙන පළාත් සභා මැතිවරණය පවත්වන අවස්ථාවේදී බස්නාහිර පළාත් සභාවේ මහ ඇමති අපේක්ෂක ධුරය දෙන්නම්, මේ මැච් එක ගහලා දෙන්න කියලා. ඒ විධියට රජීව් අමරසූරිය මහත්මයාට සජිත් ප්‍රේමදාස මහත්මයා පොරොන්දු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම දේශපාලන ඩීල් එකක් යන්නේ. මේ නීතිඥ සංගමය කියන්නේ මොකක්ද? රාජපක්ෂ පාලනය විසින් මුළුමහත් අධිකරණ පද්ධතිය තමන්ට අවනත කර ගන්න බැරි වෙද්දී, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියට විරුද්ධව කටයුතු කරමින් ඒ අගවිනිසුරුවරිය පන්නා දමන්න උත්සාහ කරද්දී ඒ ත්‍රාඩ මැදිහත් වීමට විරුද්ධව කෙළින් හිට ගත්ත නීතිඥ සංගමයක් එදා තිබුණා. ඒ වාගේම තමයි, අරගළය වෙලාවේදී මේ රටේ සුවහසක් මහජනතාව වෙනුවෙන් කෙළින් හිට ගත්ත නීතිඥ සංගමයක් තිබුණා. අද ඒකේ වත්මන් සභාපතිවරයා කුඩා කල්ලියක් එක්ක සජිත් ප්‍රේමදාස මහත්මයාට විකිණිලා තිබෙනවා. මහ ඇමති ධුරයට මුළුමහත් නීතිඥ සංගමයේ අරමුණ පාවා දෙමින් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක සාහසික අපරාධයක්. අපි නීතිඥ සංගමයේ ඉන්න සහෝදර නීතිඥයන්ගෙන් මේ කාරණය ඉල්ලා සිටිනවා. ඔබට කීර්තිමත් ඉතිහාසයක් තිබෙනවා. ඔබ අයුක්තියට, අසාධාරණයට විරුද්ධව හැම වෙලාවේම හිට ගත්ත නීතිඥ සංගමයක්. ඒ නිසා කිහිප දෙනෙකුගේ හෝ සභාපතිවරයාගේ ඊළඟ මහ ඇමති සිහිනයට ඔබගේ නීතිඥ වෘත්තිය පාවා දෙන්න එපා. ඒ නිසා කරුණාකරලා නීතිඥ සංගමයේ ඇති වෙලා තිබෙන මේ බෙදීම, ඒ වාගේම දේශපාලන වශයෙන් මේ කරන පාවා දීමට එරෙහිව ඔබ අවදි වෙන්න කියලා අපි මේ රටට ආදරය කරන සකලවිධ නීතිඥවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Namal Rajapaksa. You have seven minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 1.50]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, පසුගිය ආණ්ඩුව කාලයේ විශ්වාස භංග යෝජනා ගෙනාවේ නැහැ කියලා. ඒක ඇවිල්ලා අපට කියන්න එපා. අනුර කුමාර ජනාධිපතිවරයාගෙන් අහන්න ඇයි විශ්වාස භංග යෝජනා ගෙනාවේ නැත්තේ කියලා. ඔබතුමන්ලා ඒ වෙලාවේ ඒවා වැරැදියි කියලා දැක්කා නම් විශ්වාස භංග යෝජනා ගෙනෙන්න තිබුණා. ඒ වෙලාවේ අනුර කුමාර ජනාධිපතිවරයා, ලොහාන් රත්වත්ත රාජ්‍ය ඇමතිවරයා එක්ක දාපු ඩීල් ගැන මම දන්නේ නැහැ. අපි දන්නවා නේ ඉතින් කට්ටිය ගැන ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

දැන් ලොකු චෝදනාවක් නැඟුවා නීතිඥ සංගමයේ සභාපතිවරයා ගැන. මම මෙහෙම අහනවා අපේ අධිකරණ ඇමතිතුමාගෙන්. එතුමාත් නීතිඥවරයෙක්. ගරු ඇමතිතුමා, අධිකරණ ඇමතිතුමනි,-

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
පොඩ්ඩක් phone එක තියලා - *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මම ප්‍රශ්නයක් අහන්නේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
පස්සේ උත්තර දෙන්නම් ඔබතුමාට.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
අර කරපු චෝදනාව ඔබතුමා පිළිගන්නවාද? ඔබතුමා අධිකරණ ඇමතිවරයා විධියට, මේ රටේ නීතිඥ සංගමයේ සාමාජිකයකු විධියට, නීතිඥවරයකු විධියට ඒ චෝදනාව අනුමත කරනවාද?

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔව්, වටගල නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා. ඔබතුමන්ලා අනුමත කරනවාද අර චෝදනාව? රටේ නීතිඥ සංගමයේ සභාපතිවරයා විපක්ෂ නායකවරයා හම්බ වුණාම, ඒක දේශපාලන ඩීල් එකක් කියනකොට ඔබතුමන්ලා ඒක අනුමත කරනවාද? මොකද, ඔබතුමන්ලා නීතිඥවරු. ඔබතුමන්ලා නීතිඥ සංගමයේ සාමාජිකයෝ. ඔබතුමන්ලා විපක්ෂයේ හිටපු කාලයේ නීතිඥ සංගමය තරම් ලොකු දෙයක් තිබුණේ නැහැ ඔබතුමන්ලාට.

දැන් පින්තූරයක් ගැන කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊට කලින් යහ පාලන ආණ්ඩුව තිබුණු කාලයේ එදා ගහපු පින්තූරයේ මම විතරයි අඩු. යහ පාලන ආණ්ඩුව කාලයේ ඒ පින්තූරයේ ඒ team එකත් එක්කම අනුර කුමාර මහත්මයාත් වාඩි වෙලා හිටියා. එකම වෙනස, දැන් අනුර කුමාර මහත්මයා අයින් වෙලා මම ඒ පින්තූරයට ඇවිල්ලා. දැන් ඒ පින්තූරයට බණිනවා. ඔබතුමන්ලා ඒ කට්ටිය එක්ක වාඩි වෙලා දේශපාලනය කරලා ඩීල් දමනකොට හොඳයි, එතකොට හොඳයි. හැබැයි, ඒ පින්තූරයට දැන් බැන්නාට එදා ඒ පින්තූරයේ හිටියේ අනුර කුමාර මහත්මයා.

ගරු අධිකරණ ඇමතිතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමා වගකීම භාර ගත්තා. ඔබතුමා ඇවිල්ලා මාධ්‍යයට කිව්වා, "මම වගකීම භාර ගන්නවා" කියලා. හැබැයි වගකීම භාර ගත්තා කියලා ඒකෙන් ඈත් වෙන්න බැහැ. ජීවිත 30කට ආසන්න සංඛ්‍යාවක් නැති වෙලා තිබෙනවා. ඒ වාගේම අපි දැන ගන්න කැමැතියි, අධිකරණ ඇමතිවරයාගෙන් - පොලීසිය භාර ඇමතිවරයාත් සභාවේ ඉන්නවා - මේ සම්බන්ධයෙන් බුද්ධි අංශ වාර්තාවක් ලැබුණාද කියලා. බුද්ධි අංශ වාර්තාවක් ලැබුණා නම්, ඒ බුද්ධි අංශ වාර්තාව ගැන ආරක්ෂක කවුන්සලය මඟින් ගරු ජනාධිපතිවරයා දැනුවත් කළාද? ගරු ජනාධිපතිතුමා දැනුවත් කළා නම් ගරු ඇමතිතුමනි, ගරු ජනාධිපතිතුමා ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද? එහෙම නැත්නම් බුද්ධි අංශ වාර්තාවක් ලැබුණේ නැද්ද? ඇමතිතුමා මේ පිළිබඳව දන්නේ නැද්ද? හමුදාවට, බුද්ධි අංශයට, පොලීසියට මේ පිළිබඳව අවබෝධයක් තිබුණේ නැද්ද? ඔබතුමන්ලාට මේක දේශපාලන කාරණයක් කරලා ඇඟ බේරා ගන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් අවුරුදු දෙකක් වෙනවා මේ ආණ්ඩුව ඇවිල්ලා. ඔබතුමන්ලා ආණ්ඩුව ගන්නකොට බන්ධනාගාර පද්ධතිය තුළ යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබුණා. හැබැයි ඒ ක්‍රියාත්මක වෙලා තිබ්බ ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙළ ඔබතුමන්ලා නැවැත්වුවා. විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන පනත සංශෝධනය කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නයි තිබෙන්නේ. එහෙම වුණා නම් 15,000කට වැඩි ප්‍රමාණයකට කඩිනමින් තීන්දු දෙන්න පුළුවන්. ඇමතිතුමා, දැන් මාස 6ක් ගිහිල්ලා නේ. ඔබතුමන්ලාට මේ අධිකරණ පද්ධතියේ තිබෙන නඩු ඉක්මනට ඉවර කර ගන්න ඕනෑ කියලා නේ කියන්නේ. ඉතින් ඉවර කර ගන්න ඕනෑ නම් මාස හයක් මොකක්ද කළේ? හැබැයි, දැන් ප්‍රශ්නයක් ඇති වුණාම, ඒ පිළිබඳව කතිකාවක් ඇති වුණාම, දැන් ඒක ගෙනෙන්න කථා කරනවා. ඒක ගෙනෙන්න, ගෙනැල්ලා සංශෝධනය කරන්න. 41,000ක් බන්ධනාගාරවල ඉන්නවා. 10,000යි ඒවායේ තියන්න පුළුවන්. ඒ 41,000න් 15,000කට අදාළව කඩිනමින් තීන්දු දෙන්න පුළුවන්. ඒ තීන්දුව දෙන්න පුළුවන් හැකියාව තිබෙද්දී, ඒ තීන්දුව දෙන්න පුළුවන් වැඩ පිළිවෙළ තිබෙද්දී මොකක්ද, ඔබතුමන්ලා කරන්නේ? ඒකට අවශ්‍ය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැතුව ඉන්නවා

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

ඊළඟට, බන්ධනාගාර පද්ධතිය digitalize කරන එක ගැන ඇමතිතුමාට මම පසුගිය දවසකත් මතක් කළා. "ඔව්, කරනවා" කිව්වා. දැන් අවුරුදු දෙකක් තිස්සේ "කරනවා" කියනවා. අලි සබ්රි ඇමතිතුමා හිටපු කාලයේ ඒකේ procurement කටයුතු පවා ඉවර කරලා තිබුණේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒක ක්‍රියාත්මක කරන්නයි තිබුණේ. හැබැයි, ඒ වෙලාවේ තිබුණු දේශපාලන වාතාවරණයත් එක්ක ආණ්ඩුව මාරු වුණා. ඒ නිසා අලි සබ්රි අමාත්‍යවරයාට එදා ඒක ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා. හැබැයි, දැන් ඔබතුමන්ලා බලයට ඇවිල්ලා අවුරුදු දෙකක් වෙනවා. නමුත් අද වෙනකල් ඒක ක්‍රියාත්මක කරලා නැහැ. දැන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා විෂය භාර ඇමතිවරයා calls ගන්නවා. විවාදය යද්දී ඇමතිතුමා phone එකෙන් මල් කඩනවාද දන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ පාර්ලිමේන්තුවට විනයක් ඇතිව නේද ආවේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
පාර්ලිමේන්තුවේ විනයක් තිබෙනවා කිව්වා නේද? තමන්ට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනකොට, තමන්ට විරුද්ධව මතයක් ගොඩනැඟෙනකොට, තමන්ට විරුද්ධව චෝදනා එල්ල වෙනකොට කැබිනට් ඇමතිවරයා phone එකේ! ගෙවල්වල අයගේ ප්‍රශ්න විසඳනවා. රටේ ජනතාවගේ ප්‍රශ්න විසඳනවා නම් හොඳයි. හැබැයි, ගෙවල්වල අයගේ ප්‍රශ්න තමයි විසඳන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

බන්ධනාගාර රෝහලේ අදටත් බෙහෙත් නැහැ, ගරු ඇමතිතුමා. රටේ අනෙකුත් රෝහල්වලත් බෙහෙත් නැහැ. ජීවිත ආරක්ෂාව සඳහා වන life-saving drug එකක් තිබෙනවා, IV furosemide කියලා. ඒ drug එක ගෙනෙන්න ආණ්ඩුව මැදිහත් වෙලා තිබෙනවාද? බන්ධනාගාරයේ ඩෙංගු රෝගීන් ඉන්නවා. රට පුරාත් ඩෙංගු ව්‍යාප්ත වෙනවා. හැබැයි, ඩෙංගු මර්දනය කරන්න ආණ්ඩුවේ තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? ගරු ඇමතිතුමනි, ඔබතුමාට මේවා නිලධාරින් පිට පටවලා ඇඟ බේරා ගන්න බැහැ.

මම දැක්කා, "පරීක්ෂණ කරනකොට වෙඩි තියපු අය අල්ලන්නම්" කියනවා. පරීක්ෂණ කරන්න. හැබැයි, ඔබතුමන්ලා මේ කාරණය සම්පූර්ණයෙන් දේශපාලනීකරණය කරන්න ලැහැස්ති වෙන්න එපා. නඩු අහන්න. ඒ කටයුතු ඉක්මන් කරන්න. අධිකරණවල ප්‍රමාණය වැඩි කරන්න. විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස් සීමාව දිගු කළා කියලා අධිකරණ ප්‍රමාණය වැඩි වෙන්නේ නැහැ නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. විශාල පිරිසක් අධිකරණ පද්ධතියට බැඳෙන්න බලාගෙන ඉන්නවා. හැම අවුරුද්දේම නීතිඥවරු 1,000කට, 1,500කට ආසන්න ප්‍රමාණයක් දිවුරුම් දෙනවා. අපේ රටේ අධිකරණ පද්ධතියට නීතිඥවරුන්ගේ, ගරු විනිශ්චයකාරවරුන්ගේ අඩුවක් නැහැ. ඒ අයට අවස්ථාව දෙන්නයි තිබෙන්නේ. අද අධිකරණ පද්ධතියට විනිශ්චයකාරවරු බඳවා ගන්නවා වාගේම, අනික් පැත්තෙන් වෛද්‍යවරු බඳවා ගැනීම සම්බන්ධයෙන් තවම ප්‍රමාදයක් තිබෙනවා. මේවා පිළිබඳව ඔබතුමන්ලා අවධානය යොමු කරන්නේ නැතුව අප බය කරලා, "අපට ඉන්නවා, 159ක්, ඕනෑ එකක් නුඹලා කර ගනින්" කියන න්‍යායෙන් කටයුතු කරන්න ගියාම වෙන්නේ මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අර කථාවක් තිබෙනවා නේ, "ඉල්ලාගෙන කනවා" කියලා. මේ ඉල්ලාගෙන කන කාලේ. ඒ හින්දා අද පැහැදිලිවම ආණ්ඩුව මේ වගකීම භාර ගන්න ඕනෑ. මොකද, ජීවිත 30ක් නැති වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට තව පොඩි වෙලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේක ආණ්ඩුවට වළක්වා ගන්න තිබුණා. හැබැයි, ඔබතුමන්ලා වළක්වා ගත්තේ නැහැ. පළමු පැය 24 තුළ වළක්වා ගන්න තිබුණා. අපි අඩු ගාණේ බන්ධනාගාර හදන්න වැඩකටයුතු පටන් ගත්තා. හොරණ ප්‍රදේශයේ ඉඩම් අත්පත් කරගත්තු එකේ වැඩකටයුතු පටන් අරගෙන අවසන් කරන්න ඔබතුමන්ලා මැදිහත් වුණේ නැහැ. අම්පාරේ පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් දාන්න තිබුණා, ඒක නැවැත්තුවා. අඩු ගාණේ දැන්වත් පසුගිය ආණ්ඩුව කරපු හින්දා මේවා නවත්වනවා කියන න්‍යාය පත්‍රයේ ඉන්නේ නැතුව ඔබතුමන්ලා මේ වැඩ ටික කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔව්, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට ප්‍රථම කථා කරපු මන්ත්‍රීතුමා විසින් අධිකරණ අමාත්‍යවරයා සම්බන්ධයෙන් එක වැරදිසහගත ප්‍රකාශයක් කළා. එතුමා කථා කරන වෙලාවේ අධිකරණ ඇමතිතුමා මල් කඩනවාද දන්නේ නැහැ කිව්වා. ස්ථාවර නියෝග අනුව, වැරදි අර්ථකථන ගෙන දෙන අර්ථ ආරෝපණය කිරීම කරන්න පුළුවන්කමක් නැහැ. වාචාලකමේ සීමාවක් තියා ගන්න ඕනෑ. ඒක නිසා මෙතැන කවුරු හරි කියනවා නම්, අධිකරණ ඇමතිතුමා මල් කඩනවා කියලා, ඒක වැරදි අර්ථකථනයක්. එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියන ඉල්ලීම මම කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අධිකරණ අමාත්‍යවරයා තොරතුරු වගයක් ලබා ගනිමින් ඉන්නේ. එතුමාට එතුමාගේ දුරකථනය පාවිච්චි කරන්න බැරිද මේ සභා ගර්භයේ? මොනවාද එතුමන්ලා මේ කියන කථා? ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වාචාලකමේ සීමාවක් තියා ගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
**(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Hon. Deputy Chairperson of Committees)
ඒ අනවශ්‍ය වචන හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස නියෝග කරනවා.

ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා. ඔබතුමා කථාව පටන් ගන්න.

[අ.භා. 1.59]

**ගරු රුවන් විජේවීර මහතා**
**(மாண்புமிகு ருவன் விஜேவீர)**
(The Hon. Ruwan Wijeweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අධිකරණ හා ජාතික ඒකාබද්ධතා පිළිබඳ ගරු අමාත්‍යතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් මේ සභාවට ගෙනැවිත් තිබෙන අවස්ථාවේ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය දශක ගණනාවක් තිස්සේ අපේ රටේ අපරාධ රාජ්‍යයක් ගොඩ නැඟිලා තිබුණා. ඒ අපරාධ රාජ්‍යයට නායකත්වය දුන්නේ, දේශපාලන නායකත්වයෙන්. දේශපාලකයන්ගේ ආශීර්වාදයෙන් තමයි ඒ අපරාධ රාජ්‍යය ගොඩ නැඟුණේ. දේශපාලකයන්ගේ නායකත්වයෙන් එය ගොඩ නැඟෙනකොට ඒ දේශපාලන නායකයන්ගෙන් වරදාන, වරප්‍රසාද ලබමින් ඒ වටා එකතු වෙච්ච වෙෘර ව්‍යාපාරික වළල්ලක් හිටියා. ඒ විතරක් නොවෙයි. ඒකත් එක්ක එකට එකතු වෙච්ච මත්ද්‍රව්‍ය ජාවාරම කරපු, ඒකට නායකත්වය දුන්න පිරිසක් සිටියා. දේශපාලකයන්ගේ අනුහසින් මත්ද්‍රව්‍ය ජාවාරම කරපු දැවැන්ත ජාවාරම්කරුවන් පිරිසක් සිටියා. ඒකත් එක්ක බැඳිච්ච පාතාලයක් තිබුණා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. නීතිය අවනීතිය කරපු රාජ්‍ය නිලධාරින් කොට්ඨාසයක් ඒ අපරාධ රාජ්‍යය නිර්මාණය කරමින්, ඒ ඇතුළේ පිනුම් ගසමින් හිටියා. පුරවැසියන් විසින් ලබා දුන්නු බලය අවභාවිත කරමින් නීත්‍යානුකූල රාජ්‍යයට යටින් නිර්මාණය වෙච්ච බිහිසුණු අපරාධ රාජ්‍යයක් අපේ රටේ නිර්මාණය වෙලා තිබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අපරාධ රාජ්‍යයට එරෙහි වෙන්නට කිසිවෙකුට අවස්ථාවක් තිබුණේ නැහැ. කවුරු හරි එරෙහි වෙනවා නම් ඒ හැම කෙනෙකුම පරලොව යවන්නට ඒ දේශපාලන අධිකාරිය ප්‍රමුඛ අපරාධ රාජ්‍යයේ නායකයන් කටයුතු කළා. උදාහරණයක් විධියට කියනවා නම්, ඒ අපරාධ රාජ්‍යය ප්‍රශ්න කරනකොට ලසන්ත වික්‍රමතුංග ඝාතනය කළා. ඒ ගැන ප්‍රශ්න කරනකොට ෆෙඩ්‍රිකා ජැන්ස් පිට රටට යැව්වා, තර්ජනය කරලා; මේ රටින් එළවා දැම්මා.

ඒ විතරක් නොවෙයි. අපරාධ රාජ්‍යය ගැන ප්‍රශ්න කරන කොට පෝද්දල ජයන්ත, ප්‍රගීත් එක්නැලිගොඩ පමණක් නොව තවත් මාධ්‍යවේදීන් ගණනාවක් කුදලාගෙන ගිහිල්ලා ඝාතනය කළා; පැහැරගෙන ගිහිල්ලා අතුරුදහන් කළා. එහෙම තමයි එදා ඒ අපරාධ රාජ්‍යය කටයුතු කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒක කොච්චර තුච්ඡ තැනක තිබුණාද කියනවා නම්, ක්‍රීඩකයෙක් තමන්ට එරෙහිව ක්‍රීඩා කරනවා කියලා දැනගත්තාම, තමන්ට වඩා දක්ෂ ක්‍රීඩකයෙක් ඉන්නවා කියලා දැනගත්තාම ඒ ක්‍රීඩකයා පරලොව යවන්න පවා කටයුතු කළා. ඒ ආකාරයට එදා අපරාධ රාජ්‍යයක් නිර්මාණය කරලා තිබුණා. වසීම් තාජුදීන්ගේ ඝාතනය එවැන්නක්. "අපරාධ රාජ්‍යයක්" කියන පොතේ ඉතාම හොඳින් සටහන් කරලා තිබෙනවා, ඒ පිටුපස සිටියේ කවුද කියන කාරණාව. එදා කිසිවෙකුට එරෙහි වන්නට බැරි බිහිසුණු අපරාධ රාජ්‍යයක් නිර්මාණය කරලා තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2024දී අපට ජන වරම ලැබෙන්නේම ඒ තිබුණු අපරාධ රාජ්‍යයට එරෙහිවයි. ඒ අපරාධ රාජ්‍යයට එරෙහිව නැඟී සිටින්න පුළුවන් එකම බලවේගය ජාතික ජන බලවේගය නිසා තමයි අපට ඒ ජන වරම ලැබෙන්නේ. නීත්‍යානුකූල රාජ්‍යයක්, නීතියේ විධානය, නීතියේ ආධිපත්‍යය සහිත රාජ්‍යයක්, අල්ලස, දූෂණයෙන් තොර රාජ්‍යයක් නිර්මාණය කරන්න, අපරාධ රාජ්‍යය බිඳින්න කියන ඉල්ලීම සහිතව තමයි මහජනතාව අපට ජන වරම ලබා දුන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ ජන වරම අනුව අපි නීතියේ ආධිපත්‍යය සහිත නව දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරන්න අවශ්‍ය මැදිහත්වීම් ටික කරගෙන යමින් සිටිනවා. අධිකරණ අමාත්‍යවරයා විතරක් නොවෙයි, ජනාධිපතිවරයාගේ ඉඳන් සියලු අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය සභා සභිකයන්, අපත් එක්ක එකතු වෙලා ඉන්න ප්‍රජාව ඇතුළු සියලුදෙනා එක බලමුළුවක් විධියට එකතු වෙලා නීතියේ විධානය, නීතියේ ආධිපත්‍යය තහවුරු කරන්න විතරක් නොව, සියල්ලට ඉහළින් ඉන්නේ නීතිය, සියලුදෙනා ඉන්නේ නීතියට යටින් කියන අර්ථය යථාර්ථයක් බවට පත් කරන රාජ්‍යයක් නිර්මාණය කරන්න කටයුතු කරමින් යනවා.

මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා, එතුමාගේ තාත්තා, එතුමාගේ බාප්පා ඇතුළු එතුමාගේ කණ්ඩායම නායකත්වය දුන්නු රටේ, ඒගොල්ලන් පාලනය කරපු රටේ නීතිය කොහොමද ක්‍රියාත්මක කළේ කියලා අපි දැක්කා. කපුටෙක් මරලා තට්ටක් එල්ලන්න කිව්වා, මුළු ප්‍රජාවක් භය කරන්න. කපුටෙක් මරලා තට්ටක් එල්ලන්න කිව්වා! එහෙම කියපු අය තමයි දැන් ඔය කථා කරන්නේ නීතියේ ස්වාධීනත්වය ගැන. අපේ ආණ්ඩුවක් ආවාම පොලීසියට වෙන්නේ මොකක්ද කියලා බලා ගන්න කිව්වා. එහෙම පාලකයෝ හිටපු රටක්, මේක.

අපි මේ බලය ගන්න කොට අපේ අධිකරණ පද්ධතිය ඇතුළේ නඩු ලක්ෂ 11කට වඩා ගොඩ ගැහිලා තිබුණා. ඒ විතරක් නොවෙයි. වසර ගණනාවක්ම සේවක පුරප්පාඩු පුරවලා තිබුණේ නැහැ. ඒ වාගේම බන්ධනාගාර ඇතුළේ ඉඩ කඩ පිළිබඳවත් බරපතළ ප්‍රශ්නයක් තිබුණා. ධනාත්මක ප්‍රවේශයකින් ඒ ගැටලු සියල්ල ලිහන්න අවශ්‍ය මැදිහත් වීම අධිකරණ අමාත්‍යවරයා විසින් සිදු කරනු ලැබුවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අධිකරණ අමාත්‍යවරයා විසින් නව අධිකරණ පිහිටුවීමට කටයුතු කරනවා. මහාධිකරණ 2ක්, අල්ලස් නඩු විභාග කරන්න මහාධිකරණ 3ක්, වාණිජ මහාධිකරණ 2ක්, සිවිල් අභියාචනා මහාධිකරණයක් ඇතුළුව අධිකරණ ගණනාවක් පිහිටෙව්වා, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා. විශේෂයෙන් අල්ලස් නඩු විභාග කිරීම සඳහා මෙතෙක් කල් ඇමතිවරුන් භාවිත කළ මන්දිරයක් ලබා දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ විවාදයට එක් වෙමින් විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු කීප දෙනෙක්ම කථා කළා. අධිකරණ විනිසුරුවරුන්ගේ ධුර කාලය දීර්ඝ කිරීම සම්බන්ධව ඒගොල්ලෝ බරපතළ ප්‍රශ්නයක් මතු කරන්න හදනවා. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා කළ යුතු මැදිහත්වීම් තිබෙනවා. අධිකරණ ක්‍රියාවලිය ගත්තාම, විනිසුරුවරයාගේ කාර්යභාරය ප්‍රබල වෙනවා; විනිසුරුවරයාගේ කාර්යභාරය ඉතා වැදගත් වෙනවා. මා එහෙම කියන්නේ, නඩු තීන්දුවක් ලබා දීමේදී විනිසුරුවරයෙකුගේ දැනුම, අද්දැකීම් විතරක් නොව පරිණතභාවය ද ඉතාම වැදගත් වන නිසායි.

[ගරු රුවන් විජේවීර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස පිළිබඳව අපට පූර්වාදර්ශ ගන්න පුළුවන් රටවල් ලෝකයේ ඕනෑ තරම් තිබෙනවා. ඒ ගැන ජූලි මස 05වන දින "The Sunday Times" පුවත්පතේ මෙන්න මේ විධියට සටහන් කරලා තිබෙනවා, I quote:

> It is a known fact that the retirement age of the workforce is getting extended the world over. In some countries, like the USA, there is no age limit for senior judges - the appointments are for life.

USAවල විනිශ්චයකාරවරු ජීවිත කාලය පුරා ඔවුන්ගේ සේවය ලබා දෙනවා.

It also states, I quote:

> "In Britain, all judicial officers can hold office till the age of 75, raised from 70 in 2022 to retain experienced judges."

ඒ කියන්නේ, 2022දී බ්‍රිතාන්‍යයේ අත්දැකීම් සහිත විනිශ්චකාරවරුන්ගේ සේවය තවදුරටත් ලබා ගැනීම සඳහා ඔවුන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව වැඩි කරනවා, අවුරුදු 70 ඉඳලා 75 දක්වා.

It further states, I quote:

> "In India, it is, however, 65. In jurisdictions like Canada, Australia and Japan, it is either 70 or 75."

ඒ විධියට විදේශවල අවුරුදු 70 හෝ 75 වාගේ වයස් සීමා දාලා තිබෙනවා. එහෙම නම්, විනිශ්චයකාරවරුන්ගේ වයස වැඩි කිරීම කියන කාරණය පිළිබඳව සාකච්ඡා වන්නේ වෙන කිසිවක් නිසා නොව, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා අත්දැකීම් තිබෙන, පරිණතභාවය තිබෙන විනිශ්චයකාරවරුන්ගේ සේවය ලබා ගැනීමේ අවශ්‍යතාව තිබෙන නිසායි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

දැන් විපක්ෂයට මේ ගැන භීතිකාවක් හැදිලා තිබෙන්නේ ඇයි? මේගොල්ලෝ මේ ගෙනෙන්නේ අධිකරණ ඇමතිවරයාට එරෙහි විශ්වාස භංගය යෝජනාවක් විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද වන කොට රටේ අධිකරණ පද්ධතිය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හා නීතිපති දෙපාර්තමේන්තුව කියන යුක්තිය පසිඳලන සියලු ආයතන බල ගන්වා තිබෙනවා. ඒවාට අවශ්‍ය. ශක්තිය ලබා දීලා තිබෙනවා. අද නීතිය මේ අයට එරෙහිවත් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. නීතිය ඒ අය ළඟට එමින් තිබෙනවා. එදා මේ අය එක්ක මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරමින් අර කියපු අපරාධ රාජ්‍යයට නායකත්වය දුන්නු සමහරු දැන් කොහේද ඉන්නේ? මේ වන කොට ඒ අය ඉන්නේ ඇප පිට. ඒ සමහරු රක්ෂිත බන්ධනාගාරගත වෙලා. තවත් සමහරු වසර ගණනාවකට සිරගත වෙලා. සමහරු සිය දිවි නසාගෙන. සමහරු ඉන්නේ හැංගිලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
Give me one more minute, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. ඒ හැංගිලා ඉන්න අය, ඇප පිට ඉන්න අය ඔක්කෝම දන්නවා ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක වනවා කියලා. ඒක නිසා ඔවුන් මොකක්ද කරන්නේ? අධිකරණ ඇමතිවරයාට විතරක් නොවෙයි, සමස්ත ක්‍රියාවලියටම එරෙහිව බරපතළ මැදිහත් වීමක් කරමින් සිටිනවා. නීතිය, යුක්තිය පසිඳලන එක නවත්වන්න අවශ්‍ය මැදිහත් වීම් කරමින් සිටිනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්ථාවර නියෝග 92 යටතේ තිබෙනවා, කථා නොකරන මන්ත්‍රීවරයන් විසින් පිළිපැදිය යුතු රීති. එහි 92 (ඊ) යටතේ මෙසේ සඳහන් වනවා:

> "වාචික සන්නිවේදන උපකරණ භාවිතා කරමින් සංවාදයේ යෙදෙනු නොලැබිය යුත්තේ ය; ...."

ඒක තමයි ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා ඔබතුමියගේ අවධානයට යොමු කළේ. කථා නොකරන මන්ත්‍රීවරයෙකුට phone භාවිත කරමින් එහෙම හැසිරෙන්න බැහැ. නමුත්, පොලිසිය භාර නියෝජ්‍ය ඇමතිතුමා point of Order එකක් අරගෙන ඒ කරපු දේ සාධාරණීකරණය කරනවා. ඔබතුමිය මූලාසනයේ ඉන්න කොට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය හැටියට වගකීමක් තිබෙනවා Standing Orders අනුව කටයුතු කරන්න. මන්ත්‍රීවරයෙක් අදහස් දක්වද්දී අමාත්‍යවරයෙක් ස්ථාවර නියෝගයක් කඩ කරන කොට මූලාසනයේ සිටින නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නවා වෙනුවට, මන්ත්‍රීවරයා ඉදිරිපත් කළ කාරණා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියන එක යුක්තිසහගත නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
භාවිත කළ නුසුදුසු වචන ඉවත් කිරීම ගැන පමණයි සඳහන් කළේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතුමන්ලා "මල් කඩනවා" කියන වචනය තවදුරටත් සාධාරණීකරණය කරනවා නම්, මට හිතා ගන්න පුළුවන් නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේයි, මෙතුමාගේයි තත්ත්වය.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, ඔයගොල්ලෝ තමයි මල් කඩන්නේ. තේරුණාද? ඔයගොල්ලෝ මල් කැඩුවාට- *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒ කාරණය ගැන විවාදයකට නොයා යුතුයි. මොකද, මේ වෙලාවේ කාලය බෙහෙවින්ම වටිනවා.

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.10]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාට එරෙහිව ගෙන ආ මේ විශ්වාස භංග යෝජනාව දඩ මීමා කරගෙන, මෙතෙක් කල් මේ ආණ්ඩුව ව්‍යංග්‍යයෙන්, වක්‍රාකාරයෙන්, වංගු ගහලා කථා කළ න්‍යාය පත්‍රයක් දැන් එළිපිට අරගෙන තිබෙනවා. දැන් මුට්ටිය දාලා බලන විවාදයක් බවට මේ විවාදය පරිවර්තනය කරගෙන යනවා කියලා අපට පෙනෙනවා. විනිසුරුවරුන්ගේ විශ්‍රාම යැමේ වයස් සීමාව වැඩි කරන්න තිබෙන වුවමනාව දැන් එළිපිට කථා කරන්න පටන් අරගෙන තිබෙනවා. මෙතෙක් කල් ඒක සිදු වුණේ නැහැ. ඒ අතරතුර, ඒ මදිවාට මීට මොහොතකට පෙර අපේ ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු අය පිරිවරාගෙන ආණ්ඩුවේ ගරු මන්ත්‍රීවරයෙක් කථා කළා, අපේ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිතුමා පිළිබඳව. එතුමාට විශාල දෝෂාරෝපණයක් කළා. ඒ විගසම මම ඒ සභාපතිතුමාට දුරකථන ඇමතුමක් ගත්තා. "මෙහෙම සිද්ධියක් ගැන කියනවා. ඔබතුමා සජිත් ප්‍රේමදාස හම්බ වෙලා එතුමාගෙන් මහ ඇමති ධුරයට තරග කරන්න අපේක්ෂකත්වය ඉල්ලුවාලු. ඒ උඩ තමයි හෙට-අනිද්දා නීතිඥ සංගමයේ රැස්වීමක් කැඳවලා තිබෙන්නේ කියලා ඔබතුමාට පාර්ලිමේන්තුවේදී දෝෂාරෝපණයක් කළා. ඔබතුමා මොකක්ද කියන්නේ?" කියලා මම එතුමාගෙන් ඇහුවා. එතුමා කිව්වා, ඒ කථාව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා කියලා. ප්‍රතික්ෂේප කළා විතරක් නොවෙයි එතුමා අභියෝග කළා, "කරුණාකරලා, ඒ මන්ත්‍රීතුමාට හරි, ආණ්ඩුවේ ඉන්න කෙනෙකුට හරි එළියට ඇවිල්ලා ඒ කථාව කියන්න" කියලා. ඒ නිසා වරප්‍රසාදවලට මුවාවෙලා ඔය කථාව කියනවාට වඩා මෙතැනින් එළියට ඇවිල්ලා ඒක කියන්න. එතුමා එතකොට නඩු පවරයි එතුමාගේ කීර්තිනාමය වෙනුවෙන්. අද ඊයේ නොවෙයි, එදා පටන්ම නීතිඥ වෘත්තියට අදාළ වන හැම කාරණයකදීම නීතිඥ සංගමය නැඟී සිටියා.

ඔබතුමන්ලා නීතිඥ ලියනාරච්චි පිළිබඳව හොඳටම දන්නවා ඇති. සිය ගණන් තරුණයන් අත්අඩංගුවට අරගෙන නොයෙකුත් විධියේ හිරිහැර කරද්දී නීතිඥ ලියනාරච්චි මැතිතුමා JVP එක වෙනුවෙන් ඉදිරිපත් වෙච්ච නිසා එතුමා අත්අඩංගුවට අරගෙන වධ දුන්නා විතරක් නොවෙයි, මරා දැම්මා. ඒ පිළිබඳව අපේ නීතිඥ සංගමය දිවයින පුරා උසාවි වර්ජනය කළා. වර්ජනය කළා විතරක් නොවෙයි, ඒකට තීන්දුවක් එනකල් ඒ වර්ජනය අත්හැරියේ නැහැ. එවැනි වැඩ කරපු නීතිඥ සංගමයට විරුද්ධව දැන් තමුන්නාන්සේලා ඒ අතීතය අමතක කරලා කථා කරනවා. අපේ සභාපතිතුමා නීතිඥ වෘත්තියට බලපාන කාරණාවක් පිළිබඳව විශේෂයෙන්ම මේ රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයට එරෙහි වෙන ක්‍රියාවක් පිළිබඳවයි කථා කරන්නේ. ඒ නිසා නඩු තීන්දු කල් යන හින්දා, නඩු ගොඩ ගැසෙන හින්දා මේවා කරනවා කියලා, "කොහේද යන්නේ, මල්ලේ පොල්" වාගේ කථා කියමින් ලෝකේ නැති බොරු කථා කියන්නේ නැතුව කෙළින්ම කථාවට එන්න.

අපේ සුනිල් වටගල මැතිතුමාත් මේ කථාව දන්නවා. ඔබතුමාත් මහාධිකරණ නීතිඥ සංගමයේ සාමාජිකයෙක් වෙන්න ඇති. ඒ නීතිඥ සංගමයේ ලියුම බලන්න. ඒකෙන් ජනාධිපතිතුමාට දීර්ඝ ලියුමක් ලියලා තිබෙනවා. ඒ ඔක්කෝම කාරණා කියලා, මේ වැඩේ ඇයි නොකළ යුත්තේ කියන එක පිළිබඳව කියලා තිබෙනවා. I must very clearly state here that the Colombo High Court Lawyers' Association has sent a detailed letter, warning the President not to engage with this unnecessary, opportunistic attempt to extend the retirement age of the judges. I was not to talk about that; I was going to talk about our dear Justice Minister's issue today. I call him "dear" Justice Minister not for anything else, but because he indeed is a dear Minister. But, I feel very sorry for him.

In the first place, මම තව දෙයක් කියන්න ඕනෑ, ඔබතුමන්ලාට. මේ ගෙන එන විශ්වාසභංග යෝජනාවට අපි පක්ෂ වෙන්න එක හේතුවක් තිබෙනවා. වගකීම් පැහැර හැරීම කියන කාරණය ඇතුළු අනෙක් ඔක්කෝටම වඩා මෙතැනදී මට බලපාන කාරණයක් තිබෙනවා. මොකද පැය 24ක්, පැය 48ක් යනකල් ඇමතිතුමා මේ සිද්ධිය ගැන හරියට කට ඇරියේ නැහැ. "Social media බලලා තමයි මම මේක දැන ගත්තේ" කිව්වා. ඒක තමයි වගකීම් පැහැර හැරීම කියන්නේ. අනෙක් කාරණය මෙයයි. මේ සිද්ධිය ලොව පුරා ගියා. සජීවීව විකාශනය වුණා. හැම නාලිකාවකම විකාශනය කළා. ...... නැදෑ හිතවතුන් ඇවිල්ලා හඬා වැළපෙනවා, ආවේගශීලීව කථා කරනවා, තොරතුරු දැන ගන්න දඟලනවා. නමුත් නිල වශයෙන් කිසි දෙයක් කියන්න බැරිව ආණ්ඩුව මුනිවත රැක්කා. ඒ කාරණාවෙන් විතරක් මේ විශ්වාස භංග යෝජනාව ගෙන එන එක සාධාරණීකරණය කරන්න පුළුවන්. මේ වාගේ බරපතළ සිද්ධියක් වෙද්දී මුනිවත රැකීම නිසා, කිසිම තොරතුරක් නිල වශයෙන් දෙන්නේ නැතුව හිටපු නිසා විශ්වාසය භංග වෙනවා. ප්‍රවෘත්ති සාකච්ඡාවක් හරි තියලා, හරියට මොකද වුණේ, මොකද වෙන්නේ කියන එක සජීවීව ඒ වෙලාවේම කියන්නේ නැතුව කටයුතු කළා. අපේ නීතිය

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

භාර ඇමතිතුමාත් දවසක්, දෙකක් පහුවෙලා තමයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ ගැන විස්තර කියන්න පටන් ගත්තේ. ඉතින් මේක තමයි වැරැද්ද. ඒකයි වගකීම් පැහැර හැරීම කියන්නේ.

ඊළඟට, මම මේ කථාවත් කියන්න ඕනෑ. If we take extending the retirement age of the judges, this is not the first time governments had attempted that. Every government, for their own purpose, wanted to extend the retirement age of Chief Justices. Even when I was Minister of Justice, a particular individual - I do not want to mention names - approached me and said, "This should be done. Why do you not speak to the President?" But, President Mahinda Rajapaksa himself said, "රවුෆ්, ඒක නම් අදින්න එපා. ඒක කරදරයි" කියලා. නීතිඥ වෘත්තියේ ඉන්න එතුමාම දැන ගත්තා මේක වැරදි වැඩක්, අපි නොකළ යුතුයි කියන එක. එතුමාට විරුද්ධව දැන් නොයෙකුත් දේවල් කිය කියා යනවා. ඒක වෙන කථාවක්. නමුත් හැමෝම ඒකට උත්සාහ කළා. ඒ නිසා නිකම් කොහේදෝ යන ප්‍රශ්නයක් ඔළුවේ දමා ගන්න යන්න එපා. නීතිඥයන් විතරක් නොවෙයි, අපේ විනිශ්චයකාර මහත්වරුන්ගේ සංගම් කිහිපයක් දැනටමත් මේ පිළිබඳව ප්‍රසිද්ධියේ කියලා තිබෙනවා. දැන් ඉතින් තර්ජන යනවා, මාරුවීම් කරනවා යනාදී දේවල් කථා වෙනවා. මේ පිළිබඳව අපි මෙහේ කථා කරන්නේ නැතිව වෙන කොහේ කථා කරන්නද? මම අද මේ විවාදයේදී මේවා කථා කරන්න බලාපොරොත්තුවෙන් හිටියේ නැහැ. නමුත්, මේ අවස්ථාවේ මේ විශ්වාස භංග යෝජනාව දඩමීමා කරගෙන ඒක සාධාරණීකරණය කරන්න කටයුතු කරනවා. දැන් බළලා මල්ලෙන් පනිනවා. ඒකයි වෙන්නේ. මේක ඇත්තටම ලජ්ජා විය යුතු කාරණාවක්. මේක ලේසි පහසු වැඩකුත් නොවෙයි.

You must read the statement by the Colombo High Court Lawyers' Association. Very clearly, මෙතැන නොයෙකුත් ඡේද යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් නියම කර ඇති සහ අරමුණු සහගතව ස්ථාවර කර ඇති විශ්‍රා ම වයස් සීමාව පිළිබඳව මොකක්ද කළ යුත්තේ, මේකෙන් මොන බලපෑමද එන්නේ කියන කරුණු නීත්‍යනුකූල අපේක්ෂාව පිළිබඳ මූලධර්ම අනුව ඉතාම පැහැදිලිව කියලා තිබෙනවා. They refer to the legitimate expectation issue of the other junior judges. If you do this, all the other lawyers waiting with the expectation to go up to the Court of Appeal or to the Supreme Court would be denied that. That is why the judges' associations are now protesting. This should never be done in this *ad hoc* fashion. If you bring it as an amendment to take effect after five years or something like that, that does not matter. But, now what you are trying to do is to reward the Chief Justice.

Another bad practice, which even this Government followed and this President followed, is to appoint former Chief Justices as Permanent Representatives to the UN in New York. Former Chief Justices were appointed like that. Former Chief Justice Mohan Peiris was appointed to that post by the previous President. So, rewarding Chief Justices after their retirement is a bad practice ant that should also be resisted.

I would finally say that, in fact, you all have sought to defame the President of the Bar Association of Sri Lanka. It is a very serious issue. If at all you want to say that, come and say it outside so that he could take some action against you for defamation.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.19]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අධිකරණ ඇමතිතුමාට එරෙහිව ගෙනැවිත් තිබෙන මෙම විශ්වාස භංග යෝජනාවේදී අදහස් දැක්වීමට අවස්ථාව සලසා දීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ඔබතුමියත් දන්නවා, මීගමුව බන්ධනාගාරය තුළ සිදු වූ මෙම සිද්ධිය හේතුවෙන් ජූලි 05 වැනි දින දෙදෙනෙකු මිය ගොස් තවත් පිරිසක් තුවාල ලැබූ බව. ඊට පසුව 06 වැනි දින සිදු වූ සිද්ධියෙන් නිලධාරීන් දසදෙනෙකුත්, තවත් රැඳවූවන් 21දෙනෙකුත් මිය ගියා. ඒ වාගේම විශාල පිරිසක් තුවාල ලැබුවා. ඒ සම්බන්ධයෙන් අපි රජයේ කනගාටුව පළ කරනවා. මොකද, කිසිදු මිනිස් ජීවිතයක් ලඝු කොට තකන්න බැහැ. කිසිදු ජීවිතයකට හානියක් වීම ගැන අපේ එකඟතාවක් නැහැ. නමුත්, මේ අවාසනාවන්ත සිදුවීම මීගමුව බන්ධනාගාරය තුළ සිද්ධ වුණා. හැබැයි, මේක ඉතිහාසයේ පළමුවැනි වතාවට සිදු වූ සිද්ධියකුත් නොවෙයි. අතීතයේ අවස්ථා කිහිපයකදීම බන්ධනාගාර තුළ මෙවැනි කැලඹීම්, කැරලි කෝලාහල සිදු වෙලා තිබෙනවා. මෙතැන කියැවුණා වාගේම ඒ සමහර සිද්ධි පැවති ආණ්ඩුවල අනුදැනුම ඇතිව සිද්ධ වෙච්ච සිද්ධි.

නමුත්, මෙම සිද්ධිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන එක කාරණයක් තිබෙනවා. ඒ තමයි, අපි පසුගිය ඔක්තෝබර් මාසයේ ඉඳලා මත්ද්‍රව්‍ය නිවාරණය වෙනුවෙන් දැවැන්ත වැඩ පිළිවෙළක් මේ රටේ දියත් කිරීම. අපරාධ ජාල බිඳ දැමීම සඳහා සුවිශේෂ වැඩසටහනක් අපි මේ සමාජය තුළ දියත් කරමින් තිබුණා. ඒ දියත් කරපු මත් ද්‍රව්‍ය විරෝධී වැඩසටහනටත්, අපරාධකරුවන් නීතියේ රැහැනට කොටු කර ගැනීම සඳහා වූ වැඩසටහනටත් සමගාමීව යමින් බන්ධනාගාර තුළද සුවිශේෂ වැටලීම් දිගින් දිගටම සිද්ධ වුණා. ඒ වාගේම, එවැනි සිදුවීම්වලට අදාළව විවිධ බන්ධනාගාරවලින් විවිධ දේ අත්අඩංගුවට ගත්තා. විවිධ පුද්ගලයන් පිළිබඳ පරීක්ෂා කිරීම් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් විශේෂයෙන්ම ගරු අධිකරණ ඇමතිතුමාගේ මෙහෙයවීම යටතේ සිද්ධ කළා. පසුගිය මාස 20ක කාලය තුළ එතුමා මේ බන්ධනාගාර ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්න විසඳීම සඳහා සුවිශාල උත්සාහයක් ගත්තා. එතුමා ඒ සඳහා අවශ්‍ය පදනම දාලා තිබෙනවා. ප්‍රධානම කාරණය තමයි ඒ සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ විශාල ප්‍රමාණයක් ගෙනැවිත් තිබෙන එක. බන්ධනාගාර සහ අධිකරණ අමාත්‍යාංශයට අදාළව විතරක් නොවෙයි, මේ රජය විසින් සිදු කරනු ලබන වෙනත් නීති ප්‍රතිසංස්කරණ වෙනුවෙන් එතුමා අණපනත් විශාල ප්‍රමාණයක් මේ වෙනකොට අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර, මේ පාර්ලිමේන්තුවට ගෙන ඒමට අවශ්‍ය සියලු කටයුතු කර තිබෙනවා. ඉදිරියේදී එවැනි අණපනත් ප්‍රමාණයක් එන්න නියමිතයි. Online Safety Act එක, PTA එක අහෝසි කිරීම, සංවිධානාත්මක අපරාධ මර්දන පනත් කෙටුම්පත යන මේ සියල්ලේම කටයුතු අවසන් අදියරේ තිබෙනවා. එම නිසා රජයට අවශ්‍ය නීති රීති සම්පාදනයේදීත් ගරු අධිකරණ ඇමතිතුමා සුවිශේෂී කාර්යභාරයක් කර තිබෙනවා.

බන්ධනාගාරවල තදබදයක් තිබෙනවා. ඒ වාගේම, බන්ධනාගාර තුළ යම් ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙන බවත් අප පිළිගන්නවා. ඒවාට සාධනීය විසඳුම් හොයන්න එතුමා මේ වෙනකොට ක්‍රියාමාර්ග රාශියක් ගෙන තිබෙනවා. ඒ තිබෙන පුරප්පාඩු විශාල ප්‍රමාණයක් පුරවා තිබෙනවා; පුරවමින් තිබෙනවා. ඉදිරියටත් බඳවා ගැනීම් කරනවා. ඒක අත්‍යවශ්‍ය කාරණයක්. අපි ආණ්ඩුව භාර ගන්නකොට මානව සම්පතේ හිඟයක් තිබුණා. දීර්ඝ කාලයක් තිස්සේ බන්ධනාගාරය තුළ මේ මානව සම්පතේ හිඟය විසඳලා තිබුණේ නැහැ. එතුමා ඒ කටයුතුත් ඉෂ්ට කරනු ලැබුවා. ඒ විතරක් නොවෙයි. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව කැඳවා, ප්‍රමාදයකින් තොරව රස පරීක්ෂක වාර්තා අධිකරණ වෙත ලබා දීම පිළිබඳවත්, මේ බන්ධනාගාර තදබදය විසඳන්නේ කොහොමද කියන එක පිළිබඳවත් එතුමා දිගින් දිගටම සාකච්ඡා කර තිබෙනවා. මේ වෙනකොට ඒ සඳහා සාධනීය පියවර රාශියක් ගෙන තිබෙනවා. මම හිතන විධියට රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව රාත්‍රි 10.00 දක්වා වැඩ කරමින්, රස පරීක්ෂක වාර්තා කඩිනමින් ලබා දෙන්න මේ වෙනකොටත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ සඳහා ගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීමත්, අධිකරණ ඇමතිතුමාගේ මැදිහත්වීමත් ප්‍රශංසනීයයි. ඒ අනුව අධිකරණ ඇමතිවරයා හැටියට එතුමාගේ කාර්යභාරය ඉෂ්ට කර තිබෙනවා.

ඇත්තටම මේ සිද්ධිය ගත්තාම, මේක රටේ තිබෙන අපරාධ බන්ධනාගාරය තුළත් ක්‍රියාත්මක වීමක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියත් දන්නවා ඇති, මේ සිද්ධියට පාදක වුණු සිද්ධිය පිළිබඳව. මීගමුව බන්ධනාගාරය තුළ මත්ද්‍රව්‍ය ජාවාරම් වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වුණු කණ්ඩායමක් සහ මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ කණ්ඩායමක් අතර ඇති වෙච්ච ගැටුමක් තමයි සිද්ධ වුණේ. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි මේ අවාසනාවන්ත සිද්ධිය ඇති වුණේ. මෙවැනි සිද්ධි තුළින් ඇති වන ජීවිත හානිවීම් අපි කිසිසේත්ම අනුමත කරන්නේ නැහැ. ඒ පවුල්වලට අපගේ කනගාටුව ප්‍රකාශ කරනවා. නමුත්, මේ සිද්ධියට පාදක වෙලා තිබෙන්නේ රට තුළ තිබෙන අපරාධ ජාල බිඳ හෙළමින් කාලයක් තිස්සේ රජය ගෙන යන වැඩ පිළිවෙළට එරෙහිව බන්ධනාගාර තුළ සිදු වෙන යම් යම් කුමන්ත්‍රණ සිදුවීමයි. ඒ කාරණය තමයි මේකෙන් පැහැදිලි වෙන්නේ.

ඒ නිසා අපි මෙහිදී සුවිශේෂ අවධානය යොමු කරන්න ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. එකක් තමයි, අපි මේ ආරම්භ කරලා තිබෙන මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ පිළිවෙළ. මේ වැඩ පිළිවෙළ යටතේ පසුගිය ඔක්තෝබර් ඉඳලා මේ දක්වා 275,000කට අධික ප්‍රමාණයක් වරින් වර අත්අඩංගුවට ගෙන තිබෙනවා. මේ අත්අඩංගුවට ගැනීම් වැඩිවීමත් එක පැත්තකින් බන්ධනාගාර තදබදයට හේතුවක් වෙලා තිබෙනවා. ඒ නිසා මතට ඇබ්බැහිවූවන්, නැත්නම් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් රෝගීන් හැටියට සලකමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ පිළිවෙළට ප්‍රමුඛත්වය දෙන්න අපි රජයක් හැටියට තීන්දු කර තිබෙනවා. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් රෝගීන් ලෙස සලකමින්, පුනරුත්ථාපනය සහ ප්‍රතිකාර ක්‍රම සඳහා ප්‍රමුඛත්වය දෙමින් අප කටයුතු කරනවා. බන්ධනාගාරවල තදබදය වැළැක්වීම සඳහා ඔවුන් පුනරුත්ථාපනය සහ ප්‍රතිකාර සඳහා යොමු කරන වැඩසටහන් මේ වෙනකොට ශක්තිමත් කර තිබෙනවා. එවැනි මධ්‍යස්ථාන වැඩි කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ සඳහා අවශ්‍ය නිලධාරින් බඳවාගෙන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය, සෞඛ්‍ය අමාත්‍යාංශය යන මේ සියලු ආයතන ඒකාබද්ධ කළ වැඩසටහනක් මේ වෙනකොට ක්‍රියාත්මක කරමින් තිබෙනවා. මේ සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්න අවශ්‍යයි. ඒ කෙසේ වෙතත්, රජයක් හැටියට මේ සිද්ධිය පිළිබඳව කනගාටු වෙනවා. ඒ වාගේම මෙවැනි සිද්ධි අනාගතයේ සිදුවීම වැළැක්වීම සඳහා ගත හැකි සියලු පියවර මේ වෙනකොට ගෙන තිබෙනවා. විශේෂයෙන්ම මේ සිද්ධිය හුදකලාව නිර්මාණය වූ එකක් නොවෙයි. අධිකරණ ඇමතිතුමා පමණක් මෙයට වග කිව යුතුයි කියලා එතුමාට එරෙහිව විතරක් විශ්වාස භංග යෝජනාවක් ගෙනාවත්, මෙය එතුමා නිසා ඇති වුණු සිද්ධියක් නොවෙයි.

හැබැයි, විපක්ෂයට යටි අරමුණක් තිබෙනවා. හැම වෙලාවේම විපක්ෂය කටයුතු කරන්නේ ඒ යටි අරමුණත් සමඟ. නැත්නම්, ඔවුන් ගෙනෙන සාධනීය විවේචන අපි පිළිගන්න සූදානම්. බන්ධනාගාරයේ වෙච්ච සිදුවීම දෙස අවංකව බැලුවොත්, දීර්ඝ කාලයක් තිස්සේ ඒ අර්බුද වර්ධනය වෙලා තිබෙනවා. දේශපාලකයෝ මැදිහත්වෙලා මත්ද්‍රව්‍ය ජාවාරම බන්ධනාගාරය තුළ විතරක් නොවෙයි, මේ රට පුරාම දීර්ඝ කාලයක් තිස්සේ පෝෂණය කරලා තිබෙනවා. අපි හැමදාම කියනවා වාගේ ඒවාට ඇති තරම් උදාහරණ තිබෙනවා. දේශපාලකයන් විසින් පෝෂණය කරපු අපරාධ සංස්කෘතිය තමයි බන්ධනාගාර තුළත් නිර්මාණය වෙලා තිබුණේ. අපි කිසිවිටෙක එය අනුමත කරන්නේ නැහැ. ඒ වාගේම එවැනි තත්ත්වයක් බන්ධනාගාරය තුළ වර්ධනය කරන්න අපි කිසිම කෙනෙකුට ඉඩ දෙන්නේ නැහැ. බන්ධනාගාරය තුළ සිටින බොහෝදෙනා රිමාන්ඩ් කළ අය. ඔවුන් සැකකරුවන් පමණයි. ඔවුන් වැරදිකරුවන් බවට පත්වෙලා නැහැ. ඒ හැම කෙනෙකුගේම ජීවිත ආරක්ෂාව පිළිබඳව රජය සැලකිලිමත් වෙමින් තමයි කටයුතු කරන්නේ. එහෙත් මෙවැනි අවාසනාවන්ත සිද්ධි වරින් වර සිදුවීම වළක්වන්න බැරි විධියට අපරාධ දේශයක්, අපරාධ චර්යා නිර්මාණය කරලා තිබෙනවා. මේවාට දීර්ඝ කාලයක් තිස්සේ දේශපාලනඥයන් මැදිහත්වෙලා තිබෙනවා. ඔවුන් හදපු සංස්කෘතිය තමයි අද අපි මේ ඉවත් කරමින් ඉන්නේ, කඩමින් ඉන්නේ, බිඳ දමමින් ඉන්නේ. අපරාධ ජාල බිඳ දමනකොට ඒකට එරෙහි වෙන පිරිස් තමයි මේ විධියට තැනින් තැන මතුවෙමින් ඉන්නේ. ඔවුන්ට සහාය දෙන්නන් පිරිසක් ඉන්නවා. දේශපාලන වශයෙන් මේවා දෙස බලන්නන් ඉන්නවා. නමුත් ඒ විධියට මේ ප්‍රශ්නය විසඳන්න හැකියාවක් නැහැ. මේ පාර්ලිමේන්තුව හැටියටත්, රජය හැටියටත් අපි හැම වෙලාවේම ඒ සියලුදෙනාගේම ජීවිත රැකවරණය, ආරක්ෂාව සහ සුරක්ෂාව වෙනුවෙන් ඉදිරි පියවර ගන්නවා. අනාගතයේදී මෙවැනි සිද්ධි වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නවා.

මේ වෙනකොට ඒ අවාසනාවන්ත සිදුවීමට අදාළ විමර්ශනයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ සිද්ධ වෙනවා. ඒ අවස්ථාවේදී රැඳවූවන් 2,485ක් මීගමුව බන්ධනාගාරයේ හිටියා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට රැඳවූවන් 1,200කට ආසන්න පිරිසකගෙන් කට උත්තර ලබාගෙන තිබෙනවා. ඒ වාගේම බන්ධනාගාර නිලධාරින් සතුව තිබූ අවි ආයුධ අධිකරණ භාරයට ගෙන තිබෙනවා. ඒ පිළිබඳව මැදිහත්, සාධාරණ සහ ස්වාධීන පරීක්ෂණයක් මේ වෙනකොට සිද්ධ වෙමින් පවතිනවා. ඒ නිසා කාටවත් මේකේ අවසාන නිගමන සහ ප්‍රතිඵල ප්‍රකාශ කරන්න තවම හැකියාවක් නැහැ. මේ පිළිබඳ පූර්ණ විමර්ශනයක් සාධාරණ සහ විනිවිදභාවයකින් කරන්න ඕනෑ. ඒක කරලා වගකිව යුත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න රජය කටයුතු කරනවා. එහෙම කළොත් තමයි අනාගතයේදී බන්ධනාගාර තුළ සිටින රැඳවූවන්ගේ ජීවිතත්, බන්ධනාගාර තුළ විවිධ පීඩා යටතේ රාජකාරි කරන නිලධාරින්ගේ ජීවිතත් සුරක්ෂිත වෙන්නේ. මේ වාගේ සිද්ධි පිළිබඳව පුළුල් හා ස්වාධීන විමර්ශනයක් කිරීම හරහා තමයි ඒ අයට ආරක්ෂාව සහ රැකවරණය සපයන්න හැකියාව ලැබෙන්නේ. අපි ඒ සඳහා පියවර ගෙන තිබෙනවා. එහෙම නැතිව මේවා වළක්වා ගන්න කිසිදු හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ සිද්ධිය හුදකලා, තනි සිදුවීමක් හැටියට සලකමින්, ඒක අධිකරණ ඇමතිවරයා පිට පැටවීම වැරැදියි. මම නැවත නැවතත් කියන්නේ, මේක අප විසින් මේ රටේ දියත් කරලා තිබෙන අපරාධ ජාල බිඳ දැමීම වෙනුවෙන්

[ගරු ආනන්ද විජේපාල මහතා]

වන මෙහෙයුමට සහ මත් ද්‍රව්‍ය ජාවාරමට එරෙහිව දියත් කර තිබෙන මෙහෙයුමට එරෙහිව සිදුවූ දෙයක් කියලායි. මම එය අර්ථ දක්වන්නේ එහෙමයි. අපි අනාගතයේදීත් දිගින් දිගටම ඒවාට එරෙහිව කටයුතු කරනවා. අපරාධකරුවන් ආරක්ෂා කරන්න කිසිවෙකුත් ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ වාගේම අපරාධකරුවන්ට එරෙහිව ක්‍රියාත්මක වෙමින් ඔවුන් නීතියේ රැහැනට කොටුකර ගැනීමට අපි දිගින් දිගටම කටයුතු කරනවා. නීතියේ ආධිපත්‍යයත්, අධිකරණයේ ස්වාධීනත්වයත් වෙනුවෙන් අපි නිරන්තරයෙන් පෙනී සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ බන්ධනාගාර තදබදයට එක් හේතුවක් තමයි දීර්ඝ කාලයක් ගොඩගැසී තිබෙන නඩු. ඒ ගොඩගැසී තිබෙන නඩු විසඳීම සඳහා ගරු අධිකරණ ඇමතිතුමා විසින් අතිරේක උසාවි කිහිපයක්ම පසුගිය කාලයේ ආරම්භ කළා. සමහර අය අහනවා, අධිකරණ ඇමතිතුමා මොනවාද කළේ කියලා. මේ වෙනකොට එම අතිරේක උසාවිවල අධිකරණ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එහෙම කරන්න හේතුව වුණේ, මේ බන්ධනාගාර තදබදය වළක්වා ගැනීමට සහ රටේ ජනතාවට යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කර දෙන්නයි. නඩු කටයුතු ප්‍රමාද වෙනකොට රටේ ජනයාගේ සාධාරණ අයිතිවාසිකම් අහිමි වෙනවා. මේ සමස්තය ගැනම වෙන් වෙන් වශයෙන් කථා කරන්න හැකියාවක් නැහැ. බන්ධනාගාරය, අධිකරණය, පොලීසිය කියන යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම වෙනුවෙන් තමයි මේ රජය සහ අධිකරණ ඇමතිවරයා පෙනී සිටින්නේ. ඒ වෙනුවෙන් තමයි කටයුතු කරලා තිබෙන්නේ. ඒ වෙනුවෙන් තමයි නව අණපනත් ගෙනැවිත් තිබෙන්නේ. තවත් අණපනත් විශාල ප්‍රමාණයක කටයුතු අවසන් අදියරේ තිබෙනවා. අපි නීතියේ සාධාරණත්වය ඇති කරන්න, යුක්තිය ශක්තිමත් කරන්න නීති ප්‍රතිසංස්කරණ ගේනවා වාගේම, මානව සම්පතේ හිඟය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය පියවර රාශියකුත්, යුක්තිය පසිඳලීමේ කාර්යයේදී ක්‍රියාත්මක තලයේ කාර්යභාරයකුත් මේ වන විට රජය හැටියටත්, අධිකරණ ඇමතිවරයා හැටියටත් ඉෂ්ට කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂය මොන විශ්වාස භංග යෝජනාවක් ගෙනාවත් ඒවා ඔවුන්ගේ වෙන වෙන කුමන්ත්‍රණ වැඩසටහන්වල අංග හැටියට හඳුනා ගන්නවා මිසක්, ඒවා සාධනීය විවේචන හැටියට හඳුනා ගන්න හැකියාවක් නැහැ කියන එක මා අවසාන වශයෙන් කියන්න ඕනෑ.

අපි උදේ ඉඳලා දැක්කා, මේ විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනකොට, විශ්වාස භංගය පැත්තක තියලා ඔවුන්ගේ දේශපාලන වුවමනා වෙනුවෙන් තමයි මේ සභාවේ කාලය පාවිච්චි කරන්නේ කියලා. මම අවසාන වශයෙන් කියන්නේ මේ විශ්වාස භංග යෝජනාව අපි ප්‍රතික්ෂේප කරනවා, පරාජය කරනවා කියලායි. ඒ වාගේම මීගමුව බන්ධනාගාරයේ සිදු වුණා වාගේ අවාසනාවන්ත සිදුවීම් අනාගතයේදී සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග අපි ගන්නා බව මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.34]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මැතිතුමාට එරෙහිව අද ඉදිරිපත් වෙලා තිබෙන විශ්වාස භංග යෝජනාව ගැන කථා කරද්දී, මටත් කියන්න ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා.

පළමුවැනි එක තමයි, බන්ධනාගාර සම්බන්ධයෙන් ඉදිරිපත් වුණු කාරණා. මම බන්ධනාගාර ගැන දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මොකද, ආණ්ඩු පක්ෂයේ කථිකයන් විශාල ප්‍රමාණයකගෙන් ඒ සම්බන්ධ ඉතාම වැදගත් තොරතුරු ඉදිරිපත් වුණා. එහිදී වැදගත්ම කාරණය තමයි, බන්ධනාගාරවල අද තිබෙන තත්ත්වය සහ කාලයක් තිස්සේ තිබුණු තත්ත්වය. 2015 වර්ෂයේදී තමයි වැලිකඩ බන්ධනාගාරයේ සිරකරුවන් ඝාතනය කිරීම සම්බන්ධයෙන් සහ ඒ සිද්ධි ආශ්‍රිතව පරීක්ෂණයක් කිරීමෙන් අනතුරුව වාර්තාවක් ඉදිරිපත් කළේ. එවකට -2015 රජයේ- අගමැතිවරයා වූ රනිල් වික්‍රමසිංහ මහත්මයාට තමයි ඒ වාර්තාව ඉදිරිපත් කළේ. ඒ වාර්තාවේත් සඳහන් වනවා, බන්ධනාගාර තුළ තදබදයක් තිබෙනවා, එම නිසා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කිරීමට අවශ්‍යයි කියන එක. ඒ, 2015 වර්ෂයේදී. 2015 වර්ෂයේ රජයේ හිටපු පාර්ශ්වය තමයි මේ වනකොට සමගි ජන බලවේගයේ ඉන්නේ. ඒ පිරිස 2015 ඉඳලා 2019 වෙනතෙක් මේ සඳහා කළේ මොනවාද? එතුමන්ලාගේ කාලය තුළ බන්ධනාගාර තදබදය අඩු වුණාද? ඒ තදබදය අඩු වුණා නම් එතුමන්ලා 2020 අවුරුද්දේ රජයෙන් එළියට යනකොටම මහර බන්ධනාගාරයේ සිරකරුවන් සම්බන්ධයෙන් නැවතත් ගැටලුවක් මතු වුණේ කොහොමද? ගරු සත්‍යලිංගම් මන්ත්‍රීතුමා ඒ ගැන බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා. එතුමාට ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වන්න ඕනෑ.

ඉතිහාසය තුළ ලංකාවේ බන්ධනාගාරවල සිටින කාන්තාවන්, දරුවන් ඇතුළු සිරකරුවන්, රැඳවූවන්, බන්ධනාගාර නිලධාරින් සම්බන්ධයෙනුත්, බන්ධනාගාරවල පවතින සෞඛ්‍ය පහසුකම්වල තත්ත්වය සම්බන්ධයෙනුත් සිදු නොකරන ලද ප්‍රතිසංස්කරණ, සිදු නොකරන ලද වැඩිදියුණු කිරීම් වාගේම, බන්ධනාගාර තුළ ඉන්න අය සම්බන්ධයෙන් සහ ඒවායේ සේවය කරන නිලධාරින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙනුත් සිදු නොකරන ලද ප්‍රතිසංස්කරණ, ප්‍රතිපත්ති වෙනස් කිරීම් ඇතුළු මේ සම්පූර්ණ ක්‍රියාවලිය හර්ෂණ නානායක්කාර ඇමතිතුමා විසින් අවුරුදු එකහමාරක් ඇතුළත කළේ නැහැ කියන එක තමයි විපක්ෂයෙන් ඇවිල්ලා තිබෙන චෝදනාව. ඒක කිසිසේත්ම සාධාරණ චෝදනාවක් නොවෙයි. ඔව්, බන්ධනාගාරවල තදබදයක් තිබෙනවා. ලංකාවේ බන්ධනාගාරවලට මත්ද්‍රව්‍ය ගෙන යෑම පිළිබඳ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, මේ මත්ද්‍රව්‍ය ප්‍රශ්නය වර්ධනය වුණේ කොහොමද කියන එක ගැනත් අපට අවබෝධයක් තිබෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුව විධියට අපි ඇත්තටම උත්සාහ කරන්න ඕනෑ, අධිකරණ ඇමතිතුමා විශ්වාස භංග යෝජනාවකින් ඉවත් කිරීමට නොවෙයි. පාර්ලිමේන්තුවක් විධියටත්, දේශපාලනඥයන් විධියටත් අපට මේ පිළිබඳ පොදු වගකීමක් තිබෙන්න ඕනෑ. ඔබතුමන්ලාත් ආණ්ඩු කරලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලවලදී බන්ධනාගාරවල කරපු ප්‍රතිසංස්කරණ මොනවාද, ඒ කරපු යෝජනා ක්‍රියාත්මක කළේ කොහොමද කියන එක ගැනත් ඔබතුමන්ලාගේ කථාවලදී කරුණු ඉදිරිපත් කරාවි. ඒ නිසා හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට විතරක් මේකේ සම්පූර්ණ වගකීම පවරන්න හදන එක කිසිසේත්ම සාධාරණ කාරණයක් නොවෙයි.

විපක්ෂ නායකතුමා ඇතුළු කථිකයන් කිහිප දෙනෙක්ම ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුවේ කරපු ප්‍රකාශයක් ගැන අදහස් දක්වන්න උත්සාහ කළා, රැඳවූවන් සිටින්නේ රජය භාරයේ, රජය භාරයේ සිටින රැඳවූවන්ගේ වගකීම තිබෙන්නේ රජයට කියලා. ඒක කවුරුවත් ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. මම හිතන්නේ ඒක පළමුවෙන්ම පිළිගත්තේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. මොකද, එතුමා වගකීම්සහගත සහ මානුෂීය ප්‍රවේශයක් තිබෙන ඇමතිවරයෙක්. අපි ඒක මතක් කරන්න ඕනෑ. ආණ්ඩු පාර්ශ්වයේ කිසිම ඇමතිවරයෙකුගේ වගකීම පැහැර හැරීම සම්බන්ධයෙන් නොවෙයි මෙතැන ගැටලුව තිබෙන්නේ. බන්ධනාගාරවල තත්ත්වය අපි දියුණු කරන්නේ කොහොමද කියන එක ගැන සාමූහික වගකීමක් අපි හැමෝටම තිබෙනවා. රජයටත් තිබෙනවා, පාර්ලිමේන්තුවටත් තිබෙනවා. ඒ කෙසේ වෙතත්, මේ විශ්වාස භංග යෝජනාව ඉතාම අසාධාරණ සහ දේශපාලන අරමුණු වෙනුවෙන්ම ඉදිරිපත් කරන ලද විශ්වාස භංග යෝජනාවක්. තමන්ට තිබෙන ප්‍රශ්නයක් විසඳා ගැනීම සඳහා බන්ධනාගාරවල ඉන්න අයගේ සහ බන්ධනාගාර නිලධාරින්ගේ ගැටලු පාවිච්චි කිරීමක් හැටියට තමයි අපි මේක වටහාගන්න ඕනෑ.

Hon. Deputy Chairperson of Committees, I would also like to comment on one other matter raised in this House today about the independence of the Judiciary. That was raised by several Members of the Opposition, especially by the Hon. Rauff Hakeem. I would like to comment on it because it is being misinterpreted. What is the independence of the Judiciary has to be understood before we comment on it or politicize it.

What is the independence of the Judiciary and why do we want it? The independence of the Judiciary is rooted in the principle of separation of powers. Separation of powers means, there are three organs of government under the Constitution of Sri Lanka: the Executive, the Legislature - the Parliament - and the Judiciary. How do these institutions or these organs of government get their power? That is specifically and explicitly set out in the Constitution under Articles 4(a), 4(b) and 4(c). According to Article 4 of the Constitution, the sovereignty of the people shall be exercised and enjoyed in the following manner: the legislative power by Parliament, the Executive Power by the President and the judicial power of the people - we have to remember that judicial power is not the power of the judges or the lawyers, but of the people - by Parliament through courts, tribunals and institutions established by the Constitution. The policy-making power relating to the Judiciary is vested in Parliament. It is not vested in the High Court Judges' Association or in the Bar Association. They do a commendable job in everything and I am not saying that the Bar Association is bad or anything like that, but there is a limit to what they can do or comment on regarding the independence of the Judiciary and how the Judiciary should function. So, the policy-making power relating to the Judiciary is vested in Parliament. We should never forget that because that is related to the Sovereign Power of the people.

And, Madam, this particular allegation that we are compromising the independence of the Judiciary is baseless. Since we came into power, we have appointed several Chief Justices based only on superiority. You can check on that; any Member of Parliament can check on that. We have not appointed any outsiders to the Judiciary, to the Court of Appeal or to the Supreme Court. We have only promoted judges who are in the Court of Appeal and the Supreme Court to the positions of Chairman of the Court of Appeal and Chief Justice. So, we have not interfered with the Judiciary at any point. However, we should remember, under every President before President Anura Kumara Dissanayake, there have been such appointments made, especially to the Chief Justice position. Especially to the position of Chief Justice, every single President had appointed outsiders. That is the practice of interfering with the Judiciary. You all appointed your loyalists and people you preferred to the Judiciary, but we have not done that. All of these judges who are purported to get extension of retirement age are currently in the Judiciary. They are in the Magistrate's Court, the District Court, the High Court, the Court of Appeal and the Supreme Court. We are not making fresh appointments to those positions, except for the recruitment process that has been going on as Magistrates. Therefore, this allegation that we are making interference with the judicial power is baseless.

We also have to remember that there had been particular incidents in the history. The first woman Chief Justice of this country, who is a prominent professor and a prestigious academic, before appointed to the Supreme Court, was impeached on the findings of a Parliamentary Select Committee. That is an interference, baselessly so. But, policy-making relating to the Judiciary, whether it on salaries, the retirement age, the number of courts or other legislation connected to the Judiciary, is the right of Parliament; that is the right of the people.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, නියමිත කාලය අවසන්,

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Just give me 30 seconds, Madam.

It is true that lawyers and judges work in courthouses and it is deeply connected to our careers, but careerism is not the only approach we should take when it comes to justice because justice belongs to the people. Courts are made for the people; justice is practised for the people and the purpose of the Judiciary, the courthouses, is to deliver justice to people as expeditiously as possible. That is the intension of any law-making or any policy change that the Government is going make in the future.

Thank you, Madam, for giving me time.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අර්ජුන සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.43]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අද අපට කථා කරන්නට තිබෙන්නේ ඇත්තටම මගේ මිත්‍රයෙකු වන හර්ෂණ නානායක්කාර මැතිතුමාගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන්. එතුමා මම ගරු කරන පුද්ගලයෙක්. හැබැයි, අධිකරණ ඇමතිවරයා වශයෙන් එතුමාගේ ක්‍රියා කලාපය ගත්තාම, විශේෂයෙන්ම මේ ඛේදවාචකයට මුහුණ දීම සම්බන්ධයෙන්, ඒ වාගේම මේ ඛේදවාචකයෙන් වුණු විනාශය සම්බන්ධයෙන් ආණ්ඩුවෙන් තවමත් හරියට ශෝකය ප්‍රකාශ කරනවා අපට ඇහුණේ නැහැ.

ඇමතිතුමාගේ අවධානය පොඩ්ඩක් අපට යොමු කරන්න කියලා බිමල් රත්නායක ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

පසුගිය කාලයේ පැවැති යුද්ධයෙන් පසු වැඩිම ආරක්ෂක භටයන් ප්‍රමාණයක් ඝාතනය වූ අවස්ථාව තමයි, මේක. මම දේශපාලන වශයෙන් කථාවක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම දන්නවා, ඔබතුමන්ලා මේ පැත්තේ හිටියා නම් අපව හංවඩු ගහනවා කියලා. අපි ඔය පැත්තේ හිටියා නම් ඔබතුමන්ලා මේ ගැන ප්‍රශ්න කරනවා. සාමාන්‍යයෙන් දේශපාලනයේ වෙන්නේ එහෙමයි. හැබැයි, මෙතැන ඊට වඩා භයානක තත්ත්වයක් තිබෙන්නේ. මම ඇත්තටම ඔබතුමන්ලා පහළට දමා කථා කරනවා නොවෙයි. නමුත් මේක ඇත්තටම ආණ්ඩුවේ පළපුරුද්ද සහ නොහැකියාව පිළිබඳ ප්‍රශ්නයක්. ඒක අපට දිගටම අමාත්‍යාංශ හරහා දක්නට ලැබෙනවා. මම හිතන හැටියට ඔබතුමා අහිංසකව වෙන්න ඇති, මේ පිළිබඳ ප්‍රකාශයක් කරන්න ඇත්තේ.

ඔබතුමා මට පොඩ්ඩක් සවන් දුන්නා නම් හොඳයි, ගරු ඇමතිතුමනි. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, මට විනාඩි 8ක් වැනි පොඩි වෙලාවක් ලැබී තිබෙන්නේ. ගරු සභානායකතුමනි, could you please give your attention to my speech? Thank you.

මම මේ අධිකරණ ඇමතිතුමාට කථා කරන්නේ. ඇමතිතුමා කිව්වා, "මම Facebook එකෙන් තමයි ඒ ගැන දැනගත්තේ" කියලා. ඒ වාගේම, මම මේ සම්බන්ධයෙන්,- *[බාධා කිරීමක්]* නැහැ, මම මේ ඔබතුමා කියපු ඒවා කියන්නේ. මම මේවා කියලා හරියන්නේ නැහැ. මේක විශාල පිරිසක් - 30ක් - ඝාතනය වුණු සිද්ධියක් නේ. මේක අපි හිනා වෙන්න ඕනෑ දෙයක් නොවෙයි. අහිංසක, දුප්පත් ජනතාවගේ දෙමාපියන්, සහෝදරයන් තමයි මේ සිද්ධියෙන් ජීවිතක්ෂයට පත් වුණේ. එතැන සිරකරුවෝත් ඉන්නවා, නිලධාරිනුත් ඉන්නවා. ඒ නිසා හිනා වෙන්නේ නැතිව ඒ පවුල්වලට තිබෙන ශෝකය තේරුම් ගන්න. නීති සම්පාදනය කරන අපි ඔක්කොටම මේ පිළිබඳ යම්කිසි වගකීමක් තිබෙනවා. අපටත් ඒ ගැන වගකීමක් තිබෙනවා. අපට ඒ ගැන දුකකුත් තිබෙනවා.

ඒ වාගේම ඔබතුමා කිව්වා, ඒ සම්බන්ධයෙන් නියෝග දෙන්න ඔබතුමා දන්නෙත් නැහැ කියලා. ඒකත් හරි. ඔබතුමා අහිංසකයි. ඔබතුමාට ඒ සම්බන්ධයෙන් පළපුරුද්දක් නැහැ. මම හිතන විධියට, ජනාධිපතිතුමාගේ ඉඳලා පහළටම වනතුරු සිටින අයට ගොඩක් දේවල් සම්බන්ධයෙන් පළපුරුද්දක් නැහැ. ඒකයි මේ හැම එකක්ම කඩාගෙන වැටෙන්නේ. ඉතින්, ඒ කඩා වැටීම තුළ මම දන්නේ නැහැ, ඔබතුමා අයින් කරලා පත් කරන්න වෙන කෙනෙක් ඉන්නවාද කියලා. මම දන්නවා, merry-go-round එක වාගේ එක් පුද්ගලයෙක් පමණක් එහාට මෙහාට මාරු කරමින් අයින් වෙන, අයින් වෙන අමාත්‍ය ධුරවලට පත් කරනවා කියලා. ඒ හැර වෙන කවුරුවත් හොයා ගන්න විධියකුත් නැහැ. ඉතින්, ඔබතුමා මිනීමැරුමක් සම්බන්ධ වගකීම භාර ගන්නවා කියන්නේ, හිරේ යන්න ඕනෑ කියන එකයි. In an accident, if you say "I am responsible for the accident", you must face the law then. ඔබතුමා කිව්වා, ඒ සම්බන්ධ වගකීම භාර ගන්නවා කියලා. මම හිතන විධියට, ඒක තමයි එතුමාගේ සාමාන්‍ය ක්‍රමය, එතුමාගේ හැදියාව අනුව. එතුමා අනිවාර්යයෙන් ඒ වගකීම භාර ගන්න ඕනෑ. එතුමා විතරක් නොවෙයි, ජනාධිපතිතුමාත් ඒ වගකීම භාර ගන්න ඕනෑ. එතුමාට නම් අයින් වෙන්න බැරි වෙයි. හැබැයි, කවුරු හරි මේක භාර ගන්න ඕනෑ.

ඒ වාගේම, අධිකරණය සම්බන්ධයෙන් නොයෙකුත් කථා කියනවා. මොකක්ද, මේ අධිකරණය සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය? ඔබතුමන්ලා පැල් බැඳගෙන තමයි නීතිඥ සංගමයත් එක්ක සටන්වලට එකතු වුණේ.

අද ශිරානි බණ්ඩාරනායක මැතිනිය ගැන කථා කළා. මීට කලින් කථා කළ මන්ත්‍රීතුමිය කිව්වා, එළියෙන් කවුරුවත් පත් කරලා නැහැ කියලා. ශිරානි බණ්ඩාරනායක මැතිනිය පත් කරපු විධියත් වැරදියි. මොකද එතුමිය එළියෙන් පත් කළේ. එදාත් අපි ඒ වෙනුවෙන් සටන් කළා. ශිරානි බණ්ඩාරනායක මැතිනිය පත් කරන එකටත් අපි විරුද්ධ වුණා. ශ්‍රේෂ්ඨාධිකරණයේ අපි හඳුනන විනිශ්චයකාරවරු හිටියා. ඔවුන් සියලුදෙනාම ඒකට විරුද්ධ වුණා. එතුමිය පත් කළාට පස්සේ ඒගොල්ලන් කිව්වා, "We accept you" කියලා. ශිරානි බණ්ඩාරනායක මැතිනිය අහලා තිබෙනවා, ඇයි දැන් ඔබතුමන්ලා මා පිළිගන්නේ කියලා. ඒ කාලයේ හිටපු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් එච්චර ගෞරවනීයයි. ඔවුන් කිව්වා, "Now, you have been appointed as a Supreme Court Judge and we accept you. Before that, we were against you" කියලා. අපේ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා ඒ ගැන දන්නවා. එතුමිය ධුරයෙන් අයින් කරනකොටත් අපි විරුද්ධ වුණා. එතුමිය පත් කරපු විධියත් වැරදියි, ඉවත් කළ විධියත් වැරදියි. රාජපක්ෂවරුන්ගේ ඒ වැරදි නිසා තමයි ජනතාව ඔවුන් ඉක්මනින් බලයෙන් පහ කරලා, ගහලා පැන්නුවේ. හැබැයි, දැන් ඔබතුමන්ලා එන්නෙත් එතැනට. මොකක්ද මේ ප්‍රශ්නය? ඔබතුමන්ලා විනිසුරුවන්ට තිබෙන ආදරයට නොවෙයි විශ්‍රාම යන කාලය දීර්ඝ කරන්න හදන්නේ. ඔබතුමන්ලා මේක කරන්නේ සූරසේන මහත්මයා තියාගන්න නේ. බොරු කරන්න ඕනෑ නැහැ නේ. පුළුවන් නම් මේක ජනවාරි මාසයේ කරන්නකෝ. මේ ගැන විශේෂ කාරක සභාවක් පත් කරන්නකෝ. සාකච්ඡා කරන්නකෝ කොහොමද නඩු ටික ඉවර කරන්නේ කියලා.

මම පෙන්වන්නම්. අධිකරණ ඇමතිතුමාගේ කථාවේදී කියනවා, "You are only assuming" කියලා. මේ ආණ්ඩුව ඔබතුමා ගණන් ගන්නෙත් නැහැ. මෙහෙම දෙයක් වෙනවා කියලා ඔබතුමාට කියන්නේ නැහැ. සජිත් ප්‍රේමදාස මහත්මයා ඔබතුමාගෙන් ප්‍රශ්න අහනකොට ඔබතුමා කියනවා, "You are only assuming. We have not even discussed doing something like that" කියලා. අද උදේ ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමාත් කිව්වා, "They are all assumptions. Yes, you are assuming" කියලා. "එහෙම එකක් නැහැ, අපි සාකච්ඡා කරලාවත් නැහැ" කියනවා. මම හිතන විධියට, ඔබතුමාට ජනාධිපතිතුමාගෙන් හෝ වෙනත් කාගෙන් හෝ දෝෂාරෝපණයක් එන්න ඇති. ඒ නිසා ඔබතුමා හැන්දෑවට ඇවිල්ලා, "No, no, we have started discussing" කියලා, දීර්ඝ විස්තරයක් කියනවා. උදේ කියනවා, "You are only assuming; you are mad. We have no any intention of doing that" කියලා. ඊට පස්සේ එක පාරටම මේ කථාව කියනවා. දැන් මේ

සඳහා විශේෂ කාරක සභාවක් පත් කරලා පුළුවන් නම් අභියෝගය භාර ගන්න මේක ජනවාරි මාසයේ කරන්න. පුළුවන් නම් දෙසැම්බර් මාසය පන්නලා ජනවාරි මාසයේ මේක කරලා පෙන්වන්න. අධිකරණයේ තිබෙන නඩු ටික ඉවර කරන්න ඔච්චර වුවමනාවක් තිබෙනවා නම්-*[බාධා කිරීමක්]* බිමල් රත්නායක ඇමතිතුමා කියන්න බලන්න. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, සභානායක - *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා ඒ කාලයේ ඉගැන්නුවා නේ. සභානායකලා හදන හැටි, මෙතැන යටිගිරියෙන් කෑ ගහගෙන. දැන් ඔබතුමා අමුතුම- *[බාධා කිරීමක්]* ජනාධිපති රජ්ජුරුවෝ වෙලා පොඩි කාලයකට බලය අරගෙන. ඕවා නැති වෙනවා. මිනිස්සු ගහලා පන්නන්නේ. ඉන්දියාවේ මෝදි මහත්මයාට වුණු දේ දැක්කා නේ. ඉන්දියාවේ ආර්ථික වර්ධන වේගය සියයට 8.2යි. Cockroach Janta Party එක උද්ඝෝෂණ පටන් අරගෙන. ඊයේ වෙනකොට මුහුණ බේරිවෙලා Facebook එකට ඇවිල්ලා තනියම telephone එකෙන් කථා කරනවා. මේ වාගේ දේවල් වෙනවා. ඔබතුමන්ලා කියනවා යන්නේ නැහැ කියලා. නමුත්, යන්න වෙනවා. රාජපක්ෂලාත් ඔහොම කිව්වා. ඒ කාලයේ ඔබතුමන්ලායි, අපියි එක පැත්තේ හිටියේ. රාජපක්ෂලා 6දෙනෙක් විතර ඉන්නකොට තමයි කිව්වේ, "අපි යන්නේ නැහැ" කියලා. ඒ හින්දා මම ඔබතුමන්ලාට කියනවා, නීතිගරුකව වැඩ කරන්න කියලා. මම දන්නවා, ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමාගේ හෘදය සාක්ෂියට එකඟව එතුමා මේකට කැමති නැති බව. ඒ වාගේම, අනික් කට්ටියත් කැමති නැහැ.

නඩු ඉවර කරන්න ක්‍රම තිබෙනවා. ඒවාට අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. ඒ කටයුතු computerize කරන්න ඕනෑ. ඒ වාගේ තව ගොඩක් වැඩ තිබෙනවා.

අනික තමයි, මෙන්න මේ විනිශ්චයකාරවරුන්ට නඩු අහන්න බැරිද කියලා ඔබතුමන්ලා කියන්න. යසන්ත කෝදාගොඩ මහත්මයා, දිලීප් නවාස් මහත්මයා, ජනක් ද සිල්වා මහත්මයා, අර්ජුන ඔබේසේකර මහත්මයා, සම්පත් විජේරත්න මහත්මයා, සම්පත් අබේකෝන් මහත්මයා, ශිරාන් ගුණරත්න මහත්මයා, අචල වෙංගප්පුලි මහත්මයා, සෝභිත රාජකරුණා මහත්මයා වාගේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවරු ඉන්නවා ශ්‍රේෂ්ඨාධිකරණයේ. ඒගොල්ලන්ට බැරිද? ඔබතුමන්ලා කියනවා, බාප්පයි, පුතායි, ආච්චියි ඔක්කෝම හිරේ දමන්න ඕනෑ කියලා. ඔබතුමන්ලාට ඕනෑ ඕනෑ කට්ටිය හිරේ දමන්න විනිසුරුවරු තියාගන්න බැහැ. මොනවාද කළේ? මට නඩු දාලා අවුරුද්දක් ගියාට පස්සේ මොනවාද කිව්වේ? CID එක පන්නලා පන්නලා කියනවා, "අපරාධමය වරදක් අනාවරණ නොවේ" කියලා. කවුද ඒවාට ගෙවන්නේ? එහෙම වුණා කියලා ඇමතිවරු ඇවිල්ලා සමාව ගන්නවාද? පළි ගන්න තමයි කටයුතු කරන්නේ. ඡන්දය පවත්වන වෙලාවේ මා ඇතුළට දාලා, ගෙදරට ඇවිල්ලා පරීක්ෂා කරලා, අවුරුද්දකට පස්සේ එහෙම කියනවා. ලක්ෂ 500ක් විතර වියදම් කරලා තිබෙනවා. CID එකෙන් රෑ දෙකහමාරටත් ඇවිල්ලා ගෙදර දොරට තට්ටු කරනවා. අන්තිමට අධිකරණයට ඇවිල්ලා කියනවා, "අපරාධමය වරදක් අනාවරණ නොවේ, සමාවෙන්න" කියලා. මේවා කරන්නද ඔබතුමන්ලා මේ රාජ්‍යය අල්ලා ගන්න - State capture කරන්න - හදන්නේ? ඔබතුමන්ලා කරයි. හැබැයි, මිනිස්සු ඔබතුමන්ලාට ගහලා පන්නනන්නේ. ගහලා විතරක් ඉතුරු වෙන්නේ නැහැ. ඒ හින්දා ඔබතුමන්ලා මේවා හොඳට හිතේ තියාගන්න.

අනුර කුමාර මහත්මයාට මේක තේරෙන්නේ නැහැ. එතුමා නීතිඥවරයෙක් නොවෙයි. ඔබතුමන්ලා එතුමාට කියලා දෙන්න, මේ කරන ව්‍යවස්ථා විරෝධී කැළල, නීති විරෝධී කැළල, නීතියේ ආධිපත්‍යයට පහර දීම වැරැදියි කියලා. සුනිල් වටගල මහත්මයා හිත ඇතුළෙන් මේ ගැන දන්නවා. ඔය පැත්තේ ඉන්න නීතිඥවරුත් හිත ඇතුළෙන් දන්නවා. මොකද, අපි නීතිඥ වෘත්තියේ ඉන්නේ. කවුරු කළත් වැරදියි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා මම කොයි පක්ෂයේ සිටියත් හැමදාම වැරදි දේට විරුද්ධ වෙනවා කියලා. ඒ හින්දා ඔබතුමන්ලා මේක කරන්න එපා. මේක විශාල විනාශයක්. පොඩි කාලයකට ඔබතුමන්ලාට සහයෝගයක් හම්බ වෙයි, ඕනෑ ඕනෑ පුද්ගලයන් හිරේ දමන්න පුළුවන් වෙයි. හැබැයි, මේකෙන් ඔබතුමන්ලාගේ අනාගතය වාගේම මේ රටේ අනාගතයත් විනාශ වෙනවා. ඒ හින්දා මේ ගැන සාකච්ඡා කරන්න. ලබන ජනවාරි මාසයෙන් පස්සේ කවදාවත් ඔබතුමන්ලා මේක කරන්නේ නැහැ. මම ඒකට ඕනෑම අභියෝගයක් කරනවා. ඒ හින්දා මේක හොඳට හිතේ තියාගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Please give me one more minute, Madam.

මා ඔබතුමන්ලාට අභියෝග කරනවා, පුළුවන් නම් ජනවාරි මාසයෙන් පස්සේ මේක කරන්න කියලා. හැබැයි, ඊට කලින් කළොත් ඔබතුමන්ලාට මේකේ පාපය ගෙවන්න වෙනවා. මේකෙන් මේ රටේ ජනතාවට වාගේම ඔබතුමන්ලාටත් විශාල අනතුරකට පත් වෙන්න සිදු වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Give me one more minute, Madam.

විශේෂයෙන්ම ඔබතුමන්ලා නීතියේ ආධිපත්‍යයට සහ ස්වාධීනත්වයට අභියෝග කරන්න එපා. මේ රටේ විනිසුරුවරු ඔක්කෝම ඒ යෝජනාවට විරුද්ධයි. නීතිඥවරු ඔක්කෝම විරුද්ධයි. ඔබතුමන්ලාගේ රියෙන්සි අර්සකුලරත්න මහත්මයා විරුද්ධයි, හර්ෂණ නානායක්කාර මහත්මයා ඇතුළෙන් විරුද්ධයි, සුනිල් වටගල මහත්මයා ඇතුළෙන් විරුද්ධයි, උපුල් කුමරප්පෙරුම මහත්මයා විරුද්ධයි, සාලිය පීරිස් මහත්මයා විරුද්ධයි. *[බාධා කිරීමක්]* හිනාවෙන්න එපා මහත්තයෝ, ඒ කාලයේ අපිත් ආණ්ඩු පක්ෂවල සිටියා. හැබැයි, වැරදි දෙයක් වෙනකොට මම නම් ඒ හැම තැනකදීම අපේ නායකවරුන්ට කිව්වා, "ඕක වැරැදියි" කියලා. ඔබතුමා ඕනෑ තරම් අවස්ථා අරගෙන බලන්න. පුළුවන් නම් පෙන්වන්න, සුජීව සේනසිංහ වැරදි දේකට උදව් කරලා තිබෙනවාද කියලා? අපි පක්ෂග්‍රාහීව යම් කිසි තීන්දු තීරණ ගන්න ඇති. *[බාධා කිරීමක්]* හිනාවෙන්න එපා. ඒ කාලයේ ඔබතුමන්ලා බැට කෑවා නේ. බැට කාපු 1988-1989 කාලයේ අපි ඔබතුමන්ලා වෙනුවෙන් සටන් කළා. ඊට පස්සේත් අපි සටන් කළා. *[බාධා කිරීමක්]* කෑ ගහන්නේ කවුද කියලා බලන්න පොඩ්ඩක් නැඟිටින්නකෝ. කෑ ගහන එක්කෙනා කවුද කියලා බලන්න නැඟිටින්නකෝ. *[බාධා කිරීමක්]* මොකක්ද? ඇමතිතුමාද? ඔය පාට් එක තියාගන්න, සද්දෙ දමන්නේ නැතිව.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් වැඩිපුර විනාඩියක කාලයත් අවසන්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ඔය සද්දෙ දමන්නෙත් power එක තිබෙනකල් විතරයි. ඔහොම තමයි රාජපක්ෂලාත් හිටියේ. වරදිනකොට දුවන්නයි වෙන්නේ. ජොනීලත් හිටියේ ඔහොමයි. ඒ කාලයේ ජොනී හිටියේ ඔයිටත් වඩා උඩින්.

මම අවසාන වශයෙන් මේ කාරණය කියන්න කැමැතියි. මේ අපරාධය කරන්න එපා. මුළු රටම මේකට විරුද්ධයි. මේක කරන්න අපි ඔබතුමන්ලාට ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා ඒකාධිපති වේශයෙන් ක්‍රියා කරන එක නවත්වලා අනුර කුමාර මහත්තයාට ආපසු එන්න කියන්න, අවුරුදු තුන හතරකට කලින් හිටපු තැනට.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.53]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! அண்மையில் நீர்கொழும்புச் சிறைச்சாலையில் இடம்பெற்ற தாக்குதல் சம்பவத்தையொட்டி இன்றைய தினம் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சருக்கு எதிராக ஒரு நம்பிக்கையில்லாப் பிரேரணையை எதிர்க்கட்சியினர் கொண்டு வந்திருக்கின்றார்கள். சுதந்திரத்துக்குப் பின்னர் சிறைச் சாலைகளில் பல்வேறு சந்தர்ப்பங்களில், பல்வேறு காலகட்டங்களில் இத்தகைய தாக்குதல்கள் நடைபெற்றிருக் கின்ற வரலாற்றை நாங்கள் நன்றாக அறிந்திருக்கின்றோம். இந்தச் சந்தர்ப்பத்திலே குறிப்பாக ஒரு விடயத்தைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். சிறைச்சாலைகளில் ஏற்பட்ட இத்தகைய முறுகல் நிலைகள், தாக்குதல்கள் என்பன 1900ஆம் ஆண்டிலிருந்து ஆரம்பித்த ஒரு விடயம் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகிறேன்.

குறிப்பாக, சுதந்திரத்துக்குப் பின்னர் எமது நாட்டில் முதல் கட்டமாக, நீதி அமைச்சராக நிசங்க விஜயரத்ன அவர்கள் பதவி வகித்தபோது, 1983ஆம் ஆண்டு இத்தகைய ஒரு சிறைச்சாலைத் தாக்குதல் சம்பவம் நிகழ்ந்தது. அந்தச் சம்பவத்தில், எமது சகோதர தமிழ்ச் சமூகத்தைச் சேர்ந்த 53 கைதிகள் மரணித்திருக்கின்றார்கள். நேற்றுய தினம்கூட "கறுப்பு யூலை" என்ற பெயரில் அந்த விடயத்தை நாங்கள் விவாதித்தோம். அதேபோன்று, மீண்டும் பட்டி வீரகோன் அவர்கள் நீதி அமைச்சராக இருந்தபோது, 2000ஆம் ஆண்டு பிந்துனுவெவ சிறைச்சாலையில் இத்தகைய துரதிருஷ்ட வசமான ஒரு சம்பவம் நடைபெற்றிருந்தது. அந்தச் சம்பவத்தில் 27 கைதிகள் உயிரிழந்ததுடன், 17 கைதிகள் கடுமையாகக் காயமடைந்தனர். அதில் 12 வயதுடைய ஒரு சிறுவன்கூட படுகொலை செய்யப்பட்டதை இந்தச் சந்தர்ப்பத்தில் நான் சொல்லிக்கொள்ள விரும்புகிறேன்.

இவ்வாறான சிறைச்சாலைத் தாக்குதல்களின் வரலாற்றை எடுத்து நோக்கும்போது, 2002ஆம் ஆண்டு நாம் அனைவரும் அறிந்த விடயம் பற்றி கடந்த பாராளுமன்ற அமர்வின்போது கருத்துத் தெரிவித்த ஐக்கிய மக்கள் சக்தியின் பாராளுமன்ற உறுப்பினர் ஒருவர், சிறையில் உள்ள காடையர்கள் பற்றி தனக்கு நன்றாகத் தெரியுமெனக் குறிப்பிட்டிருந்தார். 2002இல் கௌரவ அமைச்சர் ஜோன் அமரதுங்க அவர்கள் நீதி அமைச்சராக இருந்த காலப்பகுதியில் தங்காலைச் சிறைச் சாலையில் இத்தகைய ஒரு மோதல் சம்பவம் இடம்பெற்றிருந்தது. அதன் பின்னர் 2011ஆம் ஆண்டு அநுராதபுரம் சிறைச்சாலையில் கைதி ஒருவர் சுட்டுக் கொல்லப்பட்டார். அந்தக் காலப்பகுதியில் நீதி அமைச்சராக இருந்தவர், இன்று ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியின் தேசியத் தலைவரென்று சொல்லப்படுகின்ற ரஊப் ஹகீம் அவர்கள். அதேபோன்று, 2012ஆம் ஆண்டு வெலிக்கடைச் சிறைச்சாலையிலே படுகொலைச் சம்பவமொன்று நடைபெற்றது. அப்போதும் நீதி அமைச்சராகப் பதவி வகித்தவர் கௌரவ ரஊப் ஹகீம் என்பதை இந்தச் சந்தர்ப்பத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன். எமது நீதி அமைச்சர் பொறுப்பற்ற முறையிலே நடந்துகொண்டதாக அவர் குறிப்பிட்டார். ஆனால், அவர் பதவி வகித்த காலப் பகுதியிலே சிறைச்சாலைகளில் இத்தகைய சம்பவங்கள் பல நடந்தேறியுள்ளன என்பதை அவருக்கு ஞாபகப்படுத்துவதற்கு நான் இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்திக் கொள்கின்றேன். ஏனையவர்களின் பொறுப்பற்ற தன்மையைப்பற்றி பேசுகின்றவர்கள், தாங்கள் பதவியிலே இருந்தபோது எத்தகைய பொறுப்புணர்வுடன் செயற்பட்டார்கள் என்பதை மீட்டிப் பார்த்துக்கொள்வது சிறப்பானதாக இருக்குமென நான் இந்தச் சந்தர்ப்பத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், கடந்த பாராளுமன்ற அமர்வின்போது குறித்த சிறைச்சாலை விவகாரம் பற்றி பேசப்பட்டபொழுது, கௌரவ ரஊப் ஹகீம் அவர்கள் பொய்யான, போலியான, பிழையான ஒரு செய்தியை இந்த உயரிய சபையிலே முன்வைத்திருந்தார். அதுதான் மஹர சிறைச்சாலையிலே அமைந்துள்ள பள்ளிவாசல் தொடர்பான செய்தி. அதாவது, மஹர சிறைச் சாலையிலே அமைந்துள்ள பள்ளிவாசலை பாதுகாப்பு நிமித்தமாக நான் வேறோர் இடத்திற்கு மாற்ற முயற்சிப்ப தாகப் போலியான, பொய்யான ஒரு குற்றச்சாட்டை இந்த உயரிய அவையிலே அவர் முன்வைத்திருந்தார். நான் இந்த வேளையிலே அவரிடம் கூற விரும்புகின்ற விடயம் என்னவென்றால், நீங்கள் பொறுப்புவாய்ந்த Cabinet அமைச்சராக இருந்தபொழுதுதான் குறித்த பள்ளிவாசல் மூடப்பட்டது என்றுதான். அதன் பின்னரும் இந்தப் பாராளுமன்றத்திலே நீங்கள் அதே கட்சியைப் பிரதிநிதித்துவப் படுத்தியிருந்தீர்கள். அப்போது எந்தவொரு சந்தர்ப் பத்திலாவது நீங்கள் குறித்த விடயம் சம்பந்தமாகப் பேசியிருந்தீர்களா? அமைச்சராக இருந்தபோதும், 5 வருடம் பாராளுமன்ற உறுப்பினராக இருந்தபோதும்கூட அந்த விடயத்தைப்பற்றி பேசாதவர், திடீரென இன்று வந்து பேசுகின்றார்.

குறிப்பாக, நான் தேசிய ஒருமைப்பாட்டுப் பிரதி அமைச்சராக இருந்தபோது, எமது அமைச்சர் ஹர்ஷன நாணாயக்கார அவர்களின் ஒத்துழைப்புடன் குறித்த விடயம் சம்பந்தமாகப் பலதரப்பட்டவர்களுடன் கலந்துரையாடி நியாயமான, நேர்மையான ஒரு தீர்வைப் பெற்றுக் கொடுப்பதற்கு மேற்கொண்ட முயற்சிகளைத் தொடர்ந்தும் முன்னெடுத்து வருகின்றேன் என்பதை இந்த அவையில் குறிப்பிட விரும்புகின்றேன். கௌரவ ஹர்ஷன நாணாயக்காரவின் பொறுப்பற்ற தன்மையைப் பற்றி

பேசுகின்றவர், அவர் பதவியில் இருந்தபோது எந்தளவுக்குப் பொறுப்புணர்வோடும் கடமையுணர்வோடும் செயற்பட்டார் என்பதற்கான சாட்சிதான் 2010 - 2015க்கு இடைப்பட்ட காலத்திலே அவர் நீதி அமைச்சராகப் பதவி வகித்தபோது சிறைச்சாலைகளிலே நடைபெற்றிருந்த பல்வேறுபட்ட சம்பவங்கள்! ஆனால், அதற்காக அவர் எந்தவொரு சந்தர்ப்பத்திலும் அவர் பதவி விலகுவதாகக் கூறவோ அல்லது அவருக்கு எதிராக நம்பிக்கையில்லாப் பிரேரணை கொண்டு வரப்படவோ இல்லையென்பதை நான் இச்சந்தர்ப்பத்திலே சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

எமக்கும் தெரியும், நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டுவந்தவர்களுடைய மனச்சாட்சிக்கும் தெரியும், கடந்த யூலை 5ஆம், 6ஆம், திகதிகளில் நீர்கொழும்புச் சிறைச் சாலையில் நடைபெற்ற சம்பவத்திற்கும் இதற்கு முன்னர் சிறைச்சாலைகளிலே நடைபெற்ற சம்பவங்களுக்குமிடையில் தெளிவான வேறுபாடு இருக்கின்றது என்பது. அவர்கள் அதனை நன்றாக அறிவார்கள். அரசியல் காரணத்துக்காக, பழிவாங்கும் காரணத்துக்காக அவர்களால் மேற்கொள்ளப் பட்ட அத்தகைய நிகழ்வுகள்தான் அந்தச் சிறைச்சாலைகளிலே நடைபெற்றன. ஆனால், உண்மையிலேயே அன்று நடைபெற்ற சம்பவம் குறித்து கௌரவ அமைச்சர் ஹர்ஷன நாணாயக்கார அவர்கள் வேதனையுடனும் உணர்வு பூர்வமாகவும் தனது கவலையைத் தெரிவித்து, அதற்கான நடவடிக்கைகளை மேற்கொள்வதற்கான பூரண முயற்சியையும் மேற்கொண்டார். குறிப்பாக, நான் ஒரு வருடம் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சராக அவருடன் இணைந்து செயற்பட்டிருக்கின்றேன். அந்தக் காலத்திலும்கூட உண்மையிலே நீதித்துறையை, நீதிமன்றம் சார்ந்த உட்கட்டமைப்பு வசதிகளை அபிவிருத்தி செய்வதிலும் அதற்குத் தேவையான மனித வளங்களைப் பெற்றுக் கொள்வதிலும் மிகவும் முயற்சியோடு செயற்பட்ட ஓர் அமைச்சராகவே ஹர்ஷன நாணாயக்கார அவர்களை நான் காண்கின்றேன். வழமையாக நான் அவரைச் சந்திக்கின்ற போதெல்லாம், எவ்வாறு அதிகாரிகளுடன் இணைந்து இந்த நடவடிக்கைகளைத் துரிதப்படுத்துவது என்பது பற்றியே அவர் பேசுவார். இன்று மக்களின் நம்பிக்கையை இழந்த எதிர்க்கட்சியினர், மக்களின் நம்பிக்கையைப் பெற்றுள்ள அரசாங்கத்தில் உள்ள கௌரவ அமைச்சருக்கு எதிராக நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டுவந்திருக் கின்றனர். அந்தப் பிரேரணை இன்று கண்டிப்பாகத் தோற்கடிக்கப்படும் என்பதில் எந்தச் சந்தேகமும் இல்லை என்பதை இந்தச் சந்தர்ப்பத்தில் நான் குறிப்பிட விரும்புகின்றேன்.

நாங்கள் நேற்றைய தினம் ஒரு விடயத்தைக் கண்டோம். பொதுவாகச் சொல்வார்கள், “வெள்ளம் வருகின்றபோது கீரியும் பாம்பும் ஒரு கட்டையில் ஏறும்” என்று. அதுபோல, தேர்தலின்போது பிரிந்து போட்டியிட்டாலும், எதிர்க்கட்சி களின் இலக்கு, அரசியல் கலாசாரம் ஆகியன ஒன்றாகத்தான் இருக்கின்றது என்பதை அவர்களின் நேற்றைய அந்த ஒன்றுகூடல் தெளிவாக இந்த நாட்டுக்குச் சொல்லியிருக் கின்றது. புத்தியுள்ள, இந்த நாட்டின்மீது அக்கறையுள்ள, இந்த நாட்டின் முன்னேற்றத்தின்மீது அக்கறையுள்ளவர்கள், இந்த நாட்டைச் சீரழித்த, இந்த நாட்டைப் படுகுழியில் தள்ளிய, இந்த நாட்டைப் பொருளாதார ரீதியாக, சமூக ரீதியாக, அரசியல் ரீதியாக அழித்தவர்களை மீண்டும் ஆட்சிக்குக் கொண்டுவருவதற்கு எத்தனிக்க மாட்டார்கள் என்பதில் எமக்கு நம்பிக்கை இருக்கின்றது. இன்று இந்த அவையிலே எனக்கு முன் உரையாற்றியவர், இந்த அரசாங்கத்தின் அனுபவ மின்மையைப் பற்றி பேசினார். ஆனால், கடந்த 76 வருட காலமாக மாறி மாறித் தங்களது அனுபவங்களைக்கொண்டு இந்த நாட்டை ஆட்சி செய்தவர்களால்தான் நாடு கடைசியாகப் பொருளாதார ரீதியாக மாத்திரமல்ல, அனைத்துத் துறை களிலும் வீழ்ச்சியடைந்த ஒரு நிலைமைக்குத் தள்ளப்பட்டது.

நீர்கொழும்புச் சிறைச்சாலைக் கலவரத்துக்குப் பின்னால் உள்ள காரணம் என்ன? போதைப் பொருளை ஒழிப்பதற்கும், பாதாள உலகக் கோஷ்டியினரை அழிப்பதற்குமான செயற்றிட்டங்கள் இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்ததன் பின்னர்தான் மேற்கொள்ளப்பட்டு வருவது அனைவருக்கும் தெரியும். ஆனால், கடந்த ஆட்சியாளர்கள் அவர்களுடன் கைகோர்த்துப் பக்கபலமாக நின்று, போதைப்பொருள் வியாபாரிகளை இந்த உயரிய சபைக்கும் கொண்டு வந்தார்கள். உள்ளூராட்சிச் சபைகளுக்குள்ளும் அவர்களை இணைத்து, அவர்களைப் பலப்படுத்தினார்கள். எனவே, அத்தகையவர் களைப் பலப்படுத்தியவர்கள் பாதிக்கப்படு கின்றபோது, இவ் வாறான ஒரு நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டு வந்திருக்கின்றார்கள். நீதி அமைச்சர் கௌரவ ஹர்ஷன நாணாயக்கார அவர்களுக்கு எதிராகக் கொண்டுவரப்பட்ட நம்பிக்கையில்லாப் பிரேரணை கண்டிப்பாகத் தோற்கடிக்கப்படும். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.05]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! இன்று மிகவும் முக்கியமானதொரு விவாதம் இந்தப் பாராளுமன்றத்திலே இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது. அதுதான் எங்களுடைய சகாவான அமைச்சர் கௌரவ ஹர்ஷன நாணாயக்கார அவர்களுக்கு எதிரான நம்பிக்கை யில்லாத் தீர்மானம்! கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இதற்கு முன்னர் இந்தப் பாராளுமன்றத்திலே இவ்வாறான நம்பிக்கையில்லாத் தீர்மானங்கள் கொண்டுவரப்பட்டபோது, அன்றைய காலகட்டங்களில் இருந்த அமைச்சர்களை எடுத்துக் கொண்டாலும் சரி, பிரதமர்களை எடுத்துக்கொண்டாலும் சரி, அனைவருமே அந்தப் பிரேரணையைக் கண்டு நடுங்கி, அஞ்சி, வீட்டில் தூக்கம்கூட வராது தவித்துக் கொண்டிருந்தார்கள் என்பதுதான் வரலாறு. அதாவது, வீட்டில் படுக்க முடியாது வீதியில் அமர்ந்திருந்தார்கள் என்பதுகூட வரலாறாக இருக்கின்றது. காரணம், நம்பிக்கையில்லாத் தீர்மானம் முன்மொழியப்பட்டு, அது விவாதிக்கப்பட்டு, பிறகு வாக்கெடுப்பு நடக்கும் வரைக்கும் அவர்களுக்கு என்ன நடக்கும் என்று தெரியாது! ஏனென்றால், இந்த நாடாளுமன்றத்தில் திடீரென்று ஆளுந்தரப்பில் இருந்து எதிர்க்கட்சிக்கும், எதிர்க்கட்சியில் இருந்து ஆளுந்தரப்புக்கும் தாவுகின்ற பச்சோந்தித்தனமான வேலைகளைச் செய்த வரலாறு அவர்களுக்கு உரியது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைக்கு எங்களுடைய அமைச்சர் ஹர்ஷன நாணாயக்கார

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

அவர்கள் மிகவும் சந்தோசமாக, மிகவும் cool downஆக இருந்து கொண்டிருக்கின்றார். இன்றைய இந்த நம்பிக்கையில்லாத் தீர்மானம் அவருக்கு எதிரானதாக இருந்தாலும்கூட, அவர் எந்தவிதமான கலக்கமும் இல்லாது, எந்தவிதமான அச்சமும் இல்லாது, மிகவும் சுதந்திரமாகச் சிரித்து, அதை ஒரு விளையாட்டாக எடுத்துக்கொண்டு இருக்கின்றார். ஏன்? அது வேறெதனாலும் அல்ல, அவருடைய மனச்சாட்சி பற்றி அவருக்குத் தெரியும் என்பதனால்தான். தமது மனசாட்சியின் படி குற்றம் இழைக்காதவர்களே இன்றைக்கு எங்களுடைய தேசிய மக்கள் சக்தியில் இருக்கின்ற அமைச்சர்கள் ஆவர். கௌரவ ஹர்ஷன நாணாயக்கார அவர்கள் எந்தவிதமான குற்றங்களையும் இழைக்காத அதேநேரத்தில், மற்றவர்களைப் பற்றி நினைக்கின்ற, மற்றவர்களுடைய வாழ்க்கையை நேசிக்கின்ற, அந்த நேசத்துக்கு ஏற்பத் தனது செயற்பாடுகளை முன்னெடுக்கின்ற ஒரு நேசமுள்ள மனிதர். ஆனால், எங்கள் எல்லோருக்கும் தெரியும், இந்த நாட்டில் நாங்கள் விரும்பியோ, விரும்பாமலோ அண்மையில் நீர்கொழும்புச் சிறைச்சாலைப் படுகொலைச் சம்பவம் நடைபெற்றிருக்கின்றது; அந்தச் சம்பவம் மிகவும் வருந்தத்தக்கது; மிகவும் கவலைக்கிடமானது. அதில் முப்பதுக்கும் அதிகமானவர்களின் உயிர்கள் பறிக்கப் பட்டிருக்கின்றன. அதைக் கேள்விப்பட்ட அடுத்த நிமிடமே எங்களுடைய கௌரவ அமைச்சர் ஹர்ஷன நாணாயக்கார அவர்கள் அதற்காகத் தனது ஆழ்ந்த இரங்கலைத் தெரிவித்து, மரியாதையும் செலுத்தினார். அத்தோடு அது சம்பந்தமான தனது செயற்பாடுகளை வேகமாக முடுக்கிவிட்டிருந்தார்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்தச் சம்பவம் சம்பந்தமாகப் பலரும் பலவிதமான கருத்துகளைச் சொல்லலாம். எவர் எவ்வாறான கருத்துகளைச் சொல்கின்ற போதிலும்கூட, எங்கள் எல்லோருக்கும் நன்றாகத் தெரியும், இந்தச் சம்பவம்தான் இங்கு இடம்பெற்ற முதலாவது சம்பவம் கிடையாது அல்லது எங்களுக்கு ஏற்பட்ட புதிய அனுபவம் கிடையாது என்பது. ஏனென்றால், இப்படியான சம்பவங்கள் எமது நாட்டில் நிறையவே இடம்பெற்றிருக்கின்றன; அரசாங்கத்தால் திட்டமிட்டுப் படுகொலைகள் செய்யப் பட்டிருக்கின்றன. அரசாங்கமே தேடிச் சென்று சிறைச்சாலையில் கொலை செய்த வரலாறு இருக்கின்றது. கடந்த கால வெலிக்கடை சிறைச்சாலைப் படுகொலையை எடுத்துக்கொண்டாலும் சரி, அதற்கு முன்னர் 1983ஆம் ஆண்டு வெலிக்கடைச் சிறைச்சாலையில் நடந்த குட்டிமணி போன்றோரின் படுகொலையை எடுத்துக்கொண்டாலும் சரி, அரசாங்கத்தால் ஏவப்பட்ட ஏவலாளிகளும் கொலையாளிகளும் தேடிச் சென்று சிறைச்சாலைக்குள் வைத்து அங்கிருந்த தமிழ் இளைஞர்களுடைய கண்களைத் தோண்டி எடுத்துப் படுகொலை செய்த வரலாறு இருக்கின்றது; அவர்கள்மீது கடுமையான சித்திரவதைகளைச் செய்த வரலாறு இருக்கின்றது. அன்றைய காலகட்டங்களில் அவ்வாறான படுகொலைகள் அரசாங்கத்தால் திட்டமிட்டுச் செய்யப் பட்டவை. ஆனால், இந்தச் சம்பவம் அப்படியல்ல! இந்தச் சம்பவத்தைப் பொறுத்தவரை, அரசாங்கத்துக்கும் இந்தச் சம்பவத்துக்கும் எந்தவிதச் சம்பந்தமும் கிடையாது. இது கவலைக்குரிய விடயம்!

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைக்கு விசேடமாக எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் பேசுகின்றபோது, எங்களால் ஒரு விடயத்தை அவதானிக்கக் கூடியதாக இருந்தது. எதிர்க்கட்சியினர் காலையில் தங்களுடைய பேச்சை ஆரம்பிக்கும்போது, பெரிய வீரர்களைப் போன்று பேசினார்கள்; மிகவும் சத்தமாகப் பேசினார்கள். இந்த நம்பிக்கையில்லாத் தீர்மானத்தைக் கொண்டுவந்ததன்மூலமாக ஹர்ஷன நாணாயக்கார அவர்களைப் பதவியிலிருந்து வெளியேற்றுகின்ற பாணியிலே ஆரம்பத்தில் அவர்களுடைய உரை இருந்தது. ஆனால், பகல் ஆகின்றபோது அந்தச் சூடெல்லாம் தணிந்து, பதுங்கிய பூனைகள்போல் இருக்கின் றார்கள். அவர்களால் கொண்டுவரப்பட்ட நம்பிக்கையில்லாத் தீர்மானம் தொடர்பில் அர்த்தபுஷ்டியான கருத்துகளை முன்வைக்கின்ற, ஓர் ஆற்றல்மிக்க பேச்சைக்கூட இன்றைக்கு இந்தச் சபையில் கேட்கக் கிடைக்கவில்லை. அதனால் அவர்கள், "இந்த அரசாங்கத்தினர் அனுபவமில்லாத வர்கள், இவர்கள் நீண்டகாலம் நின்றுபிடிக்க மாட்டார்கள், அதனால்தான் ஹர்ஷன நாணாயக்கார அவர்களுக்கு இந்தப் பிரச்சினை ஏற்பட்டிருக்கிறது" என்ற வகையில் கருத்துக் கூறுகின்றார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாங்கள் ஆட்சி பீடத்துக்கு வருகின்றபோதும், "இவர்கள் அனுபவமில்லாதவர்கள், எந்தவிதமான தேர்ச்சியுமில்லாத வர்கள்; அதனால் வெகுசீக்கிரத்தில் இல்லாது போய் விடுவார்கள்" என்று சொன்னார்கள். ஆனால், இன்றைக்கு இரண்டு வருடங்கள் ஆகின்றன. இரண்டு வருடங்களுக்குப் பிறகும் அதே புராணத்தைப் பாடுவதைத் தவிர, அவர்களுக்கு வேறு மார்க்கம் எதுவும் கிடையாது. அவர்கள் பழைய புராணத்தைப் பாடிக்கொண்டிருக்கிறார்கள்; நாங்கள் மக்கள் மத்தியில் சென்று கொண்டிருக்கின்றோம்; மக்களுடைய பிரச்சினைகளைச் செவிமடுக்கின்றோம். மக்களின் பிரச்சினைகளைச் செவிமடுப்பதன் காரணமாக, மக்களின் செல்வாக்கு நாளுக்கு நாள் தேசிய மக்கள் சக்தியையும் மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களையும் சூழ்கின்றது; மக்கள் எங்களுடன் அணிதிரண்டு கொண்டிருக்கிறார்கள். அவ்வாறான மக்கள் அணிதிரள்வின் காரணமாக இன்று இவர்கள் கலக்கமடைந்திருக்கிறார்கள்.

அதுமாத்திரமல்ல, இன்று இவர்கள் மக்களிடம், "இந்த அரசாங்கம் சர்வாதிகாரமான அரசாங்கமா? அடக்குமுறை களைக் கட்டவிழ்த்து விடுகின்றதா? மக்களைக் கடத்துகின்றதா? ஊடகவியலாளர்களை ஒடுக்குகின்றதா? அல்லது ஊடக நிறுவனங்களுக்குத் தீ வைக்கின்றதா?" என்று கேட்கின்றபோது, "கிடையாது" என்றே மக்கள் சொல்கிறார்கள். ஆனால், கடந்த காலங்களை நாங்கள் பார்க்கின்றபோது, நான் இங்கு சொன்ன அனைத்து அடக்குமுறைகளும் அரசாங்கத்தினாலேயே கட்டவிழ்த்து விடப்பட்ட வரலாறுதான் இந்த நாட்டிலே இருக்கின்றது. அந்த வரலாறு இன்று மாற்றமடைந்ததன் காரணமாகவும், அதேநேரத்தில் இந்த நாட்டிலேயிருக்கின்ற தமிழர், சிங்களவர், முஸ்லிம்கள் என அனைத்து இன மக்களும் வடக்கா, கிழக்கா, தெற்கா, மேற்கா என்ற வேறுபாடெல்லாம் இல்லாமல் இன்று தேசிய மக்கள் சக்தியுடன் அணிதிரண்டிருப்பதனாலும் இவர்கள் கலக்கமடைந்திருக்கிறார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தேசிய மக்கள் சக்தியை ஆட்சிபீடத்திற்குக் கொண்டுவந்தபோது மக்கள் எங்களிடம் விடுத்த வேண்டுகோள் என்னவென்றால், "இந்த நாட்டை போதை என்கின்ற பிசாசு பீடித்திருக்கின்றது. அதிலிருந்து எமது இளைஞர் சமூகத்தை, மாணவர் சமூகத்தைப் பாதுகாக்க வேண்டும்; அவர்களை அதிலிருந்து மீட்க வேண்டும்; அவர்களைக் காப்பாற்றுவதற்கான நடவடிக்கைகளை எடுங்கள்!" என்பதாகும். அதற்கேற்ற வகையில் இப்போது நாங்கள் இந்தப் போதைப்பொருள் ஒழிப்பு நடவடிக்கைகளைத் துரிதப்படுத்தியிருக்கின்றோம். இந்தப் போதைப் பொருட்களினால் நாசமாக்கப்

படுவது எங்களுடைய இளைஞர் சமுதாயம். எங்களுடைய நாளைய சமுதாயத்தை நாசமாக்குகின்ற செயற்பாடுகளை முன்னெடுத்தவர்கள் யார் என்று ஆராய்ந்து பார்க்கின்ற பொழுது, அவர்கள் கடந்த காலங்களில் ஆட்சி செய்தவர்கள்தாம். அவர்களுடைய செயற்பாட்டின் காரண மாகவே இந்த நாட்டில் போதைப்பொருட்கள் அதிகரித்தன, குற்றச் செயல்கள் அதிகரித்தன, கொலைகள், கொள்ளைகள் போன்ற செயற்பாடுகள் அனைத்தும் அதிகரித்தன. அந்த ஆட்சியாளர்களால் கட்டவிழ்த்துவிடப்பட்ட இந்த நெருக் கடியான நிலைமைகளிலிருந்து மக்களை மீட்டெடுக்கின்ற நடவடிக்கைகளை இன்று நாங்கள் எடுத்திருக்கின்றோம் என்பது எல்லோருக்குமே தெரியும்.

போதைப்பொருளுக்கு எதிரான நடவடிக்கை எடுக்கப்படு கின்றபோது, முன்னர் அவர்களுடைய சகாக்களாக இருந்த, அவர்கள் ஆதரவைப் பெற்ற நபர்கள் எல்லோருக்குமே இன்று சிறையிலே கம்பி எண்ணவேண்டிய நிலைமை எற்பட்டிருக்கின்றது. ஆகவே, அந்த சகாக்களின் - முன்னைய ஆட்சியாளர்களின் - கறுப்புக் கஜானாக்கள் இன்று காலியாகியிருக்கின்றன. அதன் காரணமாகத்தான் அவர்கள் மீண்டும் அந்தக் கஜானாவை நிரப்பும் முயற்சியில் ஈடுபடுகின்றார்கள்.

அதுமாத்திரமல்ல, இன்றைக்கு இவர்கள் நீதித் துறையைப்பற்றி அதிகமாகப் பேசுகின்றார்கள். ஆனால், நாட்டிலிருக்கின்ற மக்கள் எங்களுக்குச் சொன்னது வேறெதுவுமல்ல, “இந்த நாட்டைக் கொள்ளையடித்த, இந்த நாட்டை நாசம் செய்த, இந்த நாட்டில் இலஞ்சம், ஊழல் மோசடியில் ஈடுபட்டு, எமது நாட்டை ஊழல் மலிந்த தேசமாக்கிய முன்னைய ஆட்சியாளர்களை, இந்த நாட்டைச் சூறையாடி இந்த நிலைமைக்குக் கொண்டுவந்தவர்களைச் சட்டத்தின் முன் கொண்டுவந்து உரிய தண்டனையை வழங்குங்கள்! எங்களுடைய பணங்களை மீட்டெடுங்கள்!" என்பதாகும். அதற்கேற்ற வகையில், இன்று எங்களுடைய நீதித் துறை பலப்படுத்தப்படுகின்றது, சிறைச்சாலைகள் பலப்படுத்தப்படுகின்றன, சிறைச்சாலைகளில் இருக்கின்ற குறைபாடுகள் நிவர்த்தி செய்யப்படுகின்றன, சிறைச்சாலைகளில் இருக்கின்ற நெரிசலைக் குறைப்பதற்கு ஏதுவான நடவடிக்கைகள் எடுக்கப்படுகின்றன. அதேநேரத்தில் முன்னர் குற்றவாளிகளாக இருந்த நபர்களுக்கு எதிரான நடவடிக்கைகளும் கட்டவிழ்த்து விடப்படுகின்றன.

அவ்வாறான செயற்பாடுகளின் காரணமாக இன்று அவர்கள் அச்சமடைந்திருக்கிறார்கள் - பயமடைந்திருக் கிறார்கள். ஏனென்றால், இன்றைக்கு இந்த நீதித் துறையைச் சரியான முறையில் நிமிர்த்தி நேராக்குகின்றபொழுது, எந்தவிதமான அரசியல் நோக்கமுமின்றி நீதித் துறை சுயாதீனமாகச் செயற்படுவதற்கான நடவடிக்கைகளை முன்னெடுக்கின்றபொழுது, அவர்களுக்குத் தெரியும், அடுத்து வருகின்ற விசாரணை என்பது, இந்த நாட்டை மோசடியில் ஈடுபடுத்திய நபர்களுக்கெதிரானது என்று. அவர்களுக்கு எதிராகச் சட்டம் பதில் சொல்கின்றபொழுது, அவர்களுக்கு எதிராக சட்டம் இயங்கும்பொழுது, அச்சம் காரணமாக அரசாங்கத்தின்மீது சேறு பூசுவதைத் தவிர வேறு மார்க்கமின்றி அவர்கள் இருக்கின்றார்கள். கடந்த காலங்களில், அவன் கொள்ளைக்காரன், இவன் மோசடிக்காரன், அவன் அப்படி யானவன், இவன் இப்படியானவன், அவனோடு நான் சேரமாட்டேன், இவனோடு நான் சேரமாட்டேன் எனக் கூறிக் கொண்டிருந்தவர்கள் எல்லோரும் எந்தவிதத் தடங்கலுமின்றி இன்றைக்கு ஒரே குட்டையில் ஊறிய மட்டைகளாக ஒன்று சேர்ந்திருக்கிறார்கள். இதனை நாங்கள் வரவேற்கின்றோம். ஏனென்றால், இந்த நாட்டை நாசம் செய்த அனைத்து மட்டைகளும் ஒரே குட்டையில் சேரும்போது, அவர்கள் யார் என்பது மக்களுக்குத் தெளிவாகத் தெரியும். அதனால், மக்கள் தங்களை மேலும் தெளிவுபடுத்திக்கொண்டு, இவர்களைக் கூண்டோடு கைலாசம் அனுப்புவதற்கு ஏதுவான நடவடிக்கைகளை எடுப்பார்கள் என்று கூறிக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.*

[අ.භා. 3.20]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතක හැටියට, මම දන්නා හැටියට ආසන්න වශයෙන් අවුරුදු අටකට ආසන්න කාලයක් සහ අවුරුදු දෙකකට ආසන්න කාලයක් පැලවත්තේ බන්ධනාගාරගතව සිටින මා මිත්‍ර අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාගේ හෘදය සාක්ෂිය මෙසේ අවධි කිරීමට කැමැත්තෙමි. එතුමාට එරෙහිව තමයි අද මේ සංවාදයට ගැනෙන, විවාදයට ගැනෙන විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. එතුමාට එරෙහිව කියන්නේ අපේ මිතුරාට එරෙහිව නොවෙයි, පැලවත්තේ සිරගෙදර ඉන්න හර්ෂණ නානායක්කාර, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයාට එරෙහිවයි. එතුමාට ඒ සිර ගෙදරින් එළියට ඇවිල්ලා කථා කරන්නට පුළුවන්කමක් ලැබුණා නම්, එතුමා කථා කරන දේ තමයි මම මේ කථා කරන්නේ.

මට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, මීගමුව බන්ධනාගාරයේ සිදුවීම වැනි සිදුවීම් කලින් සිද්ධ වෙලා තිබෙනවා කියලා. 1844දී තමයි ලංකාවේ බන්ධනාගාර පද්ධතිය

[ගරු දිලිත් ජයවීර මහතා]

ආරම්භ කළේ. අද වෙනකොට අවුරුදු 182ක් වෙනවා. ඒ අවුරුදු 182ක කාලය තුළ කිසිම අවස්ථාවක බන්ධනාගාර නිලධාරියෙක් බන්ධනාගාරය තුළ මිය ගිහිල්ලා නැහැ. ඒක නිසා මෙවැනි සිදුවීමක් ඉතිහාසයේම සිද්ධ වෙලා නැහැ. එතකොට, මෙච්චර කාලයකට පස්සේ මෙවැනි සිදුවීමක් සිද්ධ වෙන්නේ කොහොමද කියන කාරණය තමයි අද මේ විවාදයේ මුඛ්‍ය කාරණය වශයෙන් ගත යුත්තේ. මේ ආණ්ඩුවේ මැති ඇමතිවරු දිගින් දිගටම කියනවා, "ආණ්ඩු බලය ඇල්ලුවා, රාජ්‍ය බලය අල්ලන්න බැරි වුණා. දැන් රාජ්‍ය බලය අල්ලනවා" කියලා. රාජ්‍ය බලය කියන්නේ මොකක්ද? රාජ්‍ය බලය කියන්නේ මේ රටේ ස්ථාවර යන්ත්‍රණය. ආණ්ඩුව කියන්නේ තාවකාලික යන්ත්‍රණය. ස්ථාවර යන්ත්‍රණය ක්‍රියාත්මක වෙන්නේ විශේෂයෙන්ම රාජ්‍ය නිලධාරින් හරහා, අධිකරණයද ඇතුළත්ව. එතකොට මේ යන්ත්‍රණය ක්‍රියාත්මක වූ ක්‍රමයක් තිබුණා, ඉතිහාසයක් තිබුණා. ඒ සඳහා අත්දැකීම් සහිත පුද්ගලයන් යොදා ගැනීමක් තිබුණා.

මම කලිනුත් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සඳහන් කළ පරිදිම, කෙනෙක් තොරතුරු ලබා ගන්නා ක්‍රමයක් තිබුණා. ලෝකයේ කවුරුත් නොකරපු පර්යේෂණ මාලාවක් මේ ආණ්ඩුව කරගෙන යනවා. කිසිම අත්දැකීමක් නැති පුද්ගලයන් පිරිසක් විසින්, කිසිම අවබෝධයකින් තොරව කරපු කටයුත්තක ප්‍රතිඵලයක් තමයි බන්ධනාගාරයේ සිදුවුණු මේ සිදුවීම. බන්ධනාගාර නිලධාරින් 10ක් මිය ගිහිල්ලා තවත් අහිංසක රැඳවූවන් - අහිංසක කියන්නේ වරද ඔප්පු නොවුණු අය බොහොමයක් හිටියා - මිය ගියා. ඇයි ඒ? රාජ්‍ය බලය අල්ලන්න ගිහිල්ලා. හිටපු කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය අනීතිකව ඉවත් කළා. ඔහුට කරන ලද ඒ අකටයුත්ත සම්බන්ධයෙන් දැන් මානව හිමිකම් කොමිසම තීන්දුවක් දීලා තිබෙනවා; ඒක වැරැදියි කියලා තීරණය කරලා තිබෙනවා. ඒ අනීතික ක්‍රියාමාර්ගය ගත්තේ ඇයි? ඒ, තමන්ට ඕනෑ පුද්ගලයෙක් මේක ඇතුළට දාගන්නයි. මොකටද? බන්ධනාගාරයේ බලය අල්ලන්න. බන්ධනාගාරයේ බලය අල්ලන්න අත්දැකීම් සහිත ඒ කොමසාරිස් ජනාරාල්වරයා ඉවත් කළාම මොකක්ද සිද්ධ වුණේ? ඊට පිටුපසින් හිටපු නිලධාරින් කිව්වා අපටත් බැහැ කියලා. අපටත් මේ විදියට හිරේ යන්න වෙනවා නම්, මේ වැඩේ භාර ගන්න බැහැ කිව්වා. අන්තිමට සොයාගෙන ගිහින් තමන් බලය ඇල්ලුවා කියලා හිතලා පුද්ගලයෙක් එතැනට දැම්මා, වැඩ බලන්න. මේ ක්‍රියාදාමය නිසා සම්පූර්ණ බන්ධනාගාර පද්ධතියේම ක්‍රියාකාරිත්වය කඩාගෙන වැටුණා. නිලධාරින් තුළ තිබුණු විශ්වාසය නැති වුණා. නිලධාරින් විසින් තීන්දු තීරණ ගත්ත ඒ ඉතිහාසය වෙනස් කරලා තීන්දු තීරණ ගන්නේ නැති තත්ත්වයට පත් වුණා. මෙවැනි කුඩා සිදුවීමක් වීමට පෙර බන්ධනාගාරය තුළට බුද්ධි තොරතුරු ලැබීමේ ක්‍රමයක් මීට කලින් තිබුණා. ඒ බුද්ධි තොරතුරු ලැබීම සම්පූර්ණයෙන්ම නැති වෙලා ගියා. බන්ධනාගාරය කියන්නේ උප සංස්කෘතියක්. උදාහරණයක් හැටියට මැගසින් බන්ධනාගාරය ගත්තොත්, පන්දාහක් විතර සිටින තැනක උසාවි දිනයකදී 50කටත් වඩා අඩු නිලධාරින් පිරිසක් විතරයි ඉන්නේ. එතකොට ඒ ඉන්න සිරකරුවන්ට පුළුවන් ඇඟිල්ලෙන් ඇනලා වුණත් නිලධාරින් ඝාතනය කරන්න. නමුත්, ඒ බන්ධනාගාර උප සංස්කෘතිය තුළ විනයක් ක්‍රියාත්මක වුණා. ඒ විනය ක්‍රියාත්මක වන්න හේතු වුණේ දීර්ඝ කාලීනව පැවතුණු ක්‍රියාකාරකම් නිසා. ඒක වෙනස් කරන්න ගිහිල්ලා තමයි මේ විනාශය සිද්ධ වුණේ. ඒ සිදුවීම අපි මොහොතකට පැත්තකින් තියමු. හැබැයි, මේකම තමයි මේ රාජ්‍ය තන්ත්‍රයේ දැන් කරන්නේ. ත්‍රිවිධ හමුදාවේ ඉඳලා අධිකරණ පද්ධතිය දක්වාම මේ රාජ්‍ය තන්ත්‍රයේ බලය අල්ලන්න ගිහිල්ලා, ඒ තැන්වලට තමන්ගේ මිනිස්සු දමන්න ඕනෑ කියලා හිතාගෙන වැඩ කරලා පළපුරුදු නිලධාරින්, පළපුරුදු නායකත්වය අයින් කරන්නට කටයුතු කළා. තමන්ගේ පටු දේශපාලනය සඳහාම පමණක් රාජ්‍ය තන්ත්‍රය යොදාගන්න ගිහිල්ලා සිද්ධ වෙච්ච මෙවැනි බරපතළ අනතුරු එකක් දෙකක් නොවෙයි, මහා විශාල ප්‍රමාණයක් අපට පෙනෙන්නට තිබෙනවා. අධිකරණයේ ස්වාධීනත්වයට අත තියපු නිසා මුළු ලෝකයේම අගෞරවයට පාත්‍ර වෙච්ච රටක් බවට අපි ළඟදීම පත්වීමට නියමිතයි. අද මේ රටේ ජාතික ආරක්ෂක පද්ධතිය සම්පූර්ණයෙන්ම කඩා වැටී තිබෙනවා. බුද්ධි තොරතුරු ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ රටේ ජාතික ආරක්ෂාව බරපතළ අනතුරකට ලක් වෙලා තිබෙනවා. මම වගකීමෙන් කියන්නේ.

අද ආර්ථිකය කඩා වැටිලා. අපේ ව්‍යවසායකයන් හිර ගෙවල්වල දාලා. මේ රටට විශාල වශයෙන් බදු ගෙවපු ව්‍යවසායකයෙක් අද රිමාන්ඩ් කර තිබෙනවා. මෙවැනි තත්ත්වයක් අපි මීට කලින් දැකලා තිබුණේ නැහැ. මොකද, අද මුළු පද්ධතියම ක්‍රියාත්මක වෙන්නේ, මේ රජයේ ජාතික ප්‍රතිපත්තිය වන තමන් පැලවත්තේ හිර ගෙදර ඉන්න නිසා අනෙක් මිනිස්සුත් හිර ගෙදර ඉන්න ඕනෑ කියලා හිතාගෙන සිටින මානසිකත්වය නිසාය කියලා මම කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කෞෂල්‍යා ආරියරත්න නියෝජ්‍ය ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.27]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අතේ තිබෙනවා පොතක්. මම ඒක ගැන කියන්න කලින් මේ කාරණය කියලා ඉන්නම්. පාර්ලිමේන්තු සම්බන්ධීකරණ කටයුතුවල යෙදුණු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ එම්.පී.පී. අමරකුමාර මහත්මයා හදිසියේම මියගොස් තිබෙනවා. රජය වෙනුවෙනුත්, අමාත්‍යාංශය වෙනුවෙනුත් නියෝජ්‍ය අමාත්‍යවරිය ලෙස මම එතුමාගේ පවුලේ අයට මේ අවස්ථාවේදී ශෝකය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අතේ තිබෙනවා 2012 වර්ෂයේ මම විශ්වවිද්‍යාලයේ වැඩ කරපු කාලයේ අපි කරපු පර්යේෂණයක් පිළිබඳ කරුණු ඇතුළත් පොතක්. මේ පොතේ ඇතුළත් පර්යේෂණය මෙහෙයවූයේ නීතිඥ මෙලනි පලිහක්කාර. 2012දී තමයි අපි මේක publish කරන්නේ. ඇත්තටම තදබදය, custody, care and correction, ඒ කියන්නේ රැකවරණය, බලාගැනීම, ආරක්ෂාව සහ විශෝධනය කියන දේවල් සම්බන්ධයෙන් කාලයක් තිස්සේ බන්ධනාගාරවල පැවති අඩුපාඩු ගැන අපි විශේෂයෙන් කථා කර තිබෙනවා, 2012දී. මෙම පොතේ පිටු අංක 79-90 දක්වා සඳහන් වන්නේ 2010 වසරේ දත්ත. ඒ කාලයේ බන්ධනාගාර ඇතුළේ 11,000ක පමණ පිරිසක් රඳවා තබන්න හැකියාව තිබුණා. මේ කියන්නේ අවුරුදු 14කට විතර එහා කාලය. නමුත් ඒ වනකොටත් 27,000ක් පමණ රඳවා තිබෙනවා. ඒ වාගේම මේ පොතේ අපි සඳහන් කරනවා, 1977දී හිටපු කීර්තිමත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයෙකු වන ජේ.පී. දෙල්ගොඩ මැතිතුමාගේ "විශෝධනය සඳහා බන්ධනාගාරගත කිරීම" කියන වාර්තාවේ කරුණු. මෙම "දෙල්ගොඩ වාර්තාව" බන්ධනාගාර ක්ෂේත්‍රයේ වැඩ කරන

බොහෝ අය පරිහරණය කරන වාර්තාවක්. අපට මේ බන්ධනාගාර ක්‍රමය ලැබුණේ යටත් විජිත පාලන ක්‍රමයේ ප්‍රතිඵලයක් ලෙසයි. 1977දී මේ වාර්තාවෙන් එතුමා ලංකාවේ බන්ධනාගාර ක්‍රමයේ, විශෝධන ක්‍රමයේ තිබෙන අඩුපාඩු සහ බන්ධනාගාර තදබදය ගැන විශේෂයෙන් කථා කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම වාර්තාව මම අද ගෙනාවේ මේ බන්ධනාගාරවල තිබෙන තදබදය සහ මේ විශෝධන ක්‍රමයේ තිබෙන අඩුපාඩු ගැන පැහැදිලි කරන්නයි. මෙහි තිබෙන පද්ධතිමය වෙනස්කම් ගැන කථා කරන්නේ ඈත කාලයේ - 1970 ගණන්වල - ඉඳලාමයි. Michel Foucault කියන ප්‍රංශ දාර්ශනිකයා යුරෝපයේ බන්ධනාගාර පද්ධතිය ගැන කථා කරලා තිබෙනවා. බන්ධනාගාර පද්ධතිය තුළ තිබෙන බලය පිළිබඳ ප්‍රශ්නය සහ මේ රැඳවියන් පුනරුත්ථාපනය කොට නැවත සමාජගත කිරීම පිළිබඳව තිබෙන දැක්ම පිළිබඳව ලංකාවේත්, ලෝකයේත් දිගටම කථා කරලා තිබෙනවා. ලංකාව ගත්තොත්, මේක ගිය අවුරුද්ද ඇතුළත වැඩි වෙච්ච තත්ත්වයක් නොවෙයි. නමුත් අපි දන්නවා, මේ සංඛ්‍යාවේ සාපේක්ෂ වැඩිවීමක් වුණු බව. මොකද, මත්ද්‍රව්‍ය සහ අපරාධවලට සම්බන්ධ අය වැඩිපුර අත්අඩංගුවට ගැනීම හේතුවෙන් බන්ධනාගාරගතවන්නන්ගේ සාපේක්ෂ වැඩිවීමක් ගිය අවුරුද්දේ වුණා. ඒ වාගේම දශකයකට වැඩි කාලයක් තිස්සේ බන්ධනාගාර පිළිබඳ පර්යේෂණවල සහ පුහුණු කිරීම්වල යෙදුණු කෙනෙකු ලෙස මා දන්නවා, ඒ කාලයේ බන්ධනාගාරවල සිටි සමහර නිලධාරින් බන්ධනාගාර ඇතුළේ තිබෙන මත්ද්‍රව්‍ය ජාවාරම්වලට සහයෝගය දුන් බව. මම කියන්නේ ඒ හැමෝම නොවෙයි, සමහර අය. ඒ වාගේම බන්ධනාගාර ඇතුළේ දූරකථන භාවිතය, බන්ධනාගාර ඇතුළේ සිට එළියේ කෙරෙන මත්ද්‍රව්‍ය ජාවාරම් මෙහෙයවීම වාගේ කර්තව්‍යයන් පවා සිදු වුණා. නමුත්, මේවා සමාජයේ කථා බහට ආවේ නැහැ. මොකද, ඒවා ඒ තරමට සාමාන්‍යකරණය වෙලා තිබුණා. නමුත්, පසුගිය අවුරුදු එකහමාර පුරාවටම වෙච්ච වෙනස තමයි, බන්ධනාගාර ඇතුළේ තිබුණු මෙන්න මේ කියන යම් යම් අපරාධ කල්ලිවල තිබුණු බලය අඩු වෙමින්, ඔවුන්ට මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදීමට තිබෙන හැකියාව අඩු කිරීමට කටයුතු කිරීම. ඒ නිසා එම රැඳවියන් තුළ යම් කිසි අසහනකාරී බවක් තිබුණු බව අපි පිළිගන්න අවශ්‍යයි.

බන්ධනාගාර සහ අධිකරණ ක්ෂේත්‍රයේ තිබුණු අඩුපාඩු ගැන, සේවක හිඟය ගැන අපි කථා කළා. මට කලින් කථා කළ මන්ත්‍රීතුමාත් ඒ පිළිබඳව කිව්වා. නිලධාරින්ගේ පුරප්පාඩු තිබෙනවා කියන එක එතුමාත් පිළිගන්නවා. අපි බලය ගන්නකොට මේ අමාත්‍යාංශයේම අනුමත පුරප්පාඩු 6,021ක් තිබුණා. ඒකත් හදලා තිබුණේ 2013 වර්ෂයේ සංඛ්‍යාලේඛනවලට අනුව. 2022දී තමයි අවසන් වතාවට මේ බඳවා ගැනීම් කරලා තිබුණේ. මේ කාලය ඇතුළත 2,000කට ආසන්න පිරිසක් අපි බඳවා ගෙන තිබුණා. බන්ධනාගාර පමණක් නොවෙයි, රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව, පොලීසිය යනාදී වශයෙන් මේ හා සමගාමීව තවත් ආයතන රාශියක් කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හා සමගාමීව අපි අධිකරණ ක්‍රියාවලිය වේගවත් කරලා තිබෙනවා. දැන් අධිකරණවල නඩු ඇහෙනවා. ඒ සඳහා අපි අලුත් අධිකරණ හතක් පිහිටුවා තිබෙනවා. අපි දන්නවා, ඒ සම්බන්ධවත් එළියේ බයක් තිබෙනවා කියලා. ඊට සමානවම නීති ප්‍රතිසංස්කරණ කිහිපයකුත් ඉදිරියේදී එන්න නියමිතයි, මේ විෂ මත්ද්‍රව්‍යවල දළ බරට නඩු පැවරීම කියන වෙනස කරන්න. මේක 2021 වර්ෂයේ සිට කරන්න අවශ්‍යයි කියලා තිබුණු නීති ප්‍රතිසංස්කරණයක්. ඒ වාගේම නිවාස අඩස්සිය පිළිබඳ නීතියත් ඉදිරියට එන්න නියමිතයි.

2025 අවුරුද්දේ සුළු වැරදි සඳහා බන්ධනාගාරගත නොකර පුද්ගලයන් 16,000ක් ප්‍රජා විශෝධනයට යොමු කරලා තිබෙනවා. ඒ වාගේ වැදගත් කාරණයකුත් මම මෙතැන සඳහන් කරන්න කැමැතියි. 2025 ජූලි මාසයේදී මේ සඳහා අමාත්‍ය මණ්ඩලය මඟින් විශේෂ කමිටුවක් පත් කළා. සුළු වැරදි සඳහා විශෝධනයට හා පුනරුත්ථාපනයට ලක්ව සිටියද, නිදහස් වීමට නොහැකිව සිටින යම් රැඳවියන් කොටසක් බන්ධනාගාරගතව ඉන්නවා. "පොදු සමාව" දීමේ ක්‍රමය ලෝකයේ ක්‍රියාත්මක වන්නේ ඒ අය සඳහායි. එවැනි රැඳවියන්ගෙන් නැවත සමාජගත කිරීමට සුදුසු අය තෝරාගෙන, නිදහස් කිරීමට යම් නිශ්චිත ක්‍රමයක් අවශ්‍යයි. ඒ කියන්නේ, ලෝකයේ අනෙකුත් රටවල ක්‍රියාත්මක කරන ආදර්ශත්, අපේ රටේ තිබෙන තත්ත්වයත් සලකා බලා නිශ්චිත හා පැහැදිලි ක්‍රමයකට අනුව එවැනි රැඳවියන්ට පොදු සමාව දීමට ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කරන්නට විශ්‍රාමික විනිසුරු ගරු එස්. තුරෛරාජා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා.

මමත් එහි සාමාජිකයෙක්. අපි එහි අවසන් වාර්තාව පසුගිය මස 10වැනි දා අධිකරණයට භාර දුන්නා. මේ ඔක්කෝම කළේ බන්ධනාගාර විශෝධනයට සමගාමීවයි. ඒ කියන්නේ, කෙනෙක් කාලයක් බන්ධනාගාරයක තබා ගැනීමෙන් පසු ඔහු හෝ ඇය විශෝධනයට ලක්කොට නැවත සමාජගත කිරීම කියන බන්ධනාගාර ප්‍රතිසංස්කරණය නම් ලොකු චිත්‍රය තුළ, ඒ දැක්ම තුළ කරපු වැඩ තමයි ඒවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඒකට අමතරව මම අර කලින් කියපු කාරණා, ඒ කියන්නේ බන්ධනාගාරගත වන අපරාධ සහ මත්ද්‍රව්‍ය වැරදිවලට සම්බන්ධ අයගේ සංඛ්‍යාව වැඩි වනකොට තාවකාලිකවත් අපට යම් යම් පියවර ගන්න වුණා.

මේ විශ්වාස භංග යෝජනාව තුළ කියනවා, අපේ අධිකරණ ඇමතිතුමා නිසි පියවර අරගෙන නැහැ කියලා, මේ රැඳවියන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය ගැන. ඒ නිසාම අපි ගිය අවුරුද්ද තුළදී සිදු කළ, දැනටමත් සම්පූර්ණ කර ඇති සහ අවසන් අදියරේ පවතින ව්‍යාපෘති කිහිපයක් ගැන කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව පල්ලෙකැලේ නව දුම්බර බන්ධනාගාරය, පල්ලන්සේන බන්ධනාගාරය, මහර බන්ධනාගාරය කියන ඒවායේ නව ගොඩනැඟිලි ඉදිකර තිබෙනවා. ඒ වාගේම වැලිකඩ මැගසින් සහ කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරවල තදබදය කළමනාකරණය කිරීමට තාවකාලික ඉදිකිරීම් කර තිබෙනවා. ඒ වාගේම වැලිසර නාවික හමුදා කඳවුර තුළ අධි ආරක්ෂිත සිර කුටි සහිත බන්ධනාගාරයක් ස්ථාපනය කර තිබෙනවා.

ඒ වාගේම දැනට ක්‍රියාත්මක වන, 2026 සහ 2028 වර්ෂ අතර අවසන්වීමට නියමිත ව්‍යාපෘති ටිකක් තිබෙනවා. පල්ලෙකැලේ බන්ධනාගාරය, වටරැක බන්ධනාගාරය සහ කළුතර බන්ධනාගාරය කියන බන්ධනාගාර තුනේම ගොඩනැඟිලි ඉදිකරමින් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල ඇති වුණු සිද්ධිය නිසා අපට එම රැඳවියන් වෙනත් තැන්වලට තාවකාලිකව අනුයුක්ත කරන්න වුණා. ඒ අනුව ඒ අය මහමෝදරට සහ බෝගම්බර පැරණි බන්ධනාගාරයට යොමු කර තිබෙනවා. ඒ වාගේම කුරුවිට බන්ධනාගාරයේ යටිතල පහසුකම් වර්ධනය රුපියල් මිලියන 288ක් යොදවා සිදු කර තිබෙනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වනවා, 2027 වර්ෂයේ සිට

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

වාරියපොළ බන්ධනාගාරය පුළුල් කරන්නත්, මාතර බන්ධනාගාරය නැවත ස්ථාපනය කිරීමේ වැඩ කටයුතු කරන්නත්. ඒ වාගේම වටරැක රිමාන්ඩ් බන්ධනාගාරයේ දෙවැනි අදියර සහ වටරැක අධිආරක්ෂිත බන්ධනාගාරයේ කටයුතු ද අපි සැලසුම් කරමින් තිබෙනවා. කොළඹ වැලිකඩ බන්ධනාගාරය හොරණ මිල්ලෑව ප්‍රදේශයේ වඩා හොඳ පහසුකම් සහිත, ඇත්තටම රැඳවියන් විශෝධනයට යොමු කළ හැකි හොඳ පරිසරයක් සහිත තැනකට ගෙනයන්නත් අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම එහි ආරක්ෂාව තහවුරු කරන්නට අවශ්‍ය දේවල් මිලදී ගැනීමත් සිදු කර තිබෙනවා. ඒ වාගේම කාර්ය මණ්ඩල පහසුකම් වැඩිදියුණු කර තිබෙනවා. එම රැඳවියන් ප්‍රවාහනයට බස් රථ 40ක් අරගෙන තිබෙනවා. ඒ වාගේම පරිවාසයේ සිටින දරුවන්ගේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයෙන් වෙනමම වෑන් රථ 10ක් අරගෙන දුන්නා, සියලු පළාත්වලට. බැරැක්ක, සනීපාරක්ෂක පද්ධති වැඩිදියුණු කර තිබෙනවා, රුපියල් මිලියන 150ක් යොදවා. බන්ධනාගාර 12ක හදිසි ප්‍රතිකාර ඒකක - ETUs - ස්ථාපනය කර තිබෙනවා. ඒ වාගේම රුපියල් ලක්ෂ 300ක් වැය කර සිර රැඳවි පුනරුත්ථාපන වැඩසටහන් අපි අලුතින් හඳුන්වා දී තිබෙනවා. ඒ වාගේම කර්මාන්ත අංශය ශක්තිමත් කරන්න අවශ්‍ය උපකරණ අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ දේවල් කිව්වේ, අපේ අධිකරණ ඇමතිතුමා නිසි පියවර අරගෙන නැහැ කියා තර්කයක් ගොඩනහමින් එතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැවිත් තිබෙන නිසායි. මම හිතන විධියට පසුගිය අවුරුදු එකහමාර තුළ මේ "නිසි පියවර" කියන කාරණය වෙනුවෙන් ඕනෑවටත් වඩා එතුමා කටයුතු කර තිබෙනවා. ඒ අනුව ඇති තරම් ප්‍රාග්ධන වියදම් යොදවමින් බන්ධනාගාර පද්ධතිය ශක්තිමත් කරන්න එතුමා කටයුතු කර තිබෙනවා. ඊට අමතරව ගත්තොත්, නීති පද්ධතිය ශක්තිමත් කිරීමටත්, නීතිය ක්‍රියාත්මක කරන ආයතන ස්වාධීන කිරීමටත් අපි වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ නිසා මම හිතන විධියට මේ තර්කය අදාළ නොවන එකක්.

ඒ වාගේම මම පැහැදිලිව කියන්න කැමැතියි, අපේ රජයේ ප්‍රතිපත්තිය වන්නේ වැඩිපුර බන්ධනාගාර හදා වැඩිපුර රැඳවියන් ඒ තැන්වලට දමන එක නොවෙයි කියලා. අපේ ප්‍රතිපත්තිය වන්නේ ඔවුන් පුනරුත්ථාපනය කර නිසි ලෙස සමාජයේ සංවර්ධනයට දායක කර ගැනීමයි. ඒ සඳහා තමයි ඇත්තටම අධිකරණ ක්‍රියාවලිය හරහා නොගොසින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වන අයට ස්වයං පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු වන්න අවස්ථාව ලබා දී තිබෙන්නේ.

මේ විශ්වාස භංග යෝජනාව ගෙනා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට මම කියන්න කැමැතියි, විශ්වාසය භංග වෙලා තිබෙන්නේ අපේ අධිකරණ ඇමතිතුමාගේ නොවෙයි කියන කාරණය. ඊයේ අර ඊනියා ඒකාබද්ධ විපක්ෂයේ ඡායාරූප දැක්කා නම් විශ්වාසය භංග වෙලා තිබෙන්නේ අන්න ඒ විපක්ෂයේය කියන කාරණය පැහැදිලි වන බව මම මතක් කරන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 22ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම අවුරුදු 22ක් විතර මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන කෙනෙක්. ඒ කාලය තුළ මේ ගෙනාපු විශ්වාස භංග යෝජනාව නිකම් ගෙනාපු විශ්වාස භංග යෝජනාවක් නොවෙයි. මෙය ඉතා වැදගත් සාක්ෂි ඇතිව ගෙනාපු එකක්. මේකේ බොහොම පැහැදිලි කරුණු සඳහන්ව තිබෙනවා. අපේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමා මං එක්ක එක chamber එකේ නීතිඥයෙකු විධියට වැඩ කරපු කෙනෙක්. ඒ යාළු මිත්‍රකම් වෙනම තිබෙනවා. නමුත්, එතුමාට පැවරුණු රාජකාරිය පිළිබඳ ප්‍රශ්නයක් මෙතැන තිබෙන්නේ.

2024 නොවැම්බර් මාසයේ 25වැනි දා අමාත්‍ය ධුරයේ දිවුරුම් දෙනකොට ගැසට් පත්‍රයක් මඟින් එතුමාට වගකීම් ගණනාවක් පැවරුවා. එම ගැසට් පත්‍රයේ විෂයයන් සහ කාර්යයන් යටතේ අංක 11හි තිබෙනවා, "යම් වරදකරුවකුට නියම කරනු ලැබූ දඬුවම් සම්බන්ධයෙන් සමාව දීම, අඩු කිරීම, ලිහිල් කිරීම, ප්‍රමාද කිරීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම" කියලා. ඊළඟට, අංක 17හි තිබෙනවා, "ජනතා පරමාධිපත්‍යය හා ජාතික ආරක්ෂාව තහවුරු වන බවට සහතික වෙමින් කාලීන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට පියවර ගැනීම" කියලා. අංක 18හි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමට අදාළ කටයුතු සිදු කිරීම පිළිබඳවත්, අංක 19හි බන්ධනාගාර ප්‍රතිසංස්කරණයට අදාළ කටයුතු කිරීම පිළිබඳවත් තිබෙනවා. ඒ විධියට අංක 20, 21, 22, 23 ආදී වශයෙන් තිබෙනවා. නමුත් මේ එකක්වත් පිළිබඳ පැහැදිලි වැඩ පිළිවෙළක් අපි මේ අවුරුදු දෙක තුළ දැක්කේ නැහැ.

මට කලින් කථා කරපු ගරු නියෝජ්‍ය ඇමතිතුමිය කියපු කාරණා මම අහගෙන හිටියා. මම check කරලා බැලුවාම, පල්ලෙකැලේ හදපු ගොඩනැඟිලිවලට සල්ලි දීලා, ඔක්කොම වැඩ කටයුතු ඉවර කරලා තිබුණේ. තව සියයට 20යි කරන්න තිබුණේ. පල්ලන්සේන හදපු බන්ධනාගාර ගොඩනැඟිලිවලට පසුගිය ආණ්ඩුවලින් ඔක්කොම සල්ලි දීලා තිබුණේ. ඒකේ සියයට 10ක්, 20ක් විතර ඉවර කරන්න තිබුණේ. එහෙම ඒවා කිව්වාට කමක් නැහැ. මොකද, පසුගිය කාලයේ කරපු ඒවාට මේ කාලයේ බෝඩ් ගහන එක වෙනම කාරණයක්.

කෙසේ වෙතත් මම කියන්නේ මේක ප්‍රශ්න ගණනාවක් ඇති වෙච්ච තත්ත්වයක් කියන එකයි. ඔබතුමන්ලා සියලුදෙනා දන්නවා, ලංකාවේ බන්ධනාගාර 37ක් තිබෙනවා කියලා. ඒ බන්ධනාගාර 37හි රැඳවියන් 10,800කට ඉන්න පුළුවන්. 2026 ජූලි 05වැනි දා වනකොට ඒවායේ රැඳවියන් 41,257ක් පිරිලා ඉන්නවා. මීගමුව බන්ධනාගාරයේ රැඳවියන් 600කට ඉන්න පුළුවන්. නමුත් 2,400ක් ඉන්නවා. සියදෙනෙකුට තිබෙන්නේ එක වැසිකිළියයි. මේ සිද්ධිය වූ රාත්‍රියේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා ගිහිල්ලා යම්කිසි විධියකට ඒ තත්ත්වය පාලනය කළාය කිව්වා. නමුත් ඒ කාරණය ගැන ඇමතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියපු කාරණය පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන් නොමඟ යැවීමක්. එතුමා කිව්වා, "ඔවුන් කියන දේ අහලා සමථ වෙලා හවස ඇතුළට යනවා. පහුවෙනි දා, 06වැනි දා උදේ වරුවේ ආහාර දීලා ඔවුන් උසාවි යන වැඩවලට ලැහැස්ති කරද්දී, ඉතාම ක්ෂණයෙන් දෙපාර්ශ්වය අතර තවත් ගැටුමක් නිර්මාණය වෙනවා" කියලා. එතුමා කියපු විධියට, මේක සම්පූර්ණයෙන්ම සමථයට පත් කරලා

තිබුණේ. නමුත් එහෙම නැහැ. හවස් වනකොට ඒ රැඳවියෝ සම්පූර්ණයෙන් බන්ධනාගාරය අල්ලා ගත්තා. බන්ධනාගාරය අල්ලාගෙන ඔවුන් ඒකේ තිබුණු ෆාමසිය සම්පූර්ණයෙන් කඩලා ඒකේ තිබුණු ඒවා බොන්න පටන් ගත්තා. උදේ 6.00ට තමයි සාමාන්‍යයෙන් බන්ධනාගාරයේ කෑම දෙන්නේ. දවල් 11.00 වනතුරු කෑම ටික දී ගන්න බැරිව ගියා. ඒක තමයි ඇත්ත තත්ත්වය. මේ ඇත්ත තත්ත්වය වහලා බොරු කරන්න ලැහැස්ති වෙන්න එපා. මොකද, පාර්ලිමේන්තුව එහෙමපිටින්ම නොමඟ යනවා. ඊයේ උසාවියේ සාක්ෂි දෙනකොට CID එක බොහොම පැහැදිලිව කිව්වා, බන්ධනාගාරයේ හිටපු අයට මේ සම්බන්ධයෙන් කිසිම පාලනයක් තිබුණේ නැහැ කියලා. මේ තත්ත්වය ඇති වෙන්නේ කොහොමද? මේ තත්ත්වය තිබෙනකොට තමයි 89දෙනෙක් යැව්වේ. හරියට කිඹුලන්ට පාන් දෙන්න යවනවා වාගේ වැඩක් තමයි මේ කරලා තිබෙන්නේ. ඔවුන් කිසිම දෙයක් අරගෙන ගියේ නැහැ.

දඩ ගෙවීමට නොහැකිව බන්ධනාගාරගත වූවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. 2022 වර්ෂයේ එවැනි රැඳවියන් 31,822ක් හිටියා. 2023 වර්ෂයේ රැඳවියන් 29,192න්, 10,863ක් නැවත එම වරදම කරලා ආපහු ඇතුළට ගිය අය. ඒ කියන්නේ, සියයට 65ක්. තමුන්නාන්සේලාට අපි මූලික වශයෙන්ම කියපු කාරණය මේකයි. මේ ආණ්ඩුව මුල ඉඳලාම කරපු වැරැද්ද තමයි, ආණ්ඩුවක් කරන්න දන්නේ නැති එක. ඒක දිලිත් ජයවීර මන්ත්‍රීතුමාත් කිව්වා. එතැනදී මේ රටේ පළමුවැනි ගොදුර බවට පත් වුණේ තුෂාර උපුල්දෙණිය මහත්මයා. මොකක්ද වුණේ? තමුන්නාන්සේලා පොදු සමාවයි, ජනාධිපති සමාවයි පටලවා ගත්තා. මමත් 1994 ඉඳලා අධිකරණ ක්ෂේත්‍ර යේ වැඩ කරපු කෙනෙක්. අපි සාමාන්‍යයෙන් කරන ක්‍රියාදාමය මේකයි. නිර්ණායක ටික හදලා ජනාධිපතිතුමාට යැව්වාම ජනාධිපතිතුමා ඒක අනුමත කරලා ආපහු එවනවා. ඒ නිර්ණායක ටික ආපහු එව්වාම බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ඒක සියලු බන්ධනාගාර අධිකාරින්ට යවනවා. ඒ අනුව තමයි ඒගොල්ලන් නිදහස් වෙන්නේ. ඒකට system එකක් තිබුණා. අවුරුද්දට දවස් 7ක්, 14ක් නිදහස් වන ක්‍රමයකුත් තිබුණා. තමුන්නාන්සේලා මොකද කළේ? සාමාන්‍යයෙන් pending cases දෙකක් තිබෙනවා නම්, එකකට අච්චු කරලා ඇතුළේ ඉන්නවා නම්, අච්චු කරපු එකෙන් එළියට ගියාම අනෙක් pending case එකට ආපහු රිමාන්ඩ් කරනවා. ඒක තමයි ක්‍රියාදාමය. තමුන්නාන්සේලා ඒ ගැන මෙලෝ හසරක් දැනගෙන හිටියේ නැහැ. ඒ නිසා මොකද කළේ?

පහුව දා උදේ පත්තරේ පළ වුණා, අනුරාධපුර අධිකරණයෙන් හිර ගෙදරට යැවූ කෙනෙක් මෙන්න ඊයේ එළියට ආවා කියලා. පත්තරේ එහෙම ප්‍රවෘත්තියක් පළ වුණා. ජනාධිපති සමාව දුන්නා කියලා තමයි පත්තරේ පළ වුණේ. ජනාධිපතිතුමා කථා කරලා කිව්වා, ඒ ගැන වහාම හොයන්න කියලා. අධිකරණ අමාත්‍යාංශයෙන් ඒ ගැන පරීක්ෂණයක් කළේ නැහැ. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ගෙනැල්ලා ඇහුවේ නැහැ, ඇයි ඔබ ඒක කළේ කියලා. බන්ධනාගාර අධිකාරිගෙන් ඇහුවේ නැහැ, ඇයි ඒක කළේ කියලා. ඒ ගැන කිසිම පරීක්ෂණයක් කළේ නැහැ. තමුන්නාන්සේලා කෙළින්ම අර මනුෂ්‍යයා interdict කරලා හිරේ දැම්මා. ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට තමයි බන්ධනාගාර කොමසාරිස්වරයෙක් හිරේ දැම්මේ. මේ විදියට තමයි තමුන්නාන්සේලා වැඩ කළේ.

ඒ කාලයේ පොදු සමාව යටතේ සාමාන්‍යයෙන් අවුරුද්දකට රැඳවියන් 1,000ක් විතර වෙසක් පොහොය දවසට, නත්තල් දවසට එළියට යනවා. අද මොකද වෙලා තිබෙන්නේ? පසුගිය වතාවේ එවැනි දවස් දෙකක් තුළදී රැඳවියන් 100යි එළියට ගියේ කියන එක මතක තියා ගන්න. ඒ නිසා මේ බන්ධනාගාර පිරෙන එක අහන්න දෙයක් නොවෙයි. රැඳවියන් 1,000ක් විතර හැම අවුරුද්දකටම එළියට ගියා. නමුත් ඒක කරන්න දුන්නේ නැහැ. ඒක තමයි තමුන්නාන්සේලා කළේ. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් හයට ෆයිල් 3,000ක් විතර යවනවා ජනාධිපතිතුමාගේ මේසය උඩට. ඇයි ඒ? එතුමා ම බලන්න ඕනෑ, දැන් ඒවා එකින් එක. ඒකට System එකක් තිබුණා. ඒ System එක තමුන්නාන්සේලා විනාශ කරලා අවසානයේ ඒ කොමසාරිස් ජනරාල් හිරේට යැව්වා. දැන් මොකද වෙලා තිබෙන්නේ? මානව හිමිකම් කොමිෂන් සභාව කියනවා ඒක සම්පූර්ණ වැරදියි, ඒකේ වගකීම භාර ගන්න ඕනෑ අමාත්‍යාංශයේ ලේකම් කියලා. ඒක කිව්වාට පස්සේ අමාත්‍යාංශයේ ලේකම් දැන් මොකක්ද කරන්නේ?

අපේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩය අනුව තමයි දඬුවම් දෙන්න කියන්නේ. මොකක්ද එහි කියන්නේ? සුළු චෝදනාවක් - කිසිදු අපරාධමය වරදක් නැහැ - නම් ඕනෑ නම් පඩිය යන්තම් අඩු කරන්න පුළුවන්. මේ වාගේ ක්‍රමයක් මිසක වෙනත් ක්‍රමයක් නැහැ. හැබැයි, දැන් මොකද කරලා තිබෙන්නේ? මේකේ වගකීම භාර ගන්නේ නැතුව අමාත්‍යාංශයේ ලේකම් මේක නීතිපතිට යවා තිබෙනවා, නඩු දාන්න කියලා. ඇයි මෙහෙම කරන්නේ? මේ රටේ අපරාධ නීතිය යටතේ වරදක් කරපු නැති කෙනෙක් සම්බන්ධයෙන් අපේ තිබෙන සාමාන්‍ය නීතිය අනුව, අපේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ මොකක්ද තිබෙන්නේ? ආයතන සංග්‍රහයේ II කාණ්ඩය කියවලා බලන්න. ඒ අනුව ඔහුට දෙන්න තිබෙන දඬුවම ගත්තොත්, සුළු චෝදනාවක් සම්බන්ධයෙන් දෙන දඬුවමක් තමයි එහි තිබෙන්නේ. එහෙම තියෙද්දී, නීතිපතිට ෆයිල් එක යවනවා, නඩු පවරන්න. ඇයි ඒ? හයේ ඉන්නවා, දැන් වන්දි ඉල්ලයි කරපු වැරැද්දට කියලා. මම බොහොම ගෞරවයෙන් කියනවා කරුණාකරලා මේ ක්‍රියාවලිය කරන්න එපා කියලා. ඒකෙන් පසුව තමයි මේවා කඩා වැටුණේ.

මීගමුව බන්ධනාගාරයේ ඉන්න ඕනෑ රැඳවියන් 600යි. නමුත් රැඳවියන් 2,400ක් ඉන්නවා. මේ අය යනකොට මේ සිද්ධිය සමනය කරලා තිබුණේ නැහැ. තමුන්නාන්සේලා දන්නවා මොකක්ද වුණේ කියලා. "බන්ධ පොලිස්" කියන කට්ටිය තමයි සාමාන්‍යයෙන් එහෙම යන්නේ. ඒ 89 දෙනෙක් බන්ධනාගාරයට යවලා තිබෙනවා. මම අහන්න කැමැතියි, ඔවුන් මොනවාද අරගෙන ගියේ කියලා. සාමාන්‍යයෙන් ඔවුන් අරගෙන යනවා, කඳුළු ගෑස්, රබර් උණ්ඩ, shields, හෙල්මට්. නමුත් ඒවා මොකුත් නැතුව තමයි ඒගොල්ලන් ගියේ. ඒගොල්ලන් නිකම්ම ඇතුළට ගියා. කවුද ඒගොල්ලන්ට ඇතුළට යන්න අණ දුන්නේ?

මේ බන්ධනාගාරයේ ඉන්නවා බන්ධනාගාර අධිකාරිවරයෙක්. ඒ වාගේම ප්‍රධාන ජේලර්වරයෙක් ඉන්නවා. මේ දෙදෙනාම අදටත් වැඩ කරනවා. වෙන තැනක ඔය වාගේ සිද්ධියක් වුණා නම්, 25ක්, 30ක් මැරුණා නම්, බන්ධනාගාර අධිකාරිගේ වැඩ තහනම් කරන්නේ නැද්ද? ඔහු සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්නේ නැද්ද? ප්‍රධාන ජේලර් සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්නේ නැද්ද? පෞද්ගලිකව ඒගොල්ලන් එක්ක මගේ කිසිම තරහක් නැහැ. මම දන්නේ නැහැ කවුද එතැන ඉන්නේ කියලාවත්. මම කියන්නේ මේකයි. තමුන්නාන්සේලා කරන්න ඕනෑ වැඩේ කරන්නේ නැතුවයි මේ වැඩේ කරගෙන යන්නේ. අද මොකද වෙලා තිබෙන්නේ? අහිංසක නිලධාරියෙක් දැන් මේකට වැරදිකරුවෙක් බවට පත් වෙන්න යනවා. මොකද, කිසිම කෙනෙක් මේ සම්බන්ධයෙන් නියෝගයක් දුන්නේ නැති නිසා. SPට, බන්ධනාගාර අධිකාරිට, ප්‍රධාන ජේලර්ට වෙඩි තැබීමේ නියෝග දෙන්න පුළුවන්. එළියේ තව පිරිසක් හිටියා. එහි ප්‍රධානියෙක් හිටියා. ඔහුට වෙඩි තැබීමේ නියෝගය දෙන්න තිබුණා. අවසානයේ මොකද වුණේ? අහිංසක නිලධාරියෙක් අද වනකොට වරදකරුවෙක් බවට පත් වෙන්න යන වැඩ පිළිවෙළක් තිබෙන්නේ. මම අහන්න කැමැතියි, අමාත්‍යාංශයේ ලේකම් මේ වකවානුව තුළ මොකක්ද කළේ කියලා. ඔහු කිසිම දෙයක් කළේ නැහැ.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ඒ වාගේම ඊයේ රූපවාහිනියේ විකාශනය කරනවා මම දැක්කා, බන්ධ පොලිස් නිලධාරින් ළඟ තිබුණේ ගිනි අවි 10න් පතරොම් 300න් පතරොම් 12කින් වෙඩි තියලා තිබෙනවා කියලා. කඳුළු ගෑස් නැහැ, රබර් බුලට් නැහැ, හෙල්මට් නැහැ. ඒ මොකුත් නැතුව තමයි ඒගොල්ලන් බන්ධනාගාරයට යවලා තිබුණේ.

මේ බන්ධනාගාරයේ හිටියා ප්‍රසාද් ප්‍රේමතිලක කියලා මහත්මයෙක්. ඔහු තමයි ලංකාවෙන් පිට ගිහිල්ලා විශේෂ පුහුණුවක් ලබා ආපු නිලධාරියා. ඔහුට මොකද කළේ? තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඔහු අනුරාධපුරයට යැව්වා. ඒ බන්ධනාගාර අධිකාරි වෙනුවට වැඩ ආවරණය කරන සහකාර අධිකාරිවරයෙක් දැම්මා. එහෙම දාලා තමයි මේ වැඩ පිළිවෙළ සකස් කළේ. බුද්ධි තොරතුරු පිළිබඳව කිසිම දැනුමක් නැති, riots ගැන කිසිම දැනුමක් නැති කෙනෙක් දාලා තමයි මේ වැඩේ කළේ.

මීගමුව බන්ධනාගාර අධිකාරිතුමා ඉස්සෙල්ලා හිටියේ කොහේද? බූස්සේ. බූස්සේ වැඩකටයුතු කර ගන්න බැරිව ඔහු මහර දෙවෙනියා විධියට දැම්මා. තමුන්නාන්සේලා මොකද කළේ? මහර දෙවෙනියා විධියට දාපු කෙනා මීගමුවට දැම්මා. එතකොට මීගමුවේ බන්ධනාගාර අධිකාරි විධියට හිටියේ ජීවක ප්‍රනාන්දු මහත්මයා. ඔහු මාරු කළා. Chief Jailer විධියට ගයාන් කියලා මහත්මයෙක් හිටියා, ඔහු මාරු කළා. අජිත් ප්‍රසන්න මහත්මයා මාරු කළා. ඒ ඔක්කෝම මාරු කරලා තමුන්නාන්සේලා මේ පුද්ගලයා එතැනට දැම්මා. ඔහු දක්ෂතාවක් තිබුණු කෙනෙක් නොවෙයි. ඒක තමයි ඇති වෙලා තිබුණු තත්ත්වය. මේක අධිකරණ ඇමතිතුමාගේ වගකීම. ඔය ක්‍රියාවලිය නිසා තමයි ඒ සිද්ධිය ඇති වෙලා තිබෙන්නේ.

පසුගිය කාලයේ බන්ධනාගාරවලට අදාළව විශාල වැඩ කොටසක් කරලා තිබුණා. නමුත් ඒ යෝජනා කළ දේවල් අදටත්, තවමත් සිද්ධ වෙලා නැහැ. පසුගිය කාලයේ තිබුණු කමිටුවෙන් බන්ධනාගාරවල තිබෙන ප්‍රශ්න මොනවාද කියලා බොහොම පැහැදිලිව කිව්වා. ඉන්න රැඳවියන් ප්‍රමාණයෙන් සියයට 50ක් අඩු කරන්න පුළුවන් යෝජනාවලියක් සකස් කරලා ඒ යෝජනාවලිය ඉදිරිපත් කරලා තිබුණා. නමුත් තමුන්නාන්සේලා ඒ යෝජනා ක්‍රියාත්මක කළේ නැහැ. ඒක තමයි අද මෙහෙම සිද්ධ වෙලා තිබෙන්නේ. 2026 ජනවාරි මාසයේ දුන්නු ඒ report එක අනුව ඒ ක්‍රියාමාර්ග ටික අරගෙන තිබෙනවාද? නැති නම් ඒකට හේතුව මොකක්ද?

මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10ට වඩා ළඟ තියා ගත්ත චූදිතයන්ට ඇප ගන්න අභියාචනාධිකරණයට යන්න ඕනෑ. ජේදුරු තුඩුවේ ඉඳලා දෙවුන්දර තුඩුව දක්වාම මිනිස්සු ඒකට කොළඹ අභියාචනාධිකරණයට එන්න ඕනෑ. ඒ නිසා ඒකට ක්‍රියාමාර්ගයක් ගත්තා. ජනවාරි මාසයේදී ඒ අවශ්‍ය යෝජනා ටික හදලා ඇමතිතුමාගේ අතට දුන්නා. මේ ජූලි මාසය. අද වෙනකොට මාස 7ක් ගිහිල්ලා තිබෙනවා. මම අහන්න කැමැතියි, තමුන්නාන්සේලා මොකක්ද ඒ යෝජනාවට කරලා තිබෙන්නේ කියලා. ඒවා ක්‍රියාත්මක කළා නම් මත්ද්‍රව්‍යවලට සම්බන්ධ සැකකරුවන්ගෙන් සියයට 50ක් බන්ධනාගාරවලින් අයින් කරන්න පුළුවන්. ඒ අය පුනරුත්ථාපනය කරන වැඩ පිළිවෙළක් සකස් කර තිබුණා. අද වෙනකල් ඒක ක්‍රියාත්මක කරලා නැහැ.

බන්ධනාගාර පිරෙන්නේ වෙන ක්‍රියාමාර්ගයක් හින්දා නොවෙයි, තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ නිසායි. තමුන්නාන්සේලා "රටම එකට" කියලා වැඩ පිළිවෙළක් පටන් ගත්තා. මොකක්ද අවසානයේ වුණේ? ඒකෙන් ගම්වල ඉන්න අහිංසක තරුණයෝ අරගෙන ඇවිල්ලා විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ ආඥාපනතේ 54වන වගන්තිය යටතේ ඇතුළට දානවා. ඒ මිනිස්සු මාස ගණන් ඇතුළේ ඉන්නවා. ඒ අය අවුරුදු එකහමාරකින්වත් එළියට ගන්න බැහැ. මොකද, රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් report එක එනකොට අවුරුද්ද පැනලා. ඒක තමයි මේ සිද්ධ වෙලා තිබෙන්නේ. ඒකට හදපු වාර්තාවට මොකක්ද කරලා තිබෙන්නේ කියලා මම තමුන්නාන්සේලාගෙන් අහන්න කැමැතියි? මොකුත් කරලා නැහැ.

මම ඊයේ පෙරේදා දැක්කා, අමාත්‍යාංශයේ ලේකම්තුමිය හරක් පැටියෙක් නිදහස් කරනවා. ඒ, අර මිය ගිය අය වෙනුවෙන් නිදහස් කළාද, එහෙම නැතිව හරක් පැටියා නිකම් නිදහස් කළාද කියලා මම නම් දන්නේ නැහැ. කවුද ඒකට සම්බන්ධ වුණේ කියලාවත් මම දන්නේ නැහැ. හැබැයි ඒවා තමයි කර කර ඉන්නේ. ඇත්තටම ඇමතිතුමා සමඟ මට පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. එතුමා මගේ ඉතාම ළඟ මිත්‍රයෙක්. නමුත් එතුමාගේ අමාත්‍යාංශයේ ක්‍රියාවලිය තුළ අපට ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබෙනවා. මේ ප්‍රශ්න ඔක්කෝම තිබියදී තමයි මේ ක්‍රියාදාමය ඉස්සරහට ගෙනියන්න හදන්නේ.

මම තව කාරණයක් කියන්න කැමැතියි, ගරු ඇමතිතුමා. 2025දී අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට සංශෝධනයක් ගෙනාවා, 2025 අංක 7 දරන සංශෝධනය ලෙස. 2025.06.18 තමයි ඒක ගෙනාවේ. අද වෙනකොට ඒකට අවුරුද්දක් පැනලා. මොකක්ද ඒකේ තිබෙන්නේ? බොහොම පැහැදිලිව එහි තිබෙනවා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඇයි, දෙකක් කියන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා උදේ ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමාට කථා කරලා විනාඩි 7ක කාලයක් ඉල්ලා ගෙන තිබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
7ක් නොවෙයි, 10ක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒකත් එක්ක තමයි ඔබතුමාට විනාඩි 16ක් ලැබුණේ. ඒ අනුව තමයි වේලාව ගණන් බලලා තිබෙන්නේ. එතකොට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, විනාඩි දෙකක් වෙන්න විධියක් නැහැ.

අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරන්න එනකොටම තමයි වෙලාව කපන්නේ. කමක් නැහැ. අධිකරණ ඇමතිතුමාට තිබෙන ප්‍රධාන කාර්යභාරය මොකක්ද? අධිකරණයේ නඩු ලක්ෂ 11ක් ගොඩ ගැහිලා තිබෙනවා. යසන්ත කෝදාගොඩ මැතිතුමා කිව්වා, අවුරුදු 47ක් යනවා කියලා ඉඩම් නඩුවක් අවසන් කරන්න. ඒකත් එක්ක අපි අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු ප්‍රමාණය වැඩි කළා, 12 ඉඳන් 20 දක්වා. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු ප්‍රමාණය වැඩි කළා, 11 ඉඳලා 17 දක්වා. දැන් ජනාධිපතිතුමා ඒ තනතුරුවලට පත් කරන්නේ නැතිව ඉන්නවා. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(5) ව්‍යවස්ථාව උල්ලංඝනය කරනවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දැන් එතුමා කියනවා, එතුමාට අග්‍ර විනිශ්චයකාරතුමා ලියුමක් එවලා තිබෙනවාය, පල්ලෙහා තනතුරු පිරෙව්වාම තමයි උඩ තනතුරු පුරවන්නේ කියලා. මාර කථාවක් ඒක. ඒවා වෙන කට්ටියට, කොණ්ඩේ බැඳපු වීන්නුන්ට කියන්න. මොකද, ඉහළ අධිකරණවලට විනිශ්චයකාරවරුන් පත් කිරීම කිසිම වෙලාවක බලපාන්නේ නැහැ පහළ අධිකරණවල පවතින විනිශ්චයකාරවරුන්ගේ හිඟයට. උඩ තනතුරු පුරවනකොට තමයි, පහළින් උඩට තල්ලු කරන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා මට තේරෙන්නේ නැහැ. ජනාධිපතිතුමා මේක අහගෙන ඉන්නවා නම් මම ගෞරවයෙන් කියනවා, කරුණාකරලා ඒ ලිපිය සභාගත කරන්න කියලා. මොකද, අධිකරණ බලය ජනතාව පාර්ලිමේන්තුවටයි දීලා තිබෙන්නේ. ජනතාවගේ පාර්ලිමේන්තු බලය තමයි අපි අධිකරණවලට දීලා තිබෙන්නේ. එම නිසා කරුණාකරලා මේ වාගේ කටයුතු කරන්න එපා කියලා අපි ඉල්ලනවා.

ඊළඟ කාරණය තමයි අධිකරණවල පවතින පුරප්පාඩු. අද ඒ පුරප්පාඩු ටික පුරවන්නේ නැහැ. දැන් තමුන්නාන්සේලා දිගින් දිගටම කියන කාරණය තමයි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසානයකට ගෙනෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය රැඳී තිබෙන්නේ නීතියේ ආධිපත්‍යය මතයි. නීතියේ ආධිපත්‍යය රැඳෙන්නේ බලතල බෙදීම අනුව. විධායකය හා ව්‍යවස්ථාදායකය පාලනය කරන්නේ ජනාධිපති. යන්තම් අධිකරණය විතරයි ස්වාධීනව තිබුණේ. අද තමුන්නාන්සේලා ඒකටත් අත ගහන්නයි හදන්නේ. මේ ක්‍රියාදාමයට අපි කියන්නේ, "සූරසේන ව්‍යවස්ථා සංශෝධනය" කියලා. මේ වාගේම එකක් ගෙනාවා, ඒ තමයි දෙවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ඒකට කියන්නේ, "රාජදූරෙයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය" කියලා. ඒවා කියවලා බලන්න. මේ විධියට කටයුතු කරලා තමුන්නාන්සේලා කරන්න හදන්නේ මොකක්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එක පුද්ගලයෙකුගේ සේවා කාලය දීර්ඝ කරලා මේක සම්පූර්ණයෙන් තමුන්නාන්සේලාගේ අතට ගන්නයි කටයුතු කරන්නේ. 1978 අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මානව හිමිකම් සම්බන්ධයෙන් තිබෙන පරිච්ඡේදය අද සම්පූර්ණයෙන් විනාශ කරලා තිබෙන්නේ. එවැනි නඩු 25ක් තිබෙනවා. මේ වනකොට මාස 7ක් ගත වෙලා ඉවරයි. ඒවා අහන්නේ නැහැ. ඒ නිසා මිනිස්සු නඩුවක් කියන්න යන්නේ නැහැ. මේ විධියට කටයුතු කරලා තමුන්නාන්සේලා අධිකරණයත් විනාශ කරලා, මේ රටේ ස්වෛරීභාවය විතරක් නොවෙයි, රටත් විනාශ කරලා තමයි නතර වෙන්නේ. 1978 අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මානව හිමිකම් සම්බන්ධයෙන් තිබෙන පරිච්ඡේදයට සිද්ධ වෙලා තිබෙන කාරණය ගැනයි මම මේ කිව්වේ.

අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරනකොට මේ කාරණයත් කිව යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සාමාන්‍යයෙන් දන්නවා ඇතැම් කාරණා විසඳන්න පුළුවන් ක්‍රම ගණනාවක් ආයතන සංග්‍රහයේ තිබෙන බව. ඒ අයට විරුද්ධව ගන්න ක්‍රියාමාර්ග එහි තිබෙනවා. ආයතන සංග්‍රහය අනුව කටයුතු කරන්නේ නැතුව අද ගිහිල්ලා Bribery Commission එකට පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා. එහෙම නැත්නම් CID එකට පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා. එවැනි පැමිණිල්ලක් දාපු ගමන් මොකද කරන්නේ? අධිකරණයට ඉදිරිපත් කරනවා. අධිකරණයට නඩුව දාන්නේ පොදු දේපළ පිළිබඳ පනත යටතේ. එතකොට මහෙස්ත්‍රාත්වරයාට ඇප දෙන්න බැහැ. ඉතින් මොකක්ද කරන්නේ? සිරගත කරනවා. අර මනුස්සයා මාස ගණනක් හිරේ. සාමාන්‍යයෙන් සාක්ෂි සම්පිණ්ඩනයක් සහිතව තමයි නඩුවක් ඉදිරිපත් කරන්න ඕනෑ. හැබැයි, අද මොකද වෙලා තිබෙන්නේ? සාක්ෂි සම්පිණ්ඩනයක් නැහැ. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 115 වගන්තියේ බොහොම පැහැදිලිව තිබෙනවා, සාක්ෂි සම්පිණ්ඩනයක් සහිතව නඩුවක් ඉදිරිපත් කරන්න ඕනෑ කියලා. අද ඒක නැහැ. අර මනුස්සයා හිරේ දාලා, පස්සේ විමර්ශන කරනවා. කට උත්තරයක් විතරක් ගන්නවා. ඒක තමයි තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරන්න හදන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව පොඩි වෙලාවක් දෙන්න.

විජිත් මලල්ගොඩ මැතිතුමා දුන් නඩු තීන්දුවක් තිබෙනවා. ඒ වාගේම නවාස් මැතිතුමා, ජනක් ද සිල්වා මැතිතුමා දුන් නඩු තීන්දු තිබෙනවා. එතුමන්ලා බොහොම පැහැදිලිව කියා තිබෙනවා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ඒ වාගේම ව්‍යවස්ථාදායක සහ අධිකරණ බලය සම්පූර්ණයෙන් තීරණය කරන්න ඕනෑ මහජනතාවයි කියලා. එම නිසා විනිශ්චයකාරවරුන් විශ්‍රාම යැමේ වයස අවුරුදු දෙකකින් වැඩි කිරීමට ගෙනෙන්න හදන සංශෝධනය ගැන තමුන්නාන්සේලා ජනමත විචාරණයකට යන්න. ජනමත විචාරණයකින් අපි ඒ ක්‍රියාදාමය කරමු කියලා ඉල්ලනවා.

තමන්ගේ නඩුව තමන්ට අහන්න බැහැ - *nemo judex in causa sua* - කියලා රීතියක් තිබෙනවා. ඒකත් මතක තියාගෙන අනාගතයේ එම සංශෝධනය වෙනුවෙන් කටයුතු කරන්න කියලා මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාට එරෙහිව ගෙනා මේ විශ්වාස භංග යෝජනාව වෙලාවේ මතක් කළ යුතු කාරණා කිහිපයක් තිබෙනවා. පාර්ලිමේන්තු ඉතිහාසය ගත්තොත්, දෝෂාභියෝග යෝජනා, විශ්වාස භංග යෝජනා බොහොමයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. විශ්වාස භංගයකට, දෝෂාභියෝගයකට පාත්‍ර වන කෙනා ගත්තොත්, ඔහුට කිසියම් කුකුසක්, භීතියක්, පොඩි අපේක්ෂා භංගත්වයක් හා කලබල වීමක් ඇති වීම ඉතිහාසය ඇතුළේ තිබෙනවා. හොඳම කලබල වීම වුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ පියාණන් වන ආර්. ප්‍රේමදාස මැතිතුමාට එරෙහිව දෝෂාභියෝග යෝජනාව ඉදිරිපත් වුණු වෙලාවේ. එවකට හිටපු ජී.එම්. ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීවරයා සකස් කළ දෝෂාභියෝගයක් ආර්. ප්‍රේමදාස මැතිතුමාට එරෙහිව ඉදිරිපත් වුණා. ඒක ඉදිරිපත් වෙච්ච වෙලාවේ ප්‍රේමදාස මහත්මයා සිංහාසනයෙන් බැහැලා පඩි පෙළේ ඉඳගත්තා. ඒ තරමට එතුමා භීතියට ලක් කළා, එතුමාට ගෙන ආ දෝෂාභියෝගය. හැබැයි, ඒ දෝෂාභියෝග චෝදනා න්‍යාය පුස්තකයේ තිබෙනවාද කියා මම පොඩ්ඩක් අහලා බැලුවා. ඒ දෝෂාභියෝගයේ එක කොළයක්වත් මේ න්‍යාය පුස්තකවල නැහැ. සියල්ල අන්තරස්ධාන කරලා, විවිධ විධියට විනාශ කරලා.

මම ඒ උදාහරණය ගත්තේ අපේ ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමාගේ තත්ත්වය ගැන කියන්නයි. එතුමාගේ තත්ත්වය ගත්තාම එතුමා වෙනදාට වඩා relaxed, වෙනදාට වඩා හිනා වෙනවා, බොහොම සන්තෝෂයෙන් එහේ මෙහේ යනවා. එතුමාගේ ක්‍රියා කලාපයේ එහෙම ස්වභාවයක් නැහැ. මම ගරු හර්ෂණ ඇමතිතුමාගෙන් ඇහුවා, මොකක්ද මේ තිබෙන වෙනස කියලා. එතුමා දුන්නේ තනි උත්තරයක්. "මන්ත්‍රීතුමා, අපි 159දෙනා ගැන මට එක සහතිකයක් තිබෙනවා දෙන්න. ජාතික ජන බලවේගයේ අපේ මන්ත්‍රීවරුන් 159දෙනාගෙන් කිසිවකු මුදලට විකිණෙන්නේ නැහැ කියන හෘදය සාක්ෂියේ සහතිකය මට තිබෙනවා" කියලා එතුමා කිව්වා. ඔන්න එක කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි මාතෘකාවට එමු. මේ විශ්වාංස භංග යෝජනාව පිටුපස තිබෙන්නේ තනි වචනයක්. මොකක්ද ඒ තනි වචනය? ඒක තමයි, "භීතිය". භීතියක් තිබෙනවා. මොන භීතියද? ඒ භීතිය තමයි, යුක්තිය පසිඳලීම පිළිබඳ භීතිය. අපි දූෂිතයන්ට දඬුවම් දෙන ක්‍රියාවලිය නිසියාකාරව පවත්වාගෙන යන්න තීන්දුවක් සහ තීරණයක් අරගෙන තිබෙනවා. ඒ සඳහා ජන වරමක් අප සතුව තිබෙනවා. ඒ ජන වරමට අනුව අදාළ ආයතන කටයුතු කරමින් ඉන්නවා. එතකොට විපක්ෂයේ ඇතැම් අය භීතියට පත් වෙලා ඉන්නවා. කවුද මේ භීතිය පිටුපස ඉන්නේ? මේ විශ්වාස භංගය ගෙන එන අය භීතියට පත්වීම පිටුපස, නම් කිහිපයක් තිබෙනවා. ඔවුන් භීතියට ලක් කරපු ඒ නම් කිහිපයෙන් එකක් තමයි, ශානි අබේසේකර. ඔහු, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හරියට මෙහෙයවනවා. තවත් නමක්, රවී සෙනෙවිරත්න. ඔහු මහජන ආරක්ෂක අමාත්‍යාංශය හරියට මෙහෙයවනවා. ඔන්න මේ විශ්වාස භංග යෝජනාව ගෙන ඒම පිටුපස තිබෙන, විපක්ෂයේ අය භීතියට පත් කරපු චරිත. තවත් නමක් තමයි දිලීප පීරිස්. ඔහු නීතිපති දෙපාර්තමේන්තුවේ වැඩේ හරියට කරනවා. දැන් අලුතින් තවත් චරිතයක් එකතු වෙලා. ඒ තමයි, මගේ මේ ඉස්සරහින් ඉන්න, ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. අන්න, විපක්ෂයේ අය භීතියට පත් කරන අය.

මම අපේ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමියගෙන් ගත්තා, අප අලුතින් ආරම්භ කරපු උසාවි පිළිබඳ විස්තරයක්. ඒකත් මේකට බලපා තිබෙනවා කියලා මම හිතනවා. මොනවාද ඒ උසාවි? මූලිකව දාලා තිබෙනවා 3ක්, Special High Courts on bribery and corruption. ඒවා තිබෙන්නේ හිටපු අමාත්‍ය නිල නිවාසවල. තමන් කාපු බීපු නිවාසවල දැන් නඩු අහනවා. මොන නඩුද? තමන් කාපු බීපු නිවාසවල පිහිටුවා තිබෙන උසාවිවල අල්ලස් නඩු අහනවා. අන්න එතකොට ඒකත් භීතියට හේතුවක් බවට පත් වෙලා. යුක්තිය ඉෂ්ට කරන එක දැන් ක්‍රියාවලියක් බවට පත් වෙලා. සාමාන්‍ය ක්‍රියාවලිය ගත්තාම, මේ විශ්වාස භංග යෝජනා ක්‍රියාවලිය ආරම්භ - start - වන්නේ එතැනින්. ඒ ක්‍රියාවලිය ඇතුළේ අපි දැක්කා, හර්ෂණ නානායක්කාර අමාත්‍යවරයාගේ විෂය පථයේ එක කොටසක් වන අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව මේ සභාවේ ගොඩක් දෙනෙක් කථා කරනවා. ඒ පිළිබඳව ලොකු කතිකාවක් ඉස්සරහට ආවා. විපක්ෂ නායකතුමා, එතුමාගේ කථාව ආරම්භ කළේ කොහොමද? අපිට අධිකරණය පිළිබඳව මේ ගරු සභාවේ කථා කරන්න ඉඩ දුන්නේ නැහැ, එසේ කථා කරන එක Parliamentary Business Committee එකෙන් තහනම් කළා කියලායි.

මම පැහැදිලිවම කියනවා, එහෙම දෙයක් වුණේ නැහැ කියලා. මම ඒ වෙලාවේත් ඒ ගැන පැහැදිලි කළා. Parliamentary Business Committee එකේදී කිව්වේ, අධිකරණය ගැන කථා කරන්න බැහැ කියන එක නොවෙයි, *sub judice* කරුණු ගැන මේ ගරු සභාවේ කථා කරන්න බැහැ කියන එකයි. ඒක තමයි සාමාන්‍ය සිද්ධාන්තය. අධිකරණය ගැන motions දමමින් ඒ ගැන කතිකාවක් හදන්න තමයි හැදුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පසුගිය දවස්වල දැක්කා අධිකරණයේ කථාව. ඒ මොකක්ද? අධිකරණයේ ගරු විනිශ්චයකාරතුමන්ලාගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමට අදාළව ආණ්ඩුවේ කතිකාවක් තිබෙනවා; අදහසක් තිබෙනවා. ඒක ඇත්ත. ඒක බොරුවක් නොවෙයි. තවම ඒක අදහසක්. ඒක කැබිනට් මණ්ඩලයට දාලා, නෛතික ක්‍රියාවලියක් start කරලා නැහැ. නමුත් ඒ ගැන අපේ අදහසක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ අදහස දැන් එක එක කවවල සාකච්ඡා වෙනවා. මොකක්ද එක කවයක්? ඒ කවය තමයි ඒකාබද්ධ විපක්ෂය. "ඒකාබද්ධ විපක්ෂය" කියන පිරිසක් ඒ සටන් පාඨය අරගෙන යනවා. මොකක්ද ඒ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 20x20 කාමරයකට කට්ටියක් ඊයේ set වුණා. කාමරය ඇතුළේ ඒ කට්ටිය set වෙලා ඉන්න කොට මම හිතුවා, හර්ෂණ නානායක්කාර මැතිතුමා මේ කටයුතු ඉක්මන් කරන්න ඔක්කෝම එක කාමරයකට දාලා විශේෂ උසාවියක් දාලා නඩු අහන්න යනවා කියලා. පස්සේ බැලින්නම්, ඒක එහෙම නොවෙයි. ඒකේ තිබෙන්නේ විත්තිකරුවන්ගේ මහා සමුළුව. එහෙම නැත්නම් චූදිතයන්ගේ එකමුතුව. එහෙමත් නැත්නම් මොකක්ද? "දංබේ" පෙරමුණ; "දංගෙඩියට යෑමෙන් බේරා ගැනීමේ" පෙරමුණ; සංසදය. "දංබේ" පෙරමුණ! අන්න එහෙම කට්ටියක් තමයි ඒ එකතු වෙලා ඉන්නේ? ඒකේ කැඳවුම්කරු කවුද? මහාචාර්ය ජී.එල්. පීරිස්. ඒකාබද්ධ විපක්ෂයේ කැඳවුම්කරු, මහාචාර්ය ජී.එල්. පීරිස්. මොකක්ද ඒකේ අරමුණ? අධිකරණයේ විනිශ්චයකාරවරුන් විශ්‍රාම යන වයස දීර්ඝ කිරීමට එරෙහිව එතුමා ඒකාබද්ධ විපක්ෂයක් කැඳවලා.

දැන් ටිකකට ඉස්සෙල්ලා post එකක් ආවා. මම ඒක මේ ගරු සභාවට පෙන්වන්න අරගෙන ආවා. මේ post එකේ තිබෙන්නේ මොකක්ද? මෙහි රනිල් වික්‍රමසිංහ මහත්මයා කියනවා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසන් කථිකයා වන අපේ ගරු නලින්ද ජයතිස්ස අමාත්‍යවරයාගේ කාලයෙන් විනාඩි දෙකක කාලයක් මම එතුමාගෙන් ඉල්ලා ගත්තා.

මේ post එකේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා කියනවා, "මට 77යි" කියලා. ඊට පස්සේ, ජී.එල් පීරිස් මහත්මයා කියනවා, "මට 79යි" කියලා. හැබැයි එතුමන්ලා කියනවා, "හැබැයි විනිසුරුවරු වයස අවුරුදු 65න් විශ්‍රාම යන්න ඕනෑ" කියලා. මෙන්න ඒ post එක. ජී.එල්. පීරිස් මහත්මයා තමයි ඒකාබද්ධ විපක්ෂයේ කැඳවුම්කරු. දැන් එතුමා දේශපාලනයෙන් විශ්‍රාම යන්න ලෑස්තිද? රනිල් වික්‍රමසිංහ ලෑස්තිද? නැහැ. හැබැයි, judicial officersලාගේ විශ්‍රාම යෑම ගැන එතුමන්ලා කථා කරනවා.

ජී.එල්. පීරිස් මහත්මයා තමයි ඒකාබද්ධ විපක්ෂයේ කැඳවුම්කරු. ඒ කැඳවුම්කරු ගැන එක්තරා මන්ත්‍රීවරයෙක් අර්ථකථනයක් දුන්නා. අපි නොවෙයි ඒ විග්‍රහය කරන්නේ වාමර සම්පත් දසනායක මන්ත්‍රීවරයා. මොකක්ද ඒ? "එයා ශත 25 අඳුරන්නේත් නැහැ. ශත 50 අඳුරන්නේත් නැහැ. බොරැල්ල හන්දියට ගිහිල්ලා දැම්මාට පස්සේ ගෙදර යන්න දන්නේත් නැහැ" කියලා ඒ මන්ත්‍රීවරයා කිව්වා. හැබැයි, ඊයේ කැඳවපු සාකච්ඡාවට වාමර සම්පත් මන්ත්‍රීවරයාත් ගියා. එතකොට අපට මොකක්ද හිතා ගන්න පුළුවන්? අන්න, ඒකාබද්ධ විපක්ෂයේ කැඳවුම්කරුගේ තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. ඊයේ සාකච්ඡාවට ආපු අතිමහත් බහුතරය ගත්තොත්, එක්කෝ එයාට චෝදනාවක් තිබෙනවා, එහෙම නැත්නම් ගෙදර කෙනෙකුට චෝදනාවක් තිබෙනවා. ඒ සමහරු ඇප පිට ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ රොත්ත දැක්කාම මට හිතුණා, "දවල්ට කා කොටා ගන්නවා. රෑට එකතු වෙලා හොරකමේ යනවා" කියලා. අන්න එහෙම set එකක් කියලා තමයි ඒ මුහුණු දිහා දැක්කාම හිතෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එකක් කියන්නම්. මේ එකතු වෙලා හිටියේ දූෂිතයන් රොත්තක්. ඇයි එහෙම එකතු වෙන්නේ? අප වාගේ දේශපාලන ව්‍යාපාරයකට අපි දූෂිතයන් ගන්නේ නැහැ. එහෙම නම්, දූෂිතයන්ට එකතු වෙන්න තැනක් තිබෙන්න ඕනෑ. අන්න ඒ දූෂිතයෝ රොත්තම අද එකතුවෙලා. අද මොකක් හෝ අපේ තිබෙන යෝජනාවක් පාදක කරගෙන ඒ දූෂිත කැළ දැන් එක රොත්තකට එකතු වෙලා ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මොකක්ද මේකෙන් තේරෙන්නේ? මේ දූෂිතයෝ කොච්චර බය වෙලා තිබෙනවාද කියනවා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හැමදාම දැකලා තිබෙන්නේ ඕනෑම කවයක නිමල් සිරිපාල ද සිල්වා නිදාගෙන ඉන්න එක. ඒත් මෙන්න මේ මනුස්සයා එදා ප්‍රවෘත්ති සාකච්ඡාවේදී ඇහැරිලා හිටියා! මම දැකපු පළමුවැනි වතාව, නිමල් සිරිපාල ද සිල්වා ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ඇහැරිලා ඉන්නවා. එච්චරට බයවෙලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි "දංබේ" පෙරමුණේ හැටි. දංගෙඩියට යැමෙන් මුදවා ගැනීමේ පෙරමුණ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙලාව ඉවර නම් එක කාරණයක් කියලා කථාව අවසන් කරන්නම්.

විපක්ෂ නායකතුමා අන්තිමට ආවා ගණිත හබයකට. ඒ මොකක්ද? විනිශ්චයකාරවරු පිරිසක් එකතුවෙලා තිබෙනවා. එතැන සූත්‍රය හැටපහට බින්දුවයි කියලා එතුමා කිව්වා. එතුමා හිතලා තිබෙන්නේ මුළු ලංකාවේම විනිශ්චයකාරවරු ඉන්නේ 65දෙනායි කියලා. ඒ කියන්නේ, ඔක්කෝම විනිශ්චයකාරවරු මොකක් හෝ ගේන විශ්‍රාම වයසට සම්බන්ධ යෝජනාවට විරුද්ධයි කියලා එතුමා හිතාගෙන ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරියගෙන් දැන ගත්තා, කොච්චර විනිශ්චයකාරවරු අපේ රටේ ඉන්නවාද කියලා. අපේ රටේ අධිකරණ පද්ධතියේ මහේස්ත්‍රාත් සහ දිසා විනිසුරුවරුන් 295යි, මහාධිකරණ විනිසුරුවරුන් 94යි, අභියාචනාධිකරණ විනිසුරුවරු 17යි, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් 13යි. ඒ අයගේ එකතුව 419යි. අනේ පව්! නමුත් විපක්ෂ නායකතුමා කියනවා, හැටපහට බින්දුවයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි අපේ ස්ථාවරය. මේ දූෂිතයන්ගේ පෙරමුණුවලට අපේ ගමන කවදාවත් නතර කරන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී කියැවුණා, අපි නීති විරෝධී යෝජනාවක් ගේන්න යනවා කියලා. අපි ගේන්න යන්නේ, විනිසුරුවරුන්ගේ වයස වැඩි කිරීමේ යෝජනාවක් නම්, ඒක ප්‍රතිපත්තිමය කාරණාවක්. ඒක කොහොමද නීති විරෝධී වෙන්නේ? ඒ නිසා මෙතැනට වැරදි අර්ථකථන ගේන්න එපා කියන කාරණාවත් මේ වෙලාවේ මම කියනවා. ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එම්. අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.10]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කරන්න ආපු කථාවත් අමතක වුණා නියෝජ්‍ය ඇමතිතුමාගේ රසබර කථා ටික අහගෙන ඉඳලා. ඇත්තටම මට හිතෙන විධියට, නියෝජ්‍ය ඇමතිතුමාට වැඩ වැඩියි. වෙන දා කරන සාරබර කථාවකට වඩා පොඩි විහිළු කථා ටිකක් තමයි එතුමා අද කියන්නේ. එතුමාට වැඩ වැඩියි. නියෝජ්‍ය ඇමතිතුමා පාපිස්සක් නොවෙයි නේ. ඒ නිසා නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඊට වඩා ටිකක් හොඳ කථාවක් බලාපොරොත්තු වෙනවා.

නියෝජ්‍ය ඇමතිතුමා කියපු කථාවකින්ම පටන් ගත්තොත්, එතුමා කියනවා බන්ධනාගාර ඇමතුතිමා වෙනදාට වඩා relaxed ලෙස ඉන්නවා කියලා. බන්ධනාගාර ඇමතිතුමා සැහැල්ලුවෙන් ඉන්නවා, සතුටින් ඉන්නවා කියනවා. මේ වාගේ විශාල ප්‍රශ්නයක් වෙලා, මිනිස්සු මැරිලා, නිලධාරීන් මැරිලා තිබියදී, ඒ වාගේ

[ගරු අමිල ප්‍රසාද් මහතා]

අවස්ථාවකත් එතුමා සතුටින් ඉන්නවා කියන එකම තමයි ඇමතිතුමා, වගකීම හරියට ඉෂ්ට කරලා නැහැයි කියන එකේ තේරුම. ඒක තමයි මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන එකේ හේතුව. එතුමාගේ අමාත්‍යාංශයේ වගකීම එතුමා හරියට ඉෂ්ට කරලා නැහැ. එතුමා කරලාත් නැහැ, නිලධාරින් කරලාත් නැහැ. ඉතිහාසයේ පළමු වතාවට බන්ධනාගාර නිලධාරින් 10ක් මැරිලා; හිරකාරයෝ එක්ක ගහගෙන මැරිලා. නමුත් එතුමා හොඳට relax එකේ ඉන්නවා. හරි කථාව ඒක තමයි. එතුමාගේ ඒ හැසිරීම දිහා බැලුවාම, අපි මේ විශ්වාස භංග යෝජනාව ගෙන ඒම ඉතාම නිවැරදියි. කොහොමත් මට කියන්න තිබෙන දේ මේකයි. එතුමා නළුවෙක්. "යසපාලිත නිර්මාණයක්- රස සාගරයක්" තමයි හැමදාමත් තිබුණේ. ඒ නිසා අදටත් ඒ රසය ඔබට ලබාදීම පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, රට පිළිබඳ අර්බුදයක් තිබෙනවා. හේතුව මේකයි. එතුමාට විධායකයේ බලතල ලබා දීලා තිබෙනවා, කැබිනට් මණ්ඩලයට අරගෙන. ඔබතුමාට එහෙම හිනාවෙලා කටයුතු කරන්න පුළුවන් film එකක නම්. නමුත්, මේක සැබෑ ජීවිතයේ වගකීම සහ වගවීම පිළිබඳ කාරණයක් ඇමතිතුමා. ඒක තමයි අපි මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කිරීමේ අදහස.

ඊළඟ එක තමයි, ඔබේ ප්‍රතිපත්ති ප්‍රකාශය ආරම්භයේ තිබෙන්නේ, "මනුෂ්‍යත්ව පාදක බන්ධනාගාරයක් - යුක්තිගරුක රැඳවුම් දිවියක්" කියලායි. මගේ ප්‍රශ්නය මෙයයි. මේ මීගමුව සිද්ධියේදී කොහේද මනුෂ්‍යත්වය තිබුණේ? කොහේද යුක්තිගරුක බව තිබුණේ? ඔබේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉස්සරහා තිබෙන තේමා පාඨයේ සිටම ඇති කරුණු මේ සිද්ධියේදී ඛණ්ඩනය වුණා. ඇමතිවරයා හිනා වෙනවා. ඇමතිවරයාට සතුටක්. ඇමතිවරයා මාර ජොලියේ ඉන්නවා. හැබැයි, ඔබේ ප්‍රතිපත්ති ප්‍රකාශය අමු අමුවේ උල්ලංඝනය වෙනවා. ඒ මරණවල යුක්තිගරුකභාවයක් තිබුණා ද? ඔවුන් අල්ලාගෙන අත පය කඩලා, බිඳලා, ඔළුවලට කළුගල් අතුරලා තිබෙනවා. අනෙක් පැත්තෙන් රැඳවූවන් 18දෙනෙක් වෙඩි වැදිලා මැරිලා තිබෙනවා. දොරේ පොඩි කොටුවකින් ඇතුළට වෙඩි තියලා තිබෙනවා. බිත්ති හතරක් ඇතුළේ හිරවලා ඉන්න මිනිස්සුන්ගේ කැරැල්ලකට නන්නාඳුනන විධියට වෙඩි තියලා තිබෙනවා. මේ විධියට සිද්ධ වෙච්ච දේවල් ඇතුළේ කොහේද යුක්තිය? සැකකරුවෝ තමයි ඒ මිය ගියේ. ඒ වැරදිකරුවෝ නොවෙයි. ඔවුන් සැකකරුවෝ කියන්නේ මේ නිසායි. ඔවුන්ගේ නඩු අහලා තීන්දුවක් අරගෙන නිවැරදිකරුවා වීමට තිබුණු අවස්ථාවයි ඔවුන්ට මේ මඟ හැරුණේ.

මේ විවාදය ඇතුළේ ඔබ එක දෙයක් කිව්වා. එක අම්මා කෙනෙකුගේ කථාවක් මෙතැන කිව්වා. අපේ දරුවන් පොලීසිය සහ දේශපාලකයන් විසින් අපරාධකරුවන් බවට පත් කළා කියලා අම්මා කෙනෙක් කිව්වා. ඒක ඇත්ත කියලා ඔබ කථා කළා. ඔව්. ඒක ඇත්ත නම්, ඒ සියලු වැරදිකරුවන් අධිකරණයට ඉදිරිපත් කරලා, අධිකරණය හරහා වැරදිකරුවන් බවට පත් කරලා, සිරගත කරලා, ඒ දඬුවම විඳලා යහපත් ජීවිතයක් ගෙවීමට අවස්ථාව තිබුණා. හැබැයි, ඔබේ ආණ්ඩුව මොකක්ද කළේ? අනුර සහ අනුරගේ ආණ්ඩුව අර අම්මාට කරපු ලොකුම අපරාධය කළා. යහපත් පුරවැසියකු ලෙස එළියට එන්න හිටපු මනුස්සයා හිරගෙය ඇතුළේ මරලා දැම්මා. ඒක, අපරාධකාරයෙක් කළාට වඩා බරපතළයි. මේවා මිනීමැරුම්. ඒකට වගකියන්න ඕනෑ කවුද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හිනාවෙලා ඉන්න පුළුවන්කම තිබියදී අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනාපු එක වැරදියි කියලා ඔබතුමන්ලා කියනවා. ඔබතුමාට අවම වශයෙන් වේදනාවක් තිබෙන්න ඕනෑ, මගේ අතින් වරදක් වුණා, මම ඒ වෙලාවේ හරි දේ කළා නම් මේ දේ වෙන්නේ නැහැ කියලා. දැනුත් හිනාවෙවී ඉන්නවා. ඉතාම සතුටුයි. මෙහෙම විවේචනයක් කරනකොට මම වාගේ කෙනෙකුට නම් වේදනයි. *[බාධා කිරීම්]* මම අධ්‍යක්ෂක නොවෙයි. මම ඒ කාලයේ films බැලුවා. මෙයාගේ film එකකුත් මම ඒ කාලයේ බලලා තිබෙනවා. *[බාධා කිරීම්]* ඒ පාර මේ පැත්තෙනුත් කෑ ගහනවා. හිරකාරයෝ වාගේ. කලබල වෙන්න ඕනෑ නැහැ. මම බන්ධනාගාර නිලධාරියා නොවෙයි. හිරකාරයෝ ටිකක් මැද්දේ ඉන්න බන්ධනාගාර නිලධාරියා වාගේ දැන් මමයි අල්ලාගන්න යන්නේ. මට කථා කරන්න අවස්ථාව හදලා දෙන්න. කොහොමත් පැලවත්තේ හිරකාරයෝ නේ. පැලවත්තෙන් පණිවුඩය දුන්නාම වැඩේ කරගෙන යනවා. පැලවත්තේ හිරකාරයෝ ටික බන්ධනාගාර නිලධාරියා කියලා හිතාගෙන මගේ දිහා බලනවා. මම ඉල්ලීමක් කරනවා. ඒ විධියට ඇදලා, ඉරලා, අනම් මනම් ප්‍රශ්න කරලා මට ගහන්න එපා කියලා. පැලවත්තේ හිරකාරයෝ වුණාට අපට කමක් නැහැ. මට මගේ අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව හදලා දෙන්න කියලා ඉල්ලනවා. *[බාධා කිරීම්]* ඒක අපි බලමු. දෙන්නේ නැහැ නේ, කථාව කරන්න. මේක මගේ වෙලාව. හරි, මම කථාව කරගෙන යන්නම්.

අධිකරණ අමාත්‍යවරයාට අපි මේ විශ්වාස භංග යෝජනාව ගේන්නේ ඇයි? අධිකරණ අමාත්‍යවරයා විධියට,- *[බාධා කිරීම්]* දෙන්නේ නැහැ නේ කථා කරන්න. අධිකරණ අමාත්‍යවරයා විධියට වසර දෙකකට ආසන්න කාලයක් බන්ධනාගාරයේ තදබදය නැති කරන්න මොනවාද කළේ? ඔබතුමාගේ කථාවේදී ඒ ගැන කියන්න පුළුවන්. දෙවැනි එක, බන්ධනාගාර පරිපාලනය ක්‍රමවත් කළාද? ඒකත් කළා නම් කියන්න පුළුවන්. තුන්වැනි එක, - 19, 20, 21 වගකීම - මත්ද්‍රව්‍ය පිළිබඳව තොරතුරු ලබා දුන් පුද්ගලයා එම තොරතුර ලබා දුන් රැඳවියා බව දැනගත්තේ කොහොමද? මේ ගැටුම ඇතිවෙන්නේ ඔත්තුවක් ලබා දුන්නා කියලා නේ. එතකොට ඒ පණිවුඩය ලබා දුන් කෙනා ආරක්ෂා කරන්න ඔබට හෝ ඔබගේ කණ්ඩායමට බැරි වුණා. ඒ වාගේම තොරතුරු ලබා දීම නිසා සිදු වූ පළමුවැනි මරණයත් මේක නොවෙයි. 2025දී බූස්ස බන්ධනාගාරයේත් මේ විධියටම තොරතුරක් ලබා දීම නිසා මරණයක් සිද්ධවෙලා තිබෙනවා. එතැනදී හෝ ඔබ යහපත් ලෙස ක්‍රියාත්මක වුණා නම් මේ සා විශාල අර්බුදයක් එන්නේ නැහැ.

ඒ වාගේම ඔබතුමා අද උදේ රූපවාහිනියට කියනවා මම දැක්කා, "මම වරදක් කරලා තිබෙනවා නම්, විපක්ෂයට කලින් අපේ පක්ෂයෙන් මා අයින් කරනවා" කියලා. ඒකේ තේරුම මේකයි. ඇමතිතුමා තවම දන්නේ නැහැ, වරදක් කරපු බව. ඒ වාගේම මේ පක්ෂය මාර පක්ෂයක් කියලා කියන්නත් උත්සාහ ගන්නවා. එහෙම මාර පක්ෂයක් නම් ගල් අඟුරු වංචාව කරපු කෙනා අයින් කරන්න තිබුණා. එහෙම මාර පක්ෂයක් නම් කථානායක පදවියට බොරු ආචාර්ය උපාධියක් පෙන්වපු මිනිහා අයින් කරන්න තිබුණා. එහෙම මාර පක්ෂයක් නම්, කන්ටේනර් 323 ගෙනාපු මිනිහා අයින් කරන්න තිබුණා. එහෙම මාර පක්ෂයක් නම් අර plug bases ටික හයි කරන්න ගිය වෙලාවේ,- *[බාධා කිරීමක්]* ර පක්ෂයක් නම් සහල්වලින් ස්වයංපෝෂිත වෙලා තිබියදීත් සහල් මෙට්‍රික්ටොන් 157,000ක් ගෙනාපු කෙනා අයින් කරන්න තිබුණා. ඇයි? සහල්වලින් ස්වයංපෝෂිතයි නේ. ඇයි සහල් ගෙනාවේ? සහල්වලින් ස්වයංපෝෂිත වෙලා තිබියදීත් ඩොලර් මිලියන 80ක් විතර වියදම් කරලා සහල් ගෙනාපු කෙනාත් අයින් කරන්න ඕනෑ. නමුත් එහෙම පාරිශුද්ධ පක්ෂයක් නොවෙයි. කයිවාරුව විතරයි.

තව දෙයක් කියන්න ඕනෑ. දිගටම කියනවා, අපි මේ විශ්වාස භංග යෝජනාව පරදිනවා කියලා. ඔව්. නමුත් අපි මේ උත්සාහ ගන්නේ, මේ අමාත්‍යවරයා කරපු වැරැද්ද ඔබතුමන්ලාට කියන්නයි. ඊට පස්සේ ඔබතුමන්ලාගේ කැමැත්ත අනුව ඡන්දය දෙන්න පුළුවන්. යම් හෙයකින් ඔබතුමන්ලා අමාත්‍යතුමා වෙනුවෙන් ඡන්දය දෙනවා කියන්නේ මේ කරපු වැරැද්ද ඔබතුමන්ලා අනුමත කළා කියන එකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න. කාලය අවසානයි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
අවසන් කරනවා. හැබැයි, එක දෙයක් කියන්න ඕනෑ. මහින්ද යාපා හිටපු කථානායකතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා; පරාදයි. කෙහෙළියට ගෙනාවා; පරාදයි. හිටපු කථානායකට ගේන්න හැදුවා. හැබැයි, ඊට කලින් අයින් වුණා. ඊළඟට කුමාර ජයකොඩිට ගල් අඟුරු වංචාවට අදාළව ගෙනාවා; පරාදයි. හැබැයි, අපි පාර්ලිමේන්තුව ඇතුළේ පැරදුණාට ජනතාවගේ පාර්ලිමේන්තුවෙන් ඔබතුමන්ලා ඔක්කෝම මේ වෙනකොට පරාදයි කියන අදහස ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා, වෙලාව දෙන්නේ නැති නිසා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද ?

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 91 (උ) යටතේ මම මේ කාරණය කියන්නේ.

ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මේ ඉන්නේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා. එතුමාට එහෙම කියන්න අයිතියක් නැහැ. එතැන තිබෙනවා, ආරෝපිත චෝදනාවක්. මොකද, මේක අධිකරණ ක්‍රියාවලියක් තුළ ඔප්පු වෙච්ච හෝ ඔප්පු කරපු චෝදනාවක් නොවෙයි. ඒ නිසා ඒ වචනය ඉවත් කරන්න කියලා ඉල්ලීමක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි ඒ පිළිබඳව පරීක්ෂා කරලා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 4.18]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

මම කථාව පටන් ගන්න කලින් නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. අම්මා කෙනෙකුගේ ප්‍රකාශයක් ගැන කලින් කථාවේදී කිව්වා. ඒක කියද්දී හිතාමතා වැරැද්දුවා කියලා මම හිතනවා. "දේශපාලනඥයෝ" කියලා නොවෙයි, "හිටපු දේශපාලනඥයෝ" කියලායි ඇය කිව්වේ. ඒ කියන්නේ අපි ගැන නොවෙයි ඔබතුමන්ලා ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම කථාව ආරම්භ කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුදු එකහමාරක්, දෙකක් අතර කාලය තුළ මේ පාර්ලිමේන්තුවේ කිහිප වතාවක් විශ්වාස භංග යෝජනා ගැන සාකච්ඡා ඇති වෙලා තිබෙනවා කියා අපි දන්නවා. මේ පළමුවැනි වතාව නොවෙයි. පක්ෂයේ ඉන්නේ මන්ත්‍රීවරුන් 30ක්, 40ක් වුණාට විශ්වාස භංග අරගෙන එනවා. ඒක දිගටම සිදු වුණා. මට මතක විධියට අපේ හිටපු විදුලිබල ඇමතිතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. ඊට පස්සේ අගමැතිතුමියට විරුද්ධව විශ්වාස භංග යේජනාවක් හෝ මොකක් හරි ගේන්න උත්සාහ කරලා අකුළා ගත්තා. මේ, තුන්වැනි විශ්වාස භංග යෝජනාව. එතුමන්ලාට කරන්න පුළුවන්ද බැරිද කියන එක ගැන නොවෙයි බලන්නේ. විශ්වාස භංග යෝජනා ගෙනෙන එක, චෝදනා කරන එක, ඇමතිවරු ඉවත් කරන එක වාගේ ලොකු වැඩ තමයි කරන්න ලැස්ති වෙන්නේ. ලොකු වැඩ කරන්න ලැස්ති වෙනවා. තමන්ට කරන්න පුළුවන් දේවල්, තමන්ට කරන්න පුළුවන් තරම වාගේ කිසිම දෙයක් තේරුම් ගන්නේ නැතුව මේ වෙද්දි සමඟි ජන බලවේගය ඇතුළු විපක්ෂය දිගටම මේ කටයුතු කරමින් ඉන්නවා. වත්මන් අධිකරණ ඇමතිතුමාට විරුද්ධව චෝදනා එල්ල කරද්දී එතුමා මොකක්ද කරලා තිබෙන්නේ කියන එක පසුගිය කථාවලදී දිගටම කියැවුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් හිටපු අධිකරණ ඇමතිවරු කවුද, ඔවුන් මේ රටට දීපු පරමාදර්ශය මොකක්ද කියලා මම මතක් කරන්න ඕනෑ. ඒ සම්පූර්ණ ලැයිස්තුව කිව්වේ නැති වුණත්, හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට කලින් 2022-2024 කාලයේ හිටපු අධිකරණ ඇමති විජේදාස රාජපක්ෂ ගත්තොත්, මේ වෙද්දි එතුමා මේ රටේ නම ගිය කෙනෙක් වෙලා තිබෙන්නේ මොකටද? මේ වෙද්දි එතුමා ගැන කථා කරන්නේ කුමන කාරණයක් සම්බන්ධයෙන්ද? එතුමා අධිකරණ ඇමති ධුරය දරද්දී එතුමාගේ පුතා එතුමාට අයිති නිවසකදී රටේ නම ගිය පාතාල නායකයෙකුගෙන් කප්පම් අරගෙන, රුපියල් කෝටි ගණනක කප්පම් අරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඒ හිටපු අධිකරණ ඇමතිතුමාගේ පුතා සහ ඔබතුමන්ලාගේ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජික චරිත් අබේසිංහ මේ වෙද්දි රිමාන්ඩ් කරලා ඉන්නවා. ඒ කිව්වේ මීට කලින් හිටපු අධිකරණ ඇමතිවරයා ගැන. මේක මතක තියාගන්න. එතුමාගේ ධුර කාලයේදී මේ රටේ නඩු තිබෙන ප්‍රධාන සංවිධානාත්මක අපරාධ කල්ලි නායකයෙක් රැඳවුම් භාරයේ සිට බන්ධනාගාරයකට මාරු කරනවා කියලා එතුමාගේ පුතා කප්පම් අරගෙන තිබෙනවා. එහෙමයි මේ රටේ අධිකරණ ඇමතිලා ක්‍රියාත්මක වුණේ.

මම හිතන විධියට, ඊට කලින් බන්ධනාගාරය භාරව හිටියේ ලොහාන් රත්වත්තේ මැතිතුමා. එතුමා රටේ නම ගිය කෙනෙක් වුණේ මොකක් නිසාද? මහ රෑ තව කවුද කෙනෙකුට එල්ලුම් ගහ

[ගරු (වෛද්‍ය) නලින් ඉන්දික මහතා]

පෙන්වන්න වැලිකඩ බන්ධනාගාරයට ගිය සිද්ධියත්, අනුරාධපුර බන්ධනාගාරයේ දෙමළ රැඳවියෙක් දණ ගස්සවලා ඔළුවට පිස්තෝලය තියලා බියගැන්වූවා කියන සිද්ධියත් තමයි එතුමා සම්බන්ධයෙන් වාර්තා වුණේ. මේ තමයි හිටපු අධිකරණ ඇමතිවරු කළ වැඩ. එම අධිකරණ ඇමතිවරු බන්ධනාගාර පද්ධතිය තැබූ තැනින් ඉහළට අරගෙන යන්න කටයුතු කිරීම වත්මන් අධිකරණ ඇමතිතුමාට පැවරිලා තිබෙනවා. ඒ කාර්යභාරය තමයි එතුමා කරමින් ඉන්නේ. නිලධාරීන්ගේ පුරප්පාඩු, හිර ගෙදර තදබදය, නීති-රීති ප්‍රතිසංස්කරණ, අනෙකුත් ප්‍රශ්න ඇතුළුව අවුරුදු 10ක්, 20ක් තුළ මහහැරිච්ච වැඩ කොටසක් එතුමා කරමින් ඉන්නවා. ඒ නිසා ඒ පිළිබඳවත් මතක් කරමින් තමයි මේ කථාව කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අධිකරණ ඇමතිතුමාට වඩා මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන අය ගැන මම දැන් අවධානය යොමු කරනවා. කලින් කියපු උදාහරණයම ගත්තොත්, හිටපු අධිකරණ ඇමතිතුමාගේ පුතාත් එක්ක ගිහිල්ලා පාතාල කල්ලි සාමාජිකයන්ගෙන් කප්පම් ගත්තේ ඔබතුමන්ලාගේ පක්ෂයේ නායකයෙක් නේ. ඔහු කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයෙකුත් වෙනවා. ලේසි නැහැ. මෙතැන ඉන්න මන්ත්‍රීවරු සියලුදෙනාත් කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයෝ නොවෙයි කියා මා හිතනවා. ඔහු ඒ තරම් වැදගත්. *[බාධා කිරීමක්]* ඔව්, YouTube channels කළා. ඔහු ඒවාටත් ගත්තේ ඒ සල්ලිද දන්නේ නැහැ. ඒවා ගැනත් හොයන්න ඕනෑ. අපි කලින් දවසකත් මේක කිව්වා. මීට කලින් තිබුණු පොහොට්ටු ආණ්ඩු ගැන, ඒ පොහොට්ටු ආණ්ඩු එක්ක පාතාලය වැඩ කළේ කොහොමද කියන එක දැන් හෙළිදරව් වෙමින් තිබෙනවා. මොකද, ඒ සිදුවීම් ගැන කරන පරීක්ෂණ, අත්අඩංගුවට ගැනීම් අපි දකිනවා. අර අම්මා කෙනෙක් කිව්වා වාගේම හිටපු දේශපාලනඥයන් එක්ක තමයි මේ වැඩේ කළේ. පොහොට්ටුවට බලය අහිමිවීමත් එක්ක, අඩු තරමින් පාර්ලිමේන්තු නියෝජනය පවා අහිමිවීමත් එක්ක ඒ සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන්ට, නැත්නම් ඒ කල්ලිවලට නව දේශපාලන අනුග්‍රහයක් ඕනෑ වෙනවා කියලා අපි හිතනවා. ඔවුන්ට නව දේශපාලන අනුග්‍රහයක්, දේශපාලන නායකත්වයක් ඕනෑ වෙනවා. ඒක හොයාගන්නේ සමගි ජන බලවේගය තුළින්ද කියලා අපට සැකයක් මතු වෙනවා. එහෙම සැකයක් මතු වෙන්නේ ඔය චරිත් අබේසිංහ - ඔහු ඔබතුමන්ලාගේ පක්ෂයේ නායකයෙක් - ගැන විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතැනින් පස්සේ ගත වෙච්ච මාසය ඇතුළත මාධ්‍ය වාර්තා අරගෙන බලන්න. මම දැකපු විධියට ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලා, තව අපේක්ෂකයෝ තුන් හතර දෙනෙක් ගැන තොරතුරු වාර්තා වුණා. කුඩු ප්‍රවාහනය කරමින් සිටියදී සජබයේ වත්තල පළාත් සභා අපේක්ෂකයෙක් අත්අඩංගුවට ගත්තා. ඊට පස්සේ සතියේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙක් වන "නින්දානේ චූටිටේ" ආයුධත් එක්ක අත්අඩංගුවට ගත්තා. ඊළඟට, නඩු තීන්දුවකින් පසුව පාතහේවාහැට හිටපු සභාපති හැංගිලා සිටියදී අත්අඩංගුවට ගත්තා. මේ විධියට සමගි ජන බලවේගය සහ පාතාලය සම්බන්ධ පුවත් සතියෙන් සතිය දිගටම මැවෙනවා. එක් පැත්තකින් පක්ෂ නායකයන් ගිහිල්ලා පාතාල කල්ලිවලින් කප්පම් ගන්නවා. අනෙක් පැත්තෙන් පොඩි පොඩි කට්ටිය කුඩු අරගෙන යද්දි දිගටම අහුවෙනවා, තුවක්කු අරගෙන යද්දි අහුවෙනවා, තව එක එක ඒවාට අහුවෙනවා. ඒ නිසා පාතාලය විසින් සමගි ජන බලවේගය ටික ටික අල්ලා ගන්නවාද කියලා සැකයක් අපට ඇති වෙනවා. එහෙම මිනිස්සු තමයි මේ විශ්වාස භංග යෝජනා ගෙනෙන්නේ. *[බාධා කිරීමක්]* ඒකට තමයි එන්නේ. පාතාලය එක කොනකින් අල්ලාගෙන එද්දී, තව කට්ටියක් දැන් ඔබතුමන්ලාගේ පක්ෂය අල්ලනවා.

ඊයේ අපි දැක්කා, අර සාකච්ඡාවක් තිබුණා නේ. හිටපු මැති ඇමතිවරු ගොඩක් කට්ටිය ඒකට ඇවිත් සිටියා. රනිල් වික්‍රමසිංහ ඇතුළු බොහෝ දෙනෙක් සිටියා. මීට කලින් දවසක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ රට හදන්න නම් සජිත් ප්‍රේමදාසගේ කඳයි, රනිල් වික්‍රමසිංහගේ ඔළුවයි ඕනෑ කියලා. ඊයේ, ඔළුව කඳට සවි කිරීමේ පළමු පියවර තබනවා අපි දැක්කා. මේක මාර වැඩක්. ඔබතුමන්ලා යහ පාලන ආණ්ඩුවක් හැදුවා. ඊට පසු රනිල් වික්‍රමසිංහ එක්ක මේක කරන්න බැහැ කියලා වෙනම පක්ෂයක් හැදුවා. වෙනම පක්ෂයක් හදලා, වෙනම පක්ෂයක් විධියට දේශපාලනය කළා. දැන් ආපසු රනිල් වික්‍රමසිංහ ඇවිල්ලා ඒ පක්ෂයට ඔළුව සවි කරන්න යනවා. "පාර්ලිමේන්තුවට ගිහිල්ලා මෙහෙම කරන්න, ඊළඟ සතියේ මේක ගන්න, ඊට පසුව මේක ගන්න, මෙහෙම මෙහෙම කරන්න" කියලා විපක්ෂ නායකතුමාට ඊයේ රනිල් වික්‍රමසිංහ කියනවා අපි දැක්කා. එතුමා දැන් උපදේශක වෙලා. ඒ කියන්නේ රනිල් වික්‍රමසිංහගේ ඔළුවයි, සජිත් ප්‍රේමදාසගේ කඳයි එකතුවෙලා අමුතු සත්වයෙක් හැදීගෙන එනවා. මම හිතන විධියට නාමල් රාජපක්ෂත් එතැන හිටියා. වලිගයටද දන්නේ නැහැ ඒ ගිහින් හිටියේ. එහෙම සතෙක් හැදෙමින් ඉන්නවා. ඒ සතා තමයි දැන් මේ රට පාලනය කරන්න ඉල්ලන්නේ. මේ විකෘති ජීවියාත් එක්ක ගමනක් රටටවත්, කාටවත් තියෙයි කියලා මම නම් හිතන්නේ නැහැ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ආණ්ඩුව ගැන, ආණ්ඩුවේ ඇමතිවරු ගැන දැන් ප්‍රශ්න කරනවා නේ. ආණ්ඩුවට වාගේම විපක්ෂයටත් යම් ගෞරවයක්, යම් භූමිකාවක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මාසයෙන් මාසයට, මාස දෙකෙන් දෙකට මොකක් හෝ හිතෙන වෙලාවට විශ්වාස භංග යෝජනා අරගෙන එන්නේ අල්ලන සෙල්ලම් කරන පොඩි ළමයින් වාගේ නේ. ඊට වඩා වැදගත් විධියට හැසිරෙන්න. සමගි ජන බලවේගයේ මේ ඉන්නේ ඡන්දයෙන් දිනලා ආපු මන්ත්‍රීවරු නේ. ඒ අය අධිකරණයේ ස්වාධීනත්වය ගැන නාමල් රාජපක්ෂත් එක්ක සාකච්ඡා කරනවා. ශිරානි බණ්ඩාරනායක මහත්මියට එහෙම මොනවා හිතෙනවාද දන්නේ නැහැ, නාමල් රාජපක්ෂ එක්ක ශ්‍රේෂ්ඨාධිකරණය ගැන කථා කරන්න යනකොට. මේක මේ අමුතුම විකෘති තත්ත්වයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා අපි බොහොම ගෞරවයෙන් ඉල්ලනවා, අඩුම තරමින් ඡන්දයෙන් දිනලා ආපු මන්ත්‍රීවරු විධියට, ඡන්දයෙන් පත්වෙලා ආපු මන්ත්‍රීවරු විධියට විපක්ෂයේ අවම භූමිකාවවත් ඉටු කරන්න කියලා. ඒ වෙනුවට මිනිස්සු එළවපු, මිනිස්සු අයින් කරපු අය නැවත ඔළුව උඩ තබාගෙන, රනිල් වික්‍රමසිංහගෙන් උපදෙස් අරගෙන, රනිල් වික්‍රමසිංහගේ ඔළුව සවි කරගන්න එක නම් දිගටම කරන්න යන්නේ, ඒක අපට තේරෙන්නේ නැහැ. ඔය විධියට වැඩ කරගෙන ගියොත් මේ පැත්තට නොවෙයි, ඔය පැත්තට ඔබතුමන්ලාම විශ්වාස භංග යෝජනා ගෙනෙන දවස වැඩි ඈතක නොවෙයි. ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.26]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 4ක් තිබුණා. ඒක විනාඩි 3ක් කරලා. මට කථා කරන්න දෙන්නේ නැතිව වාඩිවෙන්න කිව්වා නම් හරි.

මම කියන්න යන්නේ, ඇත්තටම අද මම බොහොම දුක් වෙනවා. 30දෙනෙක් මැරිලා තිබෙනවා. එක්කෙනෙක්, දෙදෙනෙක් නොවෙයි, 30දෙනෙක්. ඒ අය කවුරු වුණත්, ඒගොල්ලන්ට දඬුවම් දුන්නත්, ඒගොල්ලන් සිරකරුවන් වුණත්, ඒගොල්ලන් නිලධාරීන් වුණත්, ඔවුන්ගේ පුතාලාට දුවලාට තිබෙන කැක්කුම අපට දැනෙන්නේ නැහැ. මෙතැනට ඇවිල්ලා එක එක්කෙනා රනිල්ගේ අරවා මේවා කියලා කථා කරනවා. අපි ඇත්තටම අද කථා කරන්න ඕනෑ මැරුණු අයගේ අම්මා, තාත්තා මේ වීඩියෝ එක බලනකොට, අපේ කථා බලනකොට ඒ අම්මා, තාත්තාට, දුවට කොච්චර රිදෙනවාද කියන එක ගැන. මම දන්න සිංහල එච්චරයි. මම දන්න සිංහලෙන් තමයි සාධාරණව කථා කරන්නේ. අර

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන්න, මම දන්න සිංහලෙන් තමයි මට කථා කරන්න පුළුවන්.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන්න, කරුණාකරලා මගේ සිංහල වැරදුණාම, - අනික් අය මට කථා කරන සිංහල භාෂාව අල්ලාගෙන තමයි මම මේ භාෂාව බොහොම අමාරුවෙන් කථා කරන්නේ. එතකොට

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දැනගන්න ඕනෑ, මගේ වචන මම ඉගෙන ගෙන ආපු ඒවා නොවෙයි කියලා. තව එකක් තමයි, - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් හිතලා බලන්නකෝ. 10දෙනෙක් නැතිවෙලා තිබෙනවා, එතැන වැඩ කරපු නිලධාරීන්. මම දවස් 23ක් හිටියා, හිරේ. එතකොට හිතලා බලන්නකෝ, කොච්චර කැක්කුමක් ඇද්ද කියලා ඒ නිලධාරීන්ට, තමන්ගේ යාලුවෝ ඇතුළට දමලා මරනකොට. ඒ මිනිස්සු අවි ආයුධ අතේ තියාගෙන ඇතුළට යන්න බැරිව කොච්චර අමාරුවෙන් ඉන්න ඇද්ද කියලා හිතලා බලන්නකෝ. හැබැයි, අපේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒක තමයි ඇත්ත.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මම ඒක බොහොම වගකීමෙන් කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔව්, ඔව්, ඉවර කරන්න. දැන්ම නවත්වන්නකෝ, මයික් එක.

මට මාර දුකයි, මොකද මම ඊයේ මඩ ගැහුවා කියලා ඇමතිතුමා අද මට warrant එකක් issue කරලා තිබෙනවා. මම පාර්ලිමේන්තුවේ උදේ 9.00 ඉඳන් ඉන්නවා. නමුත්, අද warrant එකක් issue කරලා තිබෙනවා. මම බොහොම කනගාටුවෙන් කියනවා, මම ඔයගොල්ලන්ට විරුද්ධව තමයි අද ඡන්දය දෙන්නේ කියලා. මට මේකේ කිසිම දේශපාලනයක් නැහැ. හැබැයි, අර පවුල්වල අම්මාට, තාත්තාට, දරුවන්ට තිබෙන කැක්කුම මට තේරෙනවා. මට අම්මා, තාත්තා නැහැ. ඒ නිසා මට ඔයගොල්ලන්ට විරුද්ධව තමයි ඡන්දය දෙන්න වෙන්නේ. මේ ඇමතිතුමාට කියන්න, කරුණාකරලා මේකෙන් ඉවත් වෙලා යන්න කියලා. මොකද, ඒ මිනිස්සුන්ගේ කැක්කුම අපට තේරෙන්නේ නැහැ. අපි අඩියක් ගහලා ගෙදර බුදියගත්තාට අපට ඒක තේරෙන්නේ නැහැ. ඒ දරුවන්ට අම්මා නැහැ, තාත්තා නැහැ. *[බාධා කිරීමක්]* මම කථාව ඉවර කරනවා, මට තව තත්පර 10ක් දෙන්න. මට විනාඩි 4ක් තිබුණා, ඒක අඩු කළා. ඒ නිසා මට තත්පර 10ක් දෙන්න.

මම ඔයගොල්ලන්ට කියනවා, දැන්මම මෙයා ඉවත් වෙලා, නඩුවක් දාලා, arrest කරලා හිරේ දාලා, බොරුවට චෝදනාවක් දාලා නඩුව ඉවර කරන්න කියලා. නැත්නම් මම 2029දී අවුරුදු 20ක්, 25ක් මෙයාව ඇතුළට දානවා. වෙන ආණ්ඩුවක් ආවොත් මෙයා අවුරුදු 20කට, 25කට ඇතුළට දානවා. මිනී මැරුම් 30කට 2029දී අනිවාර්යයෙන් ඇතුළට දානවා. ඒගොල්ලන්ට දැන් හොඳටම පුරුදුයි, බොරු නඩු දාලා මේ දේවල් කරගන්න. අපේ නඩුවලටත් අත දාලා, අපි මෙතැනින් ඉවත් කරලා ගෙදර යවන්න. බොරුවට නඩුවක් දාලා, බොරුවට arrest කරලා, ආපහු ඇප අරගෙන එළියට ඇවිල්ලා, බොරු සාක්ෂි ටිකක් දීලා, මෙයාට කියන්න ඉවත් වෙලා ඒවා කරගන්න කියලා. නැත්නම් මම දන්නේ නැහැ, 2029දී කොහේට දුවන්න වෙයිද කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.29]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂය විසින් අපේ ගරු හර්ෂණ නානායක්කාර අධිකරණ ඇමතිතුමන්ට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, මීගමුව බන්ධනාගාරයේ ඇති වෙච්ච සිදුවීම පදනම් කරගෙන. ඒ සිදුවීම පදනම් කරගෙන ඉදිරිපත් කරපු විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදයේදී මතු වෙච්ච සමහර කරුණුත් එක්ක මට දැනුණේ විවාදයක් කරන කාරණයට වඩා සමහර කරුණු නිකම් ඉදිරිපත් කරගෙන ගියා කියලායි. අර කිව්වේ, 2029 වනකොට කොහේ යනවාද, මොනවා වෙනවාද, කියන්නේ මොනවාද කියලා තේරෙන්නේත් නැහැ කියලා. ඒකයි තිබෙන ප්‍රශ්නය. *[බාධා කිරීමක්]* සමහරු හිර ගෙවල්වල නම් යන එකක් නැති වෙයි, මේ යන විදියට වෙන කොහේ හරි යයි කියලා මට හිතෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]* ඒකයි වෙන්නේ. මට හිතෙන්නේ පරිස්සමින් හිටියේ නැත්නම් ෂුවර් එකටම යන

[ගරු වසන්ත සමරසිංහ මහතා]

එන තැනකින් injection එකක්වත් ගහනවා. මොකද, ගියොත් එක්කෝ උසාවියක, නැත්නම් බන්ධනාගාරයක, නැත්නම් පොලිසියෙන් කොහෙදි හරි අල්ලා ගන්නවා නේ. ඒ නිසා පරිස්සමින් ජීවත් වෙන්නවත් පුරුදු වෙන්න ඕනෑ. ඒකයි වැඩේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමා උදෙන්ම අධිකරණයේ ස්වාධීනත්වය ගැන කියලා තමයි කථාව පටන් ගත්තේ. ස්වාධීනත්වය පිළිබඳ කාරණය කථා කරන්න ගත්තේ අපේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට එරෙහි විශ්වාස භංග යෝජනාව ගෙන එන ගමන්. හැබැයි අපට පෙනුණා, අද දවසේම ඉදිරිපත් කළ කථා ඇතුළේ විපක්ෂයට විශ්වාසය නැති වෙලා තිබෙන බව. හර්ෂණ නානායක්කාර ඇමතිතුමා ගැන විශ්වාසයක් නැහැ කියන්න තමයි ආවේ. නමුත්, හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට විශ්වාසය තිබෙනවා. විපක්ෂයේ විශ්වාසය තමයි අහිමි වෙලා තිබෙන්නේ. විශ්වාසය නැහැ කියලා අද විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්න ආවාට, කථා කළේ අධිකරණය පිළිබඳව. අධිකරණය පිළිබඳ සංවාදය මේ සාකච්ඡාවට ආවාම අපට දැනුණේ දැන් ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳ සාකච්ඡාවක අපි ඉන්නවා කියලායි.

විශේෂයෙන් අපේ ඇමතිතුමන්ලා මේ ගැන කරුණු කිව්වා. අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම, උපරිමාධිකරණයේත් එහෙම නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයේත්, අභියාචනාධිකරණයේත් විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය වසර දෙකකින් දීර්ඝ කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳ සංවාදයක් ළඟදී එනවා. මෙහි අවශ්‍යතාව ඉතාම පැහැදිලිව අපි කියලා තිබෙනවා, කියමින් තිබෙනවා. ඒ නිසා ඉස්සරහට ඒ පිළිබඳව සංවාද කරන්න පුළුවන්.

මට හිතෙන විධියට අද විපක්ෂය සම්පූර්ණයෙන්ම ඒ ගැන තමයි කථා කළේ. මේ කථාව කියාගෙන යනකොට අපට දැනෙනවා, අපට පෙනෙනවා, විපක්ෂය පොඩි භීතිකාවකින් ඉන්නවා කියලා. ඒ භීතිකාව සරල එකක් නොවෙයි, "සූරසේන භීතිකාව." මම අහගෙන විපක්ෂයේ සමහරු කියනවා, සූරසේන භීතිකාවක් තිබෙන්නේ කියලා. කවුද මේ සූරසේන? අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමා ගැනයි මේ කියන්නේ. අග්‍ර විනිශ්චයකාරතුමා පිළිබඳව ඇති කරන භීතිකාව සරල එකක් නොවෙයි නේ. මොකද, අග්‍ර විනිශ්චයකාරතුමාගේ සේවා කාලය විතරක් නොවෙයි නේ දීර්ඝ කරන්නේ.

අග්‍ර විනිශ්චයකාරතුමාගේ සේවා කාලය විතරක් නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය, ඒ වාගේම අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය, අනෙකුත් සියලු විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය මෙහිදී දීර්ඝ වනවා. රාජ්‍ය සේවකයාගේ අවුරුදු 55ක සේවා කාලය දීර්ඝ වනකොට පහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලයත් දීර්ඝ වුණා. හැබැයි, 1978න් පස්සේ උපරිමාධිකරණවල, එහෙම නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයේත්, අභියාචනාධිකරණයේත් විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ වෙලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා පහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ වුණා වාගේම, ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීමේ අවශ්‍යතාවත් තිබෙනවා. 1978න් පස්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 21 වතාවක් සංශෝධනය වුණා. හැබැයි, ඒ එකම වෙලාවකවත් මේ ගැන අවධානය යොමු වෙලා නැහැ.

මේ කාලය වනකොට අපි දකිනවා, මේ රට තුළ දේශපාලනඥයන්ට සම්බන්ධ නඩු ගොඩක් ඇහෙන ආකාරය. දේශපාලනඥයන්ට සම්බන්ධ නඩු ගොඩක් ඇහෙනකොට, වෙන දා උසාවි ආපු නැති ජනාධිපතිවරු, වෙනදා උසාවි ආපු නැති අගමැතිවරු, ඇමතිවරු, ඔවුන්ගේ පවුල්වල ඥාතින්, හිතවතුන්, සභාපතිවරුන්, දූවලා, පුතාලා, ඒ වාගේම ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ හිටපු අධිකරණ ඇමතිවරුන්, හිටපු පොලිස්පතිවරුන් දැන් උසාවි ගාණේ එනවා. ඒ භීතිකාව තමයි දැන් මේ විපක්ෂයට තිබෙන්නේ. සූරසේන භීතිකාව විතරක් නොවෙයි, ඒ භීතිකාවත් තිබෙනවා. එම නිසා අග්‍ර විනිශ්චයකාරතුමා ඉලක්ක කරගෙන මේ එල්ල කරන්නේ වෙන කිසිවක් නොවෙයි, අධිකරණ භීතිකාව. බලාගෙන ඉන්න, තව නඩු පෝලිමට එනවා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, කෘත්‍යාධිකාරී මණ්ඩලවලත් ඉන්නවා නේ කප්පම් ගත්ත, පගාව ගත්ත මිනිස්සු. ඒක නේ ප්‍රශ්නය. එවැනි අය අල්ලාගෙන, අල්ලාගෙන යනකොට, එවැනි සිද්ධි බඩවැල වාගේ ඇදී ඇදී එනකොට දැන් කෙළවරක් නැතුව නොයෙක් අය අහුවෙනවා නේ. එහෙම අහුවෙනකොට, නඩු වැටෙනකොට මෙහෙම දේවල් වෙනවා. දැන් ඒවා විමර්ශනය වෙනවා, උසාවිවල නඩු ඇහෙනවා.

ශ්‍රේෂ්ඨාධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ වයස දීර්ඝ කරන එක දේශපාලන ප්‍රශ්නයක් බවට පත් කර ගන්නේ මොකටද? ඒකද මේ වෙලාවේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය? නැහැ. නමුත් මේ විපක්ෂය අද ඒක මේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය බවට පත් කර ගන්නවා. ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට විරුද්ධව මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන චුවමනාවක් නොවෙයි එතුමන්ලාට තිබුණේ. මොකද, ඒගොල්ලන් දන්නවා නේ මේකෙන් දිනන්න බැහැ, මේක බොරුවක් කියලා. මොකද, හර්ෂණ නානායක්කාර ඇමතිතුමා ගිහිල්ලා බන්ධනාගාරය තුළ ප්‍රශ්න හදන්න කටයුතු කළා නොවෙයි නේ.

මම අහගෙන, විපක්ෂයේ සමහරු කිව්වා තුෂාර උපුල්දෙණියගේ ප්‍රශ්නය. උපුල්දෙණියගේ ප්‍රශ්නය මොකක්ද? හිටපු බන්ධනාගාර කොමසාරිස් උපුල්දෙණිය නැති නිසා මේ ප්‍රශ්න හැදුණා වාගේයි එතුමන්ලා කථා කරන්නේ. හැබැයි, ඔහු ඉන්නකොට ප්‍රශ්න හැදුණු තැන් තිබෙනවා. මහර බන්ධනාගාරයේ ප්‍රශ්න හැදුණේ කවදාද? ඔහු හිටපු වෙලාවේ. හැබැයි, ඔහු හිටියත් මීගමුවේ ප්‍රශ්නය හැදෙන්න තිබුණා. ජනාධිපති සමාවට සුදුසු නැති අය 2025 වසරේ නිදහස් දිනයේදී list එකෙන් නිදහස් වුණා. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඔහු පත් කිරීමේ බලධාරියා කැබිනට් මණ්ඩලය, විනය බලධාරියා කැබිනට් මණ්ඩලය, ඔහුට අදාළ තීන්දු ගන්නේ කැබිනට් මණ්ඩලය, එම නිසා ඔහුගේ සේවය අත්හිටෙව්වේත් කැබිනට් මණ්ඩලය. ඒ විතරක් නොවෙයි. ඔහු ගැන පරීක්ෂණයක් කරන්න කියලා දැන් ලේකම්වරියට නියෝගයක් දීලා තිබෙන්නේත් කැබිනට් මණ්ඩලය. ඒ පරීක්ෂණ කටයුතු දැන් පටන් අරගෙන තිබෙනවා. එම නිසා රාජ්‍ය සේවයේ සිටින නිලධාරින්ට අදාළ පත්වීම් බලධාරියා, විනය බලධාරියා අදාළ තීරණ අරගෙන දැන් ඒ වැඩ කරනවා. ඒ නිසා ඔහු සිටියාද, නැද්ද කියන එක නොවෙයි කාරණය. රාජ්‍ය සේවයේ නිලධාරින් ඒ ඒ තැන්වල ඒ ඒ අයගේ කාර්යභාරයට මැදිහත් වෙලා තිබෙනවා. ඒ අනුව, බන්ධනාගාර නිලධාරින් ඒ අයගේ කටයුත්තට මැදිහත් වෙලා තිබෙනවා.

ඒ වාගේම මම අහගෙන එක් මන්ත්‍රීවරයෙක් කියනවා, "මොකක්ද මේ සිද්ධ වෙන්නේ, 54වන වගන්තිය යටතේ ගම්වල සිටින අහිංසක ළමයි ගෙනැල්ලා බන්ධනාගාර පුරවනවා" කියලා. අනේ පව්! *[බාධා කිරීමක්]* ඒක තමයි, ඒ කියන්නේ පොලිසියට වැරදිලා. මෙච්චර කාලයක් සිදුවෙලා තිබෙන්නේ, කුඩු නිකම්ම ගම්වලට යන එක, කේරළයෙන් ගංජා නිකම්ම පාවෙලා එන එක, ඒවා බන්ධනාගාරවලට නිකම්ම යන එක. ඒක තමයි වෙනවා ඇත්තේ. එහෙම යනකොට අහුවෙනවා. ඒක තමයි වෙනවා ඇත්තේ. මට හිතෙන්නේ, කෘත්‍යාධිකාරී මණ්ඩලයට දාන්න

ඇත්තේත් එහෙමයි. සල්ලි දෙන්නම නැතුව ඇති. එහෙම නම්, පාතාල සාමාජිකයෝත් එක්ක ගනුදෙනු කරන්නම නැතුව ඇති. එහෙම නේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලිසිය ගියාම යම් දේවල් සිදු වෙන්න පුළුවන්කම තිබෙවි. හැබැයි, එක්කෙනෙක් දෙදෙනෙක් අතින් සිද්ධ වන සිදුවීම් වැරැදියි කිව්වාට, පොලීසියේ, හමුදාවේ සහ STF එකේ ඉන්න නිලධාරින් මුහුද ආරක්ෂා කරනවා, ගුවන් තොටුපොළ ආරක්ෂා කරනවා, වරාය ආරක්ෂා කරනවා. මත්ද්‍රව්‍ය නැවෙන් එනවාද, බෝට්ටුවලින් එනවාද, ගුවනින් එනවාද කියලා ඔවුන් බලනවා. ඒ අය කුඩු කිලෝ ගණන් අල්ලනවා. නැව්වලින් ආපු මත්ද්‍රව්‍ය අල්ලනවා. ඒවා බෙදන තැන් අල්ලනවා. හන්දි ගාණේ, ත්‍රී වීලර් ගාණේ, බස් ගාණේ, ලොරි ගාණේ, ලයිට් කණු ගාණේ දාලා යන ඒවා අල්ලනවා. ගම්වල ඉන්න තරුණයන් විනාශ කරන මේ ජාවාරම නවත්වන්න "ඉවත් වෙනු" කියලා මෙහෙයුමක් අපි පටන් ගත්තා. එහෙම මෙහෙයුමක් පටන් ගෙන තමයි මේ විධියට මත්ද්‍රව්‍ය අල්ලන්නේ. එහෙම නැතුව ගම්වල ඉන්න අහිංසක ළමයි අල්ලන්නේ නැහැ. මේ මත්ද්‍රව්‍යවලින් ඉවත් වෙනු කියලා දැනුම් දීලා තමයි අපි මේ කටයුත්ත පටන් ගත්තේ. සියලුදෙනාම එකතු කරගෙන දිස්ත්‍රික්ක වටේ ගිහිල්ලා මත්ද්‍රව්‍යවලින් ඉවත් වෙනු කියලා මේ ව්‍යාපෘතිය පටන් ගෙන තිබෙනවා. නමුත් මත්ද්‍රව්‍ය ජාලයට බැඳිච්ච අයට, කුඩු කාපු අය වාගේ සල්ලි - පගාව - අරගෙන ජාවාරම්වල නිරත වෙලා ඉන්න අයට ඒවායෙන් ඉවත් වෙන්න බැරි වෙලා ඇති. ඒ අයට අද ඒ ගැන දුකයි, කැක්කුමයි. මොකද, සල්ලි අරගෙන දැන් ගැලවෙන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ඒ අයට දැන් කැක්කුමයි. ඒ අයට තමයි අහිංසකයි කියන්න හදන්නේ. ඒ අය අහිංසකයන් කියන්න තමයි උත්සාහ කරන්නේ. ගම්වල ඉන්න අහිංසක දෙමව්පියන්ගේ දරුවන් තමයි මේ ජාවාරම්කරුවන් ගිහිල්ලා බිලි ගන්නේ. ඒ ගම්වලට නිකම්ම කුඩු ගියේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුඩු ග්‍රෑම් 13ක්, 15ක් කොළඹදී අහු වුණා කියලා වෙන දා පොල් ගෙඩි වාගේ අකුරුවලින් පත්තරවල පළ වුණා. දැන් කුඩු ගෝනි 7, 8 අහු වෙන්නේ. කුඩු කිලෝ 750ක් අහු වුණා කියායි දැන් සඳහන් වෙන්නේ. අද කුඩු කිලෝ 750ක් අහු වුණා කියනකොට හෙට අහු වෙනවා, කුඩු කිලෝ 350ක්. ඉස්සෙල්ලා වාගේ නොවෙයි, එහෙමයි දැන් කුඩු අහු වෙන්නේ. දැන් ඒවා ගෙනෙන්නේ කවුද? ඒවා ගෙනෙන මිනිස්සුත් එක්කයි දැන් අහු වෙන්නේ. ඒවා නැව්වලින්, බෝට්ටුවලින් තමයි අහු වෙන්නේ. ඉස්සෙල්ලා එහෙම අහු වුණාද? මේ ජාවාරම දැන් පැතිරිලා හැම තැනටම අතු රිකිලි දමා තිබෙන්නේ. ඒ මිනිස්සු අහු වනකොට ඒවාට සම්බන්ධ දේශපාලන අන්කොන් අහු වෙනවා, දේශපාලන සම්බන්ධතා අහු වෙනවා. ඒ අය පක්ෂවල කෘත්‍යාධිකාරි මණ්ඩලවල ඉන්නවා. ඒ අයගෙන් සල්ලි ගත්ත මිනිස්සු ඉන්නවා. අධිකරණවලින් නඩු බේරා දෙන්න සල්ලි ගත්ත මිනිස්සු ඉන්නවා. උසාවිවලින් ඇප දෙන්න සල්ලි ගත්ත මිනිස්සු ඉන්නවා, පොලිස්පතිවරුන්ගේ, අධිකරණ ඇමතිවරුන්ගේ පුත්තු ඉන්නවා. මේ පද්ධතිය විනාශ කරපු මිනිස්සු තමයි මේ ඉන්නේ.

මේ සමස්ත ක්‍රියාවලිය තුළ, මේ සමාජය තුළ තිබෙන බරපතළ ප්‍රශ්නයක් මේ වනකොට අපි නිවැරදි කරගෙන යනවා. මේ ජාවාරම්වල කොටස්කරුවන්, චෝදනාවලට ලක් වෙච්ච මිනිස්සු තමයි මේ බන්ධනාගාරවල ඉන්නේ. ඒ අතරේ මේවාට අහු වෙච්ච, ගොදුරු වෙච්ච අයත් ඉන්න පුළුවන්. ඒවාට ගොදුරු වෙච්ච මිනිස්සු ඒවායෙන් නිදහස් කර ගන්න, මුදා ගන්න පුනරුත්ථාපන මධ්‍යස්ථාන හදලා තිබෙනවා. ඒ පුනරුත්ථාපන මධ්‍යස්ථාන හරහා ඒවාට ගොදුරු වුණු මිනිස්සු නිදහස් කර ගන්න මෙහෙයුමක් ආණ්ඩුව සිදු කරමින් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බන්ධනාගාර ඇතුළේ ඉඳන් සිදු කරන මෙහෙයුම් අපි නවත්වනවා. බූස්ස, මීගමුව ඇතුළු හැම බන්ධනාගාරයකම සිද්ධ වන එවැනි දේවල් නවත්වමින්, බන්ධනාගාර ඇතුළේ ඉඳගෙන සිදු කරන ඒ ජාවාරම් නවත්වමින් මේ සමස්ත ක්‍රියාවලිය නවත්වන්න මැදිහත් වනකොට තමයි මේ සමහර සිදුවීම් වෙන්නේ. ඒ සිදුවීම් නවත්වන්න, ඒ මෙහෙයුම සිදු කරද්දී තමයි අධිකරණ ඇමතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවේ. ඒ නිසා අපි මේ කාරණයත් කියන්න ඕනෑ. ෂොට් එකක් දාලා ගෙදර ඉන්නවාද, නැද්ද කියන එක අධිකරණ ඇමතිවරයා බලා ගනීවි. හැබැයි, එතුමා - අධිකරණ ඇමතිවරයා - තමන්ගේ රාජකාරිය හරියට කරලා තිබෙන්නේ. ෂොට් එක ගහ ගන්න බැරි වෙච්ච මිනිස්සුන්ට දැන් ඒකට හිට් එක ඇවිල්ලා තිබෙන්නේ. ඒකයි ප්‍රශ්නය. ඒ නිසා දැන් දුකයි. දුක හිතිලා තිබෙන්නේ. අධිකරණ ඇමතිවරයා ෂොට් එකක් ගැහුවා කියලා මෙතැනට ඇවිල්ලා නිකම් ෂොට් එකක් දෙන්න හදනවා. එහෙම නැහැ. අධිකරණ ඇමතිතුමා ඒ සිද්ධිය වෙච්ච වෙලාවේ ඉඳලා යන්න ඕනෑ හැම තැනටම ගියා. එහෙම නැතුව ෂොට් එකක් දාලා එතුමා ගෙදර බුදියා ගත්තේ නැහැ. හරියට ගෙදරට ගිහිල්ලා ෂොට් එකට සෝඩා දැම්මා වාගේ නේ මෙතැන කථාව. ෂොට් එක ගහන්න සෝඩා දැම්මේ එතුමා කියලා හිතාගෙනයි කථා කරන්නේ. ඒකට ඇප වෙනවා වාගේ තමයි කියන්නේ.

හැබැයි, ඒ සිදුවීම වූ දවසේ එතුමා බන්ධනාගාරයට ගියා. ඊට පසුව ඉස්පිරිතාලයට ගියා. ඉන් පසුව මියගිය මිනිස්සුන්ගේ ගෙවල්වලට ගියා. එහෙම වැඩ කරපු අධිකරණ ඇමති කෙනෙක් තමයි මේ ඉන්නේ. ඒ නිසා මේ සභාවේදී නිකම් දෙකයි පනහේ කථා කියන්න එන්න එපා. අධිකරණ ඇමතිට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න වුවමනාවට නොවෙයි විපක්ෂය මේක ගෙනාවේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වෙලාවේ කථා කරන්න ඕනෑ මාතෘකාවක් හොයා ගන්න විපක්ෂයට වුවමනාව තිබුණා. මාතෘකා හොයනකොට, ළඟ එනවා විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම පිළිබඳ ව්‍යවස්ථා සංශෝධනය. ඒ නිසා අපි විපක්ෂයට කියන්න ඕනෑ, අපි ඒ සඳහා දිනයක් යොදා ගන්නකොට ඔබතුමන්ලා ඒ ගැන කථා කරලා ඉවරයි කියන එක. ඒකට අදාළ කථාව කරලා ඉවරයි. ඒ නිසා අලුතින් කියන්න දේවල් හොයා ගන්න වෙනවා. 1978න් පස්සේ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ කරලා නැහැ. ඒ ව්‍යවස්ථා සංශෝධනයත් අපි ඉදිරියේදී කරනවා. ඒ ව්‍යවස්ථා සංශෝධනය කරනකොටත් මේ කථාවම තමයි ඔයගොල්ලන්ට කරන්න වෙන්නේ.

මීගමුව බන්ධනාගාරයේ රැඳවියන්ටත්, මේ කටයුත්තේදී බන්ධනාගාර පවත්වා ගෙන යන්න මැදිහත් වෙච්ච බන්ධනාගාර නිලධාරින්ටත්, ඒ සිදුවීමෙන් මිය ගිය නිලධාරින්ටත්, ඔවුන්ගේ පවුල්වල අයටත් කළ හැකි උපරිම සාධාරණය කරන්න අධිකරණ ඇමතිවරයා මැදිහත් වුණාය කියන එක අපි කියන්න ඕනෑ. එතුමා පෞද්ගලිකවත් මේ සිදුවීම පිළිබඳව කම්පාවට පත් වුණා. ඒ විතරක් නොවෙයි, එතුමා කළ හැකි සියලු මැදිහත්වීම් කරමින් වගකීම ඉතාම හොඳින් ඉටු කරපු ඇමතිවරයෙක්. විපක්ෂයට, විපක්ෂය විශ්වාස නැතිව මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවාට ආණ්ඩුවට ඇමතිවරයා පිළිබඳව හොඳටම විශ්වාසය තිබෙනවා කියන කාරණය සඳහන් කරමින්, මේ විශ්වාස භංග යෝජනාව වඩා විශ්වාසයෙන් අපි පරද්දනවා කියමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, in terms of Standing Order No. 10 (4) of the Parliament of the Democratic Socialist Republic of Sri Lanka, I wish to inform that I received the letter to say that I have attended Parliament, only now, at 4.38 p.m. I raise it just to inform the Chair that I am still here in Parliament. Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.45]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பான இன்றைய விவாதத்தில் அவர்மீதான தாக்குதல் உரைகளும் தற்காப்பு உரைகளும் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன. உண்மையில் சிறைச்சாலை என்பது அரச பாதுகாப்புக்குரிய ஓர் இடமாக இருக்கின்றது. அது சட்டபூர்வமாகப் பாதுகாக்கப்படுகின்ற ஓர் இடமாக இருக்கின்றபடியால், அங்கே இவ்வாறான படுகொலைச் சம்பவம் நடப்பதென்பது ஏற்க முடியாதவொரு விடயம். அந்தச் சம்பவத்திலிருந்து நாம் கற்றுக்கொள்ள வேண்டிய பாடம் என்னவென்றால், இனிவரும் காலங்களிலாவது இப்படியான தாக்குதல் சம்பவங்கள் இடம்பெறாமல் பாதுகாக்க வேண்டிய பொறுப்பு நீதி அமைச்சருக்கு அல்லது சிறைச்சாலைக்குப் பொறுப்பாக இருக்கின்ற அமைச்சருக்கு இருக்கின்றது என்பதாகும் என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

நாம் எமது நாட்டைச் சமூக ரீதியாகவும் அரசியல் ரீதியாகவும் எடுத்துப் பார்க்கின்றபோது, நேர்மறையான கலாசாரம், எதிர்மறையான கலாசாரம் என்று இரு வகையான கலாசாரங்கள் இருப்பதைக் காணலாம். அவற்றில் சிறைச்சாலைகளில் நடைபெறுகின்ற இந்தப் படுகொலைகள், தாக்குதல்கள், வன்முறைகள் மற்றும் போதைவஸ்து கலாசாரம், பாதாள உலகக் கலாசாரம், துப்பாக்கிக் கலாசாரம் என்பன நாட்டின் எதிர்மறையான கலாசாரமாக இருந்து வருகின்றன. இவ்வாறான எதிர்மறையான கலாசாரம் நாட்டுக்குக் கௌரவக் குறைவான விடயமாக இருப்பதோடு, அரசாங்கத்தினால் ஏற்றுக்கொள்ள முடியாததாகவும் இருக்கின்றது என்பதை நாங்கள் புரிந்துகொள்ள வேண்டும்.

இப்போதுகூட வெலிக்கடைச் சிறைச்சாலையில் இருக்கின்ற கைதிகளுக்கு மத்தியில் ஓர் அச்ச உணர்வு ஏற்பட்டிருக்கின்றது என்று சொல்கின்றார்கள். இனியும் இப்படியான தாக்குதல்கள் நடக்கக் கூடுமோ என்ற அச்சத்தில் அவர்கள் இருக்கின்றார்கள். ஏனென்றால், கைதிகளைப் பொறுத்தமட்டில் இரண்டு வகையினர் காணப்படுகின்றார்கள். அவர்களில் போதைவஸ்துப் பாவனைக்கு ஆதரவானவர்களும் இருக்கின்றார்கள்; அதற்கு எதிரானவர்களும் இருக்கின்றார்கள். அவ்வாறான செயல் சிறையில் நடக்கக் கூடாது என்று நினைத்துக்கொண்டு இருக்கின்றவர்கள் அதற்கு எதிரானவர்களாக இருக்கின்றார்கள். அவர்கள் அங்கு நடைபெறுகின்ற போதைவஸ்துப் பாவனை தொடர்பாகத் தகவல்களைக் கொடுக்கின்றார்கள். இதனால் அவர்கள் ஓர் அச்ச உணர்வோடு இருக்கின்றார்கள். ஆகவே, மீண்டும் சிறைச்சாலையில் இப்படியான தாக்குதல் சம்பவங்கள் நடக்காமல் இருப்பதை கௌரவ அமைச்சர் அவர்கள் உறுதிப்படுத்த வேண்டும். அப்படியானதொரு சூழ்நிலை உருவாவதைத் தடுக்க வேண்டும் என்பதை இந்த இடத்தில் கேட்டுக் கொள்கிறேன்.

இந்தச் சிறைச்சாலைப் படுகொலை என்பது ஒரு நீண்ட வரலாறு கொண்டதாகக் காணப்படுகின்றது. 1977இல் ஆட்சியைக் கைப்பற்றிய ஜே.ஆர். ஜயவர்தன அவர்கள் 5/6 பெரும்பான்மையோடு அரசாங்கத்தை அமைத்தார். அவ்வாறு 5/6 பெரும்பான்மையோடு ஆட்சிபீடம் ஏறிய ஜே.ஆர். ஜயவர்தன அவர்களுடைய ஆட்சிக் காலத்தில்தான் 1983 யூலை மாதத்தில் 'கறுப்பு யூலை' வன்முறைகள் இடம்பெற்றன. அதைத்தான் நாம் நேற்றைய தினம் நினைவுகூர்ந்தோம். அப்போது வெலிக்கடைச் சிறைச்சாலையில் தடுத்து வைக்கப் பட்டிருந்த தமிழ் அரசியல் கைதிகள் 53 பேர் இரண்டு நாட்களில் படுகொலை செய்யப்பட்டிருந்தார்கள். இந்தப் படுகொலைகளைப் புரிந்த குற்றவாளிகள் அடையாளம் காணப்பட வேண்டியதும் அவர்களுக்குரிய தண்டனை வழங்கப்பட வேண்டியதும் அவசியமான ஒன்றாகும்.

அவ்வாறில்லாமல், குற்றவாளிகள் தண்டிக்கப்படாமல் இருப்பதும் அவர்கள் பாதுகாக்கப்பட்டு வருவதும், தொடர்ந்தும் சிறைச்சாலைப் படுகொலைகள் நடைபெறுவதற்கு ஏதுவான விடயங்களாக அமைந்திருக்கின்றது. குற்றவாளிகள் உருவாகக்கூடிய சூழ்நிலையைத் தோற்றுவித்தல், குற்றவாளிகளைப் பயன்படுத்தல், குற்றவாளிகளுக்குப் பாதுகாப்புக் கொடுத்தல் போன்ற பொறிமுறைகள் கடந்த காலத்திலிருந்தே காணப்படுகின்றன. வறுமை, தொழில் வாய்ப்பின்மை மற்றும் கவனிப்பின்மை போன்ற காரணங்களால் குற்றவாளிகள் உருவாகக்கூடிய சூழ்நிலைகள் ஏற்படுவதுடன், அவர்கள் இவ்வாறான சட்ட விரோதமான செயற்பாடுகளில் ஈடுபடுகின்ற நிலையும் காணப்படுகின்றது. இப்படிப்பட்டவர்களை நாங்கள் சரியாகக் கையாளவேண்டிய தேவையிருக்கின்றது.

இப்போது போதைப்பொருள் மற்றும் பாதாள உலகச் செயற்பாடுகளில் ஈடுபட்டு, கைது செய்யப்படுபவர்கள் சிறைச்சாலைகளில் அடைக்கப்பட்டிருக்கின்றார்கள். இவ்வாறானவர்கள் சிறையில் இருக்கும்போது, நிச்சயமாக அங்கு வன்முறைகள் ஏற்படுவதற்கான வாய்ப்புகள் அதிகமாக இருக்கின்றது என்பதை நாங்கள் எதிர்பார்க்க வேண்டும். ஆகவே, வன்முறைகள் ஏற்படாத விதத்தில் நாங்கள் நடந்துகொள்ள வேண்டிய தேவையிருக்கின்றது. "சூடுகண்ட பூனை அடுப்பங்கரை நாடாது" என்றதொரு பழமொழி தமிழில் இருக்கின்றது. ஒரு தடவை சிறைச்சாலைப் படுகொலைகள் நடைபெற்றால், மீண்டும் அவ்வாறான படுகொலைகள் நிகழாமல் பாதுகாக்க வேண்டிய தார்மீகப் பொறுப்பு இருக்கின்றது; அது நிறைவேற்றப்பட வேண்டும் என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். எனவே, கற்றுக்கொண்ட பாடங்களை அடிப்படையாகக்கொண்டு, எதிர்காலத்தில் இவ்வாறான சிறைச்சாலைப் படுகொலைகளோ, சிறைச்சாலை

வன்முறைகளோ ஏற்படாத விதத்தில் அரசாங்கம் தனது கடமையை மிகவும் வலுப்படுத்திக்கொள்ள வேண்டும் என்று இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

ஏனென்றால், அண்மைய வன்முறையில் 31 பேர் வரை கொல்லப்பட்டிருக்கின்றார்கள். 1983 யூலையில் இடம்பெற்ற சிறைச்சாலைக் கலவரத்தில் 53 பேர் கொல்லப் பட்டிருக்கின்றார்கள். அன்று அந்தக் குற்றச் செயல்களில் ஈடுபட்ட குற்றவாளிகள் கண்டுபிடிக்கப்படவில்லை; நீதி வழங்கப்படவில்லை. அவ்வாறிருக்கின்றபோது, சட்டத் திலிருந்து தப்பித்துக் கொள்ளலாம் என்ற அடிப்படையில் இப்படியான வன்முறைச் செயற்பாடுகள் வாழையடி வாழை யாகத் தொடர்ந்துகொண்டிருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, சிறைச் சாலைகளில் பாதாள உலக குழுக்களைச் சார்ந்தவர்களும் போதைப்பொருள் கடத்தலுடன் தொடர்புபட்டவர்களும் இருப்பதால் வன்முறைகள் வெடிக்க வாய்ப்புள்ளதால் இனிமேலாவது மிகவும் கவனமாக இருக்க வேண்டும் என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

இறுதியாக நான் ஒரு சமூக ரீதியான விடயத்தைச் சொல்ல வேண்டும். ஏறாவூரில் காணப்படுகின்ற RDB அங்கு தனது முக்கியமான கடமைகளை ஆற்றிவருகின்றது; அந்த வங்கியை இடமாற்றுவதற்கான செயற்பாடுகள் நடைபெறுகின்றது; அது தடுக்கப்பட வேண்டும். மேலும், நெல்லுக்கான உத்தரவாத விலையும் நிர்ணயிக்கப்பட வேண்டும் என்பதைக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.51]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අධිකරණ ඇමතිතුමාට විරුද්ධ විශ්වාස භංග යෝජනාවක් ගැන කථා කරන්න ලැබීම ගැන මම කනගාටු වෙනවා. මොකද, එතුමා අපි දන්නා හොඳ පුද්ගලයෙක්. හැබැයි, මේ විශ්වාස භංග යෝජනාවේදී නම් ගරු ඇමතිතුමනි, ඔබතුමාට විරුද්ධව දරුණු විධියට කථා කරන්න වෙනවා.

ගරු ඇමතිතුමනි, මම මේ කාරණය අහන්න කැමැතියි. ඒ සිද්ධිය වුණා. අඩුම ගාණේ පළමු දවසේ ඒ සිද්ධිය වළක්වා ගත්තේ නැති, ඒ සිද්ධියෙන් පස්සේ අවශ්‍ය ක්ෂණික ක්‍රියාමාර්ග ගත්තේ නැති, ඒ ස්ථානයේ හිටපු ප්‍රධාන නිලධාරින් දෙදෙනා - SP සහ ප්‍රධාන ජේලර්වරයා - තවමත් ඒ තනතුරු දරමින් එතැන ඉන්නවා. එතැන මරණ 30ක් වෙලා තිබෙනවා. අතීතයේත් බන්ධනාගාර ඇතුළේ ඕනෑ තරම් ගැටුම් වෙලා තිබෙනවා. හැබැයි, බන්ධනාගාර නිලධාරින් මරණයට පත් වුණේ නැහැ. මෙතැනදී බන්ධනාගාර නිලධාරින් 9දෙනෙක් මිය ගොස් තිබෙනවා. මේ ගැන මුලින්ම තීන්දු තීරණ ගත්තේ නැති, දුර්වල පරිපාලනයක් කරපු SPත්, ජේලර්වරයාත් අදත් මීගමුවේ බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර්වරයා සහ බන්ධනාගාර අධිකාරීවරයා විධියට කටයුතු කරනවා. ඉතින් මෙතැනින්ම ඇමතිවරයාගේ දුර්වලකම අපට බොහොම පැහැදිලිව පෙනෙනවා. මොකද, සිද්ධිය වුණාම ඒ සිද්ධිය ගැන පළමු වගකීම දරන්න ඕනෑ වන්නේ ඒ ප්‍රධාන තනතුරු දෙක දරන පුද්ගලයෝ දෙන්නා. ඒ දෙන්නා එතැනින් ඉවත් කරන්න බැරි නම්, වෙනත් ස්ථානයකට ස්ථාන මාරු කරන්න බැරි නම්, ඔවුන් interdict කරන්න බැරි නම් අමාත්‍යවරයා විධියට ඔබතුමාගේ දුර්වලකම, ඔබතුමාගේ නොහැකියාව, ඔබතුමාගේ අදක්ෂ කළමනාකාරිත්වය බෙහොම පැහැදිලිව පෙනෙනවා.

ඒ කෙසේ වෙතත්, මේ සිද්ධිය සුළුවෙන් තකන්න පුළුවන් දෙයක් නොවෙයි. මේ සිද්ධිය ඉතාම බරපතළ සිද්ධියක්. අපේ රටේ බන්ධනාගාර ඉතිහාසයේ සිදු වුණු බරපතළම, දරුණුම ගැටුම. අතීතයේ වෙලා තිබුණු ගැටුම්වලදී බන්ධනාගාරවල රැඳවියන් පමණයි මරණයට පත් වුණේ. හැබැයි, මෙම සිදුවීමේදී බන්ධනාගාර නිලධාරින්ම 9දෙනෙක් මරණයට පත් වුණා. පළමු දවසේ සිදුවීමෙන් පසු අවශ්‍ය ක්ෂණික ක්‍රියාමාර්ග ගත්තා නම් ඒ බන්ධනාගාර නිලධාරින් මැරෙන්නෙත් නැහැ, රැඳවියන් මෙපමණ ප්‍රමාණයක් මැරෙන්නේත් නැහැ. මරණ දෙකකින් මේක නතර වෙනවා. ගරු ඇමතිතුමනි, එහෙම නම් ඔබතුමාගේ දුර්වලකම ඔබතුමා හඳුනා ගන්න ඕනෑ. ඔබතුමාට ඒක තේරෙන්න ඕනෑ.

ඔබතුමන්ලා ගිය අවුරුද්දේ තුෂාර උපුල්දෙණිය මහතා අයින් කළා. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා අයින් කළේ ඔබතුමන්ලාගේ චූවමනාවක් මත. ඒක බොහොම පැහැදිලිවම දේශපාලන චුවමනාවක්.

එතැන හිටපු ප්‍රධාන, ජ්‍යෙෂ්ඨතම නිලධාරින් දෙදෙනාම ඒ වගකීම ගත්තේ නැහැ, ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි. ඒ වගකීම ගත්තේ නැහැ. ඒ වගකීම ගත්තේ නැත්තේ ඒ නිලධාරීන්ට අමාත්‍යාංශය ගැන, ඇමතිවරයා ගැන කිසි විශ්වාසයක් තිබුණේ නැති නිසා. ඒ විශ්වාසයක් නොතිබුණු නිසා තමයි ඒ අය වගකීම ගත්තේ නැත්තේ. ඒ රාජ්‍ය නිධාරින්ගේ කොන්ද කඩලා නිසා තමයි ඒ වගකීම ගත්තේ නැත්තේ. ඊට වඩා අත්දැකීම් අඩු නිලධාරියෙක් තමයි වැඩ බලන බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විධියට පත් වුණේ. එහෙම නම්, මේ සම්බන්ධ සියලු වගකීම් අධිකරණ අමාත්‍යවරයා විධියට, බන්ධනාගාර භාරව ඉන්න අමාත්‍යවරයා විධියට ඔබතුමාට පැවරෙනවා. එහෙම නම්, අපට මේ විශ්වාස භංග යෝජනාව ගෙන ඒමට සිදුවීම සාධාරණ නැද්ද? මේ විශ්වාස භංග යෝජනාවේදී ඔබතුමාට විරුද්ධව ඡන්දය දෙන්න සිදුවීම සාධාරණ නැද්ද? මේ රටේ ජනතාව ඔබතුමාට ඇඟිල්ල දිගු කරන එක සාධාරණ නැද්ද කියන එක මම ඔබතුමාගෙන් අහනවා.

මේ සිදුවීමේදී සම්පූර්ණයෙන්ම, සියයට සියයක්ම අධිකරණ ඇමතිවරයා වග කියන්න ඕනෑ. අමාත්‍යවරයා විධියට, මේ ආයතනවල ප්‍රධානියා විධියට අනිවාර්යයෙන්ම ඔබතුමාට මේ වගකීම දරන්න වෙනවා. ඒ නිසා පැහැදිලිවම මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදය අවසන් වීමට පෙර, විනාඩියකට පෙර හරි කමක් නැහැ, අධිකරණ ඇමතිතුමා වන ඔබතුමා ඉල්ලා අස් වෙලා ඔබතුමන්ලාට ඡන්දය දුන්න පිරිසගේ ගෞරවය රකින්න කියලා මා කියනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.55]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාද කරන විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් විපක්ෂය දක්වන්නට යෙදුණු කරුණු අපි උදේ සිටම අහගෙන හිටියා. ඒ කරුණු අහගෙන ඉන්නකොට මා බලාපොරොත්තු වුණා, මේ පද්ධති වැඩිදියුණු කරගන්න අවශ්‍ය සාධනීය යමක් අපට අහගන්නට ලැබෙයි කියලා. නමුත් ඒක හීනයක් පමණයි. මොකද, අද විපක්ෂය කථා කළේ වචන නොවෙයි, හලාහල විෂ, වෛරය. ඒ අයගේ අපේක්ෂා භංගත්වය තමයි දකින්න ලැබුණේ. සමහර මන්ත්‍රීවරු කථා කළා නොවෙයි, මෙතැන වමනය කළා කියලා කිව්වොත් වඩා නිවැරදියි. කෙසේ හෝ වේවා, එම චෝදනාවලදී අයෙක් මා මිනීමරුවෙකු බවත්, තවත් අයෙක් මා බීලා නිදාගෙන සිටි බවත් කියමින් අස්ථානගත, අභූත කරුණු රාශියක් කිව්වා. මුහුණු පොත දිහා විතරක් බලලා දේශපාලනය කරනවා නම් ඒක තමයි තත්ත්වය.

අද ගරු විපක්ෂ නායකතුමා පමණක් නොවෙයි, තවත් කිහිප දෙනෙක්ම මා මෙතැන ඉන්නකොට, "අපි දිහා බලන්න. කියන දේ අහන්න" කිව්වා. ඒ කියන්නේ, අවධානය යොමු කරගන්න. නමුත් මා අවධානය යොමු කළේ නැත්තේ ඇයි? සාධනීය යමක් නොකියා වෛරය පතුරවන නිසා සහ වෙනත් දේශපාලන අරමුණු ඉෂ්ට කරගන්න කථා කරන නිසා. මා ඔබතුමන්ලාගේ මුහුණු බලන්නේ නැත්තේ මුහුණු කැත නිසා නොවෙයි, ඔබතුමන්ලාගේ හදවත කැත නිසා. නමුත් අනෙක් කරුණුවලට මම කන්දීලා තිබෙනවා.

මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළ වෙලාවේ මගේ නෑදෑයන්, යහළුවන්, හිතවතුන් ගොඩක් දෙනා කථා කරලා ඔවුන්ගේ සහාය මට පළ කළා. සමහර අය හිතනවා, මම යම් චකිතයකට, බියකට පත් වෙලා ඉන්නවා කියලා. මම එකක් කියන්නට ඕනෑ. මම ජාතික ජන බලවේගයේ නැතිව වෙන පක්ෂයක හිටියා නම් බය වෙනවා. ඇයි ඒ? ඒවායේ එකට ඉන්න මිනිස්සු ලක්ෂ තුන් හාරසියයක් අරගෙන එහා පැත්තට ගිහිල්ලා මට විරුද්ධව ඡන්දය දෙන නිසා. නමුත් මම ඉන්නේ ජාතික ජන බලවේගයත් එක්ක නේ. ඒ හින්දා මට ඒ බය තිබුණේ නැහැ.

අද මට සහාය දෙන්න කථා කරපු සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. හැබැයි, මම ජාතික ජන බලවේගයේ මගේ සහෝදර මන්ත්‍රීතුමන්ලාට ස්තුති කරන්න යන්නේ නැහැ. ඇයි ඒ? ඒ අය දන්නවා, ඔබතුමන්ලා නොදන්නා එක දෙයක්. අපි එකතු වුණේ අපට සියයට තුනක් තිබුණු කාලයේ. අපි එකතු වුණේ මේ සමාජය වෙනස් කරන්න. අපි එකතු වුණේ සහෝදරත්වයෙන්, විශ්වාසයෙන් පොදු අරමුණක් සඳහා. ඒ නිසා අපි එකිනෙකාට "thank you" හෝ "please" කියන්න ඕනෑ නැහැ. අපි හැමෝම අපේ පොදු අරමුණේ ඉන්නවා; ප්‍රතිලාභ නොලබා පොදු අරමුණේ ඉන්නවා. අපේ ජාතික ජන බලවේගයේ තිබෙන ශක්තිය නොදන්නා විපක්ෂය ගැන මට හරි දුකයි. මොකද, අපේ එකමුතුකම, සහෝදරත්වය තේරුම් ගන්නේ නැතිව ඔය වාගේ සද්ද දාලා ඔබතුමන්ලාට අප වෙනස් කරන්න තියා ඒ ගැන හිතන්නවත් බැහැ.

ඒ වාගේම මම විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. ඔවුන්ගෙන් සමහරු සමගි ජන බලවේගයේ අය. ඔවුන් මට කථා කළා. Calls දීලා කිව්වා, "ඔව්, අපි අත්සන් කළා තමයි, කියපු හින්දා. නමුත් අපට ඔයාත් එක්ක ප්‍රශ්නයක් නැහැ, හර්ෂණ. ඔයා වැඩේ හොඳට කරනවා" කියලා. ඉතින් මම ස්තුතිවන්ත වෙනවා සමගි ජන බලවේගයේ ඒ මන්ත්‍රීවරුන්ට, මට ලබා දීපු ඒ සහාය පිළිබඳව. මේක රහස් ඡන්දයක් වුණා නම්, බොහෝ වෙලාවට මට 159ට වඩා වැඩියක් ගන්න තිබුණා. මට කථා කරලා සහාය දැක්වූ සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන්ට වාගේම දෙමළ පක්ෂවල මන්ත්‍රීවරුන්ටත් ස්තුතියි.

ගරු විපක්ෂ නායකතුමා ඇහුවා, දවස් තුනක විවාදයක් දෙනවාද කියලා. He asked me in the Well of the House, "Will you give us a three-day debate on the Judiciary?" මම ඒ වෙලාවේ කිව්වේ එක දෙයයි. මේ පාර්ලිමේන්තුව තුළ කථා කරන්නේ මොනවාද කියලා Parliamentary Business Committee එකේ කථා කරන්න ඕනෑ, සභානායක එකඟ වෙලා තීන්දුවක් ගන්න ඕනෑ කියලායි. ඉතින් විපක්ෂ නායක විධියට එතුමා ඒ ගැන දන්නේ නැද්ද? එතුමා ඒ ඉල්ලීම මගෙන් කරලා හරියන්නේ නැහැ. ඒක කරන්න ඕනෑ තැන ගැනයි මා කිව්වේ; ඒ ගැනයි මා උත්තර දුන්නේ. එහෙම නැතුව, කාටවත් සමච්චල් කරන්න මට වුවමනාවක් තිබුණේ නැහැ.

අපි දැන් මේ අදාළ සිද්ධියට එමු. මීගමුව බන්ධනාගාරය තුළ වෙච්ච සිද්ධිය ගැන විශාල කනගාටුවක්, කම්පනයක් අපට තිබෙනවා. ඒ මිය ගියේ රැඳවියන්ද, නිලධාරීන්ද කියන එක නොවෙයි ප්‍රශ්නය. ඒ සියල්ල මනුෂ්‍ය ජීවිත. ඒක නොසිදුවිය යුතු දෙයක්. නමුත්, විපක්ෂයේ ඔබතුමන්ලා පෙන්වන්න උත්සාහ කළා, අධිකරණ ඇමතිවරයා වශයෙන් මා සහ ආණ්ඩුව මේ ගැන කිසිදු සැලකිල්ලක් දැක්වූයේ නැති බවක්. ඒක අසත්‍යයි. අපි මේ ප්‍රශ්න දැක්කේ බලයට ඇවිල්ලා මාස තුනක් යන්නත් කලින්. විපක්ෂයේ සමහරු මෙතැනදී කිව්වාට අපි නිලධාරීන් බඳවා ගෙන නැහැ කියලා, 1,000කට ආසන්න සංඛ්‍යාවක් recruit කිරීම අපි ආරම්භ කළා. දැනටමත් එය කෙරීගෙන යනවා. මොකද, අපි දන්නවා බන්ධනාගාරවලට කාර්ය මණ්ඩලය අවශ්‍ය බව. අපි ඒ කටයුතු ආරම්භ කළේ ගිය අවුරුද්දේ. මොකද, අපි දන්නවා ප්‍රශ්න මතු වන බව.

අපි බලයට එන විටත් බන්ධනාගාරවල තදබදය අධික ලෙස තිබුණු නිසා, තිබෙන බන්ධනාගාරවලම space වැඩි කිරීම සඳහා අපි මේ වන විටත් ව්‍යාපෘති 9කට ආසන්න ප්‍රමාණයක් - ගිය අවුරුද්දේ සිට - පටන් ගෙන තිබෙනවා. මේ අවුරුද්දේ ඒ බොහෝ ඒවා සම්පූර්ණ වෙනවා. අපි ඒ කටයුතු පටන් ගත්තේ ඒ අර්බුදය දැකපු නිසා. ඒ වාගේම අපි තේරුම් ගෙන තිබුණා, රස පරීක්ෂක වාර්තා ප්‍රමාදය තමයි පුද්ගලයෙකුට ඇප ලබා ගැනීමට තිබෙන බාධාව කියලා. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 118ක් තිබුණු නිසා අපි ඉස්සෙල්ලාම කළේ, ඒ දෙපාර්තමේන්තුවට පුද්ගලයන් බඳවා ගැනීමේ කටයුතු ගිය අවුරුද්දේම ආරම්භ කිරීමයි. ඒ වැඩ ටික දැන් අවසන් වෙලා තිබෙනවා. ඒ අනුව ජූලි 01වන දා ඉඳන් 60කට ආසන්න සංඛ්‍යාවක් එහි වැඩ කරනවා. අපි ඔවුන් සමඟ සාකච්ඡා කරනවා. ගරු ජනාධිපතිතුමාත් ඒ සඳහා directly මඟ පෙන්වීම් කරනවා. ඒ අනුව ඉතා ඉක්මනින් රස පරීක්ෂක වාර්තා 7,500ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දෙන්න සාකච්ඡා කරගෙන ඉවරයි. ඒ, මෙම සිද්ධිය ඇති වෙන්නත් කලින්.

ඒ වාගේම, රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින සෙනඟ අඩු කරන්න නම් හිර ගෙවල්ම හද හදා ඉඳලා හරියන්නේ නැහැ කියලා අප දන්නා නිසාත්, ඒවායේ ඇතුළේ ඉන්න සෙනඟ අඩු කරන්න අවශ්‍ය නිසාත් ජනාධිපති සමාව දීමේ ක්‍රමයක්

සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා වන කමිටුව පත් කළේ මීට මාස 6කට කලින්. අපට එම කමිටුවේ වාර්තාව දින කිහිපයකට පෙර ලැබුණා. ඒ අනුව අපට ඒ පිරිස අඩු කර ගන්න පුළුවන්. ඒ වාගේම රස පරීක්ෂක වාර්තා ඉක්මන් කිරීම හරහා ඒ සෙනඟ අඩු කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ කියන සිද්ධිය වෙන්නත් කලින් තමයි අපි සාකච්ඡා කළේ, පුද්ගලයන් රිමාන්ඩ් කරනවා වෙනුවට under house arrest තබන්න පුළුවන් තත්ත්වයට law එකක් හදලා ඒ සෙනඟ අඩු කර ගැනීම ගැන. මතක තබා ගන්න, අපේ රජයේ බලාපොරොත්තුව හැමෝම හිරේ තබන එක නොවන බව; හැමෝම රිමාන්ඩ් භාරයේ තබන එක නොවන බව. අප බලාපොරොත්තු වන්නේ ඒවායේ සිටින සෙනඟ අඩු කරන්නයි. රිමාන්ඩ් එකට මිනිසුන් යන එක නවත්වන්න නම් අවුරුදු 30ක්, 40ක් මේ රටේ තිබුණු ප්‍රචණ්ඩකාරී දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න ඕනෑ. එය වෙනස් නොකර අප බලාපොරොත්තු වන දෙය එක රැයින් වෙන්නේ නැහැ. ඒ වාගේම, ඒ පුද්ගලයන් එළියට ගැනීමේදී නිසි ලෙස පුනරුත්ථාපනය කළේ නැත්නම් - විශේෂයෙන්ම මත්ද්‍රව්‍යලෝලීන් - ඔවුන් නැවත එතැනට යන එක වළක්වන්න බැහැ. රටක සාර්ථකත්වය ඇති වන්නේ තිබෙන හිර ගෙවල් වැඩි වන එකෙන් නොවෙයි, තිබෙන හිර ගෙවල් අඩු වන එකෙන්. මේ සියල්ල තේරුම් ගෙන ඒ දිශානතියට තමයි අප මේ ක්‍රියාවලිය යොමු කළේ. එහෙම කටයුතු කරමින් සිටි අවස්ථාවේදී තමයි මේ අවාසනාවන්ත සිද්ධිය වුණේ.

මේ සිද්ධිය වෙච්ච දවසේ රාත්‍රියේ සිට මා ඒ ගැන දන්නවා; telephone හරහා සම්බන්ධ වෙනවා; උපදෙස් දෙනවා; බන්ධනාගාර කොමසාරිස් තීන්දු ගන්නවා. පහුවෙනි දා උදෑසන අපි සියල්ලම දන්නවා. නමුත් සමහරු කියන්නේ අපි බුදියගෙන හිටියා කියලා. කමක් නැහැ. ඔබ හිතනවා නම් ඒක ඇත්ත කියලා, එහෙම කියන්න. Sometimes, when I hear the way some of the MPs speak, I wonder whether they go home and kiss their wives and children with that same mouth they speak here. It is very unfortunate and ugly. Most probably, at the next election, you all will get your own results, we will see.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙසේ හෝ වේවා, ඒ සිද්ධියෙන් පසුව අවශ්‍ය සියලු විමර්ශන සිදු කරනු ලබනවා. යම් හෙයකින් අනීතික ලෙස නීතිය භාවිත කරලා ජීවිතයක් හානි කරලා තිබෙනවා නම්, එයට අදාළව නීතිය ක්‍රියාත්මක වෙනවා.

ඒ prison නිලධාරින් ඉතාම කෲර ලෙස ඝාතනය කරලා තිබුණා. ඒ සම්බන්ධයෙන් දැන් වන විට CID එකෙන් කට උත්තර 700 ගණනක් හෝ 800 ගණනක් අරගෙන තිබෙනවා. එතැනින් ඒ අපරාධකාරයන් අනාවරණ වුණාම, ඔවුන්ටත් මිනී මැරීම සම්බන්ධයෙන් නඩු පවරනවා.

ඒ විතරක් නොවෙයි, මේ වන විට ඒ සිද්ධිය නිසා මිය ගිය නිලධාරින්ගේ පවුල්වලට ලබා දිය හැකි සහන සහ ගෙවීම් සම්බන්ධ අවශ්‍ය කටයුතු කරනවා. දැනට යම් ගෙවීමක් කරලා තිබෙනවා. නමුත් ඒක ප්‍රමාණවත් නැහැ. තවදුරටත් කරන්න ඕනෑ ගෙවීම් සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් දාලා, කමිටුවක් දාලා ඉතා ඉක්මනින් ඔවුන්ට දෙන්න පුළුවන් සහන පිළිබඳ තීන්දු ගන්නවා. ඒ වාගේම, ඒ රැඳවියන් සම්බන්ධයෙනුත් ගත හැකි පියවර අපි සලකා බලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් අපි මොකක්ද කරලා තිබෙන්නේ? අවාසනාවන්ත සිද්ධියක් වුණා; නැවත සිදු නොවිය යුතු දෙයක් වුණා. ඒවා වළක්වන්න අවශ්‍ය පියවර අධිකරණ අමාත්‍යවරයා වශයෙන් සහ මගේ කැබිනට් මණ්ඩලයේ සහ මගේ කණ්ඩායමේ සහාය ඇතිව මම වගකීම් සහිතව ගනිමින් ඉන්නවා. ඒක අපි වසර එකහමාරක් විතර උත්සාහ කරමින් හිටපු දෙයක්. නමුත්, මේ අවාසනාවන්ත දෙය සිදු වුණා. අපේ වගකීම වන්නේ, නැවත එවන් දේවල් නොවන තැනට කටයුතු කිරීමයි.

හැබැයි, මෙතැන මතු වන ප්‍රශ්නය වන්නේ, මේ වෛරය මොකක් නිසාද එන්නේ කියන එකයි. නඩු අහන එක අප වේගවත් කරලා තිබෙන නිසා, අද අප ගෙනෙන්න හදන සංශෝධන නිසා, විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම නිසා තමයි මේ වෛරය එන්නේ.

මෙහිදී මා පැහැදිලි කරලා කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මෙතැනදී කථා කරන්න යෙදුණා, හිටපු බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය ගැන. ඔබතුමන්ලා දන්නවා, ඒක 2025දී වූ සිදුවීමක් බව. ඔහු ජනාධිපති සමාව ලබා දීලා තිබුණා, ලැයිස්තුවේ නොහිටපු අයෙකුට අනීතික ආකාරයකට. ඒ නිසා මතක තබා ගන්න, ඒක පෞද්ගලික පළිගැනීමක් හෝ මේකට සම්බන්ධ දෙයක් නොවන බව. ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කළා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55වන ව්‍යවස්ථාව අනුව විනය බලධාරියා වන්නේ කැබිනට් මණ්ඩලයයි. කැබිනට් මණ්ඩලයේ සහ E-Code එකේ තමයි, ඒ බලය තිබෙන්නේ. ඒ interdiction එක කරලා නීත්‍යනුකූලව ඔහුට විරුද්ධව charge sheet එකක් යොමු කරන්න අපි මේ වන විට නීතිය අනුව කටයුතු කරගෙන යනවා. ඒක පෞද්ගලික පළිගැනීමක් නොවෙයි. Explanations ඉදිරිපත් කළාට පස්සේ ඒ ගැන බලන්න ඕනෑ.

මම තුෂාර උපුල්දෙණිය මහත්මයාට දොස් පවරනවා නොවෙයි, මේ. නමුත්, විපක්ෂයේ කට්ටියක් පෙන්වන්න හදනවා, ඔහු හිටපු නැති නිසා මේ සිද්ධිය වුණා කියලා. ඒක වැරැදියි. මොකද, මා හිතන හැටියට මහර බන්ධනාගාරයේ සිද්ධිය වෙන්නේත් ඔහු බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වශයෙන් සිටින විටයි. මම ඔහු වැරැදියි කියලා කියනවා නොවෙයි. ඔබතුමන්ලා කියන බොරුවලට පිළිතුරක් වශයෙන් විතරයි මම ඒක කිව්වේ.

ඒ වාගේම, අපි උත්සාහ කරනවා නඩු ඇසීම වේගවත් කරන්න. මෙන්න මේක තමයි, මේ ආණ්ඩුවට එල්ල වන ප්‍රධාන ප්‍රහාරය. මොකද, ජනතාව අපට වරමක් දුන්නා, නඩු ඉක්මනට අහලා අවසන් කරන්න, දූෂිතයන්ට ඉක්මනට නඩු පවරන්න කියලා. අප බලයට එන විට කඩා වැටිලා තිබුණු ක්‍රමයක්, අපි මේ වන විට හදලා තිබෙනවා. අපේ රජය බලයට පත් වුණාට පස්සේ මේ මෑතකදී, අලුත් කඩේ, Commercial High Courts 2ක්, අල්ලස් නඩු - bribery cases - අහන්න උසාවි 3ක්, ශ්‍රෙගරි පාරේ සුළු හිමිකම් අධිකරණයක්, Permanent High Courts at Bar - ත්‍රිපුද්ගල ඒවා - 2ක් බෞද්ධාලෝක මාවතේ සහ විජේරාම මාවතේ පිහිටුවා තිබෙනවා. ඒ වාගේම, මාතර අතිරේක මහෙස්ත්‍රාත් අධිකරණය, වැල්ලවායේ තවත් දිස්ත්‍රික් උසාවියක්, තෙල්දෙනියේ, Magistrate's Court Complex - MCC - එකක් ඇති කළා. ඒ වාගේම පූගොඩ අධිකරණය අද විවෘත කළා. වාලච්චේනේ සහ කුච්චවෙලිවලත් අපි අධිකරණ විවෘත කර තිබෙනවා. ඒ වාගේම, මේ තදබදය අඩු කරන්න කොළඹින් පිට තවත් උසාවි 8ක හෝ 10ක අවශ්‍යතාව තිබෙනවා. ඒකට කාර්ය මණ්ඩලය බඳවා ගන්නවා. අපි ඒ කටයුතු වේගවත් කරනවා. අපි ඒ කටයුතු වේගවත් කිරීමේදී ඔය ඇතිවන වේදනාව, වෛරය සාධාරණයි. වැරැදි නොකරපු අය කවුරුත් මේකට බය වෙන්න අවශ්‍ය වන්නේ නැහැ. නමුත්, ඔබ මතක තබා ගන්න, අපි ජනතාවට දීපු පොරොන්දු ඉටු කරන ආණ්ඩුවක් බව. අපට කා එක්කවත් පෞද්ගලික ආරෝවක්, ආරාවුලක් නැහැ. හැබැයි, මේ භාර ගත්තු වැඩේ කරන්න ඕනෑ. මම භාර ගත්තු වැඩේ මම තනියම කරන්නේ නැහැ. අපේ මේ 159දෙනාම මට සහයෝගය

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

දෙනවා. ඒ, අපි හරි දේ කරන නිසා. So, never ever underestimate the fellowship, the brotherhood and the unity this party has. මම වරදක් කරනවා නම්, ඔබ විශ්වාස භංග ගෙනෙනකල් මගේ පක්ෂය හෝ මගේ සහෝදරවරු බලාගෙන ඉන්නේ නැහැ. ඔවුන් ඊට කලින් මාව ඉවත් කරලා හෝ මට ඉවත් වෙන්න කියලා. අපි ජනතාවට කන් දෙන මිනිස්සු. අද ජනතාව මට ඉවත් වෙන්න කියන්නේ නැහැ. ඒ වාගේම, මගේ සහෝදර ඇමතිවරු, මන්ත්‍රීවරු මට ඉවත් වෙන්න කියන්නේ නැහැ. මට ඉවත් වෙන්න කියන්නේ, ඇප පිට ඉන්න සෙට් එකක් සහ හිරේ යන්න බය සෙට් එකක්. ඉතින්, මම ඉවත් වෙන්නේ නැහැ.

අවසාන වශයෙනුත් මම ස්තුති කරනවා, දුරකථන ඇමතුම්වලින් මට සහාය පළ කරපු හිතවතුන්, ඥාතීන් ඇතුළු සියලුදෙනාට. මම කලින් කිව්වා වාගේ, මම මගේ මන්ත්‍රී මණ්ඩලයට ස්තුති කරන්න යන්නේ නැහැ. මොකද, අපි ඔක්කෝම පොදු අරමුණක කොටස්කාරයෝ හැටියට එකට ඉන්නේ. අවසාන වශයෙන් සහ වැදගත් ලෙස මා ස්තුති කරන්න ඕනෑ, සමඟි ජන බලවේගයේ මන්ත්‍රීවරු call කරලා මට දක්වපු සහයෝගයට. සමහරු මේකට කථා කරන්න එන්නේත් නැහැ කිව්වා, ඡන්දය දෙන්න එන්නේත් නැහැ කිව්වා. කෙසේ හෝ වේවා, එතුමන්ලාටත් ස්තුතියි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බිමල් රත්නායක සභානායකතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.08]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය හර්ෂණ නානායක්කාර මැතිතුමාට විරුද්ධව විපක්ෂයෙන් ඉදිරිපත් කරලා තිබෙන විශ්වාස භංග යෝජනාව ගැන කථා කරන මේ අවස්ථාවේ මම හිතන විධියට, අපේ අගමැතිතුමිය ඇතුළු අමාත්‍ය මණ්ඩලයත්, මන්ත්‍රීවරුත් ඇති තරම් කරුණු කිව්වා, මේ විශ්වාස භංග යෝජනාව ඇයි තර්කානුකූල, යථාර්ථවාදී නොවන්නේ කියන කාරණය ගැන. අපි ආණ්ඩුවක් වශයෙන් කිසිසේත්ම මීගමුව බන්ධනාගාරයේ වෙච්ච සිදුවීම අවතක්සේරු කරන්නේ නැහැ. ඒක විශාල කම්පනයක් ඇති කළ සිදුවීමක්. මොකද, ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අපි ඉතාම පැහැදිලිව ලියා තිබෙනවා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පිළිබඳව. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ මැතිවරණ ප්‍රකාශනය තුළ අපි ඒක සඳහන් කරලා තිබෙනවා. ඒ අනුව ගත්තොත්, බන්ධනාගාර තදබදය අවම කිරීම අපේ ප්‍රතිපත්තියක්. එහි මේ කරුණු සඳහන් වෙනවා. සැකකරුවන් දීර්ඝ කාලයක් රක්ෂිත බන්ධනාගාරගත කර තැබීම වෙනුවට ඇප ලබා දීමේ ක්‍රියාවලිය හා අධිකරණ කටයුතු කඩිනම් කිරීමට පියවර ගැනීම. ඊළඟට සුළු අක්‍රමිකතා හා පළමු වරට වරදකරුවන් වූවන් සඳහා ප්‍රජා වැඩසටහන් පදනම් කරගත් විකල්ප දඬුවම් ක්‍රම වෙත යොමුවීම. ඊට පස්සේ අපි ඇතුළත් කරලා තිබෙනවා, නීතිමය හා ආයතනික වෙනස්කම්. ඒ යටතේ නීතිපති දෙපාර්තමේන්තුව කාර්යක්ෂම කිරීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම, අධිකරණය ඩිජිටල්කරණය සහ විනිවිදභාවය, බන්ධනාගාර පද්ධතිය ඇතුළත දත්ත කළමනාකරණය වාගේ කාරණා සඳහන් වෙනවා. ඊට පස්සේ මූලික මානව හිමිකම් හා යටිතල පහසුකම් දියුණු කිරීම, බන්ධනාගාර තුළ සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය ජාල පාලනයට සහ දූෂණය වැළැක්වීමට දැඩි පාලන ක්‍රම යෙදවීම, සිරකරුවන්ගේ සෞඛ්‍ය පහසුකම් සහ මානසික සෞඛ්‍ය උපදේශනය සඳහා විශේෂ සෞඛ්‍ය වැඩසටහන් ආරම්භ කිරීම යනාදිය ඇතුළත් වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බන්ධනාගාරවල තිබෙන ගැටලු පිළිබඳව මැතිවරණයට කලින් අපි ජනතාවට දුන් පොරොන්දු තිබෙනවා. ජනතාවගෙන්ම කොටසක් තමයි බන්ධනාගාර ඇතුළේ ඉන්නේ. බන්ධනාගාර ඉස්සරහා ලියා තිබෙන්නේ "සිරකරුවෝද මනුෂ්‍යයෝය" කියලා. ඒ නිසා ඒගොල්ලන් මහා පරිමාණ "යක්ෂාකරණයකට" ලක් කරන්න ආණ්ඩුවක් වශයෙන් අපි කිසිසේත්ම සූදානම් නැහැ. අපි දන්නවා, අපට වැරැද්දක් වුණාම, අපේ ගෙදර කැඩුවාම, අපරාධ කළාම, හොරකම් කළාම, මිනී මැරුවාම ඒවා ගැන අපට තද, තනි වෛරයක් එන බව. තනි තනි පුද්ගලයන් වශයෙන් අපට තරහක් එනවා. නමුත් අපි ආණ්ඩුවක් විධියට සිරකරුවන්, ඒගොල්ලන්ගේ ඥාතීන් දිහා බලන්නේත් මේ රටේ පුරවැසියන් විධියට. ඒගොල්ලන් කවුරුවත් සියයට 100ක් තනියම වැරදි කරන්නේ නැහැ. ඇත්තටම බන්ධනාගාර කියන්නේ එක විධියකට ගත්තොත් සමාජ, දේශපාලන කළමනාකරණයේ අසාර්ථක වීම පිළිබඳ ප්‍රකාශනයක්. ඒක තනිකරම ඒ පුද්ගලයා මත පමණක් පටවන්න පුළුවන් දෙයක් නොවෙයි. නමුත් ශික්ෂණය කිරීම සඳහා යම් ආකාරයක දැඩි ක්‍රමත් අනුගමනය කරන්න ඕනෑ, උපදෙස්වලින්ම බැරි නිසා. ඉතින් අපි ඒවා කලින්ම දැකලා, ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න උත්සාහ කරන ආණ්ඩුවක්.

මම ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි, ඔය බන්ධනාගාර නිලධාරීන් 1,000ක් බඳවා ගන්න කැබිනට් මණ්ඩල පත්‍රිකාව හර්ෂණ නානායක්කාර ඇමතිතුමා ඉදිරිපත් කළ අවස්ථාවේදී රටේ පවතින නීති රීති රටාවලට අනුව තමයි අපට පළමුවැනි නිරීක්ෂණ හම්බ වුණේ. අපට මතකයි, ඒ නිලධාරින් බඳවා ගන්න ඉඩ දෙන්නේ නැත්නම් ඇති වෙන්න නියමිත සිදුවීම්වලට මේ කරුණු ලියපු පුද්ගලයන් වගකීම භාර ගන්න ඕනෑය කියන මට්ටමට ආනන්ද විජේපාල මහජන ආරක්ෂක ඇමතිතුමාත්, හර්ෂණ නානායක්කාර ඇමතිතුමාත්, ගරු ජනාධිපතිතුමාත් කැබිනට් මණ්ඩලයට අවධාරණය කරලා තමයි ඒ නිලධාරින් දහස බඳවා ගන්න කැබිනට් මණ්ඩලයේ අවසරය ගත්තේ. අපි දන්නවා, චක්‍රලේඛ හදන්නේ යම් කිසි නිශ්චිත මොහොතක බව. හැබැයි, සමාජයේ තත්ත්ව වෙනස් වෙන්නේ එහෙම නොවෙයි. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතියකට, ව්‍යවස්ථාවකට බැහැ සම්පූර්ණ සමාජ අවශ්‍යතා ආවරණ කරන්න. ඒ නිසා ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා ඇතුළු ආණ්ඩුව මේ ප්‍රශ්නය කල් තබා දැකලා අවශ්‍ය කටයුතු පටන් ගත්තා. ඒ මීගමුවේ මෙහෙම සිද්ධියක් වෙනවාද, නැද්ද කියන එක අනුව නොවෙයි. මෙහෙම දෙයක් ඕනෑ වේලාවක විය හැකියි කියන එක දැකලා ඒකට අදාළ කටයුතු පටන් අරගෙන තිබුණා. මේ රටේ ආණ්ඩු කරපු කවුරුත් දන්නවා, අපේ රටේ රාජ්‍ය සේවයට නිලධාරින් 1,000ක් බඳවා ගැනීම සඳහා අනුමත කර ගන්න කොපමණ අමාරුද කියලා. ඒක කවදාවත් මාසයකින්, දෙකකින්, තුනකින් කර ගන්න පුළුවන් දෙයක් නොවෙයි. නමුත් අපි ඒ ප්‍රතිසංස්කරණ ආරම්භ කරලා තිබෙනවා.

ඒ වාගේම ඔබතුමාත් දන්නවා, බන්ධනාගාරයේ සියයට 70ක් විතර ඉන්නේ කුඩුවලට සම්බන්ධ අය බව. ඒ වාගේම විවිධ හේතු මත ඇප නැතුව ඉන්න අය. මම හිතන හැටියට කුඩු සම්බන්ධයෙන් ඉන්න පිරිස සියයට 70ට වඩා වැඩියි. අපි සාමාන්‍යයෙන් දන්නා දේ තමයි කුඩු ගහලා ඇතුළට ගියාම කුඩු මුදලාලි කෙනෙක් වෙලා එළියට එන එකක් තමයි බන්ධනාගාරවල තිබෙන්නේ කියන එක. ඒක තමයි ඇත්ත දේ. නමුත් අපි අතිවිශාල වශයෙන් මැදිහත් වෙලා "ඉවත් වෙනු" කියලා මත්ද්‍රව්‍ය පාලනය පිළිබඳව දැවැන්ත වැඩසටහනක් ආරම්භ කරලා තිබෙනවා. ඒකේ විශේෂම දේ මොකක්ද? පෘතුගාලය ගත්තොත්, 2001-2003 වාගේ කාලයේ මත්ද්‍රව්‍ය උවදුරට විරුද්ධව ලෝකයේ ඉතාම පැහැදිලි වැඩසටහනක් කරපු රටක්. ඒක එක්තරා success story එකක්. පෘතුගාලය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච අය ලෙඩ්ඩු ලෙස තමයි සැලකුවේ. සිරකරුවෝ අපරාධකරුවෝ ලෙස නොවෙයි සැලකුවේ. අපිත් එය පටන් අරගෙන තිබෙනවා. ඔබතුමා දන්නවා, ඔබතුමා නියෝජනය කරන කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගරයේ මට්ටක්කුලිය වෙන්න පුළුවන්, දෙහිවල වෙන්න පුළුවන්, ඒ තැනින් තැනට, ගෙයින් ගෙට පොලීසියේ නිලධාරින්, අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරින්, ජාතික ජන බලවේගයේ සම්බන්ධීකරණ සභාපතිතුමන්ලා ස්වේච්ඡාවෙන් ගිහිල්ලා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච ළමයින්ට කිව්වා ඇවිල්ලා භාර වෙන්න, හිරගෙවල්වල දාන්නේ නැතුව වෙනත් ස්ථානවල පුනරුත්ථාපනය කරනවා කියලා. මම හිතන විධියට, මෑතකදී අධිකරණ අමාත්‍යාංශයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, සමාජ සේවා අමාත්‍යාංශයේ නිලධාරින් මැදිහත් වෙලා දෙහිවල ප්‍රදේශයේ එහෙම තරුණ පිරිසක් ඉතාම හොඳින් rehabilitate කරලා, ඒ තරුණ දරුවන්ට ඉතාම හොඳ වැඩසටහනක් ආරම්භ කරලා තිබෙනවා. මම ඒ තොරතුරු දැන ගත්තා. මොකද, සිරකරුවෙකුට වැඩිපුරම අවශ්‍ය වන දේ සමහර විට ආදරය, පිළිගැනීම වෙන්න පුළුවන්. ඉතින් ඒ වාගේ ඉතා හොඳ වැඩසටහනක් ආරම්භ කරලා තිබෙනවා. ඒ නිලධාරින් ස්වේච්ඡාවෙන් ගෙයින් ගෙට ගිහිල්ලා, පුනරුත්ථාපනයට කැමතිද කියන වැඩසටහන පටන් අරගෙන තිබෙනවා. මේගොල්ලෝ බලයේ හිටියා නම්, ඒ කට්ටියටත් පරණ විධියටම මොකද කරන්නේ? ඒගොල්ලනුත් ගෙනිහිල්ලා බන්ධනාගාරය ඇතුළට තමයි දාන්නේ. තල්මසුන් ඇල්លුවේ නැති වුණාට හැම ආණ්ඩුවකින්ම කුඩු ගහන කට්ටිය ඇල්ලුවා නේ. නමුත්, ඒ යහපත් කටයුතු පටන් අරගෙන තිබෙනවා, අධිකරණ අමාත්‍යාංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ මේ ආණ්ඩුව. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම ගත්තොත්, ඒක මානසික රෝගයක්. ඒක ලෙඩක්. ඒක නිසා අපි ඒ වැඩසටහන් පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම බන්ධනාගාරවලට යන හැම කෙනෙක්ම කුඩු මුදලාලි කෙනෙක් වෙලා එළියට එනවා වෙනුවට නැවත සාමාන්‍ය පුරවැසියෙක් වෙන්න පුළුවන් තත්ත්වය ඇති කරන්න අපි පටන් අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම වෙනුවෙන් දැන් ඩිජිටල් තාක්ෂණය අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු online file කරන්න පුළුවන්. ඒ විධියට නඩු කටයුතු කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒක තව ගොඩක් පහළට යන්න ඕනෑ. ඒ වාගේම ඔබතුමා දන්නවා, අපි කිසිම අවස්ථාවක මිනිස්සු demonize කරලා, මිනිස්සු යක්ෂයෝ කරලා ඒගොල්ලන්ට පහර දෙන්න අවස්ථාවක් හදලා නැහැ කියන එක. අපි කිසිම ජන කොටසක් - සිරකරුවෝ පවා - යක්ෂාකරණය කරන්න දෙන්නේ නැහැ. මොකද, සිරගත කිරීම කියන එක ලෝකයේ එතරම්ම සාර්ථක වෙච්ච ක්‍රමයක් නොවෙයි, නේ. ඒක කර ගන්න දෙයක් නැතිකමට කරන දෙයක්. ලෝකයේ අපරාධ අඩුවීම මේ සිරගත කිරීම නිසාම වෙලා තියෙනවාද කියන කාරණය ගත්තොත්, ඒක විශාල විවාදයක්. නමුත් මම කියන්නේ නැහැ, ඒ නිසා හිරගෙවල් වහන්න ඕනෑ, ඒ ඔක්කෝම කට්ටිය එළියේ තියන්න ඕනෑ කියලා. එහෙම තත්ත්වයකුත් ලෝකයේ නැහැ. නමුත් අපි ආණ්ඩුවක් විධියට මේ ප්‍රශ්න විසඳන්න මානුෂීය, විද්‍යාත්මක ප්‍රවේශයක් අරගෙන තිබෙනවා, ප්‍රායෝගිකව.

ඒ වාගේම අපි දන්නවා, අපේ රටේ අපරාධ රාජ්‍යයක් නිර්මාණය කළා කියලා පැවති ආණ්ඩුවලින්. ඒ අපරාධ රාජ්‍යයෙන්, ඒකට උදවු කරන දේශපාලනඥයන් පමණක් නොවෙයි, නිලධාරින් පිරිසකුත් හැදුවා. ඒ අතර පොලීසියේ, අධිකරණ සේවයේ, බන්ධනාගාර සේවයේ විවිධ අංශවල පුද්ගලයන් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, එක උසාවියකට නීති පොතක් ඇතුළට දාලා පිස්තෝල ගෙනාවේ කවුද කියලා. ඒකට උදවු කළා කියලා දැන් සලකන්නේ නීතිඥවරියක්. මම දන්නේ නැහැ, එතුමියත් අර නාමල් මන්ත්‍රීතුමා වාගේ Bar Association එකේ සාමාජිකත්වය ගත්ත කෙනෙක් ද කියලා. මම හිතන විධියට එතුමිය හරියට විභාග ලියලා එහි සාමාජිකත්වය ගත්ත කෙනෙක්. මම දැක්කා නාමල් රාජපක්ෂ මැතිතුමා Bar Association එක ගැන මොනවා හරි අහනවා. මම ඒ වෙලාවේ සභාවේ හිටියේ නැහැ. මම හිතන්නේ, සාමාජිකත්වය ගැන තමයි ඇහුවේ. මම දැනගන්න කැමැතියි, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා Bar Association එකේ සාමාජිකත්වය ගත්තේ කොහොමද කියලා. හැබැයි හරියට ගත්ත අයත් පස්සේ සවුත්තු වෙනවා. මම දන්නා තරමින් අර පිස්තෝලය දීලා තිබෙන්නේ එහෙම කෙනෙක්. අපරාධ රාජ්‍යය හැදුණාට පස්සේ අපරාධ රාජ්‍යය ඇතුළේ එහෙම දේවල් සිද්ධ වෙලා තිබෙනවා.

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ කියන්නේ ක්‍රියාවලියක්. එම ක්‍රියාවලිය අධිකරණ ඇමතිතුමා, අධිකරණ අමාත්‍යාංශය, වර්තමාන ජාතික ජන බලවේග ආණ්ඩුව පටන් ගෙන තිබෙනවා. ඒවාට අද පැහැදිලි සාක්ෂි තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුවක් බලන්න ඕනෑකම තිබෙන්නේ එක සිද්ධියක් පමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා දන්නවා, එතුමන්ලා හදිසි නීතියට කොච්චර නම් විරුද්ධ වුණාද කියලා. එතුමන්ලාම තමයි "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ හදිසි නීතිය දාන්න කිව්වේ. ඒ හදිසි නීතිය කාට විරුද්ධවද අපි පාවිච්චි කළේ? අපි කිසිම කෙනෙකුට, කණ්ඩායමකට විරුද්ධව හදිසි නීතිය පාවිච්චි කළේ නැහැ. අපි පවත්වාගෙන යන්නේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක්. ඒ නිසා තමයි අපි Global Peace Index එකේ ස්ථාන 33කින් - මට මතක හැටියට - ඉහළට ඇවිල්ලා තිබෙන්නේ. ප්‍රජාතන්ත්‍රවාදී දර්ශකවලට බන්ධනාගාරවල විධිමත් පාලනය කියන එකත් සලකා බලනවා. අපි ඒකේත් ස්ථාන ගාණකින් උඩට ඇවිල්ලා තිබෙනවා. මෙතැනදී ඇති වුණු විවාදය, අනෙක් පැත්තෙන් ආපු තර්කය තමයි මීට කලින් බන්ධනාගාරවල මැරිලා තිබෙන්නේ සිරකරුවන් පමණයි, මේ සැරේ තමයි නිලධාරින් මැරුණේ කියන එක. ඒකෙන් ඔප්පු වෙන්නේ මොකක්ද? මීට කලින් බන්ධනාගාර සිරකරුවන් මැරිච්ච හැම වෙලාවේම දේශපාලන උසිගැන්වීම් මත තමයි එය සිද්ධ වුණේ, 1983 කළු ජූලියේ සිටම. ආණ්ඩුවල දේශපාලන projects ලෙස තමයි තමන්ට හිතවත් නිලධාරින් යොදාගෙන බන්ධනාගාරවල ඒ මිනීමැරුම් කළේ. ඒවායින් තමයි ජාත්‍යන්තර වශයෙන් ලංකාව කළු වුණේ. ඇත්තටම මෙතැන දහදෙනෙක් මැරුණේ නිරායුධ නිලධාරින්. ඒ මිනිසුන්ගේ නිරායුධකම කියන්නේ, ඒගොල්ලන් බන්ධනාගාර සිරකරුවන්ට සාධාරණ ලෙස සැලකුවා කියන එක මම විශ්වාස කරනවා. ඒක මත්ද්‍රව්‍යවලට සහ පාතාලයට එරෙහිව ආණ්ඩුව දියත් කරන ප්‍රහාරයට විරුද්ධව කුඩු ජාවාරම් කල්ලි විසින් බන්ධනාගාර තුළින් හදපු ප්‍රහාරයක් කියලා තමයි අපි විශ්වාස කරන්නේ.

මෙතැනදී ඒ බන්ධනාගාර නිලධාරීන් නීත්‍යනුකූලව කටයුතු කරලා තිබෙනවා. නීත්‍යනුකූලව කටයුතු කළ නිලධාරින්ව තමයි ඒ මරා දැම්මේ. දසදෙනෙක් duty එකේදී මැරිච්ච එක ප්‍රශ්නයක් තමයි. ඒකෙන් ඔප්පු වෙන්නේ මොකක්ද? UNP, ශ්‍රී ලංකා නිදහස්

[ගරු බිමල් රත්නායක මහතා]

පක්ෂ ආණ්ඩුවලින් ඔවුන්ට කොතරම් නරක සංස්කෘතියක් උරුම කරලා දීලා තිබුණත්, අධිකරණ ඇමතිතුමාගේ මැදිහත්වීම මත සහ මේ ආණ්ඩුව හදලා තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ඇතුළේ එම බන්ධනාගාර නිලධාරීන් ඔවුන්ට උරුම වෙලා තිබුණු ඒ නරක, ජඩ, මිනීමරු සංස්කෘතිය පැත්තක තියලා වෘත්තීයමය විධියට කටයුතු කරලා තිබෙනවා කියන එක. මම විශ්වාස කරනවා, - මට තොරතුරු නම් නැහැ - බන්ධනාගාර නිලධාරින්ගේම තුවක්කු පැහැරගෙන තමයි සමහරවිට ඇතුළේ වෙඩි තියලා ඇත්තේ කියලා. මෙතැන ක්‍රියාවලියක් පටන් ගෙන තිබෙනවා. ඒ ක්‍රියාවලිය විද්‍යාත්මක, මානුෂීය ප්‍රවේශයක්. ඒ නිසා තමයි අන්තර්ජාතික වශයෙන්, - මොන ප්‍රශ්නය ඇහුවත් - මේ සිද්ධිය සම්බන්ධයෙන් විශේෂ විවේචනයක් අධිකරණ අමාත්‍යවරයාට හෝ අමාත්‍යාංශයට නැත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්නේ ඇයි? සමහරවිට විපක්ෂයට යම් මාධ්‍ය අවස්ථාවක් තිබෙනවා. මොකද මේ සිද්ධියේ බරපතළකම අපි පිළිගන්නවා නේ. හැබැයි ඒක අධිකරණ ඇමතිතුමාට විරුද්ධව ඉදිරිපත් කරමින් ඔබතුමන්ලා විවාදයේදී මතු කළ කරුණුවල කිසිම content එකක් නැහැ, නිකම් හිස් විවේචනයක් විතරයි තිබෙන්නේ. ඒ නිසා නේ ඔබතුමන්ලාගේ මන්ත්‍රීතුමන්ලා හර්ෂණ ඇමතිතුමාට කථා කරලාත් තිබෙන්නේ. මම කියන්නේ ඇත්තටම ගත්තොත් ඒක විවේචනයක් නොවෙයි. සමහර මිනී මැරුම්වලදී, සමහර බන්ධනාගාර අපරාධවලදී, - වැලිකඩ, රාගම සිද්ධිවලදී - ඇමතිවරු කටයුතු කළ විධිය අපි දන්නවා. ඒකයි මම කියන්නේ මේකේ පදනමක් නැහැ කියලා. මේ විශ්වාසභංග යෝජනාවේ පදනමක් නැහැ. මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න ඊයේ විපක්ෂ නායකතුමා කැඳවලා තිබුණා නේ සමස්ත විපක්ෂයේම එකතුවක්. මොකක්ද ඒ හේතුව? විපක්ෂ නායකතුමාට මොකක් හරි දෙයක් ඉතුරු වෙලා තිබුණා නම් ඒක නැති කර ගත්ත එක තමයි ඊයේ සිද්ධ වුණේ. ඊයේ හිටියේ කවුද? ඊයේ හිටියේ බන්ධනාගාර ඇතුළේ සැකකරුවෝ මරන්න අණ දුන් ආණ්ඩුවල හිටපු ඇමතිවරු. පෝලිම් ගස්සවලා වෙඩි තියද්දී හිටපු කට්ටියත් එක්ක තමයි ඊයේ විපක්ෂ නායකතුමා එකතු වෙලා සාකච්ඡාව කළේ. එය අමු ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක්. අර කිව්වා වාගේ, හිටියේ අධිකරණයේ නඩු තිබෙන කට්ටිය.

අද අපට පෙනෙන දේ තමයි, විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායමට සිද්ධ වෙලා තිබෙන්නේ - මෙතැන ඉන්නවා පහුගිය කාලයේ මහා පරිමාණයෙන් මේ රට විනාශ කළ, අන්තර්ජාතිකව මේ රට හුදකලා කරන්න කටයුතු කළ රාජපක්ෂලා සහ ඒ අයට කඩේ ගිය වෙනත් කණ්ඩායම්වල විශාල පිරිසක්. එතැන දූෂිතයන් රාශියක් ඉන්නවා. ඒ දූෂිතයන් රාශිය දැන් බලනවා මොකක් හෝ ක්‍රමයකින් අධිකරණය යොදාගෙන ආණ්ඩුවට ගහන්න. ඇත්තටම මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ බන්ධනාගාර සම්බන්ධ ප්‍රශ්නය නිසා නොවෙයි. අද ආණ්ඩුව අධිකරණ ක්‍රියාවලිය සාර්ථකව කරගෙන යනවා. මම අවංකව විශ්වාස කරනවා, ලංකාවේ අමාත්‍යාංශ ගත්තොත් මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඉතා හොඳ වැඩ කොටසක් කරන බව. මා මෙහෙම කියන්නේ, එය ජනාධිපතිතුමාගේ අමාත්‍යාංශය නිසා නොවෙයි. මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරියට කටයුතු කරපු නිසා තමයි Metro bus වෙන්න පුළුවන්; තවත් බස් රථ වෙන්න පුළුවන්, අපි ඒවා ප්‍රවාහනයට යොදවා තිබෙන්නේ. සල්ලි නැත්නම් ඒවා කරන්නේ කොහොමද? නැත්නම් අපි වැටුප් වැඩි කරන්නේ කොහොමද? මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විශාල සේවයක් කරලා තිබෙනවා.

ලංකාවේ මිනිසුන්ගේ ජන වරමේ ලොකුම අපේක්ෂාව තමයි නීතිය සාධාරණව සහ යුක්ති සහගතව ඉටු කරමින් දූෂිතයන්ට, මංකොල්ලකරුවන්ට දඬුවම් දෙන්න කියන එක. ඒ අනුව ගත්තොත්, ප්‍රවාහන අමාත්‍යාංශය වාගේ දෙගුණයක්, තුන් ගුණයක් ඉස්සරහට ගිහින් වැඩ කරලා තිබෙන අමාත්‍යාංශයක් තමයි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය කියලා මම අවංකවම හිතනවා. එය අති දැවැන්ත අවදානමක් අරගෙන කටයුතු කරනවා. බස් එකක් පාරට දානවා වාගේ නොවෙයි නේ, කුඩු ජාවාරම්කාරයෙකුව arrest කරන එක. අලුතින් කෝච්චියක් ධාවනයට යොදවනවා වාගේ නොවෙයි, කුඩු ජාවාරම්කාරයෙකුව අත්අඩංගුවට ගන්න එක. ඒ නිසා අපේ ජන වරමේ අපේක්ෂා අනුව ගත්තොත්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය කියන්නේ වැඩිම වැඩ කොටසක් කළ අමාත්‍යාංශ දෙක තුනෙන් එකක්. ඒක තමයි ඇත්ත. නැත්නම් මේවා කොහොමද වෙන්නේ? නීතිපති දෙපාර්තමේන්තුව ගැන සැලකිය යුතු විවේචන තිබුණා. තවමත් තිබෙනවා. නමුත් ඒ අස්සේ වැඩ කොටසක් කරලා නැත්නම් අද රාජපක්ෂලා පෝලිමේ උසාවි යන්නේ කොහොමද? එහෙම නම් අද රජපක්ෂලා පෝලිමේ උසාවි යන්නේ කොහොමද කියන්න? කවුරු හරි හිතුවා ද, රාජපක්ෂලාට උසාවි නියෝග එයි කියලා? එහෙම නම් අධිකරණ අමාත්‍යාංශය නිකම් ඉඳලා ද? අධිකරණ ඇමතිතුමා නිකම් ඉඳලා ද? අපි ඒකයි කියන්නේ. මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු වෙනස වෙනුවෙන් අපි කණ්ඩායම වැඩ කරනවා කියන එක. ඒක හරි. නමුත්, ඒ අතර ඉතාම ප්‍රමුඛව වැඩ කරන මිනිස්සු ටිකක් ඉන්නවා. ඒ අයව අගය කරන්නයි ඔබතුමන්ලාට තිබෙන්නේ. ඔබතුමන්ලා කවදාවත් විශ්වාස කරන්න එපා, පරණ දේශපාලන ක්‍රමවලට ගිහිල්ලා ඔබතුමන්ලාට බලය ගන්න පුළුවන් කියලා. එහෙම නම් ඔබතුමන්ලාට වෙනම ජනතාවකුත් ගෙනෙන්න වෙයි; 1977දී ඡන්ද දුන්න කට්ටිය නැවත ගෙනෙන්න වෙයි. ජනතාව වෙනස් වෙලා තිබෙන්නේ. ඒ වෙනසේ ලොකුම කාර්යභාරයක් කළ අමාත්‍යාංශ තමයි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය හා මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය. ඒක නිසා අපි ඔබතුමන්ලාට කියන්නේ මේකයි. ඇත්තටම ගත්තොත්, මේ විවේචනයේ පදනමක් නැහැ. අපි ආණ්ඩුවක් වශයෙන් මේ කටයුතු සම්පූර්ණ කරන්න කටයුතු කරනවා. අඩුපාඩුවක් වෙලා තිබෙන බව අපි දන්නවා. එම අඩුපාඩු සම්පූර්ණ කරගෙන ඉස්සරහට යන්න අපි උපරිම වශයෙන් කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. අපි කණ්ඩායමක්. ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමියට අද මෙතැන ඉතා තිරශ්චීන විධියට කැත කථා කියමින් පහර දුන්නා. අපි කියන්න කැමැතියි, එක

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

විරුද්ධව මන්ත්‍රීවරු 159කුයි, ජනාධිපතිවරයෙකුයි ඇතුළු ජාතික ජන බලවේගයේ අපි ඔක්කෝම ඉන්න බව. එකිනෙකා වෙනුවෙන් අපි ඉන්නවා. මේ රටේ යුක්තිය වෙනුවෙන් සටන් කරන මන්ත්‍රීවරු වෙන්න පුළුවන්, ඇමතිවරු වෙන්න පුළුවන්, අපි ඒ ඔක්කෝම අය ආරක්ෂා කරනවා. අපි ඉස්සරහට ගිහින් ඒ අයව ආරක්ෂා කරනවා. ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමාට අපි ආදරය කරන්නේ ඒ නිසායි. ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමියට අපි ආදරය කරන්නේ ඒ නිසායි. විශේෂයෙන්ම ආනන්ද විජේපාල ඇමතිතුමා. ඇත්තටම භය හිතෙනවා, එතුමාට මොනවා හරි කරයි කියලා. මොකද, මහා පරිමාණ බරක් දරාගෙන වැඩ කරනවා. එතුමා මහා පරිමාණ අපරාධකරුවන්ට විරුද්ධව වැඩ කරනවා. අපි ගරු කරන්නේ ඒ මිනිසුන්ගේ content එකට. නැතුව, අර වාගේ නිකම් පුස් වෙඩි නොවෙයි. අපි බලවේගයක්

විධියට, ව්‍යාපාරයක් විධියට, ජන වරම වෙනුවෙන් වැඩ කරන අපේ ජනාධිපතිවරයා ද, අගමැතිතුමිය ද, ඇමතිවරු ද ඇතුළු අපේ කොට්ඨාස සභාවේ අන්තිම සාමාජිකයා ද ආරක්ෂා කරනවා. ජන වරම වෙනුවෙන් වැඩ කරන ඒ සියලුදෙනා අපි උපරිමයෙන් ආරක්ෂා කරනවා. ඒ ආරක්ෂා කරන්නේ ජන වරම වෙනුවෙන්ම බව ප්‍රකාශ කරනවා.

ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා ගැන අපේ තිබෙන ආදරය, එතුමාගේ හැකියාව ගැන කථා කරන්න මේ අවස්ථාව ලබා දීම ගැන විපක්ෂයට ස්තුතිවන්ත වන ගමන්, මට විනාඩි දෙකක් විතර වැඩිපුර ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද දිනයේ වැඩකටයුතු අවසන් වනතෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.28]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අධිකරණ ඇමතිතුමා දෙවරක්ම ප්‍රකාශ කළා, අපේ විපක්ෂයෙන් call ආවා, call ආවා කියලා. එතුමා ඒක මටත් කිව්වා, මහදී මුණ ගැහුණාම. හැබැයි, එතුමා ඒ කථාව එතැනින් නැවැත්තුවා නම් ලස්සනයි. නමුත්, ඒ කථාව එතුමා එතැනින් නවත්වන්නේ නැතිව කිව්වා, අපි ඡන්දය දෙන්නේත් නැහැයි කිව්වා කියලා. ඒක අපි පිළිගන්න ඕනෑද කියලා මම අහනවා. මොකද, එක කාලයක ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් අපට කථා කරලා දොස් කියනවා, දුක්ගැනවිලි කියනවා කිව්වාම එතුමා ඒවා පිළිගත්තේ නැහැ. එහෙම තමයි, අපි එතුමන්ලාටත් කථා කරනවා. එතුමාට මමත් කිව්වා, අපට පෞද්ගලිකව එතුමා එක්ක කිසිම තරහක් නැහැ කියලා. අපි එහෙම වෛරය පතුරන දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. අපට එතුමාත් සමඟ කිසිම ප්‍රශ්නයක් නැහැ. This is not about personal animosity, but about ministerial responsibility, and it is our attempt to make the Government responsible and accountable. That is all. අපි එහෙම වෛරය පතුරන්නේ නැහැ. වෛරය පතුරලා ආපු ඔබතුමන්ලා ඒක ගැන හොඳටම දන්නවා. ඒක නිසා මතක තබාගන්න, අපි කථා කරන්න ඕනෑ වෙලාවට කථා කරනවා, අනෙක් වෙලාවට අපි ආණ්ඩුවත් සමඟ ඒ ගනුදෙනුව විසඳා ගන්නවා, දේශපාලනිකව. එහෙම තමයි අපි කටයුතු කරන්නේ.

පොල්දූව හන්දියට ඇවිල්ලා, "පාර්ලිමේන්තුවට ගිනි තියමු, වරෙල්ලා" කියලා කිව්වේ එතුමාම නොවෙයිද? වෛරය පතුරලා ඇවිල්ලා දැන් කියනවා, අපි කථා කරනවා කියලා. බනිස් ගෙඩියක් හරි දීලා කථා කරනවා තමයි, අපට පෞද්ගලිකව එහෙම තරහක් නැහැ. ඒ නිසා ඒක කියන්න එපා.

ඊළඟට, මීගමුව බන්ධනාගාරයේ ප්‍රශ්නයට අදාළව එතුමාගේ වගකීම සම්බන්ධයෙන් මට කලින් කථා කළ සියලු මන්ත්‍රීතුමන්ලා කථා කළා. අපේ ආකාෂ් නිලුපුල් මහත්මයා කියනවා මම දැක්කා, විශ්වාස භංග ගෙනෙන එක විතරයි අපි කරන්නේ, අපට බැරි දේවල් කරන්න හදනවා කියලා. ආකාෂ් නිලුපුල් නේද, නම? මේ විධියට බැලුවොත්, කිසිම විපක්ෂයට ආණ්ඩුවකට එරෙහිව විශ්වාස භංගයක් ගෙනෙන්න බැහැ. මොකද, අපි විපක්ෂයේ ඉන්නේ ඒ අවශ්‍ය මන්ත්‍රී ධුර 113 නැති නිසායි. එහෙම නැතිව දිනන්න විශ්වාස භංග ගෙනෙනවා නම් මෙතැන දාලා වැඩක් නැහැ නේ. මොන කෙහෙල් මලක් ද ඒ කියන්නේ? අපි කලින් ගෙනාපු විශ්වාස භංග යෝජනා පැරදුණාට ජනතා අධිකරණය ඉස්සරහට ගිහිල්ලා ඒවා ඔප්පු වෙලා තිබෙනවා නේ. මෙතුමා කියනවා, අපේ 40ත් එක්ක විපක්ෂයේ ඔක්කෝම 60 ගණනක් ඉන්නවා, නමුත්, මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ 37යි කියලා. කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයාට විරුද්ධව අපි තමයි විශ්වාස භංග යෝජනාව ගෙනාවේ. එය ගෙනාවාම ඔයගොල්ලන් අත්සන් කළාද? එතකොට අගමැතිතුමිය හිටියා. අගමැතිතුමිය අත්සන් කළාද? අත්සන් කළා. හැබැයි, කෝ අනුර ජනාධිපතිතුමාගේ අත්සන? පෙන්වන්නකෝ. එහෙම තමයි, මෙතැන ඉන්න හැමකෙනාම මේවාට අත්සන් කරන්න ඕනෑය කියලා නීතියක් නැහැ. විශ්වාස භංග යෝජනාව ගෙනැත් තිබෙනවා. ඔයගොල්ලන්ට කියන්න ඕනෑ ටික කියන්න. නිකම් බයිලා කියන්න එන්න එපා. මෙතැන ඉන්න ප්‍රමාණය අනුව විශ්වාස භංග ගෙනෙන්න හිටියොත්, අපට මේ අවුරුදු පහේදී කවදාවත් එහෙම එකක් ගෙනෙන්න බැහැ. ඒක නේ ඇත්ත කථාව. ඒ නිසා විශ්වාස භංගයක තේරුම මොකක්ද කියන එක මුලින් තේරුම් ගන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බන්ධනාගරයේ කථාව පටන් ගන්න කලින් දෙයක් කියන්නම්. අපේ අර්චුනා මන්ත්‍රීතුමා ඒක හරියට කිව්වා. කොහොම කොහොම කිව්වත් එතුමා ඒක හරියට කිව්වා. කථා කරන්න, කථා කරන්න ඒ පවුල්වල අයට කොච්චර දුක හිතෙනවා ඇතිද කියලා එතුමා කිව්වා. බන්ධනාගාර නිලධාරින්ටත්, ඒ නිලධාරින්ගේ පවුල්වල අයටත්, රැඳවියන් සහ ඒ අයගේ පවුල්වල අයටත් අපේ කනගාටුව මුලින්ම ප්‍රකාශ කරන්න ඕනෑ. අපි කථා කරද්දී එහෙම වෙනවා ඇති. හැබැයි, මේක රටේ අවශ්‍යතාවක් නිසා අපි මේක කරනවා මිසක් ඒගොල්ලන්ගේ හිත් රිදවන්න මේක කරනවා නොවෙයි කියන එක විශේෂයෙන්ම කියන්න අවශ්‍යයි.

භාරකාරත්වය, රැකවරණය කියන මේ ඔක්කෝම තිබුණා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ. ජනාධිපතිතුමාත් මෙතැන කිව්වා, මේ සිද්ධිය සම්බන්ධව ආණ්ඩුව වගකීම භාර ගන්න ඕනෑය කියලා. UN එකෙනුත් ඒක කියලා තිබෙනවා, හරි ඒ ඔක්කෝම හරි, ඒක පිළිගන්නවා කිව්වා. අපිත් පිළිගන්නවා. එතැනින් ඒ කථාව නතර කරමු. ඒක ආණ්ඩුවේ වගකීම. හැබැයි, වගවීම කාගෙද කියන එක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය වන්නේ. ඒක ගැන අපි කථා කරන්න අවශ්‍යයි. ඒක පැත්තකින් තිබ්බත්, හැම ප්‍රශ්නයකදීම වාගේ මේකෙදිත් මේ රට දෙකට බෙදන්න, මතවාද දෙකක් හදලා තමන්ට කැමැති අය හොඳ මිනිස්සු, අනෙක් අය කුඩුකාරයෝ යනාදී වශයෙන් තමයි කියන්න ගත්තේ. මේ ප්‍රශ්නයේදීත් බන්ධනාගාර නිලධාරින්ගේ පැත්තට එක කොටසක් බෙදලා, රැඳවියන්ගේ පැත්තට තව කොටසක් බෙදුවා. මේ කැත දේශපාලනය ඔක්කොටම කලින් නවත්වන්න ඕනෑ, බන්ධනාගාරය ඇතුළේ විතරක් නොවෙයි, ඕනෑම තැනක.

ඊයේ මම කථා කළා, යුහුන් අබේකෝන් ගැන. ඒකෙදිත් රට බෙදිලා තිබෙන්නේ. මොකක්ද, මේ මජර දේශපාලනය? අපට ද

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

මේක කියන්නේ? මේ කැත දේශපාලනය නවත්වා කරන දේශපාලනයක් කරමු. ඊට පස්සේ අපි විශ්වාස භංග ද, අරවා මේවා දේශපාලනිකව විසඳා ගනිමු.

බන්ධනාගාර කොමසාරිස්වරයා ගැන කරපු කථාවේදී, ඇත්තටම බන්ධනාගාර කොමසාරිස්වරයාගේ වැඩ තහනම් කිරීම පවා වැරදියි කියන එක මානව හිමිකම් කොමිෂන් සභාවෙනුත් කිව්වා. ඒක හරි කියමුකෝ, ඒකත් කමක් නැහැ. හැබැයි, ඔහුගේ වැඩ තහනම් කළා. දැන් අවුරුද්දකුත් ගත වෙලා. ඒ පරීක්ෂණ ටික ඉවර කරලා, බන්ධනාගාර කොමසාරිස් කෙනෙකු පත් කර ගන්න බැරි නම් ඒක දුර්වලතාවක් නොවෙයිද? මේ ආණ්ඩුවේ කොයි කොයි තැන්වල පුරප්පාඩු තිබෙනවාද, මිනිස්සු පත් කර ගන්න බැරිව හිර වෙලා. අධිකරණවල තත්ත්වයත් එහෙමයි. SriLankan Airlines එකේත් අවුරුදු ගණනක් තිස්සේ පුරප්පාඩු තිබුණා. මේවායෙත් එහෙමයි. මේවා දුර්වලතා විධියට දකින්නේම නැද්ද? ඒක ගැන විපක්ෂය කථා කරන්න අවශ්‍ය නැද්ද? මේ රටේ මිනිස්සු ඒක ගැන කථා කරන්න අවශ්‍ය නැද්ද? අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. බන්ධනාගාර කොමසාරිස්වරයෙකු දැන්වත් පත් කරලා ඉන්නකෝ. ඒ ගැන අපි කථා කරන්න අවශ්‍යයි.

ප්‍රශ්නය ඇති වුණේ, අධිකරණ ඇමතිතුමා මේ ප්‍රශ්නයට දීපු උත්තරයත් එක්කයි. "මම ගණන දන්නේ නැහැ, මම සමාජ මාධ්‍ය බැලුවේ නැහැ" කියලා අධිකරණ ඇමති කිව්වාම රටේ මිනිස්සු මොනවාද හිතන්නේ? අපිද මේකට වග කියන්න ඕනෑ? රටේ මිනිස්සු ඒ වෙලාවේ එතුමා සමඟ ඒ සම්බන්ධයෙන් ගැටුණා. එතුමා ඒක කිව්වේ ඇයි කියන එක අපි අහන්න කැමැතියි. "මම සමාජ මාධ්‍ය බැලුවේ නැහැ, මම හවසට කියන්නම්" කියලා මෙවැනි අවස්ථාවකදී අධිකරණ ඇමතිවරයෙකුට කියන්න පුළුවන්ද? ඒ වාගේම මෙන්න මේ කථාවත් අපි නොවෙයි කිව්වේ, ඒ දවස්වල එතුමා තමයි ඒකත් කිව්වේ. එතුමා කිව්වා, "කොරෝනාවලින් මැරුණු ගණන දන්නේ නැත්නම් ජනාධිපතිවරයා ඉල්ලා අස්විය යුතුයි" කියලා. එතුමා 2021.06.19වැනි දා එහෙම කිව්වා. ඒ කාලයේ විපක්ෂයේ ඉන්නකොට එතුමාට ඒක කියන්න පුළුවන්. නමුත් මෙච්චර ප්‍රශ්නයක් වෙලා තිබියදී අපි එතුමාට ඉල්ලා අස් වෙන්න කිව්වාම, අපිව මරාගෙන කන්න හදනවා. නැහැ, එහෙම කරන්න එපා. මුලින්ම ඔයගොල්ලන් තමයි එහෙම කිව්වේ. ඒ නිසා ඒක එදාටත් වලංගුයි නම්, අදටත් වලංගුයි.

එතුමා කට වරද්දා ගත්ත තවත් තැනක් තිබෙනවා. එතුමා කියන්න ගත්තා, බන්ධනාගාර නිලධාරින්ගේ පුරප්පාඩු පුරවාගන්න විධියක් නැහැ, because people from good schools do not apply anymore for these kinds of jobs. මොකක්ද ඒකෙන් අදහස් කරන්නේ? What does he mean by "good schools"? මම ඒක දැනගන්න කැමැතියි. එතුමාගේ කථාව දැන් ඉවරයි. නමුත්, ඔය වාගේ කථා කිව්වාම අපට, මේ රටේ මිනිසුන්ට ප්‍රශ්න මතු වනවා. එම නිසා ඒ සම්බන්ධයෙනුත් එතුමාට මම දෝෂාරෝපණයක් එල්ල කරනවා. ඒ වාගේම එතුමා ඉතාම ලස්සනට මේ ප්‍රශ්නයෙන් පස්සේ කරපු එතුමාගේ කථාවේදී මෙන්න කියනවා, වයස අවුරුදු හැටෙන් ඒ පරිණතභාවය ගන්න බැහැ කියලා. බන්ධනාගාර නිලධාරින් ගැනයි මේ කියන්නේ. අර වාගේ සිද්ධියක් negotiate කරන්න අවුරුදු 55න්, 60න් බැහැ කියලා එතුමා කියනවා. මෙසා විශාල ප්‍රශ්නයක් වෙලා තිබියදී ගොනා හැරෙන්නේ පොල් පැළය කන්න කියලා අපට තේරෙනවා. මොකටද මේ අවුරුදු 55, 60, 65 කියාගෙන එන්නේ? මේ ඇත්ත අවශ්‍යතාව කොහේද තිබෙන්නේ? මෙතුමාට චෝදනාවක් එල්ල වෙලා තිබෙනවා, මෙතුමා එදා රාත්‍රියේත් විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කරන සාකච්ඡාවක රැඳී සිටියා කියලා. මෙච්චර ප්‍රශ්න වෙලා තිබියදීත් මෙවැනි දෙයක් කියාගෙන එන්නේ පොල් පැළය කන්න නේද? එතුමා එහෙමම කියලා තිබෙනවා. මේ නීති සංශෝධනය කරන්න එතුමා මහන්සි වෙලා තිබෙන්නේ එක්කෙනෙකුගේ දෙදෙනෙකුගේ වැඩ කර ගන්නයි. ඇත්තටම එතුමාට වෙලාව මදි තමයි. මේ ප්‍රශ්නයත් එක්ක ලොකු බරක් එතුමාගේ ඔළුවට පැටවිලා තිබෙනවා.

Hon. Prime Minister, you made a good speech. We felt like we were in one of your lectures, Madam, and you did it really nicely. You said that your Government did not have enough time to do all the law reforms. Yes, it takes time, Hon. Prime Minister. We, as lawyers, know that it takes time. But, it has been two years now. Your Government did not have time to do reforms relating to prisons. But, did you not have time to do reforms relating to all other things like to bring in the Presidents' Entitlements (Repeal) Bill? You took it up in haste, did you not? And, also to bring in the Parliamentary Pension (Repeal) Bill and the Local Authorities Elections Bill. So, you had enough and more time to do all that. You brought in and got them passed very quickly, did you not? ඊළඟට, මෙතුමා තමන්ගේ කථාවේදී කිව්වා, "අපි ලබන මාසය හෝ ඊළඟ මාසය වෙද්දි මේ සංශෝධන ගෙනැල්ලා ඉවර කරනවා" කියලා. ඊට කලින් තිස්දෙනෙකුට වඩා මැරිලා ඉවරයි. දැන් ඔය මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 කියන එක ග්‍රෑම් 100 කරන්න ඉස්සරහට එක බින්දුවයි දාන්න තිබෙන්නේ. ඕකට වෙලාව නැතිව ගියාද? අනෙක් සියලු දේම කරන්න වෙලාව තිබුණා. මම දන්නේ නැහැ, මට තේරෙන්නේ නැහැ, මොකක්ද මේ කියන්නේ කියලා. එතුමාට වෙලාව නැතුව ගියා කියන එක ගැන මට නම් තේරෙන්නේ නැහැ.

අවසාන වශයෙන් නොවුණත්, නැවතත් ආකාෂ් නිලුපුල්ව මතක් වනවා. මොකද, හැම කෙනාම වාගේ විපක්ෂ නායක කාර්යාලයේ තිබුණු රැස්වීමක් ගැන තමයි මෙතැන වැඩි හරියක් වෙලා කිව්වේ. අධිකරණ ඇමතිතුමාගේ හොඳ කියන්න තිබුණු වෙලාවෙන් වැඩි හරියක් ගත්තේ එතැනට. හැබැයි මතක තබාගන්න, අපි සියලුදෙනාම එකට ඉඳලා photo එකක් ගත්තාම, මේ අය අද භූමිතෙල් වැදිච්ච ගැරඬි වාගේයි. බලන්න, මගේ ළඟ තිබෙන මෙන්න මේ photo එක දැකලා තිබෙනවා ද? මේක AI එන්න කලින් ගත්ත photo එකක්. එදා මේ උදැල්ලක් අරගෙන දඟලන්නේ වත්මන් ජනාධිපතිතුමා. එහා පැත්තේ ඉන්නේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය. ඊට එහා පැත්තේ මහින්ද රාජපක්ෂ මහත්මයාත් ඉන්නවා. මෙතුමාගේ පිටුපසින් කරට උඩින් වාගේ ඉන්නවා, ආනන්ද විජේපාල වාගේ මහත්මයෙක්. මම හිතන විධියට එතුමා වෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ඔව්, ඔව්, ඒක තමයි. ඊළඟට මේ එක මේසයේ ඉඳගෙන අවබෝධතා ගිවිසුම් අත්සන් කරන්නේ ඔබතුමන්ලාගේ අධ්‍යාත්මික නායකතුමායි, මහින්ද රාජපක්ෂ මහත්මයායි. ඉහළින් තිබෙන ඡායාරූපය තමයි හොඳම එක. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ තුරුල්ලේ ඉන්නේ. *[බාධා කිරීමක්]* මේ AI ද? මේ, සරම් අස්සේ හිටියේ. මම මේ ඡායාරූප **සභාගත*** කරනවා.

එතකොට මේවා බලලා නැති ආකාෂ් නිලුපුල් වාගේ පොඩි එවුන්ට මේවා බලාගන්න පුළුවන්. මේ දේශපාලන ගේම් ගැහුවේ නැත්නම් අද ඔබතුමන්ලාට ඔතැන ඉඳගන්න හම්බ වන්නේත් නැහැ. එහෙම නම් සියයට 3 නොවෙයි, සියයට 0.5ක් වත් නැහැ. ඒක මතක තියාගන්න.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අනුර කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමා ඉතාම හොඳයි. මොකද, ඔබතුමා එතුමාව බේරා ගන්න කථා කළා. අද එතුමාත් කිව්වා, අපි ඇප පිට ඉන්නේ, අපි ඔක්කෝම කුඩුකාරයෝ, අපි ඔක්කෝම වැරදිකාරයෝ හරි කියලා. එතුමාට මේ විශ්වාස භංග යෝජනාව අපි ගෙනෙන්නේ මොකකටවත් නොවෙයි කියලා ඔබතුමා පනතක් ගැන කිව්වා. ඔබතුමා කියපු පනත මොකක්ද? Proceeds of Crime Act. පසුගිය ආණ්ඩුවෙන් ගෙනැල්ලා කෙළින්ම කැබිනට් මණ්ඩලයෙනුත් ගැසට් එකේ පළ කරන්න නියම කරපු පනතක් ගැන දැන් ඇවිල්ලා කියවනවා. ඔබතුමාට දැන් සතුටුද? නිකම් ඉන්න, ඒවා කලින් ගෙනාපු ඒවා. එතුමා කියන්නේ වෙන කෙනෙක්. නීතිය කියන්නේ වෙන එකක්. එතුමා ඉල්ලා අස් වුණත් ඊළඟට පත් වන අධිකරණ ඇමතිවරයෙකුට ඒක ගෙනෙන්න පුළුවන්. ඒ නිසා නීතියෙන් බේරෙන්න කියලා එතුමාව එළවලා හරියනවාද? මොකක්ද ඒ කථාව? ඒක පොඩ්ඩක් වෙනස් කරලා 2024 දෙසැම්බර්වල ගෙනාවා. එච්චරයි.

ඊළඟට ඔබතුමා තමන්ගේ කථාව අවසන් කරමින් තමන්ගේ cadre එකට කිව්වා, අපේ ඇඟේ ලේවල පාටම තමයි අපේ පක්ෂයේ පාටත්, ඒ නිසා ලේ වාගේ අපි මෙතුමා රකිනවා කියලා. බම්බුව තමයි! එතුමා කෙළින්ම කිව්වා, රෝහණ විජේවීර මගේ නායකයා නම් නොවෙයි කියලා. ඒ, දම් පාට. ඔය රතු පාට. ඕවා කථා කරන්න ගිහිල්ලා දම් පාට වෙන්න ගුටි කන්න වෙයි. පාට ගැනවත් දන්නේ නැහැ. ඔබතුමාට මට කියන්න තිබෙන්නේ ඒක තමයි.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි. මේ සභාවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ නීතිඥවරු සියලු දෙනාම ලජ්ජා වෙන්න ඕනෑ. අද අසිත නිරෝෂණ මන්ත්‍රීතුමා කරපු කථාවේ තේරුම මොකක්ද? *[බාධා කිරීම්]* මම නම කියලාම කියනවා, ඕනෑ නම් point of Order එකක් ගන්න. මෙතැන ඉන්න සියලුම නීතිඥවරු - අධිකරණ ඇමතිතුමා පවා - එතුමා කියපු කථාව පිළිගන්නවාද කියලා කියන්න. එතුමා කියපු කථාව පිළිගන්නවාද? මම අභියෝග කරනවා, පුළුවන් නම් මේ බිල්ඩින් එකෙන් එළියට ගිහිල්ලා ඒක කියන්න කියලා. *[බාධා කිරීම්]* මොකක්ද කියලා කියන්නද? මම ඒක ආපසු කියන්න අවශ්‍ය නැහැ. නීතිඥ සංගමයේ සභාපතිතුමාව ගෙනැල්ලා මහ ඇමති කරන්න පොරොන්දු වුණා කියලා කිව්වා. මම මේක කියන්නම්කෝ. *[බාධා කිරීම්]* රජීව් අමරසූරිය මහත්මයා විතරක් නොවෙයි මේක කිව්වේ. බලන්න, පොදු රාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංගමයේ සභාපති Steven Thiru මහත්මයාත් මේ ගැන කිව්වා. ඔහු මලයාසියාවේ. ඒ වාගේම ආසියානු නීතිඥ සංගමයේ සභාපති T. L. Yap මහත්මයාත් මේ ගැන කිව්වා. ඔහු සිංගප්පූරුවේ මහත්මයෙක්. මම කියන එක අහන්නකෝ. ඒ දෙදෙනාට පොරොන්දු වුණේ මොනවාද කියලා දන්නේ නැහැ නේද? *[බාධා කිරීම්]* ඇමතිකමද? එහෙම නැත්නම් මොකක්ද? *[බාධා කිරීම්]* නිකම් ඉන්න, මහත්තයෝ.

අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා ගෞරවනීය නීතිඥවරයෙක්. ඔබතුමාව බේරා ගන්න මේ වාගේ රස්තියාදු කථා කියන්න දෙන්න එපා. මොකද, මෙතැන ඕනෑ තරම් නීතිඥවරු ඉන්නවා. ඒ ඕනෑම කෙනෙකුට නැඟිටලා ඕනෑම දෙයක් කියන්න පුළුවන්. නීතිඥවරු ශිරානි බණ්ඩාරනායකගේ ප්‍රශ්නයට එළියට බැහැලා fight කරද්දී ඔයගොල්ලන්ට හොඳයි. අරගළය පැවති අවස්ථාවේදී ගෝඨාභය රාජපක්ෂ මහත්මයා දාලා ගිය දවසේ මමත් නීතිඥ සංගමය එක්ක පාරේ හිටියේ. අපිත් වතුර ප්‍රහාරයන්ට ලක් වෙමින් තමයි ගියේ. එතකොට නීතිඥ සංගමය හොඳයි. මේක පුදුම වැඩක් වුණා නේ. ගොවියෝ මොනවා හරි කියපු ගමන් ඔවුන් කසිප්පුකාරයෝ වෙනවා. නීතිඥ සංගමය මොනවා හරි කිව්ව ගමන් ඔවුන් ඩීල්කාරයෝ වෙනවා. මේක හරි ප්‍රශ්නයක් නේ. ඒ නිසා මතක තියා ගන්න, ඔබතුමාව ගලවා ගන්න පුළුවන් කියන එක. හැබැයි, මේ වාගේ රස්තියාදුකාර කථා එක්ක ඔබතුමාව ගලවා ගන්න හම්බ වෙන්නේ නැහැ කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. වෙච්ච දේ වුණා කියන එක අපි දන්නවා. ඔබතුමා වගකීම භාර ගන්නවා කියාත් කිව්වා. නමුත් මම ඊයේ රෑ කියනවා අහගෙන හිටියා, ඉදිරියේදී එහෙම නොවෙන්න වගකීම භාර ගන්නවා කියලා තමයි කිව්වේ කියලා. මරු ඒක. මරු වගකීම් භාර ගැනීමක්. ඔබතුමා ඒ සිදුවීම වෙලා දවස් දෙකකට පස්සේ කියනවා, "Shooting orders දෙන්න ඕනෑ කවුද කියලා මම දන්නේ නැහැ" කියලා. ඊයේ රෑ - දවස් 20කට පස්සේ - කියනවා, "මම ඒක හොයා ගත්තා, ඒක බන්ධනාගාර කොමසාරිස්ගේ අතේ තිබෙන දෙයක්, කියලා. අධිකරණ ඇමතිතුමනි, මේකට මොකක් හරි කරන්න ඕනෑ නැද්ද? ඔබතුමාට මේක කරන්න බැහැ නේ. ඒ නිසා නේ අපි මෙහෙම කියන්නේ. ඒ නිසා ඔබතුමාට නැවත වතාවක් කියනවා, කරුණාකරලා වගකීම විතරක් නොවෙයි වගවීමත් පෙන්වන්න කියලා. ආණ්ඩුවේ වගවීමත් පෙන්වන්න. ආණ්ඩුවේ වගවීම පෙන්වලා ඔබතුමා ඉල්ලා අස් වෙන්න. ඔබතුමා සම්බන්ධයෙන් මේ සභාවේ විශ්වාසය භංග වෙලා තිබෙනවා කියන එක මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.42]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර මහතාට එරෙහිව ගෙනැල්ලා තිබෙන විශ්වාස භංග යෝජනාවට අදාළ ඡන්ද ප්‍රතිඵලය තව ටිකකින් අපට බලා ගන්න පුළුවන්. මේ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව අධිකරණ ඇමතිතුමාත් එක්ක 150කට වැඩි මන්ත්‍රීවරු ප්‍රමාණයක් ඉන්නවා. හැබැයි, මේ විශ්වාස භංග යෝජනාව ගෙනාපු විපක්ෂය පැත්තේ මන්ත්‍රීවරු ගණන ඕනෑ නම් 34ක්, 35ක් වෙයි. ඒ ගණන ලකුණු වුණාට පස්සේ අපි ඒ ලැයිස්තුවෙන් හොයනවා, ඇප පිට නැති, සැක පිට නැති කීයක් ඉන්නවාද කියලා. මම කියනවා, 15ක්වත් නැහැ කියලා. ආණ්ඩුව පැත්තෙන් හර්ෂණ නානායක්කාර ඇමතිතුමා එක්ක 150ක් ඉන්නකොට ඔය පැත්තේ,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. LAKSHMAN NIPUNA ARACHCHI left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ඕනෑ නම් ඔය සද්දවලින් ගණන් කළොත් කියන්න පුළුවන්, ඇප පිට කවුද ඉන්නේ, සැක පිට කවුද ඉන්නේ කියලා. *[බාධා කිරීම්]* පසුගිය අවුරුද්දයි මාස 9ක - අවුරුදු දෙකකට ආසන්න - කාලය තුළදී බන්ධනාගාර ප්‍රතිසංස්කරණ වෙනුවෙන් කරපු කටයුතු බොහොමයක් ගැන දැන් අපි මේ සභාවේදී කථා බහට ලක් කළා.

ගරු කථානායකතුමනි, අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ බන්ධනාගාර සෞඛ්‍ය සම්බන්ධ ඒකකයක් තිබෙන බව ඔබතුමා දන්නවා. අපි පසුගිය කාලයේදී ඒකට අධ්‍යක්ෂවරයෙක් පත් කළා. ඔහු අපේ තෘතීයික රෝහල්වල හිටපු අධ්‍යක්ෂවරයෙක්, අත්දැකීම් සහිත කෙනෙක්. ඒ අධ්‍යක්ෂවරයා විසින් නායකත්වය ලබා දීම තුළින් පසුගිය කාලයේදී අපිට පුළුවන්කම ලැබුණා, ජාතික මට්ටමේ බන්ධනාගාරවල පවතින සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව, බන්ධනාගාර රෝහල් පිළිබඳව මාස 4කට වරක් ජාතික මට්ටමින් සමාලෝචනයක් කරලා අඩුපාඩු සකස් කරන්න. අපි බලයට එනකොට බන්ධනාගාරවල සේවය සඳහා හිටියේ වෛද්‍ය නිලධාරින් 56යි. අපි ඒ ප්‍රමාණය 73දෙනෙකු දක්වා වැඩි කළා. ඒ වාගේම, බන්ධනාගාර 14ක පමණයි හදිසි ප්‍රතිකාර ඒකක - Emergency Treatment Units - තිබුණේ. අපි ඒක 31 දක්වා වැඩි කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම වවුනියාව බන්ධනාගාර රෝහලේත්, මඩකලපුව බන්ධනාගාර රෝහලේත් පහසුකම් වැඩි කර තිබෙනවා. අපි මඩකලපුව බන්ධනාගාර රෝහලේ inpatient ward එකක් හදලා තිබෙනවා. වැලිකඩ, මහර, බෝගම්බර කියන බන්ධනාගාර රෝහල්වලට දැනටමත් විශේෂඥ වෛද්‍යවරු යොදවා තිබෙනවා. අපි ළඟදීම අඟුණකොළපැලැස්ස බන්ධනාගාර රෝහලටත් විශේෂඥ වෛද්‍යවරයෙක් යොදවනවා. අපි ඒක කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අනුමැතිය සඳහා යවා තිබෙනවා.

ඒ වාගේම, අපි වැලිකඩ බන්ධනාගාර රෝහලේත් radiology unit එකක් පටන් ගත්තා. සාමාන්‍යයෙන් අපේ රෝහල් පද්ධතියේම ඖෂධ නිකුත් කිරීම සඳහා අපි භාවිත කරන ස්වස්ථ පද්ධතිය මෙතෙක් කල් බන්ධනාගාර රෝහල්වල තිබුණේ නැහැ. අපි බන්ධනාගාර රෝහල්වල ඖෂධ ලබා දීමත් ස්වස්ථ පද්ධතියට ඇතුළත් කළා. ඒ අනුව බන්ධනාගාර රෝහල්වලට අවශ්‍ය කරන ඖෂධ ප්‍රමාණය සෞඛ්‍ය අමාත්‍යාංශයටම ගණනය කරලා දෙන්න පුළුවන්කමක් තිබෙනවා. අපිට එහෙම සපයන්න බැරි ඖෂධ ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය මිලදී ගැනීම් කරන්න අපි අවසර ලබා දී තිබෙනවා.

එපමණක් නොවෙයි, අපි බන්ධනාගාර රෝහල්වල ජංගම දන්ත සායන පැවැත්වූවා, බන්ධනාගාර රැඳවියන් සහ බන්ධනාගාර නිලධාරින් වෙනුවෙන්. අපි බන්ධනාගාරවල තිබෙන මහජන සෞඛ්‍ය පරීක්ෂක සේවාව දියුණු කර තිබෙනවා. එපමණක් නොවෙයි, පසුගිය කාලය තුළදී තෝරා ගත් සමහර බන්ධනාගාර රැඳවියන්ගේ සහ බන්ධනාගාර නිලධාරින්ගේ සෞඛ්‍ය වෙනුවෙන්, ඔවුන්ගේ අක්ෂි පරීක්ෂාව වෙනුවෙන් සහ ඔවුන්ට තිබෙන බෝ නොවන රෝග පිළිබඳව පරීක්ෂා කිරීම වෙනුවෙන් අපි සායන පැවැත්වූවා. ඒ අනුව බන්ධනාගාර රෝහල් 22කදී 2,132ක් පරීක්ෂා කර තිබෙනවා. අවශ්‍ය අය තෘතීයික මට්ටමේ රෝහල්වලට යොමු කර තිබෙනවා. අපි medical board එකක් නම් කළා. දින 28කට වඩා බන්ධනාගාර රෝහලේ ඉන්නවා නම් එම රෝගීන් ඒ medical board එකට යවනවා. මොකද, පසුගිය කාලයේ මේක අවභාවිත වෙලා තිබුණා.

ඒ වාගේම, බෝගම්බර, අඟුණකොළපැලැස්ස සහ මීගමුව බන්ධනාගාරවල විශේෂ කාන්තා රෝහල් වාට්ටු ඇති කර තිබෙනවා. මම මේ කිව්වේ බන්ධනාගාර නිලධාරින්ගේත්, රැඳවියන්ගේත් සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කර ගැනීම සඳහා රජයක් හැටියට අපි ගන්නා ලද ක්‍රියාමාර්ග කිහිපයක්. "සිරකරුවෝ ද මනුෂ්‍යයෝය" කියන පදනම මත අපි ඒ කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම පසුගිය කාලය පුරාවටම විශේෂයෙන්ම විෂ මත්ද්‍රව්‍ය ජාවාරම මැඩ පැවැත්වීම සඳහාත්, පාතාලය මර්දනය කිරීම සඳහාත්, විවිධ අපරාධවලට සම්බන්ධ අය අත්අඩංගුවට ගැනීම සඳහාත් පොලීසිය විශේෂ කාර්යභාරයක් කරමින් ඉන්නවා. ඒ අනුව බන්ධනාගාරගත කරන ප්‍රමාණය වැඩි වුණා. රැඳවියන් 10,801ක් අනුමත වුණු බන්ධනාගාර 37 සහ කඳවුරුවල දැන් රැඳවියන් 40,884ක් ඉන්නවා. ඔව්, ඒක ඇත්ත. වැලිකඩ බන්ධනාගාරයේ රඳවා ගන්න පුළුවන් අනුමත රැඳවියන් ප්‍රමාණය 839ක් වුණාට 2026.07.13 දින වනවිට එහි රැඳවියන් 3,390ක් ඉන්නවා. කළුතර බන්ධනාගාරයේ ඉන්න පුළුවන් රැඳවියන් ප්‍රමාණය 400ක් වුණාට දැන් එහි රැඳවියන් 2,084ක් ඉන්නවා. පල්ලන්සේන කඳවුරේ ඉන්න පුළුවන් රැඳවියන් ප්‍රමාණය 470ක් වුණාට දැන් එහි රැඳවියන් 1,731ක් ඉන්නවා. ඔව්, එහෙම රැඳවියන් ඉන්නවා. එහෙම රැඳවියන් ඉන්න අතරතුර අපි මොනවාද කළේ?

අපි පසුගිය වසර දෙක පුරාවටම බන්ධනාගාරවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩ වැඩසටහනක් ඉදිරියට අරගෙන ගියා. ගරු කථානායකතුමනි, මම එයින් කිහිපයක් මේ සභාවට ඉදිරිපත් කරන්නම්. පල්ලෙකැලේ දුම්බර නව බන්ධනාගාරයේ නිල නිවස ඉදි කිරීමේ භෞතික ප්‍රගතිය සියයට සියයක් සම්පූර්ණ කර තිබෙනවා. ඒ වාගේම, ජල ටැංකි ආශ්‍රිත කටයුතු සියයට 94ක් අවසන් කරලා තිබෙනවා. පල්ලන්සේන බන්ධනාගාරයේ 2025 වසරේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද දෙමහල් ගොඩනැඟිලි සංකීර්ණය දැන් සිරකරුවන් සඳහා භාවිතයට ගන්නවා. මහර බන්ධනාගාරයේ ගබඩා සංකීර්ණයේ කටයුතු 2025 වසරේදී සියයට සියයක් අවසන් කළා. ඒ සඳහා රුපියල් මිලියන 202.56ක් ගෙවා තිබෙනවා. පරිපාලන ගොඩනැඟිලි ඉදිකිරීම් ආරම්භ කරලා, ඒ කටයුතුවලින් සියයට 25ක් සම්පූර්ණ කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 61.60ක අත්තිකාරමක් ගෙවා තිබෙනවා. වැලිකඩ, මැගසින් සහ කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරවල තදබදය කළමනාකරණය කිරීමට තාවකාලික ඉදිකිරීම් වශයෙන් 2025දී ආරම්භ කරපු ගොඩනැඟිලි ඉදිකිරීම් මේ වනවිට අවසන් අදියරේ පවතින්නේ. වැලිසර නාවික හමුදා කඳවුර ඇතුළේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන අය රඳවා ගැනීම සඳහා විශේෂිත අධි ආරක්ෂිත බන්ධනාගාරයක් ස්ථාපිත කරලා තිබෙනවා. පල්ලෙකැලේ බන්ධනාගාරයේ ගොඩනැඟිලි ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර 2028දී එය අවසන් කරන්න නියමිතයි. 2025 - 2028 කාලය තුළ ඒ සඳහා රුපියල් මිලියන 4,363ක් යොදවන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා දැනට රුපියල් මිලියන 1,782ක් වෙන් කරලා තිබෙනවා. වටරැක බන්ධනාගාරයේ පෙරසවි තාක්ෂණයෙන් ගොඩනැඟිලි දෙකක් ඉදිකිරීම සඳහා අත්‍යවශ්‍ය ඉදිකිරීම් ආරම්භ කරලා තිබෙනවා. එහි වියදම රුපියල් මිලියන 446.9යි. කළුතර බන්ධනාගාරයේ අලුත් ගොඩනැඟිලි ඉදිකරන්නට රුපියල් මිලියන 209ක් වෙන් කරලා තිබෙනවා. ගාල්ල, මහමෝදර රෝහල් පරිශ්‍රය, බෝගම්බර පැරණි

බන්ධනාගාරය, කෑගල්ල, පරගම්මන ගබඩා සංකීර්ණය තාවකාලික බන්ධනාගාර ලෙස සංවර්ධනය කරන්න මුදල් වෙන් කරලා තිබෙන්නේ. කුරුවිට බන්ධනාගාරයේ මලාපවහන පද්ධතියට රුපියල් මිලියන 288ක් ගෙවීම් කරලා අවසානයි. මේ ආදී වශයෙන් බන්ධනාගාරවල පහසුකම් වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම වාරියපොල බන්ධනාගාරය පුළුල් කිරීම සඳහා 2027 - 2029 කාල පරිච්ඡේදයට රුපියල් මිලියන 4,421ක ඇස්තමේන්තුවක් සකස් කරලා තිබෙනවා, ඒ කාලය තුළ එහි වැඩකටයුතු අවසන් කිරීමට. 2027 - 2029 කාලය තුළ මාතර බන්ධනාගාරය කොටවිලවත්තේ නැවත ස්ථාපිත කිරීමට රුපියල් මිලියන 5,189ක ඇස්තමේන්තුවක් සකස් කරලා එහි මූලික කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ. වටරැක බන්ධනාගාරයේ දෙවන අදියර සඳහා රුපියල් මිලියන 1,770ක් ඇස්තමේන්තු කරලා තිබෙනවා. එහි ඉදිකිරීම් කටයුතු 2027දී ආරම්භ වෙනවා.

මේ විධියට වටරැක බන්ධනාගාරයේ ගොඩනැඟිලි දෙකක් ඉදි කළාම රැඳවියන් 250කට අලුතින් ඉඩකඩ හැදෙනවා. කළුතර බන්ධනාගාරයේ අලුත් ගොඩනැඟිලි ඉදි කළාම රැඳවියන් 250කට ඉඩකඩ හැදෙනවා. පල්ලෙකැලේ බන්ධනාගාරයේ ඉදිකිරීම් අවසන් කළාම වැඩිපුර රැඳවියන් 2,500ක් රඳවන්නට පුළුවන්කමක් තිබෙනවා. ඒ වාගේම වටරැක බන්ධනාගාරයේ අධි ආරක්ෂිත බන්ධනාගාරය තුළ රැඳවියන් 100කට පහසුකම් හදනවා. පැරණි බෝගම්බර බන්ධනාගාරය, ගාල්ල මහමෝදර රෝහල් පරිශ්‍රය සහ කෑගල්ල පරගම්මන ගබඩා සංකීර්ණය කියන තැන් වැඩිදියුණු කළාට පස්සේ තව රැඳවියන් රඳවන්න පුළුවන්. වාරියපොල බන්ධනාගාරය තුළ රැඳවියන් 1,300කට අලුතින් පහසුකම් හදනවා. මාතර බන්ධනාගාරය කොටවිලවත්තේ ස්ථාපනය කළාම රැඳවියන් 1,500කට පහසුකම් හැදෙනවා. වටරැක බන්ධනාගාරයේ දෙවන අදියරේදී රැඳවියන් 1,250කට පහසුකම් හැදෙනවා. වැඩි වන රැඳවියන්ට අවශ්‍ය පහසුකම් හදන්න අපි මේ විධියට කටයුතු කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ අතරතුරේ බන්ධනාගාර නිලධාරින් බඳවා ගන්නවා. ඔවුන්ගේ සෞඛ්‍ය පහසුකම් පිළිබඳව බලනවා. මේ ආදී වශයෙන් අපි කටයුතු කරගෙන යනවා. හැබැයි, දැන් මේ සියල්ල තිබියදී විපක්ෂයේ කණ්ඩායමක් එකතුවෙලා මේ මොහොත පාවිච්චි කරලා අපේ අධිකරණ ඇමතිතුමාට එරෙහිව විශ්වාස භංගයක් ගෙනාවා. පසුගිය කාලය පුරාම මේ අය කටයුතු කරපු ආකාරය දෙස බැලුවාම මම දැක්කා, මීගමුව බන්ධනාගාරයේ සිදුවීම වෙලා පැය කිහිපයක් ගතවෙනකොටම මේ කට්ටිය දුවලා ගියා එක්තරා ස්ථානයකට. අර සරණාගතයින් එකතු වෙන තැනක් තිබෙනවා නේ, කොළඹ අවට. නේද? එතැන තමයි තැන. හිටපු අධිකරණ ඇමති කෙනෙකුගේ ගෙයක් තිබෙනවා. පැය කිහිපයක් යන්න කලින් එතැනට ගියා. ගිහිල්ලා සාකච්ඡා කළා මොකද කරන්න ඕනෑ කියලා.

ගරු කථානායකතුමනි, පසුගිය කාලයම බැලුවොත්, මේ අය මේ ආණ්ඩුවේ වැඩිපුර පහර ගහන්න තෝරාගෙන තිබෙන්නේ කාවද? අපරාධ, දූෂණ පිළිබඳව පරීක්ෂා කරන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, එහි අධ්‍යක්ෂ ශානි අබේසේකර මැතිතුමා, පොලිස්පතිවරයා, පොලීසිය භාර මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ අපේ පොලීසිය භාර ඇමතිවරයා. ඇයි? එක් පැත්තකින් ඒ අය තමයි මේ පරීක්ෂණ කටයුතු සිදු කරන්නේ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට පාර්ලිමේන්තුවේදීත් පහර ගහනවා, එළියේත් voice-cutsවලින් පහර ගහනවා. අහුවෙච්ච අහුවෙච්ච තැන අල්ලස් පිළිබඳ කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට එරෙහිව මතයක් ගොඩනඟනවා. මේ ආයතන තමයි මේ රටේ අපරාධ පිළිබඳව විමර්ශනය කරමින් ඉන්නේ. ඉතින්, මේගොල්ලන් ප්‍රහාරයට ලක් කරන්නේ ඒ අයව.

ඊළඟට, නීතිපති දෙපාර්තමේන්තුව. නීතිපති දෙපාර්තමේන්තුව හරහා හරියට නඩු ගොනු වෙනකොට, අන්න ඒකේ ඉන්න නිලධාරින්ට, සොලිසිටර් ජනරාල්වරයාට, අතිරේක සොලිසිටර් ජනරාල්වරයාට පහර දෙනවා. දැන් ඊළඟ අදියර තෝරාගෙන තිබෙනවා මෙතැනින් එහාට. මොකක්ද? විමර්ශනය කරලා, නඩු ගොනු කරලා, අධිකරණයේ නඩු විභාග වෙන්න යනකොට අධිකරණ ඉලක්ක කරගෙන ප්‍රහාරයක් පටන් අරගෙන තිබෙනවා. අපට පෙනෙනවා, බොහොම සැලසුම් සහගතව තමයි මේ පද්ධතිය ප්‍රහාරයට ලක් වෙන්නේ කියන එක. එහි එක් කොටසක් තමයි මේ අධිකරණ ඇමතිවරයාට එරෙහිව ගෙනෙන විශ්වාස භංග යෝජනාව. වෙන මොකුත් නොවෙයි, මේ නඩු කටයුතු වේගවත් කරමින්, නඩු පැවරීමට අදාළ කටයුතුවලට අවශ්‍ය කරන පහසුකම් සපයන ආයතන භාරව වැඩ කරන ඇමතිවරුන්ට එරෙහිව විශ්වාස භංග යෝජනා ගෙනෙනවා. මොකක්ද බලාපොරොත්තුව? බලාපොරොත්තුව තමයි, මේ සිදුවන නඩු කටයුතු වළක්වන එක; අපරාධ හෙළිදරව් වෙන එක වළක්වන එක; සිරගත වන එක වළක්වන එක. ඒකට හදාගත් එකක් මිසක් වෙන මොකක්වත් නොවෙයි. ඒ නිසා මේ විශ්වාස භංග යෝජනාව පිටුපස තිබෙන්නේ මොකක්ද? මේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විසින් නීතිය හරියට ක්‍රියාත්මක කරලා, අපරාධ මර්දනය කිරීම සඳහා, අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කටයුතු කරන එක නැවැත්වීමේ උත්සාහයක්. ඔබ සම්බන්ධ, ඔබගේ අධිකරණ ඇමතිවරු සම්බන්ධ, ඔබගේ අධිකරණ ඇමතිගේ පුත්තු සම්බන්ධව, පාතාල නායකයින් නිදහස් කරන්න, DO නොගසා ඉන්න, දඬුවම් අඩු කරන්න අල්ලස් ගත්ත අය එක්ක සම්බන්ධකම් තිබෙන කණ්ඩායමක් කලබල වෙන එක අපට පුදුම වෙන්න දෙයක් නොවෙයි.

දැක්කා නේ, එක් එක් දේශපාලන මත තිබුණු, ඒ කාලේ - ඡන්ද කාලයේ - අපට ඩීල්, ඩීල්, ඩීල් කියපු සෙට් එකම එකතුවෙලා ගිහිල්ලා රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා මූලිකත්වයේ තබාගෙන කටයුතු කරන ආකාරය. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා අලුතින් clerk කෙනෙකුත් අරගෙන ළඟින් තියාගෙන, notes ලියන්න. රනිල් වික්‍රමසිංහ කියනවා, අර අලුත් secretary notes ලියාගන්නවා. එතැනට ගෙනැල්ලා තිබෙන්නේ. මේ ඔක්කොම එකතු කරන්නේ කොහොමද? ඒ ඔක්කොම එකතු කරන රහස වෙන මොකුත් නොවෙයි, මෙන්න මේ අපරාධවලට එරෙහිව ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාවලිය. විමර්ශනය කරනවා, නඩු පවරනවා, අධිකරණයට භාර දෙනවා, අධිකරණය නඩු අහලා දඬුවම් ලබා දෙනවා. අන්න ඒවාට, එක්කෝ තමන් සම්බන්ධයි; නැත්නම් තමන්ට දේශපාලන වශයෙන් උදවු කරනවා; නැත්නම් තමන් ඒවා එක්ක ගනුදෙනු කරලා තිබෙනවා. ඒ සෙට් එකම එකතුවෙලා තිබෙනවා, එක්කෝ අධිකරණ ඇමතිවරයාට එරෙහිව; නැත්නම් මහජන ආරක්ෂක ඇමතිවරයාට එරෙහිව; නැත්නම් එම කටයුතු සිදු කරන නිලධාරින්ට එරෙහිව; නැත්නම් අගවිනිසුරුතුමා ප්‍රමුඛ අධිකරණයට විරුද්ධව. ඒක තමයි මේ තැනින් තැන මතු වෙන්නේ. ඒ නිසා තමයි මීගමුවේ සිදුවීමක් වුණාම, ඒක තමන්ගේ දේශපාලන වාසියට යොදා ගන්නේ. තමුන්නාන්සේලා කල්පනා කර බලන්න.

මීගමුවේ සිද්ධියේදී මිය ගිය ඒ බන්ධනාගාර නිලධාරින් ඝාතනයට ලක් වුණු ම්ලේච්ඡ ආකාරය බැලුවා නම්, තමුන්නාන්සේලාට මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න බැහැ; තමුන්නාන්සේලාට කළු පටි බඳින්නත් බැහැ. එදා අපි දැක්කා, කළු පටි බැඳගෙන ආවා. සද්ද නැතිව ඒවා ලිහාගෙන ගියා පැය දෙකකට පස්සේ. ම්ලේච්ඡ ලෙස ඔවුන් ඝාතනය කරලා

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

තිබුණේ. ICU එකේ හිටපු අය බලන්න මම ගියා. එකම විධියට පහර දීලා තිබුණේ. ඒ නිලධාරින් එහෙම ගියේ එතැන තිබුණු ගැටුම වළක්වන්න; ඒ රුදවියන්ට ආහාර ලබා දෙන්න. ගැටුම වළක්වන්න කියලා ගියපු අයට තමයි එහෙම පහර දීලා තිබුණේ; ඒ විධියට ම්ලේච්ඡ ලෙසයි ඒ අයව ඝාතනය කරලා තිබුණේ. හැබැයි, තමුන්නාන්සේලා ඒ සිදුවීමත් පාවිච්චි කරන්න ගියා තමන්ගේ දේශපාලන අවශ්‍යතාව සහ වාසි වෙනුවෙන්. ඒ නිසා ගරු කථානායකතුමනි, අපරාධකරුවන්ගේ පැත්තේ ඉන්නේ කවුද, අපරාධවලට එරෙහිව ක්‍රියාත්මක වෙන්නේ කවුද කියලා මේ රටේ ජනතාවට යළිත් වතාවක් පෙන්නුම් කරන හොඳ අවස්ථාවක් තමයි මේ විශ්වාස භංග යෝජනාව. ඒ නිසා, අපි මේක දිනන්නේ මේ පැත්තේ සිටින මන්ත්‍රීවරුන්ගේ ඔළු ගෙඩි ගණනින් නොවෙයි. මේ ජයග්‍රහණය පිටුපස තිබෙනවා, ජනතාවගේ බලය, ජන වරම. ඒකට එරෙහිව කටයුතු කරන තමුන්නාන්සේලාගේ කුඩා කණ්ඩායම කාත් එක්කද ඉන්නේ කියලා මේ වෙලාවේ හෙළිදරව් වෙලා පෙනෙනවා. ගරු කථානායකතුමනි, එම නිසා අපි වැඩි වේලාවක් ගන්නේ නැතුව ඡන්දයකට යමු.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතාට එරෙහිව ගෙන එන ලද විශ්වාස භංග යෝජනාවට සභාව එකඟද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, බෙදීමක් අවශ්‍යයි.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු (නීතිඥ) හර්ෂණ නානායක්කාර මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරුන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

මගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නම ඩිජිටල් පුවරුවේ සඳහන් වෙනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ඒක "No" නොවෙයි, "Yes" වෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]* මට වැරැදිලා නොවෙයි. මේක වැඩ කරන්නේ නැහැ. දැන් හදන කොට තමයි මාරු වෙලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම යෝජනාවට පක්ෂද, විරුද්ධද?

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මේක වැඩ කළේ නැහැ, ගරු කථානායකතුමා. මේගොල්ලෝ හදන කොට වැරදුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම යෝජනාවට පක්ෂද, විරුද්ධද?

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, එය සටහන් කරගන්න.

ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ වෙනත් ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම යෝජනාවට පක්ෂ ද, විරුද්ධ ද?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
පක්ෂයි.

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නෙයිනා තම්බි මරික්කාර් මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම යෝජනාවට පක්ෂ ද, විරුද්ධ ද?

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
පක්ෂයි.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම යෝජනාවට පක්ෂ ද, විරුද්ධ ද?

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
විරුද්ධයි.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම යෝජනාවට පක්ෂ ද, විරුද්ධ ද?

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
ගරු කථානායකතුමනි, දැන් හරි. මගේ නම ඩිජිටල් පුවරුවේ තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර අසුන් ගන්න.

ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ වෙනත් ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිටින්න.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම යෝජනාවට පක්ෂ ද, විරුද්ධ ද?

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර අසුන් ගන්න.

ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ වෙනත් ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிட்டல் திரையில் காண்பிக்கப்பட்டது.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 33; විරුද්ධව 151; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 33; எதிராக 151; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 33; Noes 151; Abstain 0.*

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | No |
| G 002. Sunil Handunnetti | No |
| G 005. Nalinda Jayatissa | No |
| G 006. Bimal Rathnayake | No |
| G 007. Harini Amarasuriya | No |
| G 009. Ramalingam Chandrasekar | No |
| G 010. Wasantha Samarasinghe | No |
| G 011. A.H.M.H. Abayarathna | No |
| G 012. Chrishantha Abeysena | No |
| G 013. Anil Jayantha | No |
| G 014. Harshana Nanayakkara | No |
| G 015. Dammika Patabendi | No |
| G 016. Saroja Savithri Paulraj | No |
| G 017. Ananda Wijepala | No |
| G 018. Hiniduma Sunil Senevi | No |
| G 019. Sunil Kumara Gamage | No |
| G 020. Susil Ranasinghe | No |
| G 021. Rizvie Salih | No |
| G 022. Anura Karunathilaka | No |
| G 023. Upali Pannilage | No |
| G 024. Kumara Jayakody | No |
| G 025. Nihal Galappaththi | No |
| G 026. Nihal Abeysinghe | No |
| G 027. Namal Karunaratne | No |
| G 028. Wasantha Piyathissa | No |
| G 029. Gamagedara Dissanayake | No |
| G 030. R.M. Jayawardhana | No |
| G 031. Sunil Watagala | No |
| G 032. Rathna Gamage | No |
| G 033. Mahinda Jayasinghe | No |
| G 034. Chathuranga Abeysinghe | No |
| G 035. Eranga Gunasekara | No |
| G 036. Upali Samarasingha | No |
| G 037. T.B. Sarath | No |
| G 038. Nalin Hewage | No |
| G 039. Prasanna Gunasena | No |
| G 041. Hemali Weerasekara | No |
| G 042. Sundaralingam Pradeep | No |
| G 043. Ruwan Ranasinghe | No |
| G 044. Muneer Mulaffer | No |
| G 045. Hansaka Wijemuni | No |
| G 046. Eranga Weeraratne | No |
| G 047. Namal Sudarshana | No |
| G 048. P. Ruwan Senarath | No |
| G 049. Madhura Senevirathna | No |
| G 050. Arun Hemachandra | No |
| G 051. Janitha Ruwan Kodithuwakku | No |
| G 052. Aruna Jayasekera | No |
| G 053. Sugath Thilakaratne | No |
| G 054. Kaushalya Ariyarathne | No |
| G 055. Arkam Ilyas | No |
| G 056. Aravinda Senarath | No |
| G 057. Dinindu Saman | No |
| G 058. Nishantha Jayaweera | No |
| G 060. Lakshman Nipuna Arachchi | No |
| G 061. Gayan Janaka | No |
| G 062. Najith Indika | No |
| G 063. Lakmali Hemachandra | No |
| G 064. Samanmali Gunasingha | No |
| G 065. R.M. Gamini Rathnayake | No |
| G 066. Manjula Suraweera Arachchi | No |
| G 067. K. Ilankumaran | No |
| G 068. Shantha Pathma Kumara Subasingha | No |
| G 069. Ajith Agalakada | No |
| G 070. Sagarika Athauda | No |
| G 071. Roshan Akmeemana | No |
| G 072. U. P. Abeywickrama | No |
| G 073. L.M. Abeywickrama | No |
| G 074. M.K.M. Aslam | No |
| G 075. Asitha Niroshana Egoda Vithana | No |
| G 076. Oshani Umanga | No |
| G 077. Krishnan Kalaichelvi | No |
| G 078. Upul Kithsiri | No |
| G 079. Wasantha Pushpa Kumara | No |
| G 080. Chaminda Lalith Kumara | No |
| G 081. Sarath Kumara | No |
| G 082. Nilanthi Kottahachchi | No |
| G 083. M.A.C.S. Chathuri Gangani | No |
| G 084. Darmapriya Wijesinghe | No |
| G 085. Thilanka U. Gamage | No |
| G 086. Nilusha Lakmali Gamage | No |
| G 087. Ajantha Gammeddage | No |
| G 088. Ajith Gihan | No |
| G 089. Jagath Gunawardana | No |
| G 090. Aboobucker Athambawa | No |
| G 091. Ruwanthilaka Jayakody | No |
| G 092. Thushari Jayasingha | No |
| G 093. T.K. Jayasundara | No |
| G 094. Mayilvaganam Jegatheeswaran | No |
| G 095. Rajeevan Jeyachandramoorthy | No |
| G 096. Sellaththamby Thilaganathan | No |
| G 097. Sugath Wasantha de Silva | No |
| G 098. Anushka Thilakarathne | No |
| G 099. Chandana Thennakoon | No |
| G 100. Thanura Dissanayake | No |
| G 101. Dharmapriya Dissanayake | No |
| G 102. Sujeewa Dissanayake | No |
| G 103. Kanthasamy Prabu | No |
| G 104. Susantha Kumara Nawarathna | No |
| G 105. Sena Nanayakkara | No |
| G 106. Aruna Panagoda | No |
| G 107. Nimal Palihena | No |
| G 108. Nishantha Perera | No |
| G 109. Stepni Fernando | No |
| G 110. Susantha Dodawatta | No |
| G 111. Lal Premanath | No |
| G 112. Nanda Bandara | No |
| G 113. Padmasiri Bandara | No |
| G 114. Ravindra Bandara | No |
| G 115. Sudath Balagalla | No |
| G 116. Sri Bavanandarajah | No |
| O 005. Rauff Hakeem | Yes |
| O 006. R.M.Ranjith Madduma Bandara | Yes |
| O 007. Gayantha Karunathilleka | Yes |
| O 008. Sajith Premadasa | Yes |
| O 011. Namal Rajapaksha | Yes |
| O 014. G.G. Ponnambalam | Yes |
| O 016. Ramanathan Archchuna | Yes |
| O 017. M.A.M. Thahir | Yes |
| O 021. Dayasiri Jayasekara | Yes |
| O 023. Ajith P. Perera | Yes |
| O 024. Sujeewa Senasinghe | Yes |
| O 027. J. C. Alawathuwala | Yes |
| O 028. Nalin Bandara Jayamaha | Yes |
| O 029. Hector Appuhamy | Yes |
| O 030. Hesha Withanage | Yes |
| O 031. Kavinda Heshan Jayawardhana | Yes |
| O 032. Sujith Sanjaya Perera | Yes |
| O 033. S.M. Marikkar | Yes |
| O 034. Imran Maharoof | Yes |

| | |
|---|---|
| O 035. Harshana Rajakaruna | Yes |
| O 036. Rohini Kumari Wijerathna | Yes |
| O 041. Chaminda Wijesiri | Yes |
| O 042. Mujibur Rahman | Yes |
| O 043. Waruna Liyanage | Yes |
| O 046. W.H.M. Dharmasena | Yes |
| O 048. B. Ariyawansha | Yes |
| O 050. Chathura Galappaththi | Yes |
| O 051. Chithral Fernando | Yes |
| O 052. Amila Prasad | Yes |
| O 055. D.V. Chanaka | Yes |
| O 057. M.S. Uthumalebbe | Yes |
| O 062. Jagath Vithana | Yes |
| O 063. Nizam Kariapper | Yes |
| O 065. E. M. Basnayaka | No |
| O 066. Wijesiri Basnayake | No |
| O 067. S. Sandaruwan Madarasinghe | No |
| O 068. Prageeth Madhuranga | No |
| O 069. Jagath Manuwarna | No |
| O 070. Ruwan Mapalagama | No |
| O 071. Nandana Millagala | No |
| O 072. Riyas Farook | No |
| O 081. Danushka Ranganath | No |
| O 082. Sanjeewa Ranasingha | No |
| O 083. Sunil Rathnasiri | No |
| O 084. Manjula Sugath Rathnayaka | No |
| O 085. A.M.M.M. Rathwaththe | No |
| O 086. Manoj Rajapaksha | No |
| O 087. Sunil Rajapaksha | No |
| O 088. Hasara Liyanage | No |
| O 089. Deepthi Wasalage | No |
| O 090. Kanchana Welipitiya | No |
| O 091. R. G. Wijerathna | No |
| O 092. Nishantha Samaraweera | No |
| O 093. Priyantha Wijerathna | No |
| O 094. Ruwan Wijeweera | No |
| O 095. Lasith Bhashana Gamage | No |
| O 096. Hiruni Wijesinghe | No |
| O 097. Athula Welandagoda | No |
| O 099. Thilina Samarakoon | No |
| O 100. Ambika Samivel | No |
| O 101. Dewananda Suraweera | No |
| O 103. G.D. Sooriyabandara | No |
| O 104. Kitnan Selvaraj | No |
| O 106. Chandima Hettiaratchi | No |
| O 107. Champika Hettiarachchi | No |
| O 108. Dinesh Hemantha | No |
| O 109. Geetha Herath | No |
| O 110. Bhagya Sri Herath | No |
| O 111. Muhammad Faizal | No |
| O 112. Ashoka Gunasena | No |
| O 113. Nandana Pathmakumara | No |
| O 114. Sunil Biyanwila | No |
| O 115. Samantha Ranasingha | No |

Electronic Voting Results:

**Participants:**

| | |
|---|---|
| Present | 184 |

**Votes:**

| | |
|---|---|
| Yes | 33 |
| No | 151 |
| Abstain | 0 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව, පක්ෂව ඡන්ද 33යි; විරුද්ධව ඡන්ද 151යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 03යි. ඒ අනුව පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 36යි.

නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව විරුද්ධව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 152යි.

ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු (නීතිඥ) හර්ෂණ නානායක්කාර මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව වැඩි ඡන්ද 116කින් පරාජයට පත් වී ඇත.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.16ට, 2026 අගෝස්තු 04වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.16க்கு, பாராளுமன்றம் 2026 ஓகஸ்ட் 04, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.16 p.m. until 9.30 a.m. on Tuesday, 04th August, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### විදුලිය බිඳවැටීම් සහ සූර්ය බල පද්ධති ස්ථාපනය කිරීම: මුලතිව්, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්ක
### மின்தடை மற்றும் சூரிய வலுசக்திக் கட்டமைப்புகளை நிறுவுதல்: முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா மாவட்டங்கள்
### POWER OUTAGES AND INSTALLATION OF SOLAR POWER SYSTEMS: MULLAITIVU, MANNAR AND VAVUNIYA DISTRICTS

2082/2026

**1.** ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මුලතිව්, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල 2026 වර්ෂයේ පළමු මාස 05 තුළ -

(i) වාර්තා වූ විදුලි බිඳවැටීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් විදුලි බිඳවැටීම පැවති කාල සීමාව කොපමණද;

(iii) ඒ සඳහා බලපෑ හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

(ආ) මුලතිව්, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල -

(i) සූර්ය බලශක්ති පද්ධති ස්ථාපනය කර ඇති නිවාස සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පද්ධති ස්ථාපනය කිරීම සඳහා දෙනු ලබන සහනාධාර, ණය සහ දිරිගැන්වීම් කවරේද;

(iii) 2026 වර්ෂයේදී පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සහ වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදනය කොපමණද;

(iv) විදුලි සැපයුමේ අඛණ්ඩතාව බිඳවැටීම හේතුවෙන් අධ්‍යාපන, කුඩා කර්මාන්ත සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්ට එල්ලවී ඇති බලපෑම් තක්සේරු කර තිබේද;

(v) විදුලි සම්බන්ධතා ලබා ගැනීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් වෙත දෙනු ලබන සහනාධාර හෝ වැඩසටහන් කවරේද;

(vi) එම වැඩසටහන් යටතේ පසුගිය වසර 05 තුළ ප්‍රතිලාභ ලබා ඇති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களில் 2026ஆம் ஆண்டின் முதல் 05 மாதங்களில் -

(i) பதிவாகிய மின் தடங்கல்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) ஒவ்வொரு மின் தடங்கலும் நிலவிய காலவரையறை யாது என்பதையும்;

(iii) இதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களில் -

(i) சூரிய வலுசக்திக் கட்டமைப்பு பொருத்தப் பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை பிரதேச செயலக வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி கட்டமைப்பை பொருத்துவதற்கு வழங்கப்படும் நிதயுதவி, கடன் மற்றும் ஊக்குவிப்புத் தொகை தொடர்பான விபரங்கள் யாவை என்பதையும்;

(iii) 2026ஆம் ஆண்டில் புதுப்பிக்கத்தக்க வலுசக்திப் பயன்பாட்டை ஊக்குவிப்பதற்கு நடைமுறைப் படுத்தப்படுகின்ற நிகழ்ச்சித்திட்டங்கள் மற்றும் இதற்காக ஒதுக்கப்பட்டுள்ள நிதி தொடர்பான விபரங்கள் யாவை என்பதையும்;

(iv) தொடர்ச்சியான மின்விநியோகத்துக்கு ஏற்படும் தடங்கல்கள் காரணமாக கல்வி, சிறு கைத் தொழில் மற்றும் விவசாயத்துறைக்கு ஏற்பட்டுள்ள பாதிப்புகள் மதிப்பிடப்பட் டுள்ளனவா என்பதையும்;

(v) மின் இணைப்புகளைப் பெற்றுக்கொள்வதற்கு குறைந்த வருமானம்பெறும் குடும்பங்களுக்கு வழங்கப்படும் உதவுத்தொகை அல்லது நிகழ்ச்சித்திட்டங்கள் பற்றிய விபரங்கள் யாவை என்பதையும்;

(vi) மேற்படி நிகழ்ச்சித்திட்டங்களின்கீழ் கடந்த ஐந்து ஆண்டுகளில் பயனடைந்துள்ள குடும்பங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he state in respect of Mullaitivu, Mannar and Vavuniya Districts and during the first five months of 2026 -

(i) the number of power outages reported, separately in each district;

(ii) the period for which each power outage lasted; and

(iii) the reasons for the said power outages?

(b) Will he inform this House in respect of Mullaitivu, Mannar and Vavuniya Districts -

(i) the number of houses in which solar power systems have been installed, separately by Divisional Secretary's Division;

(ii) the subsidies, loans and incentives provided for the installation of such systems;

(iii) the programmes to be implemented in 2026 to promote the use of renewable energy, and the financial allocation made for those programmes;

(iv) whether an assessment has been conducted on the impact exerted on the education, small industries and agricultural sectors due to the breakdown in the continuity of electricity supply;

(v) the subsidies or schemes available to low-income families for obtaining electricity connections; and

(vi) the number of families who have benefited under those schemes during the last five years, separately?

(c) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

(අ) (i) 2026 වසරේ පළමු මාස පහ තුළ මුලතිව්, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල වාර්තා වූ විදුලි බිඳවැටීම් සංඛ්‍යාව වගුව 1 හි 3 වන තීරුවේ දක්වා ඇත.

වගුව 1: විදුලි බිඳවැටීම් පිළිබඳ විස්තර:

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | පාරිභෝගික සේවා මධ්‍යස්ථානය | විදුලි බිඳවැටීම් සංඛ්‍යාව | කාලසීමාව (මිනිත්තුවලින්) | හේතු |
| මුලතිව් | මාන්කුලම් | 112 | 10,509 | 1. අයහපත් කාලගුණ තත්ත්වය සහ විදුලි රැහැන් මත ගස් කඩා වැටීම.<br>2. සතුන් සහ පක්ෂීන් හේතුවෙන් |
| මුලතිව් | මුලතිව් | 114 | 11,732 | 1. අයහපත් කාලගුණ තත්ත්වයන් සහ විදුලි රැහැන් මත ගස් කඩා වැටීම.<br>2. සතුන් සහ පක්ෂීන් හේතුවෙන්. |
| මන්නාරම | මඩු | 92 | 6,619 | 1. භූගෝලීය ප්‍රදේශය විශාල බැවින් එම ස්ථාන වෙත ප්‍රවේශ වීමට වැඩි කාලයක් ගතවීම.<br>2. සතුන් සහ පක්ෂීන් හේතුවෙන්.<br>3. දූෂක තැන්පත් වීම හේතුවෙන් සන්නායක හා පරිවාරකවලට සිදුවන හානි නිසා නිරිතදිග මෝසම් කාලයේ නිතර විදුලි බිඳවැටීම සිදුවීම. |
| මන්නාරම | මන්නාරම | 262 | 27,012 | 1. සුළි කුණාටුවෙන් පසු ප්‍රවේශ වීමේ අපහසුතා හේතුවෙන් විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීම ප්‍රමාද වීම.<br>2. දූෂක තැන්පත් වීම හේතුවෙන් සන්නායක හා පරිවාරකවලට සිදුවන හානි නිසා නිරිතදිග මෝසම් කාලයේ නිතර විදුලි බිඳවැටීම් සිදුවීම.<br>3. EDLහි දැනුවත්භාවයකින් තොරව පළාත් පාලන ආයතන විසින් වීදි ලාම්පු ස්ථාපනය කර තිබීම.<br>4. සතුන් සහ පක්ෂීන් හේතුවෙන්. |
| වවුනියාව | වවුනියාව | 185 | 29,017 | 1. මැයි මස අවසානයේ ඇති වූ තද සුළං හේතුවෙන් විදුලි බිඳවැටීම් සංඛ්‍යාව ඉහළ යෑම.<br>2. යම් කාලසීමාවක් තුළ අධි වෝල්ටීයතා (HV) රැහැන්වල සන්නායක නැවත යෙදීමේ කටයුතු සිදු කිරීම. |

(ii) විදුලි බිඳවැටීම්වල කාලසීමාව වගුව 1 හි 4 වන තීරුවේ දක්වා ඇත.

(iii) විදුලි බිඳවැටීම් සඳහා වූ හේතු වගුව 1 හි 5 වන තීරුවේ දක්වා ඇත.

(ආ) (i) විස්තර පහත වගුව 2හි දක්වා ඇත.

වගුව 2: වහල මත සූර්ය බල පද්ධති සහිත නිවාස සංඛ්‍යාව:

| දිස්ත්‍රික්කය | පාරිභෝගික සේවා මධ්‍යස්ථානය | වහල මත සූර්ය බල සම්බන්ධතා සංඛ්‍යාව |
|---|---|---|
| මුලතිව් | මාන්කුලම් | 432 |
| | මුලතිව් | |
| මන්නාරම | මන්නාරම | 402 |
| මන්නාරම | මඩු | 68 |
| වවුනියාව | වවුනියාව | 610 |

(ii) වහල මත සූර්ය බලශක්ති පද්ධති සවිකිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර ඇතිව වාණිජ බැංකු හරහා සහන ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. මේ වන විට රාජ්‍ය හා පෞද්ගලික බැංකු මඟින් සූර්ය පද්ධති ස්ථාපනය කිරීම සඳහා ණය පහසුකම් සලසා දී ඇත. නැවත මෙම ක්ෂේත්‍රය සඳහා සහනාධාර අවශ්‍ය වන බව නිරීක්ෂණය නොකරමි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් වහල මත සවිකර ඇති සූර්ය පැනල මඟින් සූර්ය බලශක්ති උත්පාදනයෙන් ලැබෙන ආදායම් සඳහා මුල් වසර 5ට බදු සහන ලබා දෙනු ලබයි.

(iii) 2026 වසරේ පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් වැඩසටහන් සැලසුම් කර ඇති අතර ජාතික විදුලිබල පද්ධතියේ ධාරිතාවේ ඇති ගැටලු නිරාකරණය කිරීම සඳහාද කටයුතු කරමින් සිටියි.

ඒ සඳහා පහත ක්‍රියාමාර්ග ගනිමින් ඇත.

1. පද්ධතියේ ධාරිතාව වැඩි කිරීම සඳහා ග්‍රිඩ් උපපොළවල් වැඩිදියුණු කිරීම හා අලුතින් උපපොළවල් පිහිටුවීම.
2. බැටරි තුළ ගබඩා කරන බලශක්ති ව්‍යාපෘති ස්ථාපනය සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම.
3. විදුලි සම්ප්‍රේෂණ මාර්ග වැඩිදියුණු කිරීම සහ අලුතින් ස්ථාපිත කිරීම.
4. පද්ධතියේ ස්ථායිතාව රැකගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(iv) විදුලිසැපයුමේ අඛණ්ඩතාව බිඳවැටීම හේතුවෙන් අධ්‍යාපන, කුඩා කර්මාන්ත සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රවලට එල්ල වී ඇති බලපෑම් පිළිබඳව මෙම අමාත්‍යාංශයේ අවධානය යොමු වී ඇති අතර විදුලි සැපයුමේ අඛණ්ඩතාව රැක ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් ඇත.

[ගරු අනුර කරුණාතිලක මහතා]

(v) අඩු ආදායම්ලාභී පවුල් වෙත විදුලි සම්බන්ධතා ලබා ගැනීම සඳහා එවකට ලංකා විදුලිබල මණ්ඩලය, මහජන බැංකුව, සමෘද්ධි වැඩසටහන හා මෙම අමාත්‍යාංශය එක්ව ණය වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර ණය නැවත අයකිරීමේදී ඇතිවූ ගැටලු හේතුවෙන් එම වැඩසටහන නැවතී ඇති අතර, නැවත එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමුවී ඇත.

(vi) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

(அ) (i) முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியாவில் 2026ஆம் ஆண்டின் முதல் ஐந்து மாதங்களில் பதிவான மின்வெட்டுகளின் எண்ணிக்கை அட்டவணை Iஇன் நிரல் 3இல் வழங்கப் பட்டுள்ளது.

அட்டவணை 1: மின்வெட்டு விபரங்கள்

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| **மாவட்டம்** | **ECSC** | **மின் வெட்டுகளின் எண்ணிக்கை** | **கால அளவு (நிமிடங் களில்)** | **காரணங்கள்** |
| முல்லைத் தீவு | மாங்குளம் | 112 | 10,509 | 1. மோசமான வானிலை மற்றும் மின்கம்பிகள் மீது மரம் விழுதல்.<br>2. விலங்குகள் மற்றும் பறவைகளால் ஏற்படும் பாதிப்புகள். |
| முல்லைத் தீவு | முல்லைத் தீவு | 114 | 11,732 | 1. மோசமான வானிலை மற்றும் மின்கம்பிகள்மீது மரம் விழுதல்.<br>2. விலங்குகள் மற்றும் பறவைகளால் ஏற்படும் பாதிப்புகள். |
| மன்னார் | மடு | 92 | 6,619 | 1. பரந்த புவியியல் பகுதி என்பதால், அந்த இடங்களைச் சென்றடைய அதிக நேரம் ஆகும்.<br>2. விலங்குகள் மற்றும் பறவைகளால் ஏற்படும் பாதிப்புகள்.<br>3. கடத்தி மற்றும் மின்காப்பான் சேதமடைவதால் தென்மேற்குப் பருவமழையின் போது மின்வெட்டு அடிக்கடி நிகழ்கிறது. |
| மன்னார் | மன்னார் | 262 | 27,012 | 1. புயலுக்குப் பிறகு உடனடியாக மேற்கொள்ளப்பட்ட சீரமைப்புப் பணிகள், அணுகுவதற்கு கடினமாக இருந்த காரணத்தால் தாமதத்தை ஏற்படுத்தின.<br>2. மாசு காரணமாக கடத்தி மற்றும் மின்காப்பான் சேதமடைந்ததால், தென்மேற்குப் பருவமழையின் போது அடிக்கடி மின்வெட்டுகள் ஏற்படுகின்றன.<br>3. எங்களுக்குத் தெரியாமல் உள்ளூராட்சி அமைப்புகளால் தெருவிளக்குகள் பொருத்தப்பட்டன. 4. விலங்குகள் மற்றும் பறவைகளால் ஏற்படும் பாதிப்புகள். |
| வவுனியா | வவுனியா | 185 | 29,017 | 1. மே மாத இறுதியில் வீசிய பலத்த காற்று காரணமாக, மின்வெட்டுகள் அதிகமாக இருந்தன.<br>2. HV இணைப்புகளை மறுசீரமைக்கும் பணி குறிப்பிட்ட காலத்துக்கு நடைபெற்றது. |

(ii) மின்வெட்டுகளின் கால அளவு அட்டவணை Iஇன் நிரல் 4இல் வழங்கப்பட்டுள்ளது.

(iii) மின்வெட்டுகளுக்கான காரணங்கள் அட்ட வணை Iஇன் நிரல் 5இல் வழங்கப்பட்டுள்ளன.

(ஆ) (i) விபரங்கள் கீழேயுள்ள அட்டவணை 2இல் கொடுக்கப்பட்டுள்ளன.

*அட்டவணை 2: கூரையின்மேல் சூரிய சக்தி அமைப்புகளைக் கொண்ட வீடுகளின் எண்ணிக்கை.*

| மாவட்டம் | ECSC | கூரையின்மேல் பொருத்தப்படும் சூரிய சக்தி மின்கலங்களின் எண்ணிக்கை |
|---|---|---|
| முல்லைத்தீவு | மாங்குளம் | 412 |
| | முல்லைத்தீவு | |
| மன்னார் | மன்னார் | 402 |
| மன்னார் | மடு | 68 |
| வவுனியா | வவுனியா | 610 |

(ii) கூரையின்மேல் சூரிய சக்தி அமைப்புகளை நிறுவுவதை ஊக்குவிப்பதற்காக, ஆசிய அபிவிருத்தி வங்கியின் நிதி உதவியுடன் வணிக வங்கிகள்மூலம் சலுகைக் கடன் திட்டங்கள் செயற்படுத்தப்பட்டன. தற்போது, அரச மற்றும் தனியார் வங்கிகள் சூரிய சக்தி அமைப்புகளை நிறுவுவதற்குக் கடன் வசதிகளை வழங்கி யுள்ளன. இத்தொழிற்றுறைக்கு மீண்டும் மானியங்கள் தேவைப்படுமென நான் கருத வில்லை. கூரையின்மேல் சூரிய சக்தி தகடுகள் மூலம் உற்பத்தி செய்யப்படும் சூரிய சக்தியி லிருந்து ஈட்டப்படும் வருமானத்துக்கு, முதல் 5 ஆண்டுகளுக்கு உள்நாட்டு இறைவரித் திணைக்களம் வரி விலக்கு அளிக்கிறது.

(iii) இந்த அமைச்சும் இதன்கீழ் செயற்படும் நிறுவனங்களும் 2026ஆம் ஆண்டில் மீள்புதுப் பிக்கத்தக்க சக்திப் பயன்பாட்டை ஊக்குவிப் பதற்கான திட்டங்களை வகுத்துள்ளன. மேலும், தேசிய மின்கட்டமைப்புத் திறன் தொடர்பான சிக்கல்களை குறைக்கும் பணிகளிலும் ஈடுபட் டுள்ளன.

இது தொடர்பாக பின்வரும் நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றன.

1. அமைப்பின் திறனை மேம்படுத்துவதற்காக, மின் கட்டமைப்புத் துணை மின்சார நிலையங்களை வலுப்படுத்துதல் மற்றும் புதிய மின்கட்டமைப்புத் துணை மின்சார நிலையங்களை நிறுவுதல்.
2. உலர் மின்கல சக்தி சேமிப்புத் திட்டங்களை நிறுவுவதற்கான பெறுகைச் செயன் முறைகளை ஆரம்பித்தல்.
3. புதிய மின்சாரப் பரிமாற்றல் இணைப் புகளை மேம்படுத்துதல் மற்றும் நிறுவுதல்.
4. அமைப்பின் நிலையான தன்மையை பராமரிக்கத் தேவையான நடவடிக்கை களைச் செயற்படுத்துதல்.

(iv) தொடர்ச்சியான மின்சார விநியோகத்தில் ஏற்பட்ட தடைகளால் கல்வி, சிறு கைத் தொழில்கள் மற்றும் விவசாயத் துறைகளில் ஏற்பட்டுள்ள பாதிப்புகளை அமைச்சு கவனத்தில் கொண்டுள்ளதுடன், தடையற்ற மின்சார விநியோகத்தை உறுதிசெய்வதற்குத் தேவை யான நடவடிக்கைகளும் எடுக்கப்பட்டு வருகின்றன.

(v) குறைந்த வருமானம் கொண்ட குடும்பங்களுக்கு மின்சார இணைப்பு வழங்கும் கடன் திட்டம், அப்போதைய இலங்கை மின்சார சபை, மக்கள் வங்கி, சமுர்த்தித் திட்டம் மற்றும் இவ்வமைச்சு ஆகியவற்றுடன் இணைந்து செயற்படுத்தப் பட்டது. ஆனால், கடன் வசூலில் ஏற்பட்ட சிக்கல்கள் காரணமாக அத்திட்டம் நிறுத்தப் பட்டது. இதுபோன்ற திட்டங்களை மீண்டும் செயற்படுத்துவது குறித்து பரிசீலிக்கப்பட்டு வருகின்றது.

(vi) பொருத்தமற்றது.

(இ) பொருத்தமற்றது.

(a) (i) The number of power outages reported during the first five months of 2026 in Mullaitivu, Mannar and Vavuniya Districts is presented in Column 3 of Table 1.

*Table 1: Details of power outages*

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| **District** | **ECSC** | **No. of power outages** | **Period (in minutes)** | **Reasons** |
| Mullaitivu | Mankulam | 112 | 10,509 | 1. Adverse weather condition and tree fallen on lines.<br>2. Due to animals and birds. |
| Mullaitivu | Mullaitivu | 114 | 11,732 | 1. Adverse weather condition and tree fallen on lines.<br>2. Due to animals and birds. |
| Mannar | Madhu | 92 | 6,619 | 1. A large geographical area. Therefore, time duration to access those places is high.<br>2. Due to animals and birds.<br>3. Conductor and insulator damage due to contamination causes frequent breakdowns during South-west Monsoon. |
| Mannar | Mannar | 262 | 27,012 | 1. Restoration immediately after the cyclone made delay due to difficult access.<br>2. Conductor and insulator damage due to contamination causes frequent breakdowns during South-west Monsoon.<br>3. Street lamps were installed by local bodies without our knowledge<br>4. Due to animals and birds. |
| Vavuniya | Vavuniya | 185 | 29,017 | 1. Due to high wind during end of May, the breakdowns were high.<br>2. Reconductoring work of HV lines took part for particular duration. |

[ගරු අනුර කරුණාතිලක මහතා]

(ii) The duration of the power outages is given in column 4 of Table 1.

(iii) The reasons for the power outages are given in column 5 of Table 1.

(b) (i) Details are provided in Table 2 below.

*Table 2: Number of houses with rooftop solar systems*

| District | ECSC | No. of Solar Rooftop Connections |
|---|---|---|
| Mullaitivu | Mankulam | 432 |
| | Mullaitivu | |
| Mannar | Mannar | 402 |
| Mannar | Madhu | 68 |
| Vavuniya | Vavuniya | 610 |

(ii) To promote installation of rooftop solar systems, a concessional loan scheme was implemented through commercial banks with financial assistance from the Asian Development Bank. Currently, public and private banks have offered loan facilities for installing solar systems. I do not observe that this sector needs subsidies again. The Department of Inland Revenue allows tax reliefs for the first five years on income earned from solar power generations from rooftop solar panels.

(iii) This Ministry and the institutions operating under this Ministry have planned programmes to promote the use of renewable energy in 2026 and are working to mitigate the National Grid capacity issues.

The following measures are being taken in this regard:

1. Augmentation of grid substations and establishment of new grid substations to enhance the system capacity.
2. Initiation of procurements for the installation of battery energy storage projects.
3. Upgrade and establishment of new electricity transmission lines.
4. Implement necessary measures to maintain system stability.

(iv) The Ministry has taken note of the impact on the education, small industries and agricultural sectors due to the breakdown in the continuity of electricity supply and necessary actions are being taken to ensure an uninterrupted electricity supply.

(v) A loan programme to provide electricity connections to low-income families was jointly implemented with the then Ceylon Electricity Board, the People's Bank, the Samurdhi Programme and this Ministry, but was halted due to issues that arose with loan recovery, and implementing such programmes again is under consideration.

(vi) Not applicable.

((c) Not applicable.

## විදුලිය සහිත නිවාස: මුලතිව්, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්ක

## மின்சார வசதிகொண்ட குடியிருப்புகள்: முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா மாவட்டங்கள்

## HOUSES WITH ACCESS TO ELECTRICITY: MULLAITIVU, MANNAR AND VAVUNIYA DISTRICTS

2083/2026

**2.** ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ විදුලි පහසුකම් සහිත නිවාස සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව;

(ii) විදුලි පහසුකම් නොමැති සහ විදුලි පහසුකම් අවශ්‍ය නිවාස සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව;

(iii) මුලතිවු, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල විදුලි පහසුකම් සහිත නිවාස සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව;

(iv) එම දිස්ත්‍රික්කවල විදුලි පහසුකම් නොමැති සහ විදුලි පහසුකම් අවශ්‍ය නිවාස සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පසුගිය අවුරුදු 05 තුළ ඉහත අ(iii)හි සඳහන් දිස්ත්‍රික්කවල නව විදුලි පහසුකම් ලබාදුන් නිවාස සංඛ්‍යාව;

(ii) එම දිස්ත්‍රික්කවල කෙටි පණිවුඩ සේවාව (SMS) මඟින් විදුලි බිල්පත් ලබාගැනීමට ලියාපදිංචි වී ඇති සහ ලියාපදිංචි වී නොමැති විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) 2026 වර්ෂයේදී එම දිස්ත්‍රික්කවල විදුලි පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ ඒ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කවල ග්‍රාමීය සහ දුෂ්කර ප්‍රදේශවල විදුලි සම්බන්ධතා ව්‍යාප්ත කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் மின்சார வசதியைக் கொண்டுள்ள குடியிருப்புகளின் எண்ணிக்கை மாவட்ட வாரியாகவும்;

(ii) மின்சார வசதி அற்றதும் மின்சார வசதி தேவைப்படுகின்றதுமான குடியிருப்புகளின் எண்ணிக்கை மாவட்ட வாரியாகவும்;

(iii) முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா ஆகிய மாவட்டங்களில் மின்சார வசதியுள்ள குடியிருப்பு களின் எண்ணிக்கை பிரதேச செயலாளர் பிரிவு வாரியாகவும்;

(iv) மேற்படி மாவட்டங்களில் மின்சார வசதி அற்றதும் மின்சார வசதி தேவைப்படுகின்றது மான குடியிருப்புகளின் எண்ணிக்கை பிரதேச செயலாளர் பிரிவு வாரியாகவும்;

வெவ்வேறாக யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கடந்த 05 வருட காலத்தினுள் மேற்படி அ(iii)இல் குறிப்பிடப்பட்டுள்ள மாவட்டங்களில், புதிதாக மின்சார வசதி வழங்கப்பட்டுள்ள குடியிருப்பு களின் எண்ணிக்கை;

(ii) மேற்படி மாவட்டங்களில் குறுஞ்செய்திச் சேவை (SMS) மூலம் மின்சாரக் கட்டணப் பட்டியல் களைப் பெற்றுக்கொள்வதற்குப் பதிவு செய்துள்ள மற்றும் பதிவு செய்யாதுள்ள மின் பாவனையாளர்களின் எண்ணிக்கை;

வெவ்வேறாக யாது என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) 2026ஆம் ஆண்டில் மேற்படி மாவட்டங்களில் மின்சார வசதிகளை மேம்படுத்துவதற்காக நடைமுறைப்படுத்தப்பட்டுள்ள கருத்திட்டங்கள் மற்றும் அதற்கென ஒதுக்கப்பட்டுள்ள நிதி ஏற்பாடுகள் யாவை என்பதையும்;

(ii) அம்மாவட்டங்களில் கிராமிய மற்றும் கஷ்டப் பிரதேசங்களுக்கான மின் இணைப்புகளை விரிவுபடுத்துவதற்காக நடைமுறைப்படுத்தப் படுகின்ற நிகழ்ச்சித்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House, separately, the number of houses -

(i) in Sri Lanka with access to electricity by district;

(ii) without access to electricity and requiring electricity connections by district;

(iii) with access to electricity in the Districts of Mullaitivu, Mannar and Vavuniya, by Divisional Secretary's Division; and

(iv) without access to electricity and requiring electricity connections in those districts, by Divisional Secretary's Division?

(b) Will he also inform this House, separately, the number of -

(i) houses provided with new electricity connections during the past five years in the districts referred to in (a)(iii) above; and

(ii) electricity consumers in those districts who have registered and who have not registered to receive electricity bills via the Short Message Service (SMS)?

(c) Will he further inform this House the -

(i) projects implemented in 2026 to improve electricity services in those districts, and the financial allocation made for those projects; and

(ii) programmes being implemented to expand electricity connections in the rural and remote areas of those districts?

(d) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

(අ) (i) කරුණාකර වගුව 1 බලන්න.

වගුව 1: 2025 දෙසැම්බර් 31 දිනට අප සමාගම - EDL- හි ගෘහස්ථ පාරිභෝගිකයින් සංඛ්‍යාව

| පළාත | ප්‍රදේශය | ගෘහස්ථ |
|---|---|---|
| මධ්‍යම පළාත 1 | දඹුල්ල | 67,475 |
| | ගලගෙදර | 64,202 |
| | මහනුවර නගරය | 37,756 |
| | කටුගස්තොට | 62,008 |
| | කුණ්ඩසාලේ | 119,729 |
| | මාතලේ | 82,707 |
| මධ්‍යම පළාත 2 | ගිනිගත්හේන | 72,479 |
| | හඟුරන්කෙත | 58,702 |
| | කෑගල්ල | 92,466 |
| | මාවනැල්ල | 60,589 |
| | නාවලපිටිය | 78,835 |
| | නුවරඑළිය | 74,117 |
| | පේරාදෙණිය | 91,139 |
| කොළඹ නගරය | කොළඹ නැගෙනහිර | 40,782 |
| | කොළඹ උතුර | 51,248 |
| | කොළඹ දකුණ | 44,879 |
| | කොළඹ බටහිර | 17,458 |
| නැගෙනහිර පළාත | අම්පාර | 150,916 |
| | මඩකලපුව | 103,749 |
| | කල්මුණේ | 91,087 |
| | ත්‍රිකුණාමලය | 130,176 |
| | වාලච්චේන | 73,946 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 179,214 |
| | කැකිරාව | 120,832 |
| | මින්නේරිය | 134,713 |
| වයඹ පළාත 1 | හලාවත | 94,975 |
| | කුලියාපිටිය | 89,430 |
| | පුත්තලම | 100,585 |
| | වෙන්නප්පුව | 81,302 |

[ගරු අනුර කරුණාතිලක මහතා]

| පළාත | ප්‍රදේශය | ගෘහස්ථ |
|---|---|---|
| වයඹ පළාත 2 | කුරුණෑගල | 142,265 |
| | මහව | 102,650 |
| | නාරම්මල | 87,497 |
| | වාරියපොල | 89,951 |
| උතුරු පළාත | යාපනය | 131,213 |
| | යාපනය නැගෙනහිර | 56,354 |
| | කිලිනොච්චිය | 79,426 |
| | වවුනියාව | 92,774 |
| සබරගමුව පළාත | ඇඹිලිපිටිය | 95,026 |
| | ඇහැලියගොඩ | 83,748 |
| | කහවත්ත | 105,210 |
| | රත්නපුර | 82,181 |
| | රුවන්වැල්ල | 98,962 |
| දකුණු පළාත 1 | අකුරැස්ස | 120,513 |
| | අම්බලන්ගොඩ | 84,107 |
| | බද්දේගම | 78,008 |
| | ගාල්ල | 112,702 |
| දකුණු පළාත 2 | හම්බන්තොට | 94,697 |
| | මාතර | 135,117 |
| | තංගල්ල | 116,606 |
| ඌව පළාත | බදුල්ල | 83,110 |
| | දියතලාව | 120,195 |
| | මහියංගනය | 58,501 |
| | මොනරාගල | 71,050 |
| | වැල්ලවාය | 57,292 |
| බස්නාහිර පළාත උතුර | දිවුලපිටිය | 69,391 |
| | ගම්පහ | 82,321 |
| | ජා-ඇළ | 93,489 |
| | කැලණිය | 108,772 |
| | කිරිදිවැල | 52,918 |
| | මීගමුව | 104,123 |
| | වේයන්ගොඩ | 95,971 |
| බස්නාහිර පළාත දකුණ 1 | දෙහිවල | 48,981 |
| | කළුතර | 64,962 |
| | මතුගම | 65,961 |
| | රත්මලාන | 93,526 |
| බස්නාහිර පළාත දකුණ 2 | අවිස්සාවේල්ල | 79,249 |
| | බණ්ඩාරගම | 55,544 |
| | හෝමාගම | 97,319 |
| | හොරණ | 89,314 |
| | ශ්‍රී ජයවර්ධනපුර | 94,109 |
| **එකතුව** | | **6,142,601** |

(ii) මේ වන විට විදුලිය සපයන ලද නිවාසවල ප්‍රතිශතය සියයට 100ට ඉතා ආසන්නය. නිරන්තරයෙන් අලුතින් ඉල්ලා සිටිනු ලබන විදුලි සම්බන්ධතා නිසා සියයට 100 ඉලක්කය සපුරා ගැනීම ප්‍රායෝගිකව සිදු කළ නොහැක.

(iii) කරුණාකර වගුව 2 බලන්න.

වගුව 2: 2025 දෙසැම්බර් 31 දිනට ගෘහස්ථ පාරිභෝගිකයින් සංඛ්‍යාව

| පළාතප්‍රදේශය ගෘහස්ථ | | |
|---|---|---|
| උතුරු පළාත | යාපනය | 131,213 |
| | යාපනය නැගෙනහිර | 56,354 |
| | කිලිනොච්චිය | 79,426 |
| | වවුනියාව | 92,774 |

(iv) ඉල්ලා සිටි සෑම නිවසකටම පාහේ විදුලි සැපයුම් ලබා දී ඇත. අලුතින් ඉල්ලා සිටින අවස්ථාවලදී එම සබඳතා ලබා දෙනු ලබයි.

(ආ) (i) කරුණාකර වගුව 3 බලන්න.

වගුව 3: පසුගිය වසර පහ තුළ ලබ දුන් නව ගෘහස්ථ විදුලි සම්බන්ධතා සංඛ්‍යාව

| ප්‍රදේශය | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| වවුනියාව | 3,296 | 1,998 | 989 | 1,104 | 547 |

(ii) මේ වන විට පාරිභෝගිකයන් 110,582 දෙනෙකු SMS දැනුම්දීම් සඳහා ලියාපදිංචි වී ඇත. මෙය වවුනියාව ප්‍රදේශයේ මුළු පාරිභෝගිකයන්ගෙන් ආසන්න වශයෙන් සියයට 96ක් නියෝජනය කරයි.

(ඇ) (i) එම දිස්ත්‍රික්කවල විදුලි පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් එම ආයතනවල අරමුදල් භාවිත කරමින් විදුලි පහසුකම් වැඩිදියුණු කිරීම ක්‍රියාත්මක කරනු ඇත.

(ii) එම දිස්ත්‍රික්කවල ග්‍රාමීය සහ දුෂ්කර ප්‍රදේශවල විදුලි සම්බන්ධතා ව්‍යාප්ත කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

(ඈ) අදාළ නොවේ.

(அ) (i) அட்டவணை 1ஐப் பார்க்கவும்:

அட்டவணை1: 2025 டிசம்பர் 31ஆம் திகதியில் உள்ளவாறு EDLஇலுள்ள உள்நாட்டு நுகர் வோரின் எண்ணிக்கை

| மாகாணம் | இடம் | உள்நாட்டு நுகர்வோரின் எண்ணிக்கை |
|---|---|---|
| CP 1 | தம்புள்ளை | 67,475 |
| | கலகெதர | 64,202 |
| | கண்டி நகரம் | 37,756 |
| | கடுகஸ்தோட்டை | 62,008 |
| | குண்டசாலை | 119,729 |
| | மாத்தளை | 82,707 |
| CP 2 | கினிகத்கேன | 72,479 |
| | ஹங்குரன்கெத | 58,702 |
| | கேகாலை | 92,466 |
| | மாவனல்ல | 60,589 |
| | நாவலப்பிட்டி | 78,835 |
| | நுவரெலியா | 74,117 |
| | பேராதனை | 91,139 |
| கொழும்பு நகரம் | கொழும்பு கிழக்கு | 40,782 |
| | கொழும்பு வடக்கு | 51,248 |
| | கொழும்பு தெற்கு | 44,879 |
| | கொழும்பு மேற்கு | 17,458 |
| கிழக்கு | அம்பாறை | 150,916 |
| | மட்டக்களப்பு | 103,749 |
| | கல்முனை | 91,087 |
| | திருகோணமலை | 130,176 |
| | வாழைச்சேனை | 73,946 |
| NCP | அநுராதபுரம் | 179,214 |
| | கெக்கிராவ | 120,832 |
| | மின்னேரியா | 134,713 |
| NWP 1 | சிலாபம் | 94,975 |
| | குளியாபிட்டிய | 89,430 |
| | புத்தளம் | 100,585 |
| | வென்னப்புவ | 81,302 |
| NWP 2 | குருநாகல் | 142,265 |
| | மஹவ | 102,650 |
| | நாரம்மல | 87,497 |
| | வாரியபொல | 89,951 |
| NP | யாழ்ப்பாணம் | 131,213 |
| | யாழ்ப்பாணம் கிழக்கு | 56,354 |
| | கிளிநொச்சி | 79,426 |
| | வவுனியா | 92,774 |
| சப்ரகமுவ | எம்பிலிபிட்டிய | 95,026 |
| | எஹலியகொட | 83,748 |
| | கஹவத்த | 105,210 |
| | இரத்தினபுரி | 82,181 |
| | ருவன்வெல்ல | 98,962 |
| SP 1 | அங்குரஸ்ஸ | 120,513 |
| | அம்பலாங்கொட | 84,107 |
| | பத்தேகம | 78,008 |
| | காலி | 112,702 |
| SP 2 | ஹம்பாந்தோட்டை | 94,697 |
| | மாத்தறை | 135,117 |
| | தங்காலை | 116,606 |
| Uva | பதுளை | 83,110 |
| | தியத்தலாவ | 120,195 |
| | மஹியங்கனை | 58,501 |
| | மொனராகலை | 71,050 |
| | வெல்லவாய | 57,292 |
| WPN | திவுலபிட்டிய | 69,391 |
| | கம்பஹா | 82,321 |
| | ஜாஎல | 93,489 |
| | களனி | 108,772 |
| | கிரிந்திவெல | 52,918 |
| | நீர்கொழும்பு | 104,123 |
| | வெயாங்கொட | 95,971 |
| WPS 1 | தெஹிவளை | 48,981 |
| | களுத்துறை | 64,962 |
| | மத்துகம | 65,961 |
| | இரத்மலானை | 93,526 |
| WPS 2 | அவிசாவளை | 79,249 |
| | பண்டாரகம | 55,544 |
| | ஹோமாகம | 97,319 |
| | ஹொரணை | 89,314 |
| | ஶ்ரீ ஜெயவர்த்தனபுர | 94,109 |
| **மொத்தம்** | | **6,142,601** |

(ii) தற்போதைய நிலையில், மின்சார இணைப்பு பெற்ற வீடுகளின் சதவீதம் கிட்டத்தட்ட 100% ஆக உள்ளது. அடிக்கடி புதிய மின்சார இணைப்புக் கோரிக்கைகள் வருவதால், 100% என்ற இலக்கை அடைவது நடைமுறையில் சாத்தியமற்றது.

(iii) தயவுசெய்து அட்டவணை 2ஐப் பார்க்கவும்.

*அட்டவணை 2: 2025 டிசம்பர் 31ஆம் திகதியில் உள்ளவாறு உள்நாட்டு நுகர்வோரின் எண்ணிக்கை*

| மாகாணம் | இடம் | உள்நாட்டு நுகர்வோரின் எண்ணிக்கை |
|---|---|---|
| NP | யாழ்ப்பாணம் | 131,213 |
| | யாழ்ப்பாணம் கிழக்கு | 56,354 |
| | கிளிநொச்சி | 79,426 |
| | வவுனியா | 92,774 |

[ගරු අනුර කරුණාතිලක මහතා]

(iv) கோரிக்கை விடுத்த ஏறக்குறைய அனைத்து வீடுகளுக்கும் மின்சார இணைப்பு வழங்கப் பட்டுள்ளது. புதிய கோரிக்கைகள் வரும் பட்சத்தில், அதற்கேற்ப இணைப்புகள் வழங்கப் படும்.

(ஆ) (i) தயவுசெய்து அட்டவணை 3ஐப் பார்க்கவும்.

அட்டவணை 3: கடந்த ஐந்து ஆண்டுகளில் வழங்கப்பட்ட புதிய வீட்டு இணைப்புகளின் எண்ணிக்கை.

| இடம் | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| வவுனியா | 3,296 | 1,998 | 989 | 1,104 | 547 |

(ii) தற்போதைய நிலவரப்படி, 110,582 நுகர்வோர் குறுஞ்செய்தி அறிவிப்புகளுக்காக பதிவு செய்துள்ளனர். இது வவுனியா பகுதியின் மொத்த நுகர்வோரில் அண்ணளவாக 96% ஆகும்.

(இ) (i) இந்த அமைச்சின்கீழ் உள்ள நிறுவனங்கள், தங்களது சொந்த நிதியைப் பயன்படுத்தி, அந்த மாவட்டங்களில் மின்சார சேவைகளை மேம்படுத்துவதற்கான மின்சார சேவை மேம் பாட்டுத் திட்டங்களைச் செயற்படுத்தும்.

(ii) அந்த மாவட்டங்களின் கிராமப்புற மற்றும் தொலைதூரப் பகுதிகளில் மின்சார இணைப் புகளை விரிவுபடுத்தும் திட்டங்கள் இவ்வமைச் சால் செயற்படுத்தப்பட்டு வருகின்றன.

(ஈ) பொருத்தமற்றது.

(a) (i) Please refer to Table 1 below:

*Table 1: Number of domestic consumers in our EDL company as at 31st December, 2025*

| Province | Area | Domestic |
|---|---|---|
| CP 1 | Dambulla | 67,475 |
| | Galagedara | 64,202 |
| | Kandy City | 37,756 |
| | Katugastota | 62,008 |
| | Kundasale | 119,729 |
| | Matale | 82,707 |
| CP 2 | Ginigathhena | 72,479 |
| | Hanguranketha | 58,702 |
| | Kegalle | 92,466 |
| | Mawanella | 60,589 |
| | Nawalapitiya | 78,835 |
| | Nuwara Eliya | 74,117 |
| | Peradeniya | 91,139 |
| Colombo City | Colombo East | 40,782 |
| | Colombo North | 51,248 |
| | Colombo South | 44,879 |
| | Colombo West | 17,458 |
| Eastern | Ampara | 150,916 |
| | Batticaloa | 103,749 |
| | Kalmunai | 91,087 |
| | Trincomalee | 130,176 |
| | Valaichchenai | 73,946 |
| NCP | Anuradhapura | 179,214 |
| | Kekirawa | 120,832 |
| | Minneriya | 134,713 |
| NWP 1 | Chilaw | 94,975 |
| | Kuliyapitiya | 89,430 |
| | Puttalama | 100,585 |
| | Wennappuwa | 81,302 |
| NWP2 | Kurunegala | 142,265 |
| | Mahawa | 102,650 |
| | Narammala | 87,497 |
| | Wariyapola | 89,951 |
| NP | Jaffna | 131,213 |
| | Jaffna East | 56,354 |
| | Kilinochchi | 79,426 |
| | Vavuniya | 92,774 |
| Sabaragamuwa | Embilipitiya | 95,026 |
| | Eheliyagoda | 83,748 |
| | Kahawatta | 105,210 |
| | Ratnapura | 82,181 |
| | Ruwanwella | 98,962 |
| SP 1 | Akuressa | 120,513 |
| | Ambalangoda | 84,107 |
| | Baddegama | 78,008 |
| | Galle | 112,702 |
| SP 2 | Hambantota | 94,697 |
| | Matara | 135,117 |
| | Tangalle | 116,606 |
| Uva | Badulla | 83,110 |
| | Diyatalawa | 120,195 |
| | Mahiyanganaya | 58,501 |
| | Monaragala | 71,050 |
| | Wellawaya | 57,292 |
| WPN | Divulapitiya | 69,391 |
| | Gampaha | 82,321 |
| | Ja Ela | 93,489 |
| | Kelaniya | 108,772 |
| | Kirindiwela | 52,918 |
| | Negombo | 104,123 |
| | Veyangoda | 95,971 |

| Province | Area | Domestic |
|---|---|---|
| WPS 1 | Dehiwala | 48,981 |
| | Kalutara | 64,962 |
| | Matugama | 65,961 |
| | Ratmalana | 93,526 |
| WPS 2 | Avissawella | 79,249 |
| | Bandaragama | 55,544 |
| | Homagama | 97,319 |
| | Horana | 89,314 |
| | Sri Jayeward-enepura | 94,109 |
| Total | | **6,142,601** |

(ii) As of now, the percentage of electrified households is close to 100 per cent. Due to frequent new electricity connection requests, achieving the 100 per cent target is impracticable.

(iii) Please refer to Table 2 below:

*Table 2: Number of domestic consumers as at 31st December, 2025*

| Province | Area | Domestic |
|---|---|---|
| NP | Jaffna | 131,213 |
| | Jaffna East | 56,354 |
| | Kilinochchi | 79,426 |
| | Vavuniya | 92,774 |

(iv) Electricity connections have been provided to almost every household that requested. In the event of new requests, connections are provided accordingly.

(b) (i) Please refer to Table 3 below:

*Table 3: Number of new domestic connections provided during the past five years.*

| Area | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|
| Vavuniya | 3,296 | 1,998 | 989 | 1,104 | 547 |

(ii) As of now, 110,582 consumers have registered for SMS notifications. This represents approximately 96 per cent of the total consumers in the Vavuniya area.

(c) (i) The institutions under this Ministry will implement electricity service enhancements to improve electricity services in those districts, utilizing their own funds.

(ii) Programmes to expand electricity connections in the rural and remote areas of those districts are being executed by this Ministry.

(d) Not applicable.

## "ජය ඉසුර" වැඩසටහන: විස්තර
## "ஜய இசுர" நிகழ்ச்சித்திட்டம்: விபரம்
## "JAYA ISURA" PROGRAMME: DETAILS

2117/2026

**3. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) "ජය ඉසුර" වැඩසටහන ආරම්භයේ සිට එය යටතේ අනුමත කර ඇති ණය ප්‍රමාණය සහ එම ණයවල මුළු වටිනාකම කොපමණද;

(ii) 4% - 5% දක්වා වූ සහනදායී පොලී සහනාධාරය ගෙවා තිබේද;

(iii) එසේ නම්, එම වැඩසටහනේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ එම වැඩසටහන මඟින් ලබාගත් ප්‍රතිලාභ කවරේද;

(iv) එම වැඩසටහනට සහභාගි වන වාණිජ බැංකු, එම වැඩසටහනට අනුකූලව කටයුතු කර, අමාත්‍යාංශයෙන් අදාළ පොලී වෙනස ලබාගෙන තිබේද;

(v) වෙනත් වාණිජ බැංකු හරහා ණය ගෙවූ ණය ගැනුම්කරුවන් එම සහනාධාරය සඳහා සුදුසුකම් ලබා තිබුණේද;

(vi) එසේ නම්, ඔවුන්ට එම සහනාධාරය ලබාදී තිබේද;

(vii) වැඩසටහනේ අරමුණු සහ අපේක්ෂිත ප්‍රතිලාභීන් විසින් ලබා ගත් ප්‍රතිලාභ අතර යම් විෂමතාවක් පිළිබඳව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2019 අප්‍රේල් සහ නොවැම්බර් අතර කාලය තුළ සම්පත් බැංකුව හරහා අනුමැතීන් ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම අනුමැතීන් සංඛ්‍යාව සහ වටිනාකම කොපමණද;

(iii) සීමාසහිත ග්ලෙන්රොක් (පෞද්ගලික) සමාගම විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතේ වර්තමාන තත්ත්වය සහ අනුමත කර තිබේ නම්, අදාළ ප්‍රතිලාභ ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'ஜய இசுர' நிகழ்ச்சித்திட்டம் ஆரம்பிக்கப்பட்டதிலிருந்து அதன்கீழ் அங்கீகரிக்கப்பட்ட கடன்களின் எண்ணிக்கை மற்றும் மொத்தப் பெறுமதி யாது என்பதையும்;

(ii) 4%-5% சலுகை வட்டி மானியம் செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறாயின், இந்த நிகழ்ச்சித்திட்டத்தின் ஊடாக நன்மை பெற்றுக்கொண்ட பயனாளிகளின் எண்ணிக்கை மற்றும் நன்மைகள் யாவை என்பதையும்;

(iv) பங்குபற்றுகின்ற வர்த்தக வங்கிகள் இந்த நிகழ்ச்சித்திட்டத்துடன் இணங்கிச் செயற்பட்டனவா என்பதையும், அமைச்சிலிருந்து பெறப்படவேண்டிய உரிய வட்டி மானியத்தைப் பெற்றுக்கொண்டனவா என்பதையும்;

[ගරු රවි කරුණානායක මහතා]

(v) ஏனைய வர்த்தக வங்கிகள் ஊடாக தமது கடன்களைச் செலுத்தி முடித்த கடனாளிகள் தொடர்ந்தும் இந்த மானியத்தைப் பெறுவதற்குத் தகைமையுடையோராய் இருந்தார்களா என்பதையும்;

(vi) அவ்வாறாயின், அது வழங்கப்பட்டதா என்பதையும்;

(vii) இந்த நிகழ்ச்சித்திட்டத்தின் குறிக்கோள் களுக்கும், இலக்கு வைக்கப்பட்ட பயனாளிகளால் பெற்றுக்கொள்ளப்பட்ட நன்மைகளுக்கும் இடையே ஏதேனும் வேறுபாடுகள் இருப்பதை அவர் அறிவாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2019 ஏப்பிரல் மற்றும் நவம்பர் மாதங்களுக்கு இடைப்பட்ட காலப்பகுதியில் சம்பத் வங்கி ஊடாக அங்கீகாரங்கள் வழங்கப்பட்டனவா என்பதையும்;

(ii) அவ்வாறாயின், அவற்றின் எண்ணிக்கை மற்றும் பெறுமதி யாது என்பதையும்;

(iii) வரையறுக்கப்பட்ட க்ளென்றொக் (பிரைவட்) லிமிட். நிறுவனத்தால் சமர்ப்பிக்கப்பட்ட விண்ணப்பத்தின் நிலை மற்றும் அது அங்கீகரிக்கப்பட்டு இருப்பின், அதற்குரிய நன்மைகளை வழங்காமைக்கான காரணங்கள் யாவை என்பதையும்?

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the number and total value of loans approved under the "Jaya Isura" Programme since inception;

(ii) whether the concessionary interest subsidy of 4 per cent to 5 per cent has been paid;

(iii) if so, the number of beneficiaries and the benefits derived through the programme;

(iv) whether participating commercial banks complied with the programme and received the relevant interest differential from the Ministry;

(v) whether borrowers who settled their loans through other commercial banks remained eligible for the subsidy;

(vi) if so, whether it was granted; and

(vii) whether he is aware of any disparity between the Programme's objectives and the benefits received by intended beneficiaries?

(b) Will he also inform this House -

(i) whether approvals were granted through Sampath Bank between April and November, 2019;

(ii) if so, their number and value; and

(iii) the status of the application submitted by Glenrock (Pvt.) Ltd., and if approved, the reasons for not granting the relevant benefits?

(c) If not, why?

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

(අ) (i) ලියාපදිංචි කර ඇති ණය ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව - 3,012
ලියාපදිංචි කර ඇති ණයවල මුළු වටිනාකම - රු. මිලියන 65,800

(ii) "ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා කාණ්ඩ 02ක් යටතේ ණය ලබාදුනි. ඒ අනුව, සුළු පරිමාණ ව්‍යාපාර සඳහා මුළු පොලී අනුපාතයෙන් 50%ක කොටසක්ද, මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මුළු පොලී අනුපාතයෙන් 25%ක කොටසක්ද පොලී සහනාධාර ලෙස ලබා දෙන ලදී. ණය ගැණුම්කරු වෙත ණය ලබාදිය යුතු පොලී අනුපාතය - end borrower's interest rate - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සහභාගීත්ව බැංකු ආයතන වෙත දැනුම් දෙනු ලැබේ. 2017 සිට 2019 වසර දක්වා මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ බැවින් මෙම එක් එක් වර්ෂවල ණය ගැණුම්කරු වෙත ණය ලබාදිය යුතු පොලී අනුපාතය - end borrower's interest rate - වෙනස් වේ. ඒ අනුව, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ මුළු පොලී අනුපාතයෙන් ආසන්න වශයෙන් 4%-7% ක් අතර ප්‍රමාණයක් පොලී සහනාධාර ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දී ඇත.

(iii) ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 2,757
වැඩසටහන මඟින් ලබාදුන් ප්‍රතිලාභ වටිනාකම - රු. මිලියන 56,367

(iv) ඔව්.

(v) මුදල් අමාත්‍යාංශය විසින් "ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය සඳහා බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් මාර්ගෝපදේශ අනුව, වෙනත් වාණිජ බැංකුවලින් ලබාගත් ණය පියවීමට හෝ ණය ලබාගන්නා බැංකුවේ පැවති වෙනත් ණයක් "ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය සඳහා පරිවර්තනය කළ නොහැක.

(vi) අදාළ නොවේ.

(vii) එවැනි විෂමතාවක් වාර්තා වී නොමැත.

(ආ) (i) ඔව්.

(ii) ලියාපදිංචි කර ඇති ණය ප්‍රමාණය - 01

ලියාපදිංචි කර ඇති ණයවල මුළු වටිනාකම - රු. මිලියන 7.0

(iii) මුදල් අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත "ජය ඉසුරු" ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචිය සඳහා ග්ලෙන්රොක් (පෞද්ගලික) සමාගම නමින් ණය අයදුම්පතක් ඉදිරිපත් කර නැත.

(ඇ) පැන නොනඟී.

(அ) (i) பதிவு செய்யப்பட்ட கடன்களின் எண்ணிக்கை - 3,012

பதிவு செய்யப்பட்ட கடன்களின் மொத்தப் பெறுமதி - 65,800 மில்லியன் ரூபாய்

(ii) “ ஜய இசுர” கடன் திட்டத்தின்மூலம் சிறு மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சிகளுக்கு - SMEs - இரண்டு பிரிவுகளின்கீழ் கடன்கள் வழங்கப்பட்டன. அதன்படி, சிறு அளவிலான தொழில்முயற்சிகளுக்கு இறுதிக் கடனாளியின் வட்டி விகிதத்தில் 50% பங்கும், நடுத்தர அளவிலான தொழில்முயற்சிகளுக்கு இறுதிக் கடனாளியின் வட்டி விகிதத்தில் 25% பங்கும் வட்டி மானியமாக வழங்கப்பட்டது. இறுதிக் கடனாளியிடமிருந்து அறவிடப்பட வேண்டிய வட்டி விகிதம் - end borrower’s interest rate - அபிவிருத்தி நிதித் திணைக்களத்தால் ஆண்டுக்கு ஒரு முறை பங்கேற்கும் வங்கி நிறுவனங்களுக்கு அறிவிக்கப்படும். இக்கடன் திட்டம் 2017 முதல் 2019ஆம் ஆண்டு வரை நடைமுறைப்படுத்தப்பட்டதால், இந்த ஒவ்வோர் ஆண்டிலும் இறுதிக் கடனாளியின் வட்டி விகிதம் வேறுபட்டது. அதற்கமைய இக்கடன் திட்டத்தின்கீழ் மொத்த வட்டி விகிதத்தில் சுமார் 4% முதல் 7% வரையான தொகை வட்டி மானியமாக சிறு மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சிகளுக்கு வழங்கப்பட்டுள்ளது.

(iii) பயனாளிகளின் எண்ணிக்கை - 2,757

வழங்கப்பட்ட நன்மைகளின் மொத்தப் பெறுமதி - 56,367 மில்லியன் ரூபாய்

(iv) ஆம்.

(v) “ஜய இசுர” கடன் திட்டத்துக்காக நிதி அமைச்சினால் வங்கிகளுக்கு வழங்கப்பட்ட செயல்பாட்டு வழிகாட்டுதல்களின்படி - operating guidelines - ஏனைய வர்த்தக வங்கிகளில் பெறப்பட்ட கடன்களை இத்திட்டத்தைப் பயன்படுத்தித் தீர்க்க முடியாது. அத்துடன், கடன் வழங்கும் வங்கியில் ஏற்கனவே உள்ள கடன்களை “ஜய இசுர” திட்டத்தின்கீழ் உள்ள கடன்களாக மாற்றவும் முடியாது.

(vi) பொருந்தாது.

(vii) அத்தகை முரண்பாடுகள் எதுவும் அறிக்கை செய்யப்படவில்லை.

(ஆ) (i) ஆம்.

(ii) பதிவு செய்யப்பட்ட கடன்களின் எண்ணிக்கை - 1

பதிவு செய்யப்பட்ட கடன்களின் மொத்தப் பெறுமதி - 7.0 மில்லியன் ரூபாய்

(iii) “ஜய இசுர” கடன் திட்டத்தின்கீழ் பதிவு செய்வதற்காக க்ளொன்ராக் (தனியார்) நிறுவனத்தின் - Glenrock (Private) Limited - பெயரிலான எந்தவொரு கடன் விண்ணப்பமும் நிதி அமைச்சின் அபிவிருத்தி நிதித் திணைக்களத்துக்கு - Department of Development Finance - கிடைக்கப்பெறவில்லை.

(இ) எழவில்லை.

(a) (i) The number of loan applicants registered - 3,012

Total value of registered loans - Rs. 65,800 million

(ii) Under the "Jay Isura" Loan Scheme, loans were provided to small and medium-sized enterprises - SMEs - under two categories. Accordingly, an interest subsidy of 50 per cent of the end borrower’s interest rate was provided for small-scale enterprises, while a 25 per cent interest subsidy of the end borrower’s interest rate was provided for medium-scale enterprise. The interest rate to be charged from the end borrower - end borrower’s interest rate - was annually communicated to the participating banking institutions by the Department of Development Finance. As this loan scheme operated from 2017 to 2019, the end borrower’s interest rate varied across each of these years. Consequently, under this loan scheme, an amount equivalent to approximately 4 per cent to 7 per cent of the total interest rate was provided as interest subsidies to small and medium-sized enterprises.

(iii) The number of beneficiaries - 2,757

Total value of benefits provided - Rs. 56,367 million

(iv) Yes.

(v) According to the operating guidelines issued by the Ministry of Finance to banks for the “Jaya Isura” Loan Scheme, loans obtained from other commercial banks could not be settled using this scheme nor could existing loans with the lending bank be converted into loans under the “Jaya Isura” Scheme.

(vi) Not applicable.

(vii) No such discrepancy has been reported.

(b) (i) Yes.

(ii) The number of registered loans - 01

Total value of registered loans - Rs. 7.0 million

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

(iii) The Development Finance Department of the Ministry of Finance has not received a loan application in the name of Glenrock (Pvt.) Limited for registration under the "Jaya Isura" Loan Scheme.

(c) Does not arise.

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා: විස්තර
## நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சின் செயலாளர்: விபரம்
## SECRETARY TO MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT: DETAILS

2121/2026

**4. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වර්තමාන ලේකම්වරයාගේ නම කවරේද;

(ii) ඔහු එම තනතුර සඳහා පත් කරන ලද දිනය කවරේද;

(iii) එම තනතුර දැරීම සඳහා ඔහු සතු ශාස්ත්‍රීය සහ වෘත්තීයමය සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) අමාත්‍යාංශයේ වර්තමාන ලේකම්වරයා -

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේද;

(ii) මෙරට පුරවැසිකම ලබා ඇත්තේ උපතින්ද, නොඑසේ නම්, ලියාපදිංචිය මඟින්ද;

(iii) ඔස්ට්‍රේලියාවේ පුරවැසියෙකුව සිටියේද;

(iv) ද්විත්ව පුරවැසියෙකුව සිටියේද;

(v) ඔස්ට්‍රේලියානු පුරවැසිභාවය අත්හරින ලද දිනය කවරේද;

(vi) ඔස්ට්‍රේලියානු පුරවැසිභාවය අත්හැරීමෙන් පසුව නැවත ශ්‍රී ලංකා පුරවැසිභාවය ලබාගෙන තිබේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන පුද්ගලයෙකුට අමාත්‍යාංශයේ ලේකම් ධුරය දැරීමට නොහැකි බව පිළිගන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சின் தற்போதைய செயலாளரின் பெயர் யாது என்பதையும்;

(ii) இவர் அந்தப் பதவிக்கு நியமிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(iii) அந்தப் பதவியை வகிப்பதற்கு இவருக்குள்ள கல்வி மற்றும் தொழில்சார் தகைமைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) அமைச்சின் தற்போதைய செயலாளர் -

(i) ஓர் இலங்கைப் பிரஜையா என்பதையும்;

(ii) இலங்கை குடியுரிமையை பிறப்பின்மூலம் அல்லது பதிவு செய்ததன்மூலம் பெற்றாரா என்பதையும்;

(iii) அவுஸ்திரேலிய பிரஜையாக இருந்துள்ளாரா என்பதையும்;

(iv) இரட்டைக் குடியுரிமையைக் கொண்டிருந்தாரா என்பதையும்;

(v) அவுஸ்திரேலிய குடியுரிமையைத் துறந்த திகதி யாது என்பதையும்;

(vi) அவுஸ்திரேலிய குடியுரிமையைத் துறந்த பின்னர் மீள இலங்கை குடியுரிமையைப் பெற்றுள்ளாரா என்பதையும்;

(vii) ஆமெனில், அத்திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இலங்கைப் பிரஜை அல்லாத ஒருவருக்கு அமைச்சு செயலாளர் பதவியை வகிக்க முடியாதென்பதை ஏற்றுக்கொள்வாரா என்பதை மேலும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) name of the present Secretary to the Ministry of Finance, Planning and Economic Development;

(ii) date on which he was appointed to that position; and

(iii) academic and the professional qualifications he possesses, which made him qualified to hold that position?

(b) Will he also inform this House -

(i) whether the present Secretary to the Ministry is a citizen of Sri Lanka;

(ii) whether he has acquired citizenship of this country by birth or by registration;

(iii) whether he had been a citizen of Australia;

(iv) whether he held a dual citizenship;

(v) the date on which he renounced his Australian citizenship;

(vi) whether he has obtained Sri Lankan citizenship again after renouncing Australian citizenship; and

(vii) if so, the said date?

(c) Will he further inform this House whether he accepts that a person who is not a citizen of Sri Lanka cannot hold the office of the Secretary to the Ministry?

(d) If not, why?

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

(අ) (i) හර්ෂණ සූරියප්පෙරුම

(ii) 2025.06.23

(iii) ඉහළම අධ්‍යාපන සුදුසුකම් - ආචාර්ය උපාධිය

වෘත්තීය සුදුසුකම් - පහත සඳහන් ආයතනවල යාවජීව සාමාජිකත්වය ලබාගෙන ඇත.

- Chartered Institute of Management Accountants - CIMA (UK fellow member)
- Association of Chartered Certified Accountants - ACCA (UK fellow member)
- Fellow Certified Practising Accountant - FCPA (Australia fellow member)

(ආ) (i) ඔව්.

(ii) උපතින්ය.

(iii) ඔව්.

(iv) ඔව්.

(v) 2024 සැප්තැම්බර්

(vi) ඔව්. ශ්‍රී ලාංකික පුරවැසියෙකි.

(vii) ශ්‍රී ලාංකික පුරවැසියෙකි. පුරවැසි සහතික අංකය 1000096534

(ඇ) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

(அ) (i) கலாநிதி ஹர்ஷன சூரியப்பெரும

(ii) 23.06.2025

(iii) உயர் கல்வித் தகைமை - முனைவர் பட்டம்

தொழில்முறைத் தகுதிகள் -

- Chartered Institute of Management Accountants - CIMA (UK fellow member)
- Association of Chartered Certified Accountants - ACCA (UK fellow member)
- Fellow Certified Practising Accountant - FCPA (Australia fellow member)

(ஆ) (i) ஆம்.

(ii) பிறப்பின்மூலம்

(iii) ஆம்.

(iv) ஆம்.

(v) செப்ரெம்பர், 2024

(vi) ஆம், இலங்கைப் பிரஜை

(vii) இலங்கைப் பிரஜை. குடிமக்கள் சான்றிதழ் எண் 1000096534

(இ) எழவில்லை.

(ஈ) எழவில்லை.

(a) (i) Dr. Harshana Suriyapperuma.

(ii) 23.06.2025.

(iii) Highest educational qualification - Doctorate

Professional Qualifications - Holds life membership in the following institutions:.

- Chartered Institute of Management Accountants - CIMA (UK fellow member)
- Association of Chartered Certified Accountants - ACCA (UK fellow member)
- Fellow Certified Practising Accountant - FCPA (Australia fellow member)

(b) (i) Yes.

(ii) By birth.

(iii) Yes.

(iv) Yes.

(v) September, 2024.

(vi) Yes, a Sri Lankan citizen.

(vii) A Sri Lankan citizen. Citizen Certificate Number 1000096534.

(c) Does not arise.

(d) Does not arise.

ගරු තුරෙයිරාසා රවිකරන් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 5වන ප්‍රශ්නයට - 2166/2026 - පිළිතුර දීමට අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මාසයක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு துரைராசா ரவிகரன் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 5ஆம் இலக்க வினாவுக்கு - 2166/2026 - விடையளிப்பதற்கு, பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்கள் ஒரு மாத கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education has requested for one month's time to reply to Question No. 05 - 2166/2026 - raised by the Hon. Thurairasa Ravikaran, appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.